# පුමිතිරි
# pumithiri
## 2021



**සම අවස්ථා කේන්ද්‍රය**
**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාව හා සාධාරණත්වය පිළිබඳ ඒකකය**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# පුම්තිර 2021

# පුමිතිරි 2021

විද්‍යුත් සඟරාව (E - Journal)

(1 වෙළුම 1 කලාපය)

# පුම්තිරි 2021

විද්‍යුත් සඟරාව (E - Journal)

(1 වෙළුම 1 කලාපය)


ප්‍රථම මුද්‍රණය බු. ව. 2565 ව්‍ය. ව. 2022

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ISBN 978-624-5703-11-1

පිටකවර නිර්මාණය : ලහිරු සිරිවර්ධන, දමිත් කරුණාතිලක

ප්‍රකාශනය : සම අවස්ථා කේන්ද්‍රය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය



මෙම සඟරාවේ පළ වී ඇති ලිපිවලින් ප්‍රකාශ වන අදහස් පිළිබඳව සම අවස්ථා කේන්ද්‍රයේ හෝ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ හෝ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හෝ වගකීමක් නැත. ග්‍රන්ථයෙහි අක්ෂර වින්‍යාස, ලකුණු, ඇද පද, පද බෙදීම ආදිය යෙදීම ඒ ඒ ලේඛකයාගේ අභිමතය පරිදි සිදු කරන ලදී.

# පුම්තිරි 2021

## විද්‍යුත් සඟරාව (E - Journal)

(1 වෙළුම 1 කලාපය)


ප්‍රධාන සංස්කාරක

**කථිකාචාර්ය දමිත් රණගල**

සහාය සංස්කරණය

**මහාචාර්ය නේරංජි විජේවර්ධන**

**ආචාර්ය සුජීවා සෙබස්තියන් පෙරේරා**



ප්‍රකාශනය

**සම අවස්ථා කේන්ද්‍රය**

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාව හා සාධාරණත්වය පිළිබඳ ඒකකය**

**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

උපදේශකත්වය

**මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද**
පීඨාධිපති - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර**
මානවවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**මහාචාර්ය නේරංජි විජේවර්ධන**
කමිටු සම්බන්ධිකාරක
ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාව හා සාධාරණත්වය පිළිබඳ ඒකකය

කමිටු සාමාජිකයන්

**ආචාර්ය ශාන්ත ගම්ලත්**
**ආචාර්ය සුජීවා සෙබස්තියන් පෙරේරා**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඉමේෂා ධර්මසේන**
**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුමනජිත් කුමාර**
**කථිකාචාර්ය දමිත් රණගල**

# සංස්කාරක සටහන

'පුම්තිරි' විද්‍යුත් ශාස්ත්‍රීය සංග්‍රහයේ පළමු කලාපය 2022 වර්ෂයේ මාර්තු මාසයට යෙදී ඇති ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාව හා සාධාරණත්වය පිළිබඳ ඒකකය විසින් සිදුකරනු ලබන කර්යයන් අතර, සුවිශේෂ ශාස්ත්‍රීය ප්‍රවේශයක් වශයෙන් ප්‍රකාශයට පත්වෙයි. මේ වූකලි ස්ත්‍රී-පුරුෂභාවයට අදාළ අනුබද්ධ විෂය ක්ෂේත්‍ර අලළා විරචිත ශාස්ත්‍රීය නිබන්ධ සංග්‍රහයකි. පුම්තිරි ශාස්ත්‍රීය සංග්‍රහයේ මෙම පළමු කලාපය ශාස්ත්‍රීය නිබන්ධ දහතුනකින් සමන්විත වන අතර, සංගෘහිත රචනා සියල්ල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් සම්පාදනය කරනු ලැබ තිබේ.

විශ්වවිද්‍යාලයක පරමාර්ථ පිළිබඳ අදහස් දක්වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලය) ප්‍රථම උපකුලපති සහ විශ්වවිද්‍යාලයේ නිර්මාතෘ අතිපූජ්‍ය වැලිවිටියේ ශ්‍රී සෝරත නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ ''මෙම විශ්වවිද්‍යාලයෙන් පොතේ ගුරුන් පිරිසක් බිහි වේවා යි බලාපොරොත්තු නො වෙමු. කියන දේ එසේම පිළිගන්නා විවේචනයට අකමැති පිරිසක් බලාපොරොත්තු නො වෙමු'' යයි ප්‍රකාශ කොට තිබේ. උපාධි පාඨමාලාවන්ට අදාළ විෂය කටයුතුවලට සමගාමීව මෙවන් ශාස්ත්‍රීය නිබන්ධ රචනයට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු කිරීමේ පරමාර්ථය ද එයයි. ඒ අනුව රටේ පවතින කෝවිඩ් 19 වසංගතය හමුවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශ්වවිද්‍යාලයෙන් බැහැරව මාර්ගගත ක්‍රමයට ඉගෙනුම් ක්‍රියාවලිය සිදුකරන සමයක ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාව හා සාධාරණත්වය පිළිබඳ ඒකකයේ දැනුම්දීම අනුව ශාස්ත්‍රීය නිබන්ධ රචනා කළ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අපගේ ගෞරවාදරය හිමි කරමු.

මෙම ශාස්ත්‍රීය ලේඛන සඳහා අප විසින් ඔවුන් වෙත ලබා දෙන ලද කාලය ද සීමාසහිත විය. එමෙන්ම රටේ පැවැති තත්ත්වය තුළ පර්යේෂණ කටයුතු සිදුකළ යුතු වුයේ ද විවිධ සීමාවන්ට යටත්ව. එනිසා උපාධි අපේක්ෂකයන් විසින් සිදුකළ මෙම ශාස්ත්‍රීය රචනා පරිශීලනය කරන විට එම තත්ත්වය කෙරෙහි අවධානය යොමුකරන මෙන් කාරුණිකව සිහිපත් කරමු.

තවද මෙම කාර්යය සඵල කර ගැනීමෙහිලා උපකාර කළ භවතුන්ට කෘතඥතාව පිරිනැමීම අපගේ යුතුකමකි. ඔව්හු මේ ව්‍යායාමයෙහි දායකකාරකාදීහු වෙති. නිරන්තරයෙන්ම මෙම කාර්යය පිළිබඳ විමසාබලා නිසි උපදේශකත්වය මෙන්ම අඛණ්ඩ අනුග්‍රහය ලබාදුන් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය ශිරාන්ත හීන්කෙන්ද මහතාට පළමු කොට ස්තුතිය පළ කරමු. මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර මහතා එහිදී ඉටුකළ මෙහෙවර ද කෘතඥතා පූර්වකව සිහිපත් කළ යුතුය.

සෝදුපත් බැලීමේ දී සහාය වූ සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ භාග්‍යා දිල්හානි මාඹුලගේ මිය සහ පිටකවරය නිර්මාණය කළ ලහිරු සිරිවර්ධන මහතාත්,

දමිත් කරුණාතිලක මහතාත් කළ උපකාර ගෞරවයෙන් සිහිපත් කරමු. මෙම ග්‍රන්ථ කාර්යයට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාව හා සාධාරණත්වය පිළිබඳ ඒකකයේ කමිටු සාමාජිකයන් ද දැක්වූ සහයෝගය ද වෙසෙසින් පැසසිය යුතුය.

**සංස්කාරක මණ්ඩලය**
2022 මාර්තු 08 වැනි දින

# ලේඛක වගතුග

**ආශා උදයංගනී දයාරත්න**
තෙවන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**ඩබ්. එච්. මල්ෂා දිලිණි**
තෙවන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**ඒ.එම්.එස්.එන්. අබේකෝන්**
සිව්වන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**එල්.බී.පී.එස්. ජයසේකර**
සිව්වන වසර
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

**ඒ.ඩබ්.සී.එස්. වීරතුංග**
සිව්වන වසර
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය

**ජේ.ජී.ඩී. සචිනි හංසිකා**
සිව්වන වසර
දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

**එන්.එස්. දිල්ෂාන් ප්‍රේමචන්ද්‍ර**
තෙවන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**සමරපුල්ලිගේ ඩයනි හන්සිකා**
සිව්වන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**බුද්ධික මිතුල කුමානායක**
සිව්වන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**එම්.සී.එස්. වර්ණකුලසූරිය**
සිව්වන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**ටී.ඒ. ශානිකා තාඹුගල**
සිව්වන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**හපුතන්ත්‍රීගේ පැතුම් නිවන්ත**
සිව්වන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

**චමත් සඳරු ගුණරත්න**
සිව්වන වසර
අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති අධ්‍යයනාංශය

# පටුන


ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තා භූමිකාව 01

විවිධ සමාජ තත්ත්වයන් තුළ කාන්තා භූමිකාව 15

පිතෘ මූලික සමාජ ක්‍රමය තුළ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ
මානව හිමිකම් සහ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව 28

භූගෝල විද්‍යාවේ ස්ත්‍රීවාදී ප්‍රවේශය 40

ස්ත්‍රියට නිසිතැන 48

නූතන ස්ත්‍රීවාදය කෙරෙහි රැකියාවේ නිරත වන
කාන්තාවන්ගේ ආකල්පය 60

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය වන
වැටුප් විෂමතාව 65

කාන්තා සාපරාධිත්වයට හා වින්දිතභාවයට
බලපන්නා වූ මාසික ආර්තවය 71

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ කාන්තා වින්දිතයෝ 78

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත රැකියාවේ නියුක්ත කාන්තාවන්ගේ අපරාධ
වින්දිතභාවය 85

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බැඳි අපරාධ වින්දිතභාවයෙහි කාලීන ස්වභාවය
පිළිබඳව පූර්ව පර්යේෂණ පත්‍රිකා ඇසුරෙන් විශ්ලේෂණය 98

පුම්තිරිභාවය හා සංක්‍රාන්තික ලිංගිකත්වය 111

පොදු ප්‍රවාහනයේ දී සිදුවන කාන්තා ලිංගික හිංසනය හා
ස්ත්‍රී-පුරුෂ සමාජභාවය 122

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තා භූමිකාව

**ආශා උදයංගනී දයාරත්න**

වත්මන් සමාජ සන්දර්භය තුළ පවා මුල් බැස ගත් කාන්තා විමුක්තිය සම්බන්ධයෙන් හඬ නගන යුගයක ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බැඳි කාන්තාවගේ භූමිකාව පිළිබඳ තෙවන ඇසකින් විමසීමට මෙම ලිපිය උපකාරී වනු ඇතැයි අපේක්ෂා කරමි. මාතෘ මූලික සමාජ ක්‍රමයේ සිට කාන්තාවට වන්දනීය ලෙස සැලකීම සේම එම සංකල්පය මුළුමනින්ම උඩුයටිකුරු වූ යුගයක් අප සියලු දෙනා පසුකරමින් යයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය යන පදයට වඩා සමාජීය හා මනෝභාවාත්මක වශයෙන් වෙනස් වූ අර්ථයක් ගෙන දෙන පදයකි. ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය යනුවෙන් සරලව අදහස් වන්නේ උපතින් තීරණය වන මානවයාගේ ලිංගික බවේ වෙනසයි. ජීව විද්‍යාත්මකව ස්වභාවයෙන් ම සියලුම ජීවීන් ස්ත්‍රී-පුරුෂ ලෙස විභේදනය කළ හැකිය. එය විශ්ව සාධාරණ න්‍යායකි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පදය මුල් වරට භාවිත කොට ඇත්තේ මනෝ වෛද්‍ය විද්‍යාවේදීය. රොබට් ස්ටෝලන් 1968 දී කළ මනෝවිශ්ලේෂණ පිළිබඳ අධ්‍යයනයේ දී **Gender යන** පදය ස්ත්‍රී-පුරුෂ විභේදනය නොසලකා මානව හැසිරීම් විස්තර කිරීමට භාවිත කොට තිබේ. එහෙත් නූතන අර්ථයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පදය ඉතා පුළුල්ව භාවිත කිරීම සිදු කරන ලද්දේ ස්ත්‍රීවාදීන් විසිනි. 1970 සහ 1980 දශකවල සම්භාව්‍ය ස්ත්‍රීවාදී රචනාවලදී වර්තමාන අදහසින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පදය භාවිත කොට තිබේ. ඉන්පසු ස්ත්‍රීවාදීන් විසින් සිය සමාජ දේශපාලන විග්‍රහයන්හිදී ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයට පත් කොට ඇති මෙම සමාජ නිර්මිතය පිළිබඳ විවේචනාත්මක දෘෂ්ටියක් ගොඩනඟනු ලැබීය.

Scott, දක්වන ආකාරයට "ස්ත්‍රී-පුරුෂ ජීව විද්‍යාත්මක වෙනස මත සමාජයේ එම දෙපක්ෂය දකින ආකාරයට අනුව වෙනස් වූ සමාජ තත්ත්වයන් ඔවුනොවුන් වෙත නිර්මාණය කර දී තිබේ. මෙම සමාජ නිර්මිතය සමාජ සම්බන්ධතාවල පදනම වන අතර ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන සාධකවල සබඳතා විස්තර කිරීමේදී හෝ හඳුනා ගැනීමේදී මූලික වේ".

ආසියාතික සංස්කෘතිය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බැඳි සංකල්ප පැහැදිලිව හඳුනා ගැනීමට හැකිය. මනුෂ්‍ය සත්ත්වයෙකු ලෙස ලිංගභේදමය වශයෙන් වෙනසක් උරුම කොට ගන්නා ගැහැනු දරුවෙකුට හෝ පිරිමි දරුවෙකුට ඔවුන්ගේ සමාජ ජීවිතයට බලපෑම් කරන්නේ ජීව විද්‍යාත්මක පදනම මත ගොඩනැගුණු

සමාජ මතවාදයි. එය සමාජයෙන් සමාජයට මෙන්ම සංස්කෘතියෙන් සංස්කෘතියට විවිධත්වයක් පෙන්නුම් කරන්නා වූ සංකල්පයකි. ලිංග භේදය මත ගොඩනැගුණු එම සංකල්පය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ලෙසින් හඳුනාගත හැකිය. මෙම සංකල්පය සමාජානුයෝජනය තුළදී ම හඳුනා ගැනීමට හැකි වේ. සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදීන් ඉදිරිපත් කරන ආකාරයට දෛනික ජීවිතයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිරන්තරයෙන් නිරූපණය කරන බව පෙන්වා දෙයි.

මෙම තත්ත්වය බිළිඳකු බිහිවන මොහොතේ සිටම සමාජය විසින් නිර්ණය කරනු ලබයි. පිරිමි දරුවාට නිල්පාටත්, ගැහැනු දරුවාට රෝස පාටත් ආරෝපණය කිරීම සිදුවන අතර සමාජානුයෝජන සංකල්පයේදී මෙම සලකුණු තුළින් නිරූපණය කරනු ලබන කාර්යභාරය ද ස්ත්‍රී-පුරුෂ සමාජ විෂමතාව වෙන් කර දක්වයි. බොහෝ අවස්ථාවලදී අප සමාජයේ ද පවතින මතවාද අතර කුටුම්භයේ සියලුම කාර්යයන් කාන්තාවට භාරය. යම් අවස්ථාවකදී යම් පුරුෂයකු විසින් ආහාරය පිසිනවා තවකෙකු දුටුවොත් **"ඔහු ගෑනු වැඩ කරනවා"** යැයි සමාජය විසින් කියනු ලබයි. එයට හේතුව වන්නේ ද ස්ත්‍රී-පුරුෂ කාර්යභාරයන් සංකේතාත්මකව විභේදනයට ලක් කොට තිබීමයි.

එසේම කෘත්‍යවාදී සංකල්ප තුළින් මූලික අවධානයට යොමු කරනුයේ සමාජය සෑම අවයවයක්ම යම් කිසි කාර්යයක් ඉටු කිරීම සිදු වන බවයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළදී මෙම කෘත්‍යාත්මක මෙහෙවරක් පවතින බව කෘත්‍යවාදී සමාජ විද්‍යාඥයකු වූ **ටැල්කොට් පාසන්** විසින් සඳහන් කරනු ලබයි. ඔහු විසින් (1950) දී පමණ න්‍යෂ්ටික පවුල් සංස්ථාවේ ස්ත්‍රී-පුරුෂ විභේදනයේ පවත්නා කෘත්‍යාත්මක කාර්යභාරය පිළිබඳ විග්‍රහ කරන ලදි. එනම්,

- උපයෝගී තත්ත්වය
- භාවාත්මක තත්ත්වය යනුවෙනි.

ඒ අනුව පුරුෂයා පවුල තුළ උපයෝගී තත්ත්වයක් ආරෝපණය කරනු ඇත. ආර්ථිකය ශක්තිමත් කරමින් නිවසට අවශ්‍ය සියලුම භෞතික අවශ්‍යතා පරිපූර්ණ කාර්යභාරයේ නිරත වන අතර ස්ත්‍රිය විසින් භාවාත්මක කාර්යභාරය පූර්ණය කරනු ලබයි. ඒ අනුව දරුවන්ගේ අවශ්‍යතා මෙන්ම ආදරය හා කරුණාව උත්පාදනය කරමින් භාවාත්මක අංශය පරිපූර්ණ කිරීමට ස්ත්‍රිය සමත් වෙයි. මේ කාරණා ත්‍රිත්වය ම පවුල් සංස්ථාව නිසි ලෙස විකාශනයට අවශ්‍ය වන්නේය. පුරුෂයන්, ශාරීරික හා මානසික වශයෙන් ශක්තිමත්, එඩිතර, ඉක්මනින් තීරණ ගත හැකි, නායකත්වයක් සහිත, බුද්ධිමත් හා තාර්කික කොටසක් ලෙස සමාජය විශ්වාස කරයි. ස්ත්‍රීන් ලාමක, සුන්දර, පුරුෂයකු මත යැපෙන, කාරුණික, සසලවන සිතැත්තියක් ලෙසින් සැලකේ. මෙම මූලික ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාව පුරුෂයන්ට මෙන් ස්ත්‍රීන්ටද පොදු වන අතර දරුවකු වයස අවුරුදු 2ක් පමණ වන විට මෙම අනන්‍යතාව තමා තුළම ස්ථාපිත කර ගනී (Ehrhardt, 1972). මේ අනුව ස්ත්‍රීන් හා පුරුෂයන්ට පවරා දී ඇති කාර්යයන්ද වෙනස් බව පැහැදිලිව හඳුනාගත හැකිය. දරුවකු කුඩා කල සිට සමාජානුයෝජන කිරීම තුළින් දිගු කලක් තිස්සේ

මෙම අනන්‍යතාව ඇය හෝ ඔහුගේ මනස තුළ ස්ථාපිත කෙරේ (Kagan 1964, Smith and Leloyd, 1978).

| | | |
|---|---|---|
| කෘත්‍යවාදය | කාන්තාවන් කුඩා දරුවන් රැක බලා ගැනීම. දරුවන්ට ඉගැන්වීම. | තාර්කික ලෙස කටයුතු කිරීම. |
| ඝට්ටනවාදීන් | ශ්‍රම විභජනය නිසා කාන්තාවන් නිවසේ රැඳීම. සම්පත් බෙදී යාම. | සමාජය හා සම්බන්ධ වීම. |
| සංකේත අන්තර්ක්‍රියාවාදය | සමාජානුයෝජනය තුළ පවුල තුළ අන්තර්ක්‍රියාකාරීත්වය. (කාන්තාවන්ට රෝස පාට ආරෝපණය කිරීම) | පිරිමි දරුවන්ට නිල් පාට ආරෝපණ කිරීම. |

Margaret Mead විසින් 1935 දී සිදු කරන ලද **Sex and Temperament in three Primitive Societies** යන අධ්‍යයනයට අනුව ජීව විද්‍යාත්මකව ලිංග භේදය අනුව ස්ත්‍රීන්ගේ හා පුරුෂයන්ගේ ගති ලක්ෂණ සහ හැකියාවන්හි වෙනසක් නොපවතින බව හෙළි කරන ලදී. ඇය ප්‍රකාශ කරන ආකාරයට එබඳු වෙනස්කම් ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර ස්ථාපිත කරන්නේ සමාජානුයෝජන ක්‍රියාවලිය මගිනි. ස්ත්‍රීන් හා පුරුෂයන් අතර ලිංගික වෙනස හැර වෙනත් ස්වාභාවික වෙනසක් ඇතැයි පැහැදිලි නිගමනයකට මෙතෙක් එළැඹී නොමැති බව පැහැදිලිව තහවුරු කරගත හැකිය (Maccoby and Jacklin, 1974).

ශ්‍රී ලංකාව වැනි ආසියානු සංස්කෘතියකට හිමිකම් කියන්නා වූ පවුල් සංස්ථාවක පිතෘ මූලික සමාජ ව්‍යුහයක් දැකගත හැකිය. කාන්තාව පවුලේ තීරණ ගැනීමේදී සහභාගි වන්නේ කලාතුරකිනි. කුඩා කල දෙමහල්ලන් යටතේ ද, තරුණ කල සැමියා යටතේද, වැන්දඹුවක් වූ කල පුතාට ද යටත් වූ ඇයගේ ජීවිතය තොටිල්ලේ සිට මිනී වළ දක්වාම යටත් විජිතයකි. පාරම්පරික සම්ප්‍රදාය අනුව භාර්යාවගේ මූලික කාර්යභාරය නම් ගෘහයේ කටයුතු කරමින් දරුවන් රැක බලා ගත්ත ද, ගැමි කත කුඹුරේ හා ගෘහ කර්මාන්තවල පිරිමින් හා උරෙනුර ගැටෙමින් තම පවුලේ ආදායම තර කිරීමේ කාර්යයෙහි කාලාන්තරයක් පුරා නියැලී සිටියාය. නමුත් සාම්ප්‍රදායික කාර්ය විභේදනයේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රජා කටයුතු සහ දේශපාලන කටයුතුවලට සහභාගි වීම පිරිමියාට පමණක් අති විශේෂ වූ විෂයයක් බවට පත් වීම හඳුනා ගත හැකි ය. සාම්ප්‍රදායික විශ්වාස සහ ප්‍රතිමාන නොහොත් මිමි වර්ග කාන්තාවගේ යටහත් පහත්භාවය ඔප්නැංවීමට ප්‍රතිෂ්ඨාපනය කර ඇති බවක් පෙනේ. උදාහරණ වශයෙන් යමෙකු කාන්තාවක වී උපදින්නේ නම් පූර්ව ජන්මය කරන ලද පාප කර්මයක් නිසාය යන ජනප්‍රවාදය හඳුනාගත හැකිය. කාන්තාවන්ගේ කාර්යයන් පිරිමින් ලවා සිදු කිරීම ද පාපයක් ලෙස සලකන ලදී. කාන්තාවගේ නුවණේ තරම හැඳිමිටේ දිගට සීමා වන බවත්, ස්ත්‍රීන් මානසික

වශයෙන් දුර්වල බවත්, භාවමය වශයෙන් තුලනාත්මක නොමැති බවත් සහ තාර්කික නොවූ අවිශ්වාස කොටසක්ය යන විවිධ මිථ්‍යාවන් සමාජය තුළ මුල් බැසගෙන පවතී. මෙවන් පුහු මතයන් සමාජය විසින් රෝපණය කරන ලද මිථ්‍යා විශ්වාසයන් ය. එසේ ම ජනමාධ්‍ය තුළින් ද කාන්තාවගේ සැබෑ තත්ත්වය නිසි පරිදි නිරූපණය නොකිරීම හේතුවෙන් ඇය සමාජයේ අප්‍රසාදයට පත් වීමට හේතු වී ඇති බව පැහැදිලි ය.

පවුල් සංස්ථාව තුළ කාන්තාවක්, මවක, බිරිඳක, සොයුරියක, දියණියක වශයෙන් විවිධ කාර්යභාරයන් සිදුකරයි. පුරාණ කාන්තාවගේ සමාජ තත්ත්වය ද බොහෝවිට ගෘහය මුල් කරගෙන ගොඩනැගී තිබේ. බුද්ධකාලීන සමාජයේ කාන්තාවගේ සමාජ තත්ත්වය සහ භූමිකාව පිළිබඳ සිගාලෝවාද සූත්‍රයෙහි කරුණු දක්වා තිබේ. ඉන්දීය සමාජය තුළ කාන්තාවගේ ප්‍රධාන මෙහෙවර වූයේ සිය සැමියාට සේවය කිරීමයි. ඉතිහාසය තුළ කාන්තාවට අධ්‍යාපනය ලැබීමේ අයිතිය අහිමි වී තිබුණත් වර්තමානයේ අධ්‍යාපනය ලැබීමටත් රැකියාවන්හි නිරත වීමටත් අවස්ථාව උදා වී ඇත. මෙම තත්ත්වය තුළ දී පුරුෂයා සේම ධනය ඉපයීමටත් කාන්තාවට හැකි වීම නිසා කාන්තාව කාර්යයන් බොහොමයක් ඉටු කළ යුතු චරිතයක් බවට වර්තමානයේ දී පත් වී ඇත.

කාන්තාව සඳහා සමාජයේ පිළිගත් විෂම නීති පද්ධතියක් ද පවතී. එහිදී කාන්තාව අතිශයින්ම ශීලාචාර විය යුතු බව සමාජ මතයයි. කාන්තා ගුණාංගයන්ගෙන් යුතු මෙන්ම ලැජ්ජා බය දෙකෙන්ම යුක්ත වීමද සමාජය විසින් බලාපොරොත්තු වනු ලැබේ. එසේම තම අදහස් එඩිතරව දක්වා සිටීමට සමාජයේ කාන්තාවට තහංචි පනවා තිබේ. කාන්තාව සම්බන්ධයෙන් සමාජයේ දරන තීව්‍ර මත වාද කැපී පෙනෙන අවස්ථාවන් ලෙසින් දරුවන් නැති විවාහක කාන්තාවන්, වැන්දඹු කාන්තාවන්, විවාහ නොවූ කාන්තාවන් සහ දික්කසාද වූ කාන්තාවන්ගේ චරිත සම්බන්ධව බාහිර සමාජය විසින් ආරෝපණය කරන්නා වූ මතවාදයන් පෙන්වාදිය හැකිය. කාන්තාව අංග සම්පූර්ණ වන්නේ ඇය විවාහ ජීවිතයට ඇතුළත් ව දරුවන් ලබා පවුලේ නම ගෙන යාමට අඩු වශයෙන් එක පුතෙකු හෝ බිහි කළ විට යැයි විශ්වාසයක් සාම්ප්‍රදායික සමාජය තුළ පවතී. මීට අමතරව සති පූජාව, වැන්දඹුවන් යළි විවාහ වීම, බහුභාර්යා සේවනය ආදි සංකල්ප තුළින් එකල සමාජයේ කාන්තාවට හිමිව තිබූ තත්ත්වය පිළිබඳ මැනවින් හඳුනාගත හැකිය.

ආගමික වතාවත් ඉටු කිරීමේ දී ද කාන්තාව විවිධ වෙනස්කම්වලට බඳුන් වෙයි. ලෝකයේ මුල් වශයෙන් බිහි වූ බොහෝ ආගම් යම් ප්‍රමාණයකට හෝ කාන්තා සමානාත්මතාව අගය කළ ද පසු කලකදී ආගම ආයතනික ස්වරූපයක් ගත් පසු එම තත්ත්වය බිඳ වැටිණි. ජනප්‍රවාද, බුදු දහම, හින්දු ආගම සහ ඉස්ලාම් දහම අනුව කාන්තාවට පුරුෂ පක්ෂයට හා සම්බන්ධ ඇතැම් ආගමික උත්සවවලට සහභාගි වීමට ඉඩ ලබා නොදෙයි.

**"කාත්තාව අපිරිසුදු තැනැත්තියකි"** යන මිථ්‍යා මතය මීට මුල් වී තිබේ. ශ්‍රී ලංකාවේ ඇතැම් පළාත්වල ගොයම් පාගන කමතට පා තැබීමට පවා කාන්තාවට තහංචි පනවා ඇත්තේ ඇගේ අවාසනාවෙන් අස්වැන්න අඩු වේ යන මිථ්‍යා මතය මුල්කර

කර ගනිමිනි. එසේම ලෝකයේ මුල්වරට ප්‍රජාතන්ත්‍රවාදය බිහි වූ ඇතැන්ස්හි පෞර රාජ්‍ය ප්‍රධානීන්ගේ පාලන ආයතනයක් වූ පුරවැසි සභාවේ පාලනයට නගරවාසි කාන්තාවන්ට, වහලුන්ට සහ විදේශිකයන්ට තහංචි පනවා තිබේ. ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදය තුළ පවා කාන්තාව අප්‍රධාන තත්ත්වයකට පත් කර ඇති අයුරු හඳුනාගත හැකිය. පහත දැක්වෙන කවි පෙළෙන් එය මනාව විවරණය වෙයි.


බැඳලා හරියට වසර නවයයි
මගේ කුස තවමත්ම හිස්මැයි
කොයිතරම් දෑ කළත් වෙහෙසී
උරුම නැති දේ පිළිසිඳිල්ලයි...
නෝක්කාඩු පුස් වදන් විතරයි
කරුමෙ වෙලාව මටම උරුමයි
කුසක් නොපිරුණු කතක් විතරයි
දන්නේ විඳවන විදිහෙ ගැඹුරයි....

කිසිම අඩුවක් නැතුව හැමදේ
ඔප්පු වෙනවා සෑම තැනකම...
කලට වේලට සියලු දේමත්
සිද්ධ වෙනවා නියම ගානට
මොකක් හෝ පෙර පවක් හින්දා
අහිමි වීමක් පැනලා මැද්දට
ජීවිතේ අපේ හිනාවක් යට
ඇවිලෙන්නේ ගිනිගොඩකි සැරටම....

නොවදිනා දෙවියෙක් නැතුව ඇති
නොගිය දේවාලයක් ගානෙම
නොකළ පූජා තොවිල් නැතුවැති
ඒ තරම් අරහංනෙ දැං මට
ගැහැනියක් අම්මෙක් ම වන්නට
නොහැකි වී අසරණ ම වෙන තැන
කිසිම එකියක් හිත හදන්නෑ
උන් තලන්නෙම මාව හරහට....

වඳ වදන් මූසලයි නොකියා
කියති සමහරු නොකී ගානට
ඒත් ඉවසම් වැදුව දවසට
මමත් අම්මෙක් වේවී දවසක.....
ජෝඩුවක් තුන්පත් රැන වී
ගෙදර සාලෙ අඬන සද්දෙට
රැට හීනෙන් තාම ගැස්සෙයි
කඳුළු පුරවන් මැදියමේ සිට

ගැහැනියක් කිසි දිනෙක දරුවෙක්
නැතුව ඉන්නා කෙනෙක් දැක්කම
අත තියාලා බඩට ඇහුවොත්
තාම නැද්දෝ ඉතිං ඔහෙලට....
ඊට වැඩියෙන් හොඳයි සත්තයි
උලක් අරගෙන් තියනු විදිහට..
ඇනලා බලපන් බොක්කෙ ඇති ගිනි
ඒකි විඳවන තරමෙ ගින්දර.....




විසි එක්වන සියවසේ කාන්තාවගේ ඕනෑ එපාකම් පුරාතන ගැහැනුන්ට වඩා බොහෝ සෙයින් වැඩි වී තිබේ. 1963 Home Economics යන පාසල් පොතෙන් කාන්තාවක විසින් දැරියන් සඳහා ලියන ලද පරිච්ඡේදය මීට නිදසුන් ලෙස දැක්විය හැකිය.

*"ඔහු සායනයට පැමිණි වහා නින්දට යාමේ වුවමනාව ඔහුට ඇත්තේ නම් එය එසේ විය යුතුය. සියලු දේම ඔබේ සැමියාගේ කැමැත්ත පෙරටු කොට ගෙන සිදු වනවා මිස කිසි විට ඔහුට සමීප ව අඹුසැමියන් ලෙස හැසිරීමට උත්තේජනය කිරීම මගින් පීඩනය නොදෙන්න. ඔබගේ සැමියා එක්වීමට කැමැත්ත ප්‍රකාශ කරයි*

*නම්, මිනිසාගේ තෘප්තිය ගැහැනියගේ තෘප්තිමත් වීමට වඩා හැම විට ම වැදගත් වන හෙයින් කීකරුව එකඟ වන්න.''* (Home Ecconomics 1963).

විසි එක්වන සියවසෙහි ගැහැනු ඔවුන්ගේ මවුවරුන් හා පෙර මිත්තණියන්ට වඩා ස්ත්‍රී-පුරුෂ සම්බන්ධතාවෙන් වෙනත් බොහෝ දේ බලාපොරොත්තු වෙති. පුරාතනික සකස්වීමකින් යුත් ඔවුන්ගේ මොළයේ පිරිමින් පිළිබඳ ප්‍රමුඛතාවන් අනුව තවමත් ආවේණික වන අතරම ඔවුන් තම පුරාතනයන්ගෙන් ඉවත් වී ඇත. ඔවුන්ගේ මොළය අතීතයෙහි මුල් ඇද තිබියදී නූතන පරපුර අතීත පරම්පරාවල කිසිසේත්ම සිදු නොවූ තෝරා ගැනීම් සහ තීරණ ගැනීම් සඳහා ඔවුන්ට ඉඩ දීම බලාපොරොත්තු වෙති. 1950 දශකයේ ගැහැනුන්ගෙන් 60%කගේ කන්‍යාභාවය නැති වුණේ විවාහ ගිවිස ගත් මිනිසා හෝ විවාහ වූ මිනිසාගෙන්ය. වර්තමානය වන විට එම සංඛ්‍යාව 1%කි. 1960 සිට බටහිර යුරෝපයේ ඉපදුණු ගැහැනුන් පස්දෙනෙකුගෙන් එක් ගැහැනියක දරුවන් නැති තැනැත්තියකි. 1960 ට පෙර ගැබ් ගැනීමේ හැකියාව තිබුණු ගැහැනු ගැබ් ගැනීමට හේතු වූයේ උපත් පාලන ක්‍රම අඩුවෙන් පැවතීම නිසාය. අද වන විට බහුතරයක් ගැහැනු තම අත්බෑගයේ තොල් සායම් ගෙන යනවා සේම කොන්ඩමයක් ද තබාගෙන සිටිති. ලිංගික එක්වීමක් බලාපොරොත්තුවෙන් සිටීම ඔවුන්ගේ ආත්ම අභිමානය නංවන්නක් ලෙස ඔවුහු සිතති.

අද වන විට ලිංගික විප්ලවය මෙහෙය වන්නේ වයස අවුරුදු විසි ගණන්වල සිටින ගැහැනුන් නොව වයස අවුරුදු 40 පමණ වන ගැහැනුය. ඔවුන්ගේ වයස අවුරුදු 30 පමණ වන විට ස්ථිර රැකියාවක් සොයාගෙන අවසන්ය. නිවසින් පරිබාහිරව මොවුන් කටයුතු කරන අතරම බොහෝ ගැහැනු විවාහ ජීවිත ගත නොකිරීමට තීරණය කරති. බොහෝ ගැහැනුන්ට තවදුරටත් ජීවිතයට විවාහයක් නැත. ඔවුන්ට ජීවිතය ඉතා දිගය. විවාහය ඕනෑ ආදරේ වෙනුවෙනි.


සාම්ප්‍රදායික විවාහය තුළින් ගැහැනියට සමාජ ගරුත්වය, ආරක්ෂාව සපයයි. 1970 ගණන් වනතුරු පවුලේ ප්‍රධානත්වය පිරිමියා සතු විය. පවුලේ අයට ආහාර ලබා දෙමින් පෝෂණය කිරීම මෙන්ම මුදල් උපයන ලද්දේත් පිරිමියා විසිනි. අද වන විට සාම්ප්‍රදායික විවාහය තුළ ද තවදුරටත් ගැහැනිය තමාම රැකියාවක් කරමින් මුදල් උපයා ගැනීමට පෙලඹී තිබේ.

ගැහැනුන්ගේ ජීවිතය තුළ දී ඔවුන් ආදරේට ප්‍රමුඛත්වය ලබා දෙයි. අතීතයේදී ගැහැනු පරිණාමය වූයේ මිනිසුන්ට සැලකිලි දක්වන්නන් හා මිනිස්සුන්ගේ ආදරවන්තියන් ලෙසය. එයට හේතුව නිරතුරු ආහාර පාන ලබා දෙමින් ඇය ආරක්ෂා කිරීම සිදු කරන බැවිනි.

මිනිසෙකුගේ ආරක්ෂාවත්, ආදරයත් ලැබීමට අසමත් වූ ගැහැනියක සිටී නම් ඇය ඔවුන් විසූ ගල් ගුහාවෙන් එළියට පන්නා හරිනු ලබයි. ආදරෙන් තම දරුවන් හදා වඩා ගනිමින් ජයග්‍රාහි ලෙසින් තම පරපුර ඉදිරියට රැගෙන යාම කාන්තාවගේ භූමිකාවයි. වසර ගණනක් පුරා පැවත ආ මෙම තත්ත්වය උපත් පාලන පෙත්ත හඳුන්වාදීමෙන් පසු විප්ලවීය වෙනසක් ඇති කළේය. එහිදි කාන්තාවට වැඩ කිරීම,

දරුවන් ලැබීම යන දෙකෙන් තමා කැමති කාර්ය තෝරා ගැනීමට අවස්ථාව උදාවිය. එසේම 1960 ගණන් වලදී බිහි වූ කාන්තා ව්‍යාපාරයන්හි ප්‍රතිඵලයක් වශයෙන් කාන්තා විමුක්තිය, නිදහස් චින්තනය ඔස්සේ තීරණ ගැනීමට කාන්තාවට අවස්ථාව හිමි විය. 1980 සහ 1990 වර්ෂයන්හි සමාන අවස්ථාත් නීති රීති නිසාත් රාජ්‍ය බලයෙහි නව තනතුරුවලට හා ඉහළ පුටුවල කාන්තාවෝ අසුන් ගත්හ. විසිඑක් වන සියවසෙහි නිදහස් හා ස්වාධීනව තීරණ ගන්නා තමාගේම පිහිට ලබා සිටින ගැහැනියට ද මුල් යුගයේදී ගැහැනියට තිබූ හැඟීම් වන ආරක්ෂාව සහ තෘප්තිමත්භාවය ලැබීම සඳහා මිනිසකු ඕනෑ වීම නොවෙනස්ව පවතින බව හඳුනාගත හැකිය.

මේ මූලික අවශ්‍යතා ඉටු වී නැති නව යුගයේ ගැහැනියටද ආරක්ෂිත බව, ආත්මීය සැකය සහ වරදකාරී බව වේගයෙන් ඇති වන හැඟීම්ය. එය කුමක් නිසා දැයි ඇයට හැඟීමක් ඇති නොවේ. ගැටලුව ඇත්තේ මෙහිය. ගැහැනිය අද ප්‍රතිචාර වශයෙන් ඇති කර ගන්නා හැඟීම්වල තත්ත්වයට ඇගේ හැඟීම් පරිණාමය වීමට මොළයේ ස්ථිරව සකස්ව ඇති කොටසට වසර මිලියනයක් පමණ කාලයක් ගත වීම අවශ්‍ය විය. නමුත් ඇගේ තත්ත්වයෙහි ඇතිවූ වෙනස්කම් ලෝකයේ අද දක්නට ඇත්තේ අවුරුදු 50ක පමණ අතීතයේ සිටය. ඒ නිසා ඇයගේ ජීව විද්‍යාත්මක ස්වභාවය ඇගේ පරිසරය සහ නොගැළපේ.



?



පිරිමින්ගේ සහ ගැහැනුන්ගේ මොළ පරිණාමය වී ඇත්තේ වෙනස් ශක්තීන් සහ හැකියාවන් ඇතිවය. සතුන්ට දඩයම් කිරීමේ වගකීම් දරන්නන් ලෙස පිරිමින්ගේ මොළයට දුර ගමන් මාර්ග සොයා යාම, උපක්‍රම යොදා යම් කාර්යයක් සංවිධානය කිරීම ආදි කටයුතු සඳහා මොළයේ විශේෂ ප්‍රදේශයක් අවශ්‍ය විය. ඔවුන්ට තවකෙකුගේ චිත්තවේග සමග දොඩමළු වීමට හෝ සංවාද ඇතිකර ගැනීමට කිසිසේත් වුවමනා නොවේ. අන්‍යෝන්‍ය සම්බන්ධතා සඳහා ශක්තිමත් ප්‍රදේශ ඔවුන්ගේ මොළයේ වර්ධනය වී නොමැත. ඔවුන් බාහිර පරිසරය දකින්නේ ගුහාවක සිට දිගු දුරක් දකින ආ ආකාරයටයි. නමුත් ගැහැනු ඊට හාත්පසින්ම වෙනස්ය. ඔවුන්ට කෙටි දුර ගමන් යාමේ හැකියාව, පුළුල් අවට ප්‍රදේශයක් මනා ලෙස දැක ගැනීමේ හැකියාව මෙන්ම, ඒ හේතුවෙන් පරිසරය පිළිබඳ විමසිල්ලෙන්

සිටීම, එකවර කටයුතු කිහිපයක් කිරීමේ දක්ෂතාව ඇතිවේ. එයට හේතුව වන්නේ පිරිමින්ගේ සහ ගැහැනුන්ගේ මොළයේ විශේෂ ප්‍රදේශ සංවර්ධනය වී ඇති නිසායි. ඒ අනුව කාන්තාවට හිමි භූමිකාව ද, ඇයගේ ජීවන චර්යා ද ඊට අනුරූපව වෙනස් වෙයි.

**පර්යේෂණවලින් ගැහැනු පිරිමින්ට වඩා 3%ක් සාමාන්‍ය බුද්ධියෙන් ඉහළ බව පෙනී යයි**

1999දී පෙන්සිල්වේනියා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථානයේ මොළයේ පර්යේෂක මහාචාර්ය **"රූබන් ගර්"** පිරිමි මොළයට වඩා ගැහැනු මොළයේ ධූසර ද්‍රව්‍ය ඇති බව සොයා ගෙන තිබේ. එම ධූසර ද්‍රව්‍ය මොළයේ ගණිතමය කටයුතු කරන අතර ගැහැනු පිරිමින්ට වඩා හොඳ අදහස් හුවමාරු කරන්නියක ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව ගැහැනු පිරිමින්ට වඩා දක්ෂ බව පැහැදිලිව හඳුනාගත හැකිය. එසේම පිරිමි මොළය සැකසී ඇත්තේ එකවර එක් කාර්යයක නිරත වීම සඳහා වුවද ගැහැනු මොළය සැකසී ඇත්තේ එකවර බොහෝ කටයුතු සිදු කිරීමට හැකියාව ඇති පරිදි ය.

ජීව විද්‍යාත්මකව විමසීමේ දී අප නිර්මාණය වී ඇත්තේ ක්‍රෝමසෝම 46කිනි. එය මවගෙන් 23ක් ලෙස සහ පියාගෙන් 23කී. මවගෙන් ලැබෙන විසිතුන්වැනි ක්‍රෝමසෝමය x නම් සහ පියාගෙන් ලැබෙන විසිතුන්වන ක්‍රෝමසෝමය x නම් එහි ප්‍රතිඵලයක් වශයෙන් xx දරුවෙකු බිහිවෙයි. x දරුවෙක් යනු ගැහැනු ළමයෙකි. පියාගේ විසිතුන්වැනි ක්‍රෝමසෝමය y නම් xy දරුවෙකු බිහි වේ. එනම් පිරිමි දරුවෙකි. මනුෂ්‍ය ශරීරයේ සහ මොළයේ මූලික ආකෘතිය ගැහැනු ය. අප සියලු දෙනාම ආරම්භ වූයේ ගැහැනු ආකෘතියකට අනුව ය. ඒ හේතුවෙන් පිරිමින්ට ද ගැහැනු ශරීරාංග පවතී. ඒ අතර තන පුඩු සහ ක්ෂීර ග්‍රන්ථි වැදගත් වේ. කළලය ඇති වී සති හයත් අටත් ගත්වන පසු ලිංගය වර්ධනය වේ. ඒ අනුව xy හෙවත් පිරිමි ළමයෙකු ටෙස්ටොස්ටෙරෝන් නම් හෝමෝනය සිරුර පුරා යොමු කිරීම මගින් පුරුෂ අණ්ඩ නිපදවීමට හා මොළය නියමාකාරයෙන් සකස් වී පිරිමි ආකාරයෙන් ක්‍රියා කිරීමට සහ හැසිරීමට පටන් ගනී. කලාතුරකින් xx කළල තුළද මෙය සිදුවේ. x කළලය තුළද පිරිමි හෝමෝන අල්ප වශයෙන් තිබිය හැකිය. නමුත් xx කළලය ගැහැනුය. එවිට ගැහැණු ලිංගික අවයව පිහිටන අතර මොළයේ ආකෘතිය ස්ත්‍රී ලිංගවම පවතී. මොළය දිගින් දිගටම ස්ත්‍රී හෝමෝන අනුව සකස් වීමෙන් නිවස ආරක්ෂා කිරීමේ ආකල්පය වර්ධනය වීම සමඟ වාචික සහ අවාචික සංඥා වටහා ගැනීමේ මධ්‍යස්ථාන ද දියුණු වේ. ඒ ආකාරයෙන් ස්ත්‍රි ආකාරයෙන් ක්‍රියා කිරීම හා හැසිරීම ඇති වේ.

**චිත්තවේගිකව කටයුතු කළ යුත්තේ ගැහැනුන් පමණ ද?** මේ ප්‍රශ්නය දෙස සමාජ විද්‍යාත්මක ඇසින් විමසූ විට උපතින්ම කාන්තාව ළාමක ගති පැවතුම් ඇති තැනැත්තියක ලෙසින් හඳුනාගත හැකිය. කත, ලිය, මියුලැසි වැනි සමානාර්ථ යෙදුම් මීට උදාහරණ ලෙස දැක්විය හැකිය. ගැහැනියකට නොසතුටට හෝ

චිත්තවේගික තත්ත්වයකට පත් වූ විට ඇය හඬා වැටීමට ඉඩ තිබේ. සියුම් දේ බරපතළ ලෙසින් ග්‍රහණය කොට ගනිමින් ඇය හඬන්නට ඉඩ ඇත. සාමාන්‍ය ජනවහර තුළ පවා '**ගැහැනියක් වගේ අඬන්න එපා**' යනුවෙන් ප්‍රකාශ කරන්නේ එබැවිනි. දෙපසට අත් වනමින්, චිත්තවේග බව පළ කරන පද යොදා ගනිමින්, ඇගේ විඳීම් හෝ දුක ප්‍රකාශ කරමින් නිතරම කතා කරමින් සිටින අයුරු දැකගත හැකිය. ඇයට අවශ්‍ය වන්නේ මවක සේ ආදරය, ආරක්ෂාව දැක්වීම සහ සවන් දීමයි. නමුත් නිතරම සිදු වන්නේ පිරිමියා ඇය තේරුම් ගනිමින් සිටින අවස්ථාවකදී ඇය ගළවා ගැනීමට ආයාචනා කරන ආකාරයටයි. එවන් අවස්ථාවකදී ශක්තියක් වීම වෙනුවට අවවාද කිරීම සිදුකරයි. රහස් දැන ගැනීමට නොයෙක් ප්‍රශ්න අසයි. එතරම් දුක් නොවන ලෙස පවසයි.

මවක සේ ළංවිය යුතු අවස්ථාවක ඔහු පියෙක් වීමට තැත් කරයි. එම තත්ත්වය මානව පරිණාමයේ සිටම පැවත ආ තත්වයකි. ගැහැනිය ලෙස ඇයගේ චිත්තවේගික තත්ත්වය පෙන්වීම, එය ජය ගැනීමට සහ ඉක්මනින් අමතක කිරීමට කරනු ලබන හැඟීම් ප්‍රකාශනයකි. නමුත් පිරිමියා විසින් සිදු කරනු ලබන්නේ එයට විසඳුම් ලබාදීමයි. ගැහැනුන්ට ශක්තියක් වන්නේ යම් භයානක මොහොතකින් ගැළවුණු විට පවා පිරිමි මුව වැළඳගෙන හැඬූ විටය. හැඟීම් ඉවතට පිට වීමට සෑම විටම ඉඩ නොදෙන්නේ නම් නූතන මිනිසා චිත්තවේගික නොවීම හෝ මිත්‍රශීලී නොවීමටත් ඉඩ පවතියි. පිරිමින් මෙන් නොව, ගැහැනියකට විශිෂ්ට සංවේදී හැකියාවක් පවතී. ඔවුන්ට ලැබෙන තොරතුරු පිරිමින්ට වඩා විස්තර සහිතව ඔවුන්ගේ හැඟීම් ද වඩාත් චිත්තවේග ව සහ වාචිකව ප්‍රකාශ කිරීමේ හැකියාවක් පවතින්නේ ය. උදාහරණයක් වශයෙන් ගැහැනියක් තමහට අපහාස කිරීම නිසා හඬන්නට ඉඩ ඇතත් පිරිමියෙකුට එසේ කිරීම ඔහු නොදැන සිටීමට ද ඉඩ ඇත. මක්නිසාදයත් අපහාසය සැමවිටම මිනිසා විසින් චිත්තවේගිකත්වය ආරෝපණය කොට කරන ලද්දක් වන බැවිනි. නමුත් පිරිමියා එහි වචනාර්ථයෙන් පුළුල් අදහසක් අවධාරණය කර නොගනී.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ කාන්තාවගේ භූමිකාව පිළිබඳ විමසීමේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ බැඳී  කාන්තා අපරාධ පිළිබඳව කතා නොකරම බැරි තේමාවකි.

- ස්ත්‍රිය හා පුරුෂයා සිදුකරන අපරාධවල වෙනසක් තිබෙනවා ද?
- ඔවුන් සිදු කරන අපරාධ වර්ගවල වෙනසක් තිබෙනවාද?
- කාන්තාවන් සිදු කරන අපරාධවල ප්‍රමාණය සහ ස්වභාවය වෙනස් වන්නට බලපාන හේතු මොනවාද?

යන කරුණු පිළිබඳවත් මෙහිදී පුළුල්ව අවධාරණය කළ යුතුයි. කාන්තාවකගේ අපරාධකාරීත්වය අධ්‍යයනය කිරීමේදී පෞරුෂත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතුය. කාන්තාවන් ඔවුන්ගේ පෞරුෂත්වයට පේනවට වැඩි අපගාමීත්වයක්, අපරාධකාරිත්වයක් ඔවුන් තුළින් ඉස්මතු කරයි. පෞරුෂත්වය සම්බන්ධ කාරණාවලදී පොලිසිය, අධිකරණය තුළ දී පවා ඔවුන් ආරක්ෂා කිරීමක් වැනි දෙයක් සිදු වන බව පෞරුෂත්වය පිළිබඳ න්‍යායාචාරීන් විසින් පෙන්වා දෙනු

ලබයි. Hillary Allen විසින් 1987 දී ප්‍රකාශ කළේ මානසික සෞඛ්‍ය සම්බන්ධ විග්‍රහයක් ඉදිරිපත් කරමින් කාන්තාවන්ගේ මානසික සෞඛ්‍ය අධ්‍යයනය කිරීමේ දී, ඔවුන්ට දඬුවම් ලබාදීමේ දී අධිකරණය විසින් අඩු පීඩනයක් ලැබෙන දඬුවම් ලබා දෙනු ලබන බවයි. Eileen Leonard (1982) සඳහන් කළේ පෞරුෂත්වය සම්බන්ධ කාරණයේදී සමහර අවස්ථාවලදී දරුණු ලෙස අපරාධ කළ ගැහැනුන්ට, පිරිමින්ට සාපේක්ෂව තරයේ දඬුවම් ක්‍රම පවතින බවයි. ඒ හා සම්බන්ධ කරුණු කිහිපයක් ඉදිරිපත් කරමින් එහි දී අවධානයට යොමු කළේ දරුණු ගණයේ අපරාධ කරන කාන්තාවන්ට පිරිමි පුද්ගලයන්ට වඩා ප්‍රබල දඬුවම් ලබාදෙන බවයි. ලිංගිකත්වය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සම්බන්ධ අපරාධ පිළිබඳ සාකච්ඡා කිරීමේදී Frances Heidesohn කළ ඉදිරිපත් කිරීම් වැදගත් වෙයි. ඇය විසින් අධ්‍යයනය කරන ලද්දේ,

> ***කාන්තාවන් අපරාධ කරන්නේ ඇයි සහ කාන්තා අපරාධකාරීත්වයට බලපාන හේතු මොනවාද?***
> ***සමහර කාන්තාවන් පමණක් අපරාධ කරන්නේ ඇයි?***

යන්න පිළිබඳවයි. ඇය මේ ආකාර සම්බන්ධව ආකාර ත්‍රිත්වයකින් ඇගේ අදහස් ඉදිරිපත් කළාය. ඒ අනුව,

1 Biological Theory
2 Sex-role Theory
3 Transgression ලෙසින් හඳුනාගත හැකිය.

එපමණක් නොව, කාන්තා සාපරාධීත්වය හා සම්බන්ධව කටයුතු කිරීමේදී PMS සංකල්පය පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ හැකිය. ඔසප් වීමෙන් දින 21- 28 අතර කාලයේදී ස්ත්‍රී හෝමෝන ශීඝ්‍රයෙන් පහළ බසින කාලය ලෙස හඳුනාගත හැකිය. මෙම සමයේදී කාන්තාවන්ට ඇතිවන බියකරු, අඳුරු අවපීඩන සහිත කාලයකට මුහුණ දීම හේතුවෙන් ඇයට සියදිවි නසා ගැනීම පවා සිතෙන ස්වභාවයක් හට ගනී. කාන්තාවන් විසි පහකගෙන් එක් අයෙකු ඔවුන්ගේ හෝමෝන සමබරතාව වෙනස්වීමෙන් ප්‍රබල වේදනාවට පත්වෙයි. එසේම ඇයගේ චරිත ලක්ෂණ වෙනස් වීමට ද හැකියාව පවතියි. අධ්‍යයනවලින් තහවුරු වී ඇත්තේ PMS සමය තුළ පහරදීම්, සාප්පුවල බඩු සොරකම් කිරීම් වැනි අපරාධවලට කාන්තාව වැඩි වශයෙන් යොමු වන බවයි. එසේම කාන්තා සිරගෙවල් තුළ සිටින රැඳවියන් 50%ක් පමණ මිනීමැරුම් හා පහර දීම් මෙන්ම එවන් අපරාධ සිදුකර ඇත්තේ පෙර ඔසප් පීඩන කාලයේදී බව අනාවරණය වේ. එබැවින් සමහර රටවල් කාන්තා සාපරාධිත්වය සම්බන්ධ අපරාධවලට දඬුවම් පැමිණවීමේ දී අධිකරණය ද පෙර ඔසප් දිනවල ස්වභාවය සැලකිල්ලට ලක් කරයි. එසේම මෙම සංකල්පය ව්‍යතිරේකයක් ලෙස ද සමහර රටවල භාවිත කෙරේ.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සම්බන්ධ කාන්තාවගේ භූමිකාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ඒ හා සම්බන්ධ න්‍යායාත්මක කරුණු පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය. ඒ අනුව,

- Sex-role Theory
- Sex-role Theory (Continued)
- Social Control
- Lack of Opportunities
- Transgression ලෙසින් හඳුනාගත හැකිය.

## Sex -role Theory

මෙහිදී කාන්තාවන් හා පුරුෂයන් කුඩා කල සිටම සමාජානුයෝජනය වන්නේ කෙසේද යන්න පිළිබඳවත් ඔවුන්ට හිමි කාර්යයන් පිළිබඳවත් මෙම න්‍යාය මගින් කරුණු ඉදිරිපත් කෙරේ. එසේම ඔවුන්ගේ කාර්යභාරය සමග ඔවුන්ගේ ගති ලක්ෂණ ද නිතරම ප්‍රචණ්ඩකාරී වීම්, කේන්ති යාම වැනි තත්ත්ව යටතේ එය සංවර්ධනය වන්නේ කෙසේද යන්න පිළිබඳව අධ්‍යයනය කරනු ලබයි. මෙහිදී ප්‍රධාන වශයෙන් සමාජානුයෝජන සංකල්පය හා බැඳී න්‍යායාත්මක කාරණා පිළිබඳව සාකච්ඡා කරයි.

## Sex-role Theory (Continued)

කාන්තාවන් වැඩිපුර කරන වැරදි අතර කඩ සාප්පුවලින් සොරකම් කිරීම්, ගණිකා වෘත්තිය ආදි සමාජ විරෝධී ක්‍රියාවන් හඳුනාගත හැකිය. කාන්තාව ප්‍රචණ්ඩ අපරාධ කරා යොමු වීමේ අවම තත්ත්වයක් පවතී. මෙයට හේතුව වන්නේ සමාජානුයෝජනයයි. එසේම ඔවුන් එම අපරාධ සඳහා යොමු වන්නේ ඔවුන්ගේ සිතෙහි ආශාවන් සන්තර්පණය කර ගැනීම සඳහාය. එවන් දේට සිත යොමු වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ ඔවුන්ට හිමි කාර්යය මුල්කර ගනිමිනි. ඔවුන් සොරකම් කරන්නේ පොඩි දෙයක් වුවත් සමහර අවස්ථාවලදී ගොදුරු විරහිත අපරාධවල වින්දිතයෙක් විය හැකිය.

## Social Control

සමාජ පාලනය තුළදී අපරාධ සිදුකරන ආකාරය Fance Heidnsohn 1985 දී විසින් සඳහන් කරනු ලබන පාලනය තුළ පවත්නා ධර්මතා සහ සාරධර්ම පිළිබඳ, සමාජ සම්බන්ධතා, පවුල තුළ හා පවුලෙන් පිට සමාජ සම්බන්ධතා පවත්වන්නේ කෙසේද? යනාදිය සහ සමාජ පාලනයට එය ඉවහල් වීමට කාන්තාව කෙතෙක් දුරට මෙයට සක්‍රියව දායක වනවාද යන කාරණය මුල් කොට ගෙනයි.

## Lack of Opportunities

අවස්ථාවන් අහිමි වීම තුළ කාන්තාවට ඇතිවන තත්ත්වය කෙරෙහි මෙම න්‍යායයන් තුළින් අවධානය යොමුකර තිබේ. කාන්තාවන් රැකියා කරන ස්ථානවලදී තත්ත්වය සහ කාර්යභාරය පිළිබඳව සාකච්ඡා කළ යුතුය. මෙහිදී ''කාන්තාවන් පිරිමින්ට සාපේක්ෂව අඩුවෙන් අපරාධ කරන්නේ ඇයි ?'' යන්න දෙසට අවධානය යොමු කිරීමේදී අවස්ථාවන් අඩුවීම නිසා ඔවුන් අපරාධවලට යොමුවීම අවම වශයෙන් හඳුනාගත හැකි බව පෙන්වා දිය හැකිය. උදාහරණ වශයෙන් සුදුකරපටි අපරාධ සම්බන්ධයෙන් කාන්තාවන් එම වෘත්තීන්හි නියැළීම අඩු වශයෙන් දැකගත හැකි බැවින් එම අපරාධ වලට කාන්තාවගේ දායකත්වය අවම වශයෙන් දැකගත හැකිය. සමාජ විෂමතාව නිසා කාන්තාව එවන් වෘත්තින්වලට යාමට අපහසු වීම ඇයට ලැබෙන අවස්ථාවන් අහිමිවීම ලෙසින් හඳුනාගත හැකිය.

## Transgression

අතික්‍රමණය, පශ්චාත් නූතනවාදී අදහස් ඉදිරිපත් කළ Coral Smart (1990) දී අදහස් කළේ Transgressive Criminology පිළිබඳ සම්ප්‍රදායිකත්වය ඔබ්බට ගිය ලක්ෂණ කාන්තාවන්ට අපරාධ කිරීමට උපකාරී වන බවයි. විශේෂයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී දූෂණ, අපචාරවලට ලක්වීම තුළ කාන්තාවන් අතික්‍රමණයට ලක්වීම මගින් අපරාධවලට ගොදුරු වීමක් හඳුනාගත හැකිය. මේ ආකාරයෙන් ස්ත්‍රී සාපරාධීත්වය න්‍යායාත්මක කාරණා තුළින් තවදුරටත් තහවුරු කරගත හැකිය.

කාන්තාවන්ට එරෙහි සමාජ අසාධාරණය බිහිවීමට බලපාන ප්‍රධානතම හේතුව ලෙසින් චේතන රැකියා ක්‍රමය හඳුන්වාදිය හැකිය. දහනවවන සියවසේ දී මහා බ්‍රිතාන්‍ය පනවන ලද නීති මගින් සෑම විටම සියලුම මාදිලියේ රැකියා ක්ෂේත්‍රවල ඇයව නොසලකා හරින ලදි. විවාහක කාන්තාවන්ට රැකියාවට ඉල්ලීම් කිරීමටවත් අවස්ථාව අහිමි වූ යුගයක් අපි අතීතයේ පසු කරමින් සිටියෙමු. වර්තමානය වනවිට එම තත්ත්වය යම්තාක් දුරකට සමනය වී ඇතත් රැකියාවක් සිදු කිරීම තුළ පිරිමින්ට සාපේක්ෂ අඩු වේතනයක් ඇයට හිමිවේ. එපමණක් නොව ඇගේ ගෘහස්ථ ශ්‍රමය ද සූරාකෑම තවදුරටත් නොවෙනස්ව පවතී.

කාන්තාව කඩුල්ලෙන් එහාට දුක නොකියා හිතේ බර තම නිවෙස් සීමාවට කොටු කරමින් ජීවිතයට එඩිතරව මුහුණ දෙයි. උත්තරීතර මාතෘ භූමිකාවෙන් පරිබාහිරව ඇය සමාජ ප්‍රගමනයට දායක වන්නා වූ උත්තුංග චරිතයකි. නොයෙක් නෛතික ප්‍රතිපත්ති මගින් කාන්තාව රැකගැනීමටත්, ඇයගේ නිදහස පිළිබඳ අයිතිය නැවත ඔවුන්ට ලබා දීමටත් කටයුතු කර දී තිබෙන අයුරු වර්තමානයේ දී දැක ගත හැකිය. නමුත් ඇයට ලැබෙන නිදහස පූර්ණ නිදහසක් නොව, ඩොමිනියන් තත්ත්වයකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බැඳි කාන්තාවගේ භූමිකාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පුරුෂයා හා සමාන තැනක් ඇය බලාපොරොත්තු නොවන අතර ඇයට හිමිවිය යුත්තේ සම තැන නොව, නිසි තැනයි. ඇයට හිමි නිසි තැන ඇය සතු කිරීමට නම් සමාජ දෘෂ්ටිකෝණය තුළ ද හැරවුම් ලක්ෂයක් නිර්මාණය කළ යුතුය.

මෑත කාලය තුළ දී සාම්ප්‍රදායික ආධිපත්‍යය පිළිබඳ සංකල්පය දිගින් දිගටම අභියෝගයට ලක්වන බව පැහැදිලිව හඳුනාගත හැකිය. කායික ශ්‍රමයෙන් කෙරෙන රැකියා අවස්ථා අඩු වී යාමත් සමග කම්කරු පන්තියේ ද පුරුෂයාට එරෙහිව අභියෝග රැසක් ගොඩනැගී ඇති අයුරු හඳුනාගත හැකිය. කාන්තාවට අර්ධකාලීන රැකියා අවස්ථා පුළුල් වීම සමඟ සමස්ත පන්ති ව්‍යුහය තුළ පුරුෂ සේවා වියුක්තිය ද ඉහළ ගොස් ඇති බව අනාවරණ කරගත හැකිය. ඒ තුළින් කාන්තාව ස්වකීය උත්සාහයෙන් තම ජීවිතය ගොඩනැගීමේ පියවර තබන්නට පටන්ගෙන ඇත. වර්තමාන Covid 19 වසංගත තත්ත්වය තුළ දී නිවසටම සීමා වී කටයුතු කිරීම හේතුවෙන් කාන්තාවට සහ ළමයින්ට එරෙහිව සිදුවන හිංසනය පෙරට වඩා දරුණු තත්ත්වයකට පත්ව තිබීම කණගාටුවට කරුණකි. කාන්තාවන්ගේ වින්දිතභාවය ද, පිරිමි වින්දිතභාවයට සාපේක්ෂව සමාජයේ ඉහළ මට්ටමක පවතින බව ප්‍රසිද්ධ නොරහසකි. ඒ සඳහා ඇගේ ජීව විද්‍යාත්මක පදනම ද, පුරුෂාධිපත්‍යය සංකල්පය ද, ඉවහල් වන බව හඳුනාගත හැකිය. ස්ත්‍රී-පුරුෂ විභේදනය දුරලමින් සමාජ, දේශපාලන, ආර්ථික ආදි සියලු අංශයන්හි ප්‍රවර්ධනයට කාන්තාව දායක කර ගනිමින් ඇයගේ දක්ෂතා අගය කරමින් ද ඇයට වටිනාකමක් ආරෝපණය කිරීම ඇයව දිරිමත් කිරීමක් ලෙස දැකිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

චන්ද්‍රවංශ ආරියරත්න, (2012). පිරිමින්ගේ ආදරය සහ ගැහැනුන්ගේ ආදරය, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 869, මරදාන පාර, පුංචි බොරැල්ල, කොළඹ 10.

චන්ද්‍රවංශ ආරියරත්න, (2008). පිරිමි සහ ගැහැනු මෙතරම් වෙනස් ඇයි, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය, 869, මරදාන පාර, පුංචි බොරැල්ල, කොළඹ 10.

ලියනගේ කමලා, වලාකුළුගේ සුමුදු, (2006). ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය, ෆෙඩ්රික් ඊබට් පදනම, අංක 4, ඇඩම්ස් පටු මඟ, කොළඹ 4.

www.e-thaksalawa.moe.gov.lk

www.researchgate.net

# විවිධ සමාජ තත්ත්වයන් තුළ කාන්තා භූමිකාව

ඩබ්.එච්. මල්ෂා දිලිණි

සමාජය යනු විවිධ ආකෘතීන් යටතේ නිර්මාණය වූ පුළුල් විෂය පථයකි. ඒ අනුව මෙකී සමාජය ප්‍රධාන ලෙස ස්ත්‍රී හා පුරුෂ ලෙස ද වර්ග කර දැක්විය හැකි අතර ඒ අනුව ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ස්ත්‍රීත්වය හා පුරුෂත්වය යන සංකල්ප බිහි වී ඇත. මේ අතරින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු අතීතයේ සිට පැවත එන ප්‍රබල සංකල්පයකි.

**"ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට එකිනෙකට වෙනස් වූ ගති ලක්ෂණ, අනන්‍යතා, හැසිරීම් රටා, භූමිකා සහ වෘත්තීන් සමාජය විසින් නිර්මාණය කර ඇති අතර ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට පවරා දී ඇති එම සමාජ සංස්කෘතික තත්ත්වය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය''** ලෙස නිර්වචනය කිරීමට හැකිය.

එනම් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන සංකල්පය යටතේ මානව සමාජය තුළ කාන්තාවට හා පුරුෂයාට වෙන් වූ භූමිකාවක් ලබා දී ඇත. කෙසේ නමුත් ස්ත්‍රී-පුරුෂ ලිංග භේදය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පද සමාන අර්ථ ඇති පද ලෙස සමාජයේ විසින් බොහෝ අවස්ථාවල භාවිත කරනු ලැබේ. නමුත් ස්ත්‍රී පුරුෂ ලිංගභේදය යනු උපතින් තීරණය වන මානවයාගේ ලිංගය වෙනසයි. ඒ අනුව ජීව විද්‍යාත්මක සංකල්පයක් ලෙස ස්ත්‍රී-පුරුෂ ලිංග භේදයත්, සමාජීය මෙන්ම මනෝභාවාත්මක සංකල්පයක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවයත් වෙනස් වූ අර්ථ ගෙන දෙයි.

කෙසේ නමුත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ කතා කිරීමේ දී සමාජය තුළ ස්ත්‍රිය හා පුරුෂයාට සම තැනක් හිමි වේ ද යන්න ගැටලුවකි. මානව සමාජයේ ආරම්භයේ සිට ස්ත්‍රීන්ට වඩා පුරුෂයාට ප්‍රධාන තැනක් හිමි වී ඇති බව අප කවුරුත් දන්නා කරුණකි. ඒ අනුව මෙම ලිපිය මගින් මා අවධානය කිරීමට යොමු වන්නේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මුල්කරගත් සමාජය තුළ කාන්තාවට හිමි වී ඇත්තේ කෙබඳු භූමිකාව ද යන්න පිළිබඳවයි. මෙකී සමාජභාවය පිළිබඳ කතා කිරීමේදී පැරණි සමාජය හා නූතන සමාජය පිළිබඳව අවධානය යොමු කිරීම ද වැදගත් වන අතර කාන්තාවට හා පුරුෂයාට හිමි විශේෂ කාර්යයන් පිළිබඳ විමසා බැලීමෙන් සමාජය තුළ කාන්තාවට හිමි භූමිකාව හඳුනා ගත හැකිය. එනමුත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ ස්ත්‍රියගේ හා පුරුෂයාගේ භූමිකාව ඒකාකාරී නොවේ. සමාජයෙන් සමාජයට, සංස්කෘතියෙන් සංස්කෘතියට කාන්තාවගේ භූමිකාවත්, පුරුෂයාගේ භූමිකාවක් වෙනස් වෙයි.

මැදපෙරදිග රටවල් හා ඉන්දියාව වැනි විදෙස් රටවල ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන සංකල්පය යටතේ කාන්තාව ඉතාමත් පහත් තත්ත්වයකට, අඩු වරප්‍රසාද හිමි තැනැත්තියගේ භූමිකාවට පත්කර තිබීම අපට දැකිය හැකිය.

උදාහරණ වශයෙන් ඉන්දියාව තුළ තම ස්වාමි පුරුෂයා මිය ගිය පසු කාන්තාවන් සති පූජාව සිදු කිරීමට යොමු වීමත්, බමුණු සමාජය තුළ ශ්ලෝක ඇසීම පවා කාන්තාවට තහනම් දෙයක් වීමත් පෙන්වා දිය හැකිය. එමෙන්ම මුස්ලිම් සමාජය ප්‍රමුඛ කරගත් මැදපෙරදිග රටවල පවා කාන්තාව නිවස තුළම සිටිමින් සේවය කරන ඒකාකාරී ජීවිතයකට කොටු කර ඇත. නමුත් යුරෝපීය රටවල් සමාජය ගත් විට කාන්තාව පිරිමියා හා සමානව ගැටෙමින් සමාජය තුළ කටයුතු කරයි.

**පැරණි සමාජය**

ඈත අතීතයේ සිට සියවස් ගණනාවක් පුරා ස්ත්‍රිය හා පුරුෂයා අතර වෙනස් සමාජ භූමිකා සහ සමාජ තත්ත්වයක් නිර්මාණය කොට ස්ත්‍රිය හා පුරුෂයා අතර වෙනස් තත්ත්වයක් සමාජය විසින් ආරෝපණය කර ඇත. එදා සමාජයේ විස්තෘත පවුල් ක්‍රමය තුළ පිරිමි දරුවකු පියා යටතේ තම කාර්යභාරය හා භූමිකාව ආරෝපණය කරගනිමින් සමාජගත වීම ද, ගැහැනු දරුවකු මව යටතේ තම කාර්යභාරය හා භූමිකාව ආරෝපණය කරගන්න සමාජගත වීමද සිදුවේ. ඒ අනුව දරුවන් සමාජානුයෝජනය වීම ප්‍රාථමික අදියර ලෙස පවුල තුළින්ම ඔවුන්ට හුරු කරන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සංකල්පය මත පිහිටා බව මේ අනුව අනාවරණය කළ හැකිය. මෙකී වෙනස් වීම මත ස්ත්‍රියට වඩා පුරුෂයාට ප්‍රධාන තැනක් හිමිකර දෙමින් සෑම සමාජයක් තුළම පුරුෂාධිපත්‍යය යන සංකල්පය ද ප්‍රමුඛ වී ඇත. ඒ අනුව සමාජය තුළ පොදුවේ ගත් විට පුරුෂයාට වඩා කාන්තාවට පහළ තත්ත්වයක් ඇති බව ගම්‍ය වේ. එහිදී ජාතිය, ආගම, කුලය, පන්තිය ආදිය හරහා මෙකී සමාජය තුළ පහළ තත්ත්වය කාන්තාවට හිමි වන බව බව තවදුරටත් අවිවාදයෙන් පෙන්වා දීමට හැකිය.

නිදසුන් වශයෙන් භාරතයේ බ්‍රහ්මණ සමාජයේ පැවති අදහස් අනුව කාන්තාව යනු සෑම විටම පුරුෂයා යටතේ සිටිය යුතු තැනැත්තියක වශයෙන් පෙන්වාදීම සඳහන් කළ හැකිය. එනම් ළමා කාලය තුළ තම පියා යටතේ ද විවාහ වූ පසු තම ස්වාමි පුරුෂයා යටතේ ද, මහලු වූ කල තම වැඩිමහල් පුත්‍රයා යටතේ ආදි වශයෙන් පුරුෂයා යටතේ ජීවිත කාලයම ගෙවිය යුතු බව පෙන්වා දී ඇත. එපමණක් නොව පුරුෂයාගේ ලිංගික තෘප්තිය වෙනුවෙන් සේවය කරමින් නිවස තුළට වී දරුවන් වදමින් හදා වඩා ගනිමින් නිවසේ කටයුතු කළ යුතු බවත්, අධ්‍යාපනය හා තම ආගම ඇදහීමේ නිදහස පවා ඇයට අහිමි කර දී ඇත.

ඒ අනුව ඉතිහාසයෙ සිටම කාන්තාවට පහත් සමාජ තත්ත්වයක් ආරෝපණය කර දී ඇති බව පෙන්වා දීමට හැකිය. එමෙන්ම පවුල් සංස්ථාව තුළ කාන්තාව හා පුරුෂයාට වෙන් වූ විශේෂ කාර්ය භාරයන් හඳුනා ගැනීමට හැකිය. එහිදි, මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට කාන්තාවට හා පුරුෂයාට පවුල තුළ වෙන් වූ කාර්යභාරයන් තුළින් කාන්තාව සමාජය තුළ දැරූ භූමිකාව හඳුනා ගැනීමට පහසු වේ.

එහිදී කාන්තාව විසින්,

- ගෙදර නිවසේ වැඩ කටයුතු කිරීම
- දරුවන් බිහි කිරීම
- දරුවන් හදා වඩා ගැනීම ද,

පුරුෂයා විසින්,

- දඩයම් කිරීම
- මසුන් ඇල්ලීම
- දර එකතු කිරීම

මුල් කාලීන සමාජයේ දැකිය හැකිය. ඉන්පසු සමාජ විකාශනයත් සමග ගොවිතැන් කිරීම, අධ්‍යාපනය ලැබීම යන කාර්යයන් ද පුරුෂයාට කිරීමට හැකියාව ලැබුණ නමුත් කාන්තාවට හිමි වූයේ ගෘහ පාලනය හා දරුවා හදා වඩා ගැනීමේ ඒකාකාරී ජීවන රටාව ය. ගෙදරට පමණක් සීමා වූ මෙම කාර්යයන් ඉටු කිරීමට කාන්තාවගේ ශරීරය ජීව විද්‍යාත්මක ලෙස ද හැඩ ගැසී ඇත.

එමෙන්ම ප්‍රජනන කාර්යයට යෝග්‍ය අයුරින් නම්‍යශීලී සිරුරක් සහිත ස්ත්‍රිය නිර්මාණය වී ඇති බැවින් ඇය පුරුෂයාට වඩා දුර්වල, නම්‍යශීලී අයකු ලෙසද සමාජය තුළ සැලකේ. එයට සාපේක්ෂවව පුරුෂයා සතු දැඩි මාංශ පේශී හා වෙනත් ශාරීරික ලක්ෂණ නිසා ඔහු ශක්තිමත්, එඩිතර, නිර්භීත අයකු ලෙස සලකනු ලැබේ. එමෙන්ම ස්ත්‍රීය දුර්වල තැනැත්තියකි, ඇගේ ලිංගිකත්වය පහසුවෙන් පුරුෂයන්ගේ අතවරයට ලක් වේ, ඇයට ගර්භණී සමයේදී දඩයම් කිරීම වැනි කාර්යන්මයන්හි නියැලීමට නොහැකිය, දරුවන් රැකබලා ගැනීම ඇයට පමණක් සීමා වූ කාර්යයක් වැනි ආකල්ප සාම්ප්‍රදායික සමාජය තුළින් තදින් බැස ගෙන ඇත්තේ මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසාය. පුරුෂයා නිවෙසින් බැහැරව යම් කාලයක් තුළ පමණක් වැඩ කළත්, භාර්යාවගේ වැඩ බිම නිවස නිසා මුළු දවසම වැඩවලට නිරත වීමට සිදුවිය. මේ මත ස්ත්‍රී-පුරුෂ සමාජ වෙනස්කම් ඇති විය.

ඒ අනුව කාන්තාව හා පුරුෂයා මානව ප්‍රජාව පොදුවේ නියෝජනය කළත් ඔවුන්ට සමාජය තුළ අතීතයේ පවා ලබාදී ඇති කාර්යභාරයන් වෙනස් වෙයි. එහිදී පුරුෂයාට ආර්ථිකයේ හිමිකාරීත්වය ද, කාන්තාව නිවස තුළ ඒකාකාරී ජීවන රටාවක් මත තම වගකීම ඉටු කිරීමත් සිදුකරන බව ඔවුන්ගේ කාර්යභාරයක් මගින් හඳුනා ගැනීමට හැකිය. කෙසේ වුවත් සමාජ විකාශනයත් සමඟ මෙකී කාර්යභාරයන් මුළුමනින්ම වර්තමානය දක්වා වෙනස් වීමට ලක් වී නැත. එනමුත් පුරුෂයාගේ කාර්යභාරය පුරුෂයා තුළ තවදුරටත් තහවුරු වී ඇති අතර කාන්තාවට හිමි ගෘහ පාලන කටයුතුවලට අමතරව ආර්ථිකයට දායක වීම ද වර්තමානයේ දැකිය හැක. ඒ අනුව කාන්තාවට සමාජය තුළ හිමි තත්ත්වය හා කාර්යභාරය මත ඇගේ භූමිකාව වර්තමානය වන විට පුළුල් වී ඇති නමුත් පුරුෂයාට හිමි භූමිකාව

අතීතයේ සිට වර්තමානය දක්වා තවදුරටත් ස්ථාවරව පවත්වාගෙන යන බවද මෙයින් ගම්‍ය වෙයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන සංකල්පය යටතේ කාන්තාවට හා පුරුෂයාට වෙන් වූ තත්ත්වයක් හා කාර්යභාරයක් මෙන් ම භූමිකාවක් ලබා දෙමින් සමාජය තුළ විෂමතාවයක් ඇති කිරීම ආරම්භ වන්නේ ගැමි සමාජයෙන්ය. ගෝලීයකරණයත් සමඟ සමාජය දියුණුවට ලක් වුවත් එකී ගැමි සමාජය පවතින්නා වූ මතවාද නිසා තවමත් කාන්තාවට පුරුෂයාට සාපේක්ෂව හිමිවන්නේ අඩු තත්ත්වයකි. දරුවකු කුඩා කල සිට සමාජානුයෝජනය වීමේ දී ප්‍රථම අදියර තබන්නේ තම පවුල් තුළින් ය. පවුල තුළ ද ප්‍රධාන වන්නේ පියාය. පිතෘ මූලික සමාජ ක්‍රමය තුළ කාන්තාවට වඩා පුරුෂයාට නිදහස් භූමිකාවක් ලබා දී ඇත. මව සැමවිටම නිවසේ කටයුතු සිදු කරමින් කාලය ගත කරන අතරතුර දී ගැහැනු දරුවන් තම මවට ආහාර පිසීමට, නිවසේ කටයුතු වලට උදව් වෙමින් නිවසේ ම කාලය ගත කළ යුතු අතර පිරිමි දරුවකු සැමවිටම පියා සමග ගැටෙමින් නිවසින් බැහැරව කාලය ගත කිරීමට ඔහුට ඉඩ සලසා දී ඇත. ඒ අනුව දරුවන් වුවත් කුඩා කල සිට සමාජානුයෝජනයට ලක් කරන්නේ කාන්තාවට හා පුරුෂයාට සමාජයේ විෂමතාවක් පවතින බව පෙන්වා දෙමින්ය. කෙසේ විග්‍රහ කළ ද සමාජය තුළ කාන්තාවට ලබා දී ඇත්තේ සේවකයකුගේ එනම් දාසියකගේ භූමිකාවය. පුරුෂාධිපත්‍යය යටතේ කාන්තාවට මෙම භූමිකාවක ලැබී ඇතත් මෙහි පවතින විශේෂත්වය වන්නේ වැඩිහිටි කාන්තා පාර්ශ්වය මෙම විෂමතාව පිළිගෙන ඒ අනුව කුඩා කල සිට ගැහැනු දරුවන්ව මෙම විෂමතාවයට අනුව සමාජානුයෝජන කිරීමය. මව, කිරි අම්මා, ආච්චි වැනි පවුලක වැඩිහිටි කාන්තාවන් ගැහැනු දරුවකුට පිරිමි දරුවකු මෙන් හැසිරීමට නොදී විවිධ තහංචි දමන්නේ ද කාන්තාවක් ලෙස ඇය ද තමාට හිමි භූමිකාව පිළිබඳව තේරුම් ගෙන ඒ අනුව කටයුතු කරන බැවින් ය.

**නූතන සමාජය**

සමාජ විකාශනයත් සමගම නූතන සමාජය තුළ මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මුල්කොට පුරුෂයාගේ හා කාන්තාවගේ භූමිකාව යම් සමානකමකට ගැටෙමින් පවතී. කාන්තාව විසින් මුල් කාලීන ඒකාකාරී ජීවන රටාව තුළින් ඔබ්බට ගොස් ගෘහ පාලනය, දරුවන් බිහිකිරීම හා හදාවඩා ගැනීම යන කාර්යයන්වලට අමතරව අධ්‍යාපනය ලැබීම, වෘත්තියේ නියැලීම ආදී පුරුෂයා සිදු කරන කෘත්‍යයන් කාන්තාව ද සිදු කරනු දැකිය හැකිය. ඒ අනුව සමාජයේ තුළ ආර්ථිකයේ මූලිකත්වය දරන පුරුෂයාට හා සමානව කාන්තාවද ආර්ථිකයට දායකත්වය සපයනු ලැබේ. නමුත් සමාජ විකාශනය සමඟ කාන්තාවගේ කාර්යභාරය විකාශනය වුවත්, එය සෑම සමාජයකම සංස්කෘතියකම කාන්තාවට හිමිවේද යන්න ද ගැටලුවකි. ඊට හේතුව වන්නේ කාලයත් සමඟ සමාජය විකාශනය වුවත් තවමත් පැරණි සමාජයේ පැවති සාරධර්ම, සංස්කෘතින්, මතවාද, චාරිත්‍ර වාරිත්‍ර, අදහස් හා සිතුම් පැතුම් නූතන සමාජ ක්‍රමය සමග මිශ්‍ර වී පැවතීම ය.

බොහෝ නූතන රාජ්‍යයන් විසින් ස්ත්‍රී-පුරුෂ සමාන අයිතිවාසිකම් නීත්‍යානුකූලව පිළිගනු ලැබ ඇතත් නීතිය ක්‍රියාත්මක කිරීමේදී පීතෘ මූලික සමාජ ඇගයීම්වලට අනුව සිදු කිරීම නිසා ප්‍රායෝගිකව ස්ත්‍රී අයිතීන් කඩ වීම දක්නට ලැබේ. රාජ්‍ය විසින්ද අසමාන නීති රීති හා ඒවා ක්‍රියාත්මක කිරීමට ආයතන ද නිර්මාණය කරමින් ස්ත්‍රී-පුරුෂ වෙනස පවත්වාගෙන යාමට ආධාර දෙනු ලැබේ. බොහෝ රටවල ගෘහ මූලිකයා ලෙස රාජ්‍ය සලකන්නේ පවුලේ වැඩිමහල් පුරුෂයාය. පවුලේ දේපල, විවාහය, දික්කසාදය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැනි දෑ සම්බන්ධ නීතිරීති ද පුරුෂයන්ට වාසි වන අයුරින් නිර්මාණය කර තිබේ. ඒ අනුව සමාජය තුළ පුරුෂයාට යටත්ව සිටීමට, පුරුෂයා තරම් බලවත් නොමැති තත්ත්වයක් කාන්තාවට ආරෝපණය කර ඇත. උදාහරණ වශයෙන් ගත් විට ස්ත්‍රී දූෂණය සම්බන්ධ අපරාධයක් ගත්විට එයින් කාන්තාව වින්දිතභාවයට පත් වුවත් ඊට නීතිමය පිළිසරණ වෙත ගිය විට ඒ හමුවේ ද ඇය වරින් වර මානසිකව වින්දිතභාවයට ලක්වේ. පොලිසිය, අධිකරණය හමුවේ සිදුවීම් අවිධිමත් ලෙස විභාග කිරීම මීට හේතුව ය. පුරුෂාධිපත්‍ය ප්‍රබල බැවින් නීතිමය සහාය ලබා ගැනීමට ගිය විට වරදකරුවන්ට නිසි දඬුවම් නොලැබීම සිදුවේ. කාන්තාවන් නීතිය හමුවේ වරදකරුවෙකු වුවහොත් ඇයට සමාජයේ විශාල ගැරහුම්වලට ලක්වීමට සිදු වුවත්, පුරුෂයාට එසේ මුහුණදීමට සිදුවන්නේ නැත. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත කාන්තාවට සමාජය තුළ හිමි වී ඇත්තේ පුරුෂයාට යටත්ව සිටිය යුතුය යන තැන ය.

එමෙන්ම කාන්තාවට හිමි වී ඇති භූමිකාව කතා කිරීමේදී ප්‍රධාන භූමිකාවක් ලෙස වින්දිතභාවය පෙන්වා දිය හැකිය. වින්දිතභාවය යනු "යම්කිසි හේතුවක් මුල් කරගෙන කායික, මානසික, සමාජීය, ආර්ථික ආදි වශයෙන් හිංසාවට, පීඩනයට පත් වීම" ය. ඒ අනුව කාන්තාවන් මේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මුල්කරගෙන සමාජය තුළ නොයෙක් ආකාරයෙන් හිංසාවට,පීඩනයට ලක් වන බැවින් වින්දිතයකු භූමිකාව හිමි වේ. සම්පත් බෙදී යාමේ විෂමතාවය මත පුරුෂයා විසින් ආර්ථිකය මුල් කොට ධනපති පංතිය ද, කාන්තාව විසින් නිර්ධන පංතිය ද නියෝජනය කරනු ලබන බව කාල් මාක්ස් විසින් විග්‍රහ කරනු ලැබ ඇත.

**න්‍යායාත්මක විග්‍රහය**

ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ පවතින න්‍යායන් මගින් ද කාන්තාවට හිමි භූමිකාව තේරුම් ගැනීමට හැක. ඒ අනුව කෘත්‍යාත්මක න්‍යායට අනුව,

සමාජය තුළ ලැබෙන තත්ත්වය හා කාර්යභාරය මත ස්ත්‍රී හා පුරුෂ ලෙස බෙදෙන බවත් ගැහැනු දරුවකුට මවගේ කාර්යයන්ද, පිරිමි දරුවන්ට පියාගේ කාර්යයන්ද කුඩා කල සිට ඉගැන්වීම හරහා විශේෂ කෘතයන්ට හුරු වන බවත් මෙම න්‍යායෙන් පෙන්වා දී ඇත. ටැල්කොට් පාසන් විසින් පෙන්වා දෙනු ලබන ආකාරයට පුරුෂයා විසින් මූල්‍යමය කටයුතු ප්‍රධාන කොටගත් උපයෝගී කාර්යභාරයක් ද, කාන්තාව භාවාත්මක කාර්යභාරයක් ඉටු කරන බවත් පෙන්වා දෙමින් ස්ත්‍රීයට අඩු සමාජ තත්ත්වයක් පවතින බව පෙන්වා දෙනු ලැබ ඇත.

**සවිටනවාදී න්‍යාය**

කාන්තාව නිවස තුළම කොටු වන බව ද පුරුෂයාට මුල්‍යමය කටයුතු හරහා නිවසෙන් බැහැරව නිදහස් භූමිකාවක් හිමි වන බවද, මෙම න්‍යායෙන් පෙන්වා දී ඇත. කාල් මාක්ස්ට අනුව සම්පත් බෙදී යාමේ විෂමතාව මත පුරුෂයා ධනපති පන්තියක් කාන්තාව නිර්ධන පන්තියක් නියෝජනය කරන බව පෙන්වා දී ඇත. ඒ හරහා ධනපති පන්තිය සැම විටම නිර්ධන පන්තිය යටත් කරගන්නා පරිදිම පුරුෂාධිපත්‍යය යටතේ පවුල තුළ පුරුෂයා විසින් කාන්තාව යටත් කර ගනු ලැබ ඇත .

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ පවතින ගැටලු**

- පාලන පද්ධතින්හි අවම නියෝජනයක් ඇති රජයේ හෝ පෞද්ගලික ආයතනයන්හි පිරිමින්ට වඩා අඩුවෙන් උසස් නිලතල කාන්තාවන්ට හිමි වීම.
- පිරිමි නිදහස් සොයා යන අතර ගැහැනිය සම්බන්ධතා රැකගනිමින් නිවස තුළම සිටීම.
- කාන්තාව හා පුරුෂයා අතර පුරුෂයාට වැඩි අගයක් පවරා තිබීම.
- කාන්තාවට අඩු සමාජ තත්ත්වයක් හා පුරුෂයාට වැඩි සමාජ තත්ත්වයක් ආරෝපණය කර තිබීම.
- කාන්තාව නිවසටම සීමා වීම.
- සංස්කෘතිය තුළින් පුරුෂයාට ප්‍රචණ්ඩකාරී ගතිලක්ෂණ ආරෝපණය කර ඇති අතර කාන්තාවට කාරුණික තැන්පත් ගති ලක්ෂණ ආරෝපණය කර තිබීම.
- කාන්තා නිදහස් සීමා වීම ඇතැම් විට ඇයට පීඩාකාරී වීම

කාන්තාවක් යනු කුඩා කල දියණියකගේ භූමිකාව ද, තරුණ වියට පත්ව විවාහ වී බිරිඳගේ භූමිකාවත්, මවකගේ භූමිකාවත් ආදි ලෙස ජීවිත කාලය පුරා කාන්තාවක වශයෙන් විවිධ භූමිකාවන් යටතේ විශාල කාර්ය කාර්යභාරයක් ඉටු කරන්නා වූ කෙනෙකි. ඒ අනුව මෙම ස්ත්‍රී සමාජභාවය සංකල්ප යටතේ එකී කාර්යභාරය සීමා කරමින් ඇයව පීඩනයට ලක් කර ඇත. පවුල් තුළම දරුවන් හදා වඩා ගැනීම, නිවසේ වැඩ කටයුතු සියල්ලම සිදු කිරීම් කාන්තාවන්ගේ අතින්ම කළ යුතුය යන මතය සමාජය තුළ ස්ථාපනය කර තිබෙන නිසා ඇතැම් අවස්ථාවල කාන්තාව නිවස තුළ තම කාර්යභාරය ඉටු කරන්නේ ඉතාමත් පීඩාකාරී ලෙස නිරන්තරයෙන් ම ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පවා පත් වේ. දවස පුරාම කාර්යයන්වල නියැලීම නිසා ඈ අවිවේකී වූ ජීවිතයක් ගත කරනු ලැබේ. වර්තමානය වන විට ගැමි සමාජය පැවති කාන්තාවගේ ඒකාකාරී බව තුරන් ව ඇය සමාජගත වී පිරිමින් සමඟ ගැටෙමින් ජීවත් වේ. එහිදී ඇයට නිවස තුළට ම කොටු වී ජීවත් වීම වෙනුවට සමාජය හා ගැටීමට අවස්ථාවල ලැබුණ ද මෙමගින් සිදු වී ඇත්තේ ඇගේ පවතින්නා වූ කාර්යභාරයන් තවදුරටත් වැඩි වීම පමණි.

කාන්තාව උදෑසන අවදිවීමේ සිට රාත්‍රියේ නින්දට යාම දක්වා ඇයට විශාල කාර්යභාරයන් ප්‍රමාණයක් ඇති අතර ඊට අමතරව ද රැකියාවක නියැලීමේ දී ඇය නිවසේ කටයුතු රැකියාවේ කටයුතු යන දෙයාකාරයම ඉටු කිරීමට සිදු වෙයි. නමුත් පුරුෂයා ආර්ථිකය නගා සිටු සිටුවීමට නිවසින් බැහැරව රැකියාවක යෙදුණත් ඔහු එම කාර්යයට පමණක් මූලිකත්වය සපයයි. නමුත් කාන්තාවට රැකියාවට අමතරව දරුවාගේ කාර්යභාරය, නිවසේ කාර්යභාරය, තම ස්වාමි පුරුෂයාගේ කාර්යභාරය යනාදි කාර්යභාරයන් රැසක් ඇයට ලැබී ඇත. ඒ අනුව ඇය දවස පුරාම වැඩ කරන යන්ත්‍රයක් මෙන් හඳුන්වා දිය හැකිය. සෑම තැනකදීම නායකත්වයට පත්වන්නේ පුරුෂයාය. නමුත් වර්තමානය වන විට කාන්තාව ද පුරුෂයා මෙන් ම ඇතැම් අවස්ථාවල නායකත්වයට පත් වන අවස්ථා ඇත. නමුත් සමාජ සංස්ථා සැලකීමේදී උසස් නිලතලවලට එමෙන්ම නායකත්වයට පත්වීම පිරිමින්ට වඩා කාන්තාවන්ට හිමි වන්නේ අඩුවෙන් ය. කෙසේ නමුත් කාන්තාවක් යම් උසස් නිල තලයකට පත්වුවත්, නායකත්වයක් දැරුවත්, පුරුෂයා තුළ ඊට ඇත්තේ විරෝධතාවයකි.

**සමාජ සංස්ථා තුළ කාන්තාවට හිමි තැන**

සමාජය වූ කලී නිර්මාණය වී ඇත්තේ සමාජ සංස්ථාවල ඒකරාශී වීමෙනී. එනම් පවුල් සංස්ථා, අධ්‍යාපන සංස්ථා, ආර්ථික සංස්ථා, දේශපාලනය සංස්ථා, හා ආගමික සංස්ථා යන සංස්ථා පහ එක්වීමෙනි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ කාන්තාවන්ට හිමි ස්ථානය පිළිබඳ කතා කිරීමේදී මෙම සමාජ සංස්ථා ප්‍රධාන තැනක් ගනී. සමාජ සංස්ථාව ඔස්සේ කාන්තාවට ඒ තුළ හිමි භූමිකාව හඳුනාගැනීමෙන් සමස්ත සමාජය නියෝජනය කරමින් කාන්තාවට හිමි තැන හඳුනා ගැනීම ඉතාමත් පහසු කාර්යයකි.

සමාජ සංස්ථා අතර ප්‍රධාන ස්ථානය හිමිවන්නේ පවුල් සංස්ථාවටයි. පුද්ගලයාට සමාජානුයෝජනය වීම සඳහා මූලික අඩිතාලම ලබාදෙන්නේ මෙකී පවුල් සංස්ථාව හරහා නිසා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් පවුල පිළිබඳව අවධානය යොමු කිරීම ඉතාම වැදගත් වේ.

පවුල තුළ ප්‍රධානතම කාර්යභාරය ඉටු කරන්නේ කාන්තාව ය. පුරුෂයා විසින් ආර්ථිකය මෙහෙයවන විට නිවසේ ආහාරපාන පිළියෙල කිරීම, නිවස පිළිවෙළට තබා ගැනීම, දරුවන් වැදීම, දරුවන්ගේ වැඩ කටයුතු කිරීම, දරුවන් උස් මහත් කිරීම ඇතුළු කටයුතු රාශියක් සිදු කරන්නේ කාන්තාවගේ අතින් නිසා කාන්තාව පවුල් සංස්ථාව තුළ ඒකාකාරී ජීවන රටාවකට අනුගත වී ඇත. එහිදී නිවස තුළට ම ඇගේ ජීවිතය සීමා කොට ඇත. සමාජ විකාශනයත් සමග ඇය ආර්ථික කටයුතු, දේශපාලන කටයුතු ආදි කටයුතුවල පුරුෂයකු මෙන් කටයුතු කරමින් භූමිකාව දැරුවත් නිවසේ සමස්ත කාර්යභාරයක් ම ඉටු කළ යුතු වන්නේ කාන්තාවගේ අතින් ය. එම නිසා නිවසේ කාර්යයන් ඉටු කරන කාන්තාව තම ජීවිත කාලය පුරා දියණියක, බිරිඳක හා මවක ලෙස තම පවුල වෙනුවෙන් කැපවී ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව පවුල් සංස්ථාව තුළ නිවසටම ඒකාකාරී වූ ජීවන රටාවක් ඇයට හිමි වුවත් වර්තමානයේ බොහෝ සමාජයන් තුළ පවුල් සංස්ථාව

මෙහෙයවීමේ ප්‍රධාන භූමිකාව හොබ වන්නේ කාන්තාව ය. පුරුෂයා විසින් ආර්ථිකය පැත්තෙන් තම පවුලට සහය දැක්වුවත් ආර්ථික කටයුතු ඇතුළු පවුලේ සමස්ත පුළුල් කාර්යභාරයක් කාන්තාව ඉටු කරන නිසා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත මෙන්ම වත්මනයේ පවතින සමාජ රටාවත් සමඟ කාන්තාව පවුල් සංස්ථාවේ ප්‍රධානතම භූමිකාව හොබවන්නා ලෙස හඳුන්වා දීමට හැකිය.

අධ්‍යාපන සංස්ථාව සැලකීමේ දී කාන්තාවගේ භූමිකාව සමාජ ක්‍රමය අනුව විවිධත්වයක් ගනී. මුල් කාලීන සමාජය තුළ කාන්තාවට අධ්‍යාපනය ලැබීමට තිබූ අයිතිය මුළුමනින්ම නැති වී තිබුණි. එය පුරුෂයාට හිමි කාර්යභාරයක් පමණක් විය.

නිදසුන් ලෙස භාරතීය බ්‍රාහ්මණ සමාජයේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය අහිමි වී තිබුණේ පහත් කුලවලට ය. එලෙසම කාන්තාවට ද අධ්‍යාපන ලැබීමට මෙන්ම ශ්ලෝක ගායනා කිරීම ඇසීම පවා තහනම් විය. ඒ අනුව එම සමාජය තුළ කාන්තාව අධ්‍යාපනය හමුවේ ඉතාමත් පහත් කුලවල තත්ත්වයට ඇද දමා තිබුණි. කෙසේ නමුත් වර්තමානය වන විට පුරුෂයා හා සමානවත්, ඇතැම් අවස්ථාවක පුරුෂයා අභිභවා යමින් අධ්‍යාපනය තුළ කාන්තාව ප්‍රමුඛත්වයට පත් වී ඇත. එනමුත් පාසල වැනි අධ්‍යාපනය ලබාදෙන ආයතනවල දී ඉහළ තනතුරු ප්‍රදානයේ දී තවමත් වැඩි අවස්ථා හිමිවන්නේ පුරුෂ පාර්ශ්වයට ය. ඒ අනුව ස්ත්‍රී සමාජභාවය මුල්කොටගත් සමාජය තුළ කාන්තාවට අධ්‍යාපන සංස්ථාවේ යම් දියුණුවක් තිබුණද, එය මුළුමනින්ම තවදුරටත් හිමිකරගෙන ඇත්තේ පුරුෂ පාර්ශ්වය යි. එය ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙන් ලද ආභාසයෙහි ප්‍රතිඵලයක් ලෙස දැක්වීමට හැකිය.

ආගමික සංස්ථාව තුළින් කාන්තාව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ අගතියට පත්වන ආකාරය ප්‍රධාන ලෙස හඳුනාගැනීමට හැකිය. ආගම විශාල ලෙස සමාජ ක්‍රියාකාරිත්වයට සහය දැක්වුව ද, බොහෝ ආගම් කාන්තාවන් කෙරෙහි තවමත් දක්වන්නේ අගතිගාමී ආකල්පයන්ය. ඇතැම් ආගම් මගින් කාන්තාවන්ට ලබා දී ඇත්තේ ශුද්‍ර වැනි පහත් කුලයක තත්ත්වයකි. කෙසේ නමුත් ආගම ඇදහීමේ අයිතිය පවා බොහෝ සමාජයන් තුළ කාන්තාවට හිමි වී නැත. බ්‍රාහ්මණ සමාජය තුළ ආගම ඇදහීමට තහනම් වීම, ඉස්ලාමීය කාන්තාවන්ට පල්ලිය තුළට ඒමට අවසර ඇත්තේ යම් සීමාවකට පමණක් වීම ආදි සමාජ තහංචි කාන්තාවට පනවා ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මුල්කරගෙන ලොව විවිධ ආගම් මගින් දක්වා ඇති ප්‍රතිචාර හඳුනාගැනීමෙන් කාන්තාවට හිමි භූමිකාව පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය.

- ඉන්දියානු හින්දු වැසියන් අතර පවතින සති පූජාව නම් චාරිත්‍රය ගත්විට තව ස්වාමිපුරුෂයාගෙන් තොර ලෝකයක් පිළිබඳව සිතීමට පවා කාන්තාවට නොහැකි බව මෙමගින් පෙන්වා දෙයි.
- චීන ජාතිකයන් කාන්තාවෝ සමාන කර ඇත්තේ සියල්ලටම විපත ගෙන දෙන ජලයට ය.
- තම කෙස් වැටියේ සඟවාගෙන දන්ත ධාතුව ලංකාවට වැඩම කරවූයේ හේමමාලා කුමරිය වුවද උන්වහන්සේ වැඩ සිටින මාළිගය අසල ඇති පත්තිරිප්පුවට ගොඩ වීම කාන්තාවන්ට අකැප ය

- දළදා පෙරහැරට හා දළදා මාළිගාවේ තේවාවන් සඳහා කිසිම විටෙක කාන්තාවන් සහභාගී කර නොගනී.
- ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ උඩමළුවට නැගීමේ අයිතිය පවා කාන්තාවට පොදුවේ අහිමි කර ඇත.
- ඉස්ලාම් ආගම තුළ කාන්තාවන්ගේ විවාහය තම පියාට හා වැඩිමහල් සොහොයුරාට අවශ්‍ය පරිදි තීන්දු කිරීම සිදුවේ.

මෙලෙස සමාජය තුළ කාන්තාවට සම තැන අහිමි වීමට හේතු වන්නේ හුදෙක් ආගමික වස්තූන්ගෙන් කාන්තාව ඈත් කර තැබීමක් නොව සමාජය තුළ ස්ත්‍රී-පුරුෂ සමාජ විෂමතාව මත සමානාත්මතාව ස්ත්‍රීයට නොලැබීමේ ප්‍රතිඵලයක් නිසා ය. මානව සමාජයේ ආරම්භයේ දී ආර්ථිකය මුළුමනින් ම මෙහෙය වන ලද්දේ පුරුෂාධිපත්‍යය යටතේ ය. පුරුෂයා මුළුමනින් ම නිවසින් බැහැරව ආර්ථිකය මෙහෙයවීමෙන් මූල්‍යමය කටයුතු සිදු කළ අතර එමනිසා ඔහු සම්පත් බෙදී යාමේ විෂමතාවය මත ධනපති පන්තිය ලෙස ද හඳුන්වන ලදි. කෙසේ වුවත් වත්මන් සමාජයේදී කාන්තාව ආර්ථික සංස්ථාව තුළ ප්‍රධාන තැනක් හිමි කරගෙන ඇත. කාන්තාවන් විටෙක ලිංගික භාණ්ඩයක් ලෙස ද, ලිංගිකත්වය අලෙවි කරමින් මෙන්ම ශ්‍රමය සපයමින් ද ආර්ථිකය නගා සිටුවීමට දායක වේ. කෙසේ නමුත් රැකියා ක්ෂේත්‍රය තුළ උසස් නිලතල කාන්තාව හිමිකරගෙන තිබුණත් පුරුෂයාට සාපේක්ෂව ඉහළ නිලතල ලැබීමෙන් ප්‍රවණතාව අඩුය. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ පුරුෂයා අභිභවා යාමට කාන්තාවට අවස්ථාවක් ලබා දී නැති බව පෙනේ.

ශ්‍රී ලංකාව තුළ ඇඟලුම් කර්මාන්තයේ නියැලීම, මැද පෙරදිග රටවලට ගෘහ සේවයට යාම ඇතුළු නොයෙකුත් ක්‍රම මගින් කාන්තාව ආර්ථිකය ඉහළ නැංවීමට දායක වීම වත්මනේ ප්‍රවණතාවකි, ඒ අනුව කාන්තාව ආර්ථිකමය වශයෙන් ශ්‍රම බලකාය නියෝජනය කරනු ඇත. බොහෝ සමාජ තුළ කාන්තාව ලිංගික භාණ්ඩයක් ලෙස ලේබල්කරණයට ලක් කර ඇත. ජපානය, ඇමෙරිකාව වැනි රටවල ගණිකා වෘත්තිය සමාජ සම්මත නීතිය පිළිගත් රැකියාවක් ලෙස අනුමත කර ඇත. වත්මන් සමාජය පමණක් නොව ඈත අතීතයේ සිට අධිරාජ්‍ය පාලන සමයේ පවා ගණිකාවන්, නාට්‍ය අංගනාවන් ආදි ලෙස කාන්තාවන්ට විවිධ නිල නාම ලබා දෙමින් ලිංගික භාණ්ඩයක් ලෙස ආර්ථිකය නගා සිටුවීම්ටත් විනෝදාස්වාදය ලබා ගැනීමටත් පුරුෂයා භාවිත කර ඇත.

දේශපාලන සංස්ථාව සැලකීමේ දී කාන්තාව හා දේශපාලනය අතර ඇත්තේ දූරස්ථභාවයකි. මෙය නූතන සමාජය තුළ පමණක් නොව අතීතයේ සිටම පැවත එන තත්ත්වයකි. සමාජය තුළ පවතින්නාවූ විවිධ මතභේද, ආකල්ප මගින් කාන්තාවට දේශපාලනය තුළ ආධිපත්‍යය පිහිටුවා ගැනීම ඉතාමත් අසීරු කාරණාවක් වී ඇත. බොහෝ පුද්ගලයන් පවසන්නේ කාන්තාවගේ ප්‍රධාන භූමිකාව මවක හා බිරිඳක ලෙස කටයුතු කරන බැවින් ඇය දේශපාලනයට උචිත නොවන බවය. දේශපාලන රැස්වීම් පමණක් නොව සමාජීය හා දේශපාලනික ව සවිබල ගැන්විය හැකි කිසිදු අවස්ථාවකට සහභාගි වීමට කාන්තාවට ඇති අවස්ථා පවා

අහිමි වීම සෑම සමාජ ස්තරයක ම අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙන්නකි. ලංකාවට සර්වජන ඡන්ද බලය හඳුන්වාදීමේදී ස්ත්‍රී-පුරුෂපසියලු දෙනාටම සමානවම අයිතිය ද ඊට අනුබද්ධිතව සමාන දේශපාලනික බලය ද ලබා දුන් නමුත් ලබා දුන් බලය හා සමාජය විසින් ලබාගෙන පවත්වාගෙන යන බලය අතර පැහැදිලි වෙනසක් තිබේ.

ස්ත්‍රී-පුරුෂ සමාජ සමාජභාවී අනන්‍යතාව මත පදනම් නොවුණු සම දේශපාලනික බලයක් සර්වජන ඡන්ද අයිතියෙන් අදහස් වුවද සමහර කාන්තාවන්ගේ ඡන්ද අයිතිය ඇගේ පවුලේ හෝ ස්වාමි පුරුෂයාගේ මතයෙන් බලපෑමට ලක්වී තිබේ. කාන්තාවන් වශයෙන් ස්වාමියාගේ ස්වාධීන දේශපාලන මතයක් දැරීම, සිය ස්වාමියාට කීකරු නොවීම හා යහපත් බිරිදක් හා ගෘහණියක් නොවීම ලෙස සලකන කාන්තාවන් සමාජය තුළ බහුලව හමුවී ඇත. දේශපාලනයට සම්බන්ධ වූ බොහෝ කාන්තාවෝ සිය පියාගේ, සහෝදරයාගේ හෝ ස්වාමියාගේ අභාවය නිසා හෝ ඔවුන්ගේ මග පෙන්වීම යටතේ දේශපාලනයට පැමිණියෝ වෙති. මෙවැනි පිරිමි දේශපාලන ශක්තියකින් තොරව දේශපාලනට පිවිසීම කාන්තාවන්ට ඉතා දුෂ්කර කාර්යයකි. එසේ දේශපාලන පවුල් පසුබිමකින් තොරව දේශපාලනයට පැමිණීමට උත්සාහ කරන කාන්තාවන්ට සිය ලිංගිකත්වය හා සමාජභාවී අනන්‍යතාව මත පදනම් වී ශාරීරිකවත්, මානසිකවත් විවිධ අඩන්තේට්ටම්වලට ගොදුරු වීමට සිදුවේ.

මෙමගින් තහවුරු වන්නේ අනෙක් සමාජ සංස්ථාවලට සාපේක්ෂව දේශපාලන සංස්ථාව තුළ කාන්තාවගේ භූමිකාව ඉතාමත් අල්ප වන බවය. දේශපාලනය මෙහෙයවීමට ඇයට ඇති හැකියාව පුරුෂ බලවේග ඔස්සේ ඉඩ නොලැබෙන බවය. කෙසේ නමුත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ සමාජයේ කාන්තාවන් හා පුරුෂයන් යන දෙපාර්ශවයම විසින්ම පොදුවේ දේශපාලනයට පිවිසෙන කාන්තාවන්ට එල්ල කරන විවේචන මගින් දේශපාලනික වශයෙන් කාන්තාවට මැදිහත්වීමට ඇති අයිතිය අහුරනු ලැබේ.

කෙසේ නමුත් පොදුවේ ගත් විට අතීත සමාජය හා නූතන සමාජය යන කාල දෙක තුළම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මුල් කරගෙන  යම් යම් වෙනස්කම් ඇති වුවත් කාන්තාවට සමාජය තුළ ස්වාධීනව නැගී සිටීමට ඉඩ ප්‍රස්තාව ලබා දී නොමැත. කාන්තාවට තවමත් හිමි වන්නේ පුරුෂයාට වඩා පහත් අඩු භූමිකාවක් ය. ඇය සමස්ත මිනිස් ප්‍රජාවටම උපත ලබා දෙන උතුම් මාතෘ පදවිය දැරුවත් ඇතැම් අවස්ථාවල ඇය යම් විටෙක දී විනෝදාස්වාදය සඳහා යොදා ගන්නා භාණ්ඩයක් ලෙසත්, දැන්වීම්කරණයට, අලෙවිකරණයට යනාදි දේවල් සඳහා යොදා ගන්නා වෙළෙඳ භාණ්ඩයක් ලෙස පත් කොට ඇත.

කාන්තාව ප්‍රචාරණයට යොදා ගැනීම තුළින් ඒ කාන්තාවගේ සමාජීය ප්‍රතිරූපය ගොඩනැංවීමට උත්සාහ දරයි. කාන්තාව වෙළෙඳ දැන්වීම් තුළ මවක්, බිරිඳක්, සහෝදරියක්, පෙම්වතියක් යනාදි භූමිකා රඟ දක්වයි. ඇතැම් අවස්ථාවල දී අඩ නිරුවත් කාන්තාවන්ගෙන් යුක්ත දැන්වීම් ප්‍රචාරය මගින් පාඨකයන්ට ලැබෙන්නේ

ලිංගික තෘප්තිය මිස වෙන කුමක් ද? මේ හා සමාජය විසින් අවබෝධ කරගන්නේ කාන්තාව ලද බොළඳ, මටසිළුටු ලිංගිකත්වය මුල් කරගෙන බිහි වූ තැනැත්තියක බවය. ඒ අනුව තරගකාරී වෙළෙඳපොළ තුළ ලාභය පසුපස හඹා යෑමේ තරඟයෙන් ජය ගැනීමට ස්ත්‍රීය වෙළෙඳ භාණ්ඩයක් ලෙස පාවිච්චි කිරීම සිදුවන්නකි. ස්ත්‍රිය පිළිබඳ ආකල්ප ඉතා පහත් මට්ටම දැමීමට මෙන්ම කාන්තාවගේ භූමිකාව සමාජය තුළ හෑල්ලුවට ලක් කිරීමට මෙය හේතු වේ.

**සමාලෝචනය**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු සමාජය තුළ සමාජයේ විකාශනයට ද සමාජයේ සංයුතියට ද බලපාන්නා වූ සංකල්පය බව මින් පෙන්වා දීමට හැකිය. පුරුෂයන් ශාරීරිකව හා මානසිකව ශක්තිමත්, එඩිතර, ඉක්මන් තීරණ ගත හැකි නායකත්වයක් සහිත බුද්ධිමත් කොටසක් වන අතර ස්ත්‍රීය සුන්දර, ළාමක, පුරුෂයා මත යැපෙන, කාරුණික, ඉක්මනින් සසල වන සිතක් ඇති තැනැත්තියක ලෙස සමාජය වර්ගීකරණය ලක් කර ඇති අතර මෙකී වර්ගීකරණය  මුල්කොටගෙන ඔවුන්ට වෙන්වූ භූමිකාවන් සමාජය විසින් ආරෝපණ කරන ලැබ ඇත. සංස්කෘතිය, ආගම්, විශ්වාස ඇදහිලි හා සිරිත් විරිත් මගින් කාන්තාවට හා පුරුෂයාට මෙකී විෂමතාවය මත තත්ත්වය හා කාර්යයභාරයක් ස්ථාපිත කර තිබෙනු ඇත. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ  සමාජභාවය යනු "පිරිමිකමට හා ගැහැනුකම වෙනසට අදාළ වන්නා වූ ලක්ෂණ පරාසයක්" ලෙස සරලව අර්ථ කථනය කිරීමට හැකි ය.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ කාන්තාවන්ගේ භූමිකාව ගත් විට සමස්ත සමාජය තුළ පුරුෂයා හා සම තත්ත්වයක් කාන්තාවට ඈත අතීතයේ සිට නූතන සමාජය දක්වා ලැබී නැත. එමෙන්ම ඇයට කිසි විටෙකත් ඔහු ඉක්මවා යාමට ද සමාජය විසින් ඉඩ සලසා නැත. මෙය පුරුෂයා විසින්ම සිදු කරන්නක් නොවේ. කුඩා කාලයේ සිට ගැහැනු දරුවා පිරිමි දරුවා වශයෙන් වෙන් වෙන් වශයෙන් තමාට හිමි භූමිකාව හඳුනා ගනිමින් සමාජානුයෝජනය වීමේ ප්‍රතිඵලයක් ලෙස කාන්තාවන් පුරුෂ යන දෙපාර්ශ්වය ම විසින් ස්ත්‍රියට හා පුරුෂයාට වෙන් වූ කාර්යභාරයක්, භූමිකාවක් ඇති බව තේරුම් ගෙන සමාජය තුළ හැසිරීම දක්නට ලැබේ. පවුල් සංස්ථාව, ආර්ථික සංස්ථාව, අධ්‍යාපනික සංස්ථාව, ආගමික සංස්ථාව හා දේශපාලන සංස්ථාව  සමස්ත සමාජයම නියෝජනය කරන මෙකී ඒකක හරහා සමාජය තුළ කාන්තාව දරන භූමිකාව හඳුනා ගැනීමට හැකිය. කෙසේ වුවත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත කාන්තාවක් මුල් කාලීන සමාජය තුළ සිට කායික, මානසික, සමාජීය, ආර්ථිකමය, නෛතික වශයෙන් නොයෙක් අංශ ඔස්සේ හිංසාවට පීඩාවට පත්වූ අවස්ථා බහුලය.

වර්තමානයේ කාන්තාව ආර්ථික හා සමාජ තත්ත්වය දියුණු වීම වැනි කාරණා තුළදී ඇයට ආර්ථික සූරා කෑම, ලිංගික අපයෝජනය හා දේශපාලනික බැහැර කිරීම්, නීතිමය වෙනස්කම්වලට මෙන්ම ගෘහය තුළ ද යම් යම් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුව ඇත. අදටත් සෝමාලියාව, ඊජිප්තුව වැනි

රටවල්වල ගෝත්‍ර අතර පවතින චාරිත්‍ර වාරිත්‍ර මෙන්ම ආගම් අතර පවතින විවිධ දර්ශනයන්ද, ඉන්දියානු සමාජයේ පවතින්නාවූ සමාජ ක්‍රමය තුළ ද තිබෙන්නා වූ විවිධ හේතු කොටගෙන කාන්තාව සමාජය තුළ තවමත් හිංසනයට පත් කරන බව නිදර්ශන ලෙස පෙන්වා දීමට හැකි වේ. ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන වැඩි පිරිසක් කාන්තාවන් වුවද, ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2016 වාර්තාවකට අනුව කාන්තාවන් අතර රැකියා නියුක්ති අනුපාතය 36.5%ක් වේ. කාන්තාවන් අධ්‍යාපනයෙන් පසු විවාහයක් සිදු කර ගැනීමෙන් අනතුරුව මවක ලෙස වගකීම් ඉටු කිරීම උදෙසා නිවසේ නතර වීම මෙයට එක් හේතුවකි. ඒ අනුව පෙනී යන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මගින් කාන්තාවට හිමි තත්ත්වය හා කාර්යභාරය මත ඇයට සමාජය හා ගැටෙමින් පුරුෂයා මෙන් ක්‍රියා කිරීමට තිබෙන අවස්ථාව වැළැක්වෙන බවත් ඇය නිවස තුළම පීඩාවට පත් වී ඒකාකාරී ජීවන රටාවක් ගත කරන බව ය.

මේ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ කාන්තාවට හිමි භූමිකාව පිළිබඳව අවධානය යොමු කිරීමෙන් ඇය වින්දිතයෙකුගේ භූමිකාව හොබවන බව අවිවාදයෙන්ම පෙන්වා දීමට හැකි වේ. ඒ අනුව ඇය තමන්ගේ ජීවිත කාලය පුරාම පුරුෂාධිපත්‍යයට යටත් ව සිටිමින් මෙලෙස වින්දිතභාවයට පත්වේ. නීතිය, සමාජය, සංස්කෘතිය, ආර්ථිකය, දේශපාලන යනාදී සෑම අංශයක් හරහා ම මෙය දැකිය හැකිය. පුරුෂයාට වඩා පහත් තැනක් මානව සමාජයේ ආරම්භයේ සිටම කාන්තාවට හිමිවී ඇති අතර නූතනය වන විට සමාජය කාලීන වශයෙන් විකාශය වී කාන්තාවට හිමි තත්ත්වය මුළුමනින්ම ඉවත් වී නොමැත. සෑම විටම කාන්තාව පුරුෂයා යටතේ තාඩන පීඩන, සමාජ අසාධාරණයන්ට ලක් වනු ලැබේ. පවුල තුළ දාසියක ලෙස කටයුතු කරමින් ප්‍රධාන භූමිකාවක් හොබවන ඇය රැකියා ස්ථානයේදී පවා පත්වන්නේ වින්දිතභාවයට ය. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත ඇය වින්දිතභාවයට පත්වීම ඔප්පු වේ. යම් අපරාධයක් නිසා වින්දිතභාවය පත් වූ කාන්තාව ඊට යුක්තිය ඉෂ්ඨ කර ගැනීමට අපරාධ යුක්ති ක්‍රමය පිළිසරණ පැතීමේදී පවා ඇය ඒ හරහා වරින් වර වින්දිතභාවයට පත්වේ. මීට හේතු වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හරහා ආරෝපණය කර ඇති භූමිකාව ය. මේ අනුව මානව සමාජයේ ආරම්භයේ සිට පැවත එන මෙම ප්‍රබල සංකල්පය සමාජය තුළ තවදුරටත් පවතින බව හඳුනාගැනීමට හැකිවේ.

සමාජ විකාශනය මත කාන්තාවගේ කාර්යභාරයන් වෙනස් වුවත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන සංකල්පය හරහා කාන්තාවට හිමි වන වින්දිත භූමිකාව කිසිසේත්ම වෙනසකට ලක් නොවී ඇති බව ඉහත විස්තරයෙන් හඳුනාගැනීමට හැකිය. ඒ අනුව කාන්තාව යනු ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හරහා සෑම විටම වින්දිතභාවයට පත් වන තැනැත්තියක් ලෙස පෙන්වාදිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ඇන්ටිගනී කණ්ඩායම (2013). කාන්තාවන්ට එරෙහි ව ඇති දුර්මත හා ලේබල් අහෝසි කරමු. Samahima, [online], 10 Nov, available : https://.www.samahima.com [13 Oct 2021]

ජයසිංහ, ඒ. කේ. ජී. ස්ත්‍රීපුරුෂ සමාජභාවය, කඩුල්ල ප්‍රකාශන, කඩවත.

පෙරේරා, එම්. සී. එස්. (2014). සමාජ ප්‍රශ්න, කොළඹ 10, එස්. ඇන්ඩ් එස්. ප්‍රින්ටර්ස්.

ලියනගේ, කේ සහ වළාකුළුගේ, එස්. (2006). ස්ත්‍රිපුරුෂ සමාජභාවය හා ස්ත්‍රීත්වය, කොළඹ 4, ෆෙඩ්රික් ඊබට් පදනම.

හේරත්, කේ. (2018). කාන්තා දේශපාලනය කාන්තා ගැටලුවලට පිළිතුරු සෙවීම සඳහා පමණක් ද?. බී.බී.සී සිංහල සේවය, [online],29 January, available: https://www.bbc.com/sinhala/sri-lanka [accessed 12 Oct. 2021].

# පිතෘ මූලික සමාජ ක්‍රමය තුළ ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ මානව හිමිකම් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

**ඒ.එම්.එස්.එන්. අබේකෝන්**

**හැඳින්වීම**

පිතෘ මූලිකත්වය යන්න සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී, එම සංකල්පය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව ඉදිරිපත් ව ඇති සංකල්පයක් ලෙසින් පෙන්වාදිය හැකිය. ඒ අනුව, මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු කුමක්ද? යන්න සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වැදගත් වනු ඇත. එහිදී ස්ත්‍රී-පුරුෂ ලෙසින් පවතින ලිංග භේදය, ස්ත්‍රීත්වය හා පුරුෂත්වය මෙන්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පද බැලූ බැල්මට එක සමාන අරුත් ඇති පද ලෙස පෙනී ගියද, ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය හෙවත් 'Sex' යන පදය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හෙවත් Gender යන පදය අතර සුවිශාල වෙනසක් පවතින බව සඳහන් කළ යුතුය. එහිලා ලිංගභේදය ජීව විද්‍යාත්මක සාධක මත පදනම්ව උපතේදීම යමෙකුට උරුම වන තත්ත්වයක් බව පෙන්වාදිය හැකිය. මෙකී ජීව විද්‍යාත්මක සාධක මත ඇති වන ලිංග භේදය නොවෙනස්ව පවතින්නකි. නමුත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන්න උපතේදී ම හිමි වන තත්ත්වයක් නොවේ. එනම්, මෙකී සංකල්පය මානව හැසිරීම් පදනම් කර ගනිමින් ඉදිරිපත් කරන ලද්දකි. මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හෙවත් Gender යන පදය මුල් වරට භාවිත කර ඇත්තේ, මනෝ වෛද්‍ය විද්‍යාව විෂයය තුළය. එහිලා රොබට් ස්ටොලර් (Robert Stoller) නමැත්තා විසින් වර්ෂ 1968 දී කළ මනෝ විශ්ලේෂණය පිළිබඳව අධ්‍යයනයක් ඇසුරින් Gender යන පදය, ස්ත්‍රී-පුරුෂ භේදය නොසලකා මානව හැසිරීම් හා හැඟීම් විවරණය කිරීමට භාවිත කර ඇත. නමුත් මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන පදය පුළුල්ව හා නිවැරදි අර්ථයෙන් භාවිත කිරීම, 1970-1980 දශකයේ දී ස්ත්‍රීවාදය ආරම්භ වීමෙන් අනතුරුව සිදු වී ඇති බව පෙනේ.

ජීව විද්‍යාත්මකව ස්ත්‍රියට හා පුරුෂයා හට ලැබී ඇති ලිංගික වෙනස මත සමාජය විසින් දීර්ඝ කාලයක් මුළුල්ලේ වෙනස් වූ සමාජ තත්ත්වයන් මෙම දෙපිරිසටම ප්‍රදානය කර ඇති ආකාරයක් දක්නට ලැබේ. සාමාජීය හා සංස්කෘතිකමය වශයෙන් සිදු කළා වූ මෙකී බෙදීම් සමාජයේ සෑම ස්තරයකදී ම දැකගත හැකිය. ඒ යටතේ, සමාජය විසින් ස්ත්‍රියට හා පුරුෂයාට වෙන් වූ රැකියාවන්, අනන්‍යතා, හැසිරීම් රටා සහ භූමිකාවන් නිර්මාණය කර දී ඇත. උදාහරණයක් ලෙසින්, කාන්තාවන් උස්

හඬින් කථා කිරීම බොහෝ විට අනුමත නොකිරීම සහ පුරුෂයාට එකී තත්ත්වය අදාළ නොවීම පෙන්වාදිය හැකිය.

මෙපරිද්දෙන් ස්ත්‍රියට හා පුරුෂයාට පවරා දෙන ලද සමාජ තත්ත්වය සරලවම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ලෙසින් පෙන්වාදිය හැකිය. ඒ අනුව, මෙකී තත්ත්වය සමාජය විසින් නිර්මාණය කරන ලද්දක් බවත්, එය ලිංගිකත්වය මෙන් ස්වාභාවිකවම ලැබී ඇති තත්ත්වයක් නොවන බවත් පැහැදිලි වේ.

"සමාජය විසින් කාලාන්තරයක් තිස්සේ, විධිමත්ව නිර්මාණ කර දෙනු ලැබ ඇති සමාජ සබඳතාව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender) ලෙස සරලව හැඳින්විය හැකිය" (ලියනගේ සහ වළාකුළුගේ, 2006).

එහිලා මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ස්ථාපිත කිරීමට, ආගම, සංස්කෘතිය, විශ්වාස, ඇදහිලි හා සිරිත් විරිත් යම් වැදගත් කාර්යභාරයක් සිදු කරයි. මෙකී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන්න සමාජයෙන් සමාජයට, සංස්කෘතියෙන් සංස්කෘතියට වෙනස් වන තත්ත්වයක් බව එමගින් පැහැදිලි වේ. එහි ප්‍රතිඵලයක් ලෙසින් ජීව විද්‍යාත්මකව ලිංභේදයෙන් පමණක් වෙනස් වුවත්, ස්ත්‍රිය හා පුරුෂයා සමාජ මානව ජීවීන් ලෙසින් පිළිගැනීමට ලක්ව ඇති මුත්, ලොව සෑම සමාජයකම ස්ත්‍රීන් හා පුරුෂයින් අතර අසමානතාවක් හා අසමාන බල සම්බන්ධතාවයක් ගොඩ නගා ඇති ආකාරයක් විද්‍යාමාන වේ. එකී තත්ත්වය මානව සමාජය ඇරඹි ප්‍රාථමික යුගයන්හි දී පවා විද්‍යාමාන වූ තත්ත්වයකි. මෙකී අසමානතාව පවුල, පාසල, ආගමික ආයතන, රැකියා ස්ථාන යනාදි වූ සෑම සමාජ සංස්ථාවක් කෙරෙන්ම ප්‍රකට වේ. ඒ යටතේ, පවුල තුළ ස්ත්‍රියට හිමි වී ඇති ස්ථානය හා තත්ත්වය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේදී ද තහවුරු වන්නේ, අති බහුතරයක් පවුල්, පිතෘ මූලික හෙවත් පුරුෂයාගේ මූලිකත්වයෙන් කටයුතු කරන බවයි. ඒ යටතේ බොහෝ විට කාන්තාව පවුල තුළ අප්‍රධාන තත්ත්වයකට පත් වන අතර, ඉහත සඳහන් අසමානතාව සඳහා ද මෙම පිතෘ මූලිකත්වයෙන් ගොඩ නැගෙන්නා වූ පවුල හේතු සාධකයක් වනු ඇත. එහිලා පිතෘ මූලිකත්වය කුමක්ද යන්න සම්බන්ධයෙන් පහත පරිදි පුළුල්ව විමසා බැලිය හැකි වේ.

**පිතෘ මූලිකත්වය යන්න අර්ථ දැක්වීම**

පිතෘ මූලිකත්වය හෙවත් (Patriarchy) යන පදය, පවුල (Patria) සහ පාලනය (Archy) යන ග්‍රීක පදවලින් බිඳී ආවකි (ලියනගේ සහ වළාකුළුගේ, 2006: 30). එහි අර්ථය වන්නේ, විස්තෘත පවුලක (Extended Family) වැඩිමහල් පුරුෂයා විසින් එම පවුලේ වයසින් අඩු පිරිමින් සහ ස්ත්‍රීන්ව පාලනය කරනු ලැබීම යන්නයි. සාහිත්‍යමය අර්ථයෙන් ගත් කළ පිතෘ මූලිකත්වය යන්නෙන්, පුරුෂ මූලිකත්වයකින් යුක්ත පවුල යන්න ගම්‍ය වේ. මෙකී පිතෘ මූලික පවුල යන සංකල්පය මානව ශිෂ්ටාචාරයේ ආරම්භක අවධි දක්වාම දිව යන අතර, ක්‍රිස්තු පූර්ව යුගයන්හි දී පවා කාන්තාවන් පුරුෂයා යටතේ කටයුතු කළ බවට සාධක පවතී.

එහිලා මෙකී පිතෘ මූලිකත්වය නම් සංකල්පය සඳහා විවිධ දාර්ශනිකයන්, දේශපාලඥයන්, චින්තකයන් වැන්නවුන් විවිධ අර්ථකථන සපයා ඇත. එහිදී මැක්ස් වෙබර් (Max weber) දක්වන පරිදි, පිතෘ මූලිකත්වය යන සංකල්පයෙන් පවුලක වැඩිමහල් පුරුෂයා විසින්, වයසින් අඩු පිරිමි සාමාජිකයන්, ස්ත්‍රීන් හා දැසි දස්සන් මත පතුරවන ආධිපත්‍යය විස්තර කරන බව සඳහන් කරයි. නමුත් ස්ත්‍රීවාදීන්ට අනුව පිතෘ මූලිකත්වය යන්නෙන්, ස්ත්‍රිය මත පැටවෙන පුරුෂයාගේ ආධිපත්‍යය ගම්‍ය වන බව සඳහන් කරයි. ඊට අමතරව ඔවුන් සඳහන් කරන්නේ, පුරුෂයන් විසින් ස්ත්‍රිය පාලනය කරනු ලබන ආකාරයත්, ස්ත්‍රියට සමාජය සලකන ආකාරය මෙන්ම එය කාලාන්තරයක් මුළුල්ලේ වර්ධනය වූ ආකාරයත් මෙම පිතෘ මූලික සංකල්පයෙන් පැහැදිලි වන බවයි. විශේෂයෙන්ම ස්ත්‍රීවාදීන් විසින් වෙබර්ගේ මතය විවේචනය කරමින් සඳහන් කරනු ලබන ප්‍රධාන කරුණක් නම්, වැඩිමහල් පුරුෂයකු විසින් පාලනය කරනු ලැබීම ප්‍රතික්ෂේප කරමින්, සමස්තයක් ලෙස සියලුම පුරුෂයන් විසින් සෑම ක්ෂේත්‍රයකදී ම ස්ත්‍රියව පාලනය කරනු ලැබීම හා පුරුෂයා සෑම විටම සමාජයේ ඉහළ තලයක ස්ථානගත වෙමින්, ස්ත්‍රිය පවුල තුළදී මෙන්ම ඉන් පිටතදී ද සූරා කෑමක් ලෙසින් අවධාරණ කරයි. ඒ සඳහා මාධ්‍යයක් ලෙසින් ප්‍රචණ්ඩත්වය යොදාගනු ලබන බවත් ස්ත්‍රීවාදීන් විසින් වැඩිදුරටත් පෙන්වා දෙනු ලබයි.

රැඩිකල්වාදි ස්ත්‍රීවාදයේ පුරෝගාමියකු වන සිල්වියා වොල්බි (Sylvia Walby) සඳහන් කරන ආකාරයට, විරුද්ධ ලිංගිකයන් අතර සමාජ හැසිරීම් පුරුෂයා විසින් තීරණය කරනු ලබන බවත්, ස්ත්‍රිය හා පුරුෂයා අතර පවත්නා සියලුම අසමානතා නිර්මාණය වීමට මූල සාධකයක් ලෙසින් මෙම පිතෘ මූලිකත්වය බලපාන බවත් පෙන්වා දී ඇත. මෙම මතවාදයන්ට අනුව පවුල තුළ පමණක් නොව ආර්ථික, ආගමික, දේශපාලනික ආදි වූ සෑම සමාජ සංස්ථාවක් තුළම ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයකට පත් කිරීම උදෙසා මෙම පුරුෂ මූලික හෙවත් පිතෘ මූලික සමාජ ක්‍රමය බලපානු ලබයි.

පිතෘ මූලිකත්වය සම්බන්ධයෙන් සමාජවාදි සමාජ විද්‍යාඥයන් විසින් පළ කරනු ලබන්නේ වෙනස් ආකාරයක අර්ථ දැක්වීමකි. ඔවුන්ට අනුව පීතෘ මූලික සමාජ සබඳතා නිර්මාණය කර ඇත්තේ ධනවාදීන් විසිනි. එහිදී ධනපතියන්ගේ අවශ්‍යතා සංතර්පණය කරගැනීම අරබයා පුරුෂයා විසින් ස්ත්‍රිය සූරාකෑමට පෙළඹේ. ඒ අනුව මොවුන් සඳහන් කරන ප්‍රධාන කරුණක් නම් ස්ත්‍රියට විමුක්තිය දිනා ගැනීමට ඇති එකම මාර්ගය ධනවාදි සමාජ ක්‍රමය මුලිනුපුටා දැමීම බවයි. මෙම ස්ත්‍රී-පුරුෂ සමාජ අසමානතාව සඳහා හේතු වශයෙන් බොහෝ ස්ත්‍රීවාදීන් විසින් ද සඳහන් කරනු ලැබ ඇත්තේ, ජීව විද්‍යාත්මක හෝ ස්වාභාවික හේතු මත නොව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ පිතෘ මූලික සමාජය විසින් ස්ත්‍රිය පහත් අප්‍රධාන සහ පුරුෂයාට අවනත විය යුතු තත්ත්වයකට පත් කිරීම ඊට හේතු වී ඇති බවයි. විශේෂයෙන්ම පවුල තුළදීත් සෙසු සමාජ සංස්ථා තුළදීත් ස්ත්‍රිය නොසලකා

හැරීමකට, වෙන්කොට සැලකීමකට, සූරා කෑමට මෙන්ම අපයෝජනයට පත් කිරීමද සිදු වේ. එලෙස වෙන් කොට සැලකීම සාමාන්‍ය තත්ත්වයක් ලෙසින් පුරුෂයා පමණක් නොව ස්ත්‍රියද විශ්වාස කරන තත්ත්වයක් අද්‍යතනයේ දක්නට ලැබෙන්නේ පිතෘ මූලික සමාජ ක්‍රමයක් සමාජය තුළ ගැඹුරින් ස්ථාපිත කර ඇති බැවිනි. ඒ සඳහා කුඩා කල පටන් සිදුවන සමාජානුයෝජනය ද ප්‍රබල උත්තේජනයක් සපයනු ලැබේ.

පවුල තුළ පවත්නා මෙකී පිතෘ මූලිකත්වය සම්බන්ධයෙන් විමසීමේ දී සෙසු සෑම සමාජ ඒකකයකදී ම මෙන් ස්ත්‍රියට ඉහළින් පුරුෂ පාලනය ක්‍රියාත්මක වන අතර පවුල තුළ ස්ත්‍රියකගේ කාර්යභාරය ආර්ථිකමය වශයෙන් තක්සේරු නොකෙරේ. තවද පවුලේ සියලුම වැදගත් තීරණ පුරුෂයා විසින් ගනු ලැබේ. පවුලක ස්ත්‍රිය ආදායම් උපයන රැකියාවක නියුක්ත වුවද ඇය උපයන්නා ලෙසින් නොසැලකේ. විශේෂයෙන්ම පවුලක පුරුෂ පාර්ශ්වය භුක්ති විඳින නිදහස සෑම විටම ස්ත්‍රී පාර්ශ්වයට අහිමි කර ඇත.

ආර්ථික අංශයෙන් ගත් විටද ස්ත්‍රිය හා පුරුෂයාගේ ශ්‍රම ශක්තිය තක්සේරු කරනු ලබන්නේ ආකාර දෙකකිනි. විශේෂයෙන්ම ආදායම් උපයන රැකියාවක නියුක්ත වීමට බොහෝ විට ස්ත්‍රීන්ට අවකාශයක් හිමි නොවන අතර එලෙසින් ස්ත්‍රිය යම් රැකියාවක නියුක්ත වන්නේ නම් පුරුෂයා හෝ පවුලේ වැඩිමහල් පුරුෂයෙකුගේ අවසර ලබාගත යුතු වීම බොහෝ විට දැකගත හැකිය. රැකියා ස්ථානයේ දී පුරුෂයාට සමානවම හෝ ඊට වැඩි පැය ගණනක් තම ශ්‍රමය කැප කළ ද බොහෝ අවස්ථාවන්හි දී කාන්තාවට ලැබෙන වේතනය පුරුෂයාට වඩා අවම මට්ටමක පවතී. බොහෝ විට කාන්තාවන් ලිංගිකමය වශයෙන් රැකියා ස්ථාන තුළදී බහුලව පීඩාවට හා පීඩනයට පත් වේ.

ප්‍රජනන කාර්යයේ දී ලිංගිකත්වයේ දී පවා ස්ත්‍රිය පුරුෂාධිපත්‍යට නතු වන අවස්ථාවන් සුලබය. විශේෂයෙන්ම ආගමික නියමයන් සහ රාජ්‍ය නීතිවලින් පවා එකී ජීව විද්‍යාත්මක කෘත්‍යයන් පාලනය කර ඇත. බොහෝ නූතන රාජ්‍යයන් මෙලෙස ස්ත්‍රී-පුරුෂ විභේධනය මත සිදු වන අසාධාරණයට එරෙහිව කටයුතු කරමින් කාන්තාවන් හට පුරුෂයන්ට සමාන අයිතිවාසිකම් ලබා දීමට නීත්‍යානුකූලව කටයුතු කරන බව ප්‍රකාශ කරනු ලැබුවද එකී නීති ක්‍රියාත්මක වීමේදී අදාළ තත්ත්වය විද්‍යාමාන වන බවක් පෙනෙන්නට නැත. මේ හේතු සාධක මත පදනම්ව ස්ත්‍රී අයිතිවාසිකම් කඩවීම බහුලව සිදු වේ. උදාහරණයක් ලෙසින් පොදු ප්‍රවාහන ක්ෂේත්‍රය භාවිතයේ දී කාන්තාවන් අපහරණයට ලක් වුවද බොහෝ කාන්තාවන් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට උත්සාහ නොකිරීම දැකගත හැකිය. මන්ද යත් පොලීසිය වැනි ආයතනවල දී ද බොහෝ අවස්ථාවන්වල දී එවැනි කාන්තාවන් පුනර් වින්දිතභාවයට පත් වන බැවිනි.

ස්ත්‍රිය විෂයහි සිදුවන්නා වූ අසාධාරණය සඳහා ගතානුගතික විශ්වාසයන් සහ සිරිත් විරිත්, ආකල්ප, සංස්කෘතික අගනාකම් යනාදිය ද බලපානු ඇත. උදාහරණ ලෙසින්, පුරුෂයා කවරාකාරයේ හැසිරීමක් ප්‍රකට කළ ද, ඔහු නහවා ගෙට ගත හැකිය යන සංකල්පය ශ්‍රී ලංකාවේ සමාජගතව ඇති මෙවන් ආකල්පයකි. ඒ

ඔස්සේ කාන්තාවගේ ස්වයං තීරණ ගැනීමේ අයිතිය හා නිදහස සීමා කර ඇති බවක් විද්‍යමාන වේ.

එක්සත් ජාතීන්ගේ සංගමය ඉදිරිපත් කරනු ලබන දත්තවලට අනුව ලෝකයේ මුළු වැඩ පැය ගණනින් 60% සඳහා ස්ත්‍රීන් ශ්‍රමය යෙදවුවද ඇයට හිමි වන්නේ මුළු ලෝක ආදායමෙන් 10% ක් පමණි. ලෝක ජනගහනයෙන් 51% ක් ස්ත්‍රීන් වුවත් ජාතික මට්ටමේ ව්‍යවස්ථාදායකයන්හී ස්ත්‍රී නියෝජනයේ සාමාන්‍ය ප්‍රතිශතය 14% කි (ලියනගේ සහ වළාකුළුගේ, 2006: 33).

මෙකී සියලුම තත්ත්වයන් පිතෘ මූලිකත්වය මත ගොඩ නැඟී ඇති සමාජ ක්‍රමයන් හේතුවෙන් සිදු වන බව ඉහත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී වැඩි දුරටත් පැහැදිලි වේ. විශේෂයෙන්ම කුලය, ජාතිය, වර්ගය, ආගම, සංස්කෘතිය, දේශපාලන මතවාදය, රට, ප්‍රදේශය ආදි වශයෙන් මෙකී පිතෘ මූලිකත්වය ක්‍රියාත්මක වන ආකාරයද විවිධාකාර වේ. විශේෂයෙන්ම අතීතයේ ස්ත්‍රියට හිමිව තිබූ නිදහස හා සමාජ තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයක් වර්තමානයේ ඇය භුක්ති විඳින ආකාරයක් දැකගත හැකි වන අතර අනාගතයේ දී එකී තත්ත්වය තවදුරටත් වෙනස් විය හැකිය. උදාහරණයක් ලෙසින් අතීතයේ ලාංකික කාන්තාවන්ට ආගමික, සාමාජීය මෙන්ම සංස්කෘතික ආදි වශයෙන් වූ විවිධ තහංචි ගණනාවක බලපෑම්වලට යටත් වීමට සිදු වුවත් වර්තමානයේ එකී තත්ත්වයෙන් බැහැරව කාන්තාවට යම් නිදහසක් හා ස්වාධීනත්වයක් හිමිව ඇති ආකාරයක් දැකගත හැකිය. නමුත් මෙපරිද්දෙන් කවරාකාරයේ වෙනස්වීම් සිදු වුවත් පිතෘ මූලිකත්වය තුළ කාන්තාව අප්‍රධාන තත්ත්වයකට පත් කර තිබීම මේ මොහොතේදීත් දැකගත හැකි තත්ත්වයක් බව සඳහන් කළ යුතු වේ. නමුත් මෙකී පිතෘ මූලිකත්වය මත පීඩනයට ලක් ව සිටි කාන්තාවන් තම නිදහස සහ අයිතිවාසිකම් වෙනුවෙන් අතීතයේ පටන්ම දැඩි අරගලයක නිරතව බොහෝ ජයග්‍රහණයන් ලබා ඇත.

උදාහරණ ලෙසින්, මුස්ලිම් දැරියන්ගේ අධ්‍යාපන අයිතිවාසිකම් වෙනුවෙන් ප්‍රබල මතයක් සමාජගත කළ මලාලා යූසුෆ්සායි (Malalala Yousafzai) නම් දැරිය පාකිස්තානය වැනි දැඩි ආගමික, මූලධර්ම මතවාදයන් පවතින මුස්ලිම් සංස්කෘතියක් තුළ ජීවත් වෙමින් සමස්ත මුස්ලිම් කාන්තාවන්ගේම ආධ්‍යාපනික සහ සෙසු අයිතිවාසිකම් සඳහා කටයුතු කිරීම පෙන්වා දිය හැකිය.

මෙකී පිතෘ මූලිකත්වයෙහි විරුද්ධ අංශය මාතෘ මූලිකත්වයයි. එහිලා අතීතයේ බහුතරයක් සමාජ තුළ මාතෘ මූලිකත්වයක් පැවති බවට මූලාශ්‍රය සාක්ෂි සපයයි. ඒ යටතේ ඉන්දියාවේ බ්‍රාහ්මණ යුගයට ප්‍රථමයෙන් කාන්තාව දේවත්වයෙන් ඇදහූ බවත් ඇය සශ්‍රීකත්වයේ සංකේතයක් ලෙසින් වැඳුම් පිදුම් කළ බවත් ප්‍රකට වේ. ඒ සඳහා හොඳම නිදසුනක් නම් ඉන්දියාවේ පැවති “ජගත් මාතා” වන්දනයයි. මීට අමතරව චීනයේ ඈත පිටිසර ගම්මාන කීපයක අද්‍යතනය වන විටත් මාතෘ මූලික

සමාජ පවතී. තවද කේරළයේ නායර් ගෝත්‍රික ජනතාව අතර ස්ත්‍රී පාර්ශ්වය හරහා දේපළ උරුම වීමද මීට කදිම නිදසුනකි.

මේ අනුව ස්ත්‍රීන් හා පුරුෂයන් අතර පවත්නා මෙකී සමාජ අසමානතාව සඳහා ප්‍රධාන හේතුව ලෙසින් පිතෘ මූලිකත්වය හඳුනාගත හැකි අතර එකී තත්ත්වය අප්‍රධාන මට්ටමට ගෙන ඒම ඔස්සේ මෙම ආකල්ප, අගය කිරීම්, විශ්වාසයන් ආදිය වෙනස් කළ හැකිය. ඒ සඳහා සියලුම සමාජ සංස්ථා සතුව වගකීමක් පවතී. මන්ද යත් අනාදිමත් කාලයක පටන් පැවති මතවාදයක් වෙනස් කිරීම යනු පහසු කටයුත්තක් නොවන බැවිනි. එහිලා මෙකී පිතෘ මූලික සමාජ ක්‍රමයක් යටතේ දිවි ගෙවන ශ්‍රී ලාංකික කාන්තාවගේ තත්ත්වය මානව හිමිකම් සහ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවයේ දැකගත හැකි ඌනතා සම්බන්ධයෙන් වැඩි දුරටත් පහත පරිදි විමසා බැලිය හැකිය.

**ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ මානව හිමිකම් සහ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සම්බන්ධයෙන් වන කාලීන විග්‍රහය**

වර්තමාන ඩිජිටල් ලෝකය තුළ කාන්තා අයිතීන් ඉතා වේගයෙන් වර්ධනය වෙමින් තිබුණද පෙර සඳහන් කළ පරිදි පුරුෂාධිපත්‍යය සමඟ බැඳි දීර්ඝ ඉතිහාසයක් ඉක්මනින් වෙනස් කිරීම ඉතා අපහසු කාර්යයක් වී ඇත. එහිලා ශ්‍රී ලංකාව ඇතුළු ලොව සංවර්ධනය වෙමින් පවත්නා බොහෝමයක් රාජ්‍යයන්හි මෙම පුරුෂාධිපත්‍යය හෙවත් පිතෘ මූලිකත්වය බහුල වශයෙන් විද්‍යමාන වේ. 2000 දශකයේ සිට ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය පුරුෂයන් ගණන ඉක්මවා ගොස් ඇති බව සඳහන් වුවද අද්‍යතනය වන විටත් මෙකී පිතෘ මූලික සංකල්පයෙන් බැහැර වීමක් සිදු වී නොමැති බවක් දිස් වේ. එහිලා ශ්‍රී ලංකාවේ වෙසෙන වර්තමාන ජනගහනයෙන් 52%ක් කාන්තාවන් වන බව අදාළ වාර්තා වැඩි දුරටත් පෙන්වා දෙයි. නමුත් සංඛ්‍යාත්මකව සිදුව ඇති මෙම වර්ධනය ශ්‍රී ලංකාවේ කාන්තාවන් හා ගැහැණු දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් හේතු සාධක වී තිබේද යන්න විමසා බැලිය යුතු කරුණකි. එක්සත් ජාතීන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ අසමානතා දර්ශකයට අනුව, රටවල් 187ක් අතරින් ශ්‍රී ලංකාව 74 වන ස්ථානයේ පසු වේ. එම තත්ත්වය සම්බන්ධයෙන් විමසීමේ දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ සුබවාදී අනාගතයක් සම්බන්ධයෙන් යම් බලාපොරොත්තුවක් ඇති නමුත් වර්තමානය වන විටත් ශ්‍රී ලංකාවේ කාන්තාවන්හට ආගමික, ආර්ථික, දේශපාලන, විවාහය, රැකියාව තුළදී මෙන්ම තම පෞද්ගලික දිවිය තුළද බොහෝ බාධකවලට මුහුණ දීමට සිදුව ඇති සෙයක් විද්‍යාමාන වේ. ඒ යටතේ කාන්තාවන්ගේ සමාජ භූමිකාව පිළිබඳ පූර්ව නිගමනයන්ට එළැඹීම හේතුවෙන් අද්‍යතනය වන විටත් කාන්තාවන් හට බොහෝ අවස්ථාවන් මග හැරෙන අතර විවිධ බාධක හා තහංචි මධ්‍යයේ දිවි ගෙවීමට සිදුව තිබේ.

ආර්ථික අංශයෙන් මෙරට කාන්තාවන්ගේ අයිතීන් සුරක්ෂිත වී ඇතිද යන්න සම්බන්ධයෙන් විමසීමේ දී ශ්‍රී ලංකාවේ ශ්‍රම බළකායේ නියුක්ත පුරුෂයන් 72.4% ට

සාපේක්ෂව මෙරට ශ්‍රම බලකාය සඳහා කාන්තාවන්ගේ දායකත්වය 32.5% ක් වන බව සඳහන් වේ. එය පුරුෂ ශ්‍රම බලකායෙන් අඩකටත් අඩු ප්‍රතිශතයක් වන බැවින් මෙරට කාන්තාවන් විසින් ශ්‍රම බලකාය සඳහා දක්වනු ලබන දායකත්වය ඉතා අල්ප යැයි ඇතැමෙකුට තර්ක කළ හැකිය. නමුත් සත්‍ය තත්ත්වය ඊට බොහෝ වෙනස් ස්වරූපයක් ගන්නා බව එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය විසින් වර්ෂ 2020 දී නිකුත් කළ වාර්තාවකට අනුව පැහැදිලි වේ. එහි සඳහන් වන පරිදි දැරිය හැකි මුදලකට ගුණාත්මක දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ළමාරක්ෂක සේවා නොමැතිකම නිවසේ රාජකාරි බෙදා ගැනීමට පුරුෂයා වෙතින් කිසිදු සහායක් නොලැබීම මෙන්ම සේවිකාවන්ට අවශ්‍ය සහාය නොදක්වන ඇතැම් සේවා ස්ථාන විවිධ සංස්කෘතීන් වැනි බොහෝ සාධක හේතුවෙන් ශ්‍රී ලංකාව තුළ ශ්‍රම බලකාය සඳහා කාන්තාවන්ගේ සහභාගීත්වය අවම වී තිබේ. එමෙන්ම කාන්තාවන්ගේ විරැකියා අනුපාතය 36.3% ක් වන අතර පුරුෂයන්ගේ විරැකියා අනුපාතය 21.1% ක් වීමෙන් පැහැදිලි වන්නේ පුරුෂයන්හට රැකියාවක පහසුවෙන් නියුක්ත වීමට හැකියාව පවතින බවත් එකී රැකියාවේ දීර්ඝකාලීනව නියුක්ත වීමේ හැකියාවක්ද පවතින බවයි. මෙරට බොහෝ කාන්තාවන් ස්ථිර ආදායමක් නොලැබෙන රැකියාවල නියුක්ත වන බැවින් කොවිඩ්-19 වැනි ව්‍යසනයන්හි දී ශ්‍රී ලංකාවේ පවුල් හතරෙන් එකකට වැඩි ප්‍රමාණයක සිටින කාන්තාවන්ට එය දැඩි බලපෑමක් කර ඇත. ගෘහමූලිකයා වශයෙන් කාන්තාව කටයුතු කරන පවුල් සම්බන්ධයෙන් විමසීමේ දී මෙම වසංගත තත්ත්වය හේතුවෙන් එවැනි කාන්තාවන්හට පෙරට වඩා තුන් ගුණයක වැඩි බරක් දැරීමට සිදුව ඇති බව ඇතැම් වාර්තා ඔස්සේ වැඩි දුරටත් පැහැදිලි වේ. එමෙන්ම කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම වර්තමානය වන විට ක්‍රමයෙන් ඉහළ යමින් තිබියදීත් මේ මොහොත වන විටත් ඔවුන්ගේ දැනුම හා ශ්‍රමය බොහෝ විට වැය වන්නේ නිවසේ එදිනෙදා වැඩ කටයුතු වලට පමණි. විශේෂයෙන්ම මෙලෙස කාන්තාවන් රැකියාවක නියුක්ත වීම සඳහා දැඩි උනන්දුවක් සහ පෙලඹවීමක් නොදක්වීම උදෙසා පීතෘ මූලික සමාජ හා සංස්කෘතික පසුබිමක් යටතේ කාන්තාව කෙරේ ඇති කරනු ලබන පීඩනය මූලික වී ඇති බව පැහැදිලි වන කරුණකි. ඊට හොඳම උදාහරණයක් නම් පසුගිය සමයේ ශ්‍රී ලංකා පොලිසියේ කාන්තා නියෝජ්‍ය පොලිස්පති නිලයට පත් වීම් ලද ප්‍රථම කාන්තාව වූ බිම්ශානි ජාසිං ආරච්චිගේ නමැත්තියගේ පත් වීම අභියෝගයට ලක් කරමින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන් තිස් දෙදෙනෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කරනු ලැබීය. වැඩි දුරටත් කාන්තාවක් අදාළ නිලයට පත්කිරීමට විරුද්ධත්වයක් නොතිබුණද "කාන්තා නියෝජ්‍ය පොලිස්පති" ලෙසින් සඳහන් වන නිලයක් තවමත් ශ්‍රී ලංකා පොලිසිය තුළ නොමැති වීම හේතුවෙන් අදාළ පත්කිරීම නීතියට පටහැනි බව, ඉදිරිපත් කර ඇති පෙත්සමේ සඳහන් වේ.

වැටුප් පරතරය සම්බන්ධයෙන් විමසීමේ දී ලොව පුරාම විවිධ රැකියාවන් හි ස්ත්‍රී-පුරුෂ වැටුප් පරතරයක් බොහෝ අවස්ථාවලදී දැකගත හැකිය. නමුත් පුද්ගලයකු නිරත වන රැකියාව අනුව ස්ත්‍රී-පුරුෂ වැටුප් පරතරයක් ඇති වීම සාමාන්‍ය තත්ත්වයක් වුවද එක හා සමාන අධ්‍යාපනයක් ලබා එක හා සමාන අත්දැකීම් ඇති

කාන්තාවකට, පුරුෂයකු හට ගෙවනු ලබන වැටුපෙන් හරි අඩකටත් වඩා අඩුවෙන් ගෙවීම් සිදු කරන ආයතන කර්මාන්තශාලා සහ වෙනත් රැකියා ස්ථාන රැසක් ශ්‍රී ලංකාවේ ඇති බවට වාර්තා වේ.

උදාහරණ ලෙසින්, නීති, ඉංජිනේරු වැනි වෘත්තින් මෙන්ම තේ දළු, කුරුඳු, රබර් කිරි කැපීම වැනි රැකියාවන්වල දී ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර සැලකිය යුතු වැටුප් පරතයක් දක්නට ලැබේ. ඒ අනුව පැහැදිලි වන කරුණක් නම් ශ්‍රී ලංකාවේ ඇතැම් වෘත්තින්හි ගෙවනු ලබන වේතනයන් සම්බන්ධයෙන් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවකින් තොරව ක්‍රියා කරන බවයි. එමඟින් රැකියාවන්හි නියුක්ත වන කාන්තාවන් බොහෝ ප්‍රමාණයක් අයථා ශ්‍රම සූරාකෑම්වලට ලක්ව සිටින බව පැහැදිලි වේ.

ලිංගිකත්වය ශරීරය සහ දරුවන් වැදීම සම්බන්ධයෙන් විමසා බැලීමේදී ද තහවුරු වන වැදගත් කරුණක් වන්නේ මෙරට කාන්තාවන්ගේ එකී අයිතිවාසිකම් පුරුෂාධිපත්‍යය හේතුවෙන් උල්ලංඝනය වී ඇති බවත් එම අංශය තුළද ස්ත්‍රී-පුරුෂ සමානත්මතාවයක් දැකගත නොහැකි බවත්ය. එහිලා සෑම පුද්ගලයෙකුටම තමන්ගේ ශරීරය සම්බන්ධයෙන් ස්වාධීනව තීරණ ගැනීමට හැකි විය යුතු අතර අනෙක් පසින් ඒ සම්බන්ධයෙන් ඔහුට හෝ ඇයට අනුලංඝනීය අයිතියක්ද පවතී. ඒ අනුව සෑම කාන්තාවකටම ලිංගික හා ප්‍රජනන අයිතීන් ඇත. එමඟින් අදහස් වන්නේ ලිංගිකව එක්වීමට ගැබ් ගැනීමෙන් ආරක්ෂා වීමට මෙන්ම ආරක්ෂිත ගබ්සා කිරීම් වැනි සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමට ඕනෑම කාන්තාවක් හට අයිතියක් පවතින බවයි. කෙසේ නමුත් ගබ්සාව සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ නීතිය ඉතා දැඩි බව සඳහන් කළ යුතුය. නමුත් උතුරු ඇමෙරිකාවේ බහුතරයක් රාජ්‍යයන් ඕස්ට්‍රේලියාව, රුසියාව වැනි ලෝකයේ රාජ්‍යයන් වැඩි ප්‍රමාණයක් කාන්තාවගේ ඉල්ලීම සහ ඇතැම් කොන්දේසි මත ගබ්සාව සඳහා අවසර ලබා දී ඇත. ඒ ඔස්සේ අදාළ රාජ්‍යයන් විසින් කාන්තාවක් සතුව පවතින ලිංගිකත්වය ශරීරය සහ දරුවන් වැදීම සම්බන්ධයෙන් වන අයිතිවාසිකම් සුරක්ෂිත කොට ඇත. නමුත් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 303 වගන්තියට අනුව ගබ්සාවක් කළ හැක්කේ කළලයෙන් මවගේ ජීවිතයට හානියක් සිදු වන අවස්ථාවකදී පමණි. ඊට පරිබාහිරව සිදු කරනු ලබන ගබ්සාවන් නීති විරෝධී ලෙසින් සලකනු ලබන අතර ඊට අදාළව දඬුවම්ද නියම කරනු ලැබේ. විවිධ හේතු සාධක මත මෙම නීතිය ලිහිල් කරන ලෙස වෛද්‍යවරුන්ගෙන් හා කාන්තා සංවිධානවලින් වසර ගණනාවක සිට විවිධ ඉල්ලීම් ඉදිරිපත් වූ නමුත් ඒ සෑම අවස්ථාවකදීම ආගමික නායකයින්ගේ විරෝධය හේතුවෙන් අදාළ ඉල්ලීම් කිසිදු රජයක් විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළේ නැත. නමුත් එය කාන්තා පාර්ශ්වයෙන් විමසන කල්හි ලැබිය යුතු අයිතිවාසිකමක් ලෙසින් සඳහන් කළ හැකිය.

උදාහරණ ලෙසින්, වයස අවුරුදු 18ට අඩු ගැහැනු ළමයෙකු ලිංගික අපයෝජනයක් හේතුවෙන් ගැබ් ගැනීමක දී ගබ්සාව සඳහා අවසර ලබා දිය යුතු බවට වන අදහස් පෙන්වාදිය හැකිය.

නමුත් ශ්‍රී ලංකාව වැනි දැඩි සංස්කෘතික පදනමක පිහිටා කටයුතු කරන රාජ්‍යයන් වෙතට මෙවැනි අයිතිවාසිකම් ලබා දීම තවත් පසෙකින් ගැටලුකාරී තත්ත්වයන් නිර්මාණය කිරීමට දායක වන බවද මෙහිලා සඳහන් කළ යුතුය. තවද ස්ත්‍රී දූෂණ හා වෙනත් ලිංගික හිංසනයන්, ස්ත්‍රී ලිංගික අවයව විකෘති කිරීම, බලහත්කාරයෙන් විවාහ වීම, බලහත්කාරයෙන් ගැබ් ගැන්වීම, බලහත්කාරයෙන් ගබ්සා කිරීම හෝ බලහත්කාරයෙන් වන්ධ්‍යකරණය ඇතුළු ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන්ට බිය නොවී ජීවත් වීමට කාන්තාවන්ට හැකි වීමට අවැසි පරිසරයක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව මේ ඔස්සේ පැහැදිලි වේ. ඒ යටතේ මෙරට සිදු වන සමීප සහකරු හිංසනය සහ ලිංගික හිංසනය ප්‍රධාන මහජන සෞඛ්‍ය ගැටලුවක් සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් ලෙසින් පෙන්වාදිය හැකිය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ දත්තවලට අනුව ගෝලීය වශයෙන් ලොව පුරා සිටින කාන්තාවන්ගෙන් 30% ක් පමණ කායික හා ලිංගිකමය වශයෙන් හවුල්කාර ප්‍රචණ්ඩත්වයට හෝ හවුල්කාර නොවන ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන බව පෙන්වා දෙයි. ඒ අතරින් වැඩි ප්‍රමාණයක් සමීප හවුල්කාර ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන බව සඳහන් ය. ලොව පුරා වයස අවුරුදු 15-49 තෙක් වයස් කාණ්ඩයන් හි පසු වන කාන්තාවන්ගෙන් 27% ක පමණ පිරිසක් සමීප සහකරු හේතුවෙන්, ශාරීරික හා ලිංගික ප්‍රචණ්ඩත්වය අත් විඳින බව සඳහන් වේ. විශේෂයෙන්ම ගෝලීය වශයෙන් සිදු වන කාන්තා ඝාතනවලින් 38% ක් පමණම සමීප සහකරුවන් විසින් සිදු කරනු ලැබ ඇති බව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් වැඩිදුරටත් අවධාරණ කරයි.

මීට අමතරව ශ්‍රී ලාංකික කාන්තාවන්ගෙන් බහුතරයක් තමන්ට හිමි අයිතිවාසිකම් සම්බන්ධයෙන් නොදැන සිටීම හා අයිතිවාසිකම් කඩ වූ විටෙක කටයුතු කළ යුතු ආකාරය නොදැනීමද විශාල ගැටලුවක් බවට පත්ව ඇත. විශේෂයෙන්ම බහුතරයක් කාන්තාවන් තමන්ගේ ශරීරයේ අයිතිය තමා සතු වන බව නොදැන සිටීම විවාහ ජීවිතය තුළ සිදුවන ශාරිරික හා ලිංගික හිරිහැරවලට විරුද්ධ වීමට තමාට අයිතියක් ඇති බව නොදැන සිටීම සහ නිතීය යටතේ තම අයිතිවාසිකම් සම්බන්ධයෙන් අදහස් පළ කිරීමට තමාට අවකාශයක් පවතින බව නොදැන සිටීමත් ඉතා ඛේදනීය තත්ත්වයක් බව මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලද විද්වතුන්ගේ අදහස වී ඇත. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ දී සිදුකරන ලද කාන්තා සුභසාධන සමීක්ෂණ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් 35.3% ක් තම බිරිඳට පහර දීමට පුරුෂයන්ට හොඳ හේතුවක් තිබිය හැකි බවට එකග වී ඇති අතර අදාළ සමීක්ෂණයට සම්බන්ධ වූ කාන්තාවන්ගෙන් 47.5%ක් කාන්තාවන්ට වඩා පුරුෂයන් උසස් යැයි පවසා ඇත. ඒ

අනුව පැහැදිලි වන්නේ ලාංකික සමාජය තුළ මුල් බැසගෙන ඇති පීතෘ මූලික සංකල්පය මත කාන්තාව විසින්ම තමන් පුරුෂයාට වඩා පහළ ස්තරයකට ඇද දමාගෙන ඇති බවයි. විශේෂයෙන් ම මෙම සමීක්ෂණයට සම්බන්ධ වූ සෑම කාන්තාවන් පස් දෙනෙකුගෙන් එක් අයෙකුම තම ජීවිත කාලය තුළ ශාරීරික හෝ ලිංගික හිංසනයන් අත්විඳ ඇතැයි අදාළ වාර්තාවේ වැඩිදුරටත් සඳහන්ව ඇත. අද්‍යතනය වන විට සමස්ත ලෝකයටම තර්ජනයක් වන කොවිඩ්-19 වසංගතයත් සමඟින් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට එරෙහිව සිදු වන ගෘහස්ථ හිංසනය වැඩි වී ඇති බව එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය විසින් 2020 දී නිකුත් කරනු ලැබූ වාර්තාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇඳිරි නීතිය පනවා තිබූ කාල වකවානුව තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් වූ පැමිණිලි ඉහළ ප්‍රතිශතයකින් වාර්තා වූ බව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය 2020 වසරට අදාළව තම වාර්තාවන් ඔස්සේද පෙන්වා දී ඇත.

මෙරට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සඳහා වන නෛතික ප්‍රතිපාදන සම්බන්ධයෙන් විමසීමේ දී, 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත ඔස්සේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ලක්වන්නන්ට නීතිමය රැකවරණය සපයා ඇත. එහිලා මෙකී පනත මගින් ගෘහස්ථ හිංසනය සම්බන්ධයෙන් වන කාන්තා අයිතීන් වලින් ඔබ්බට ගිය පුළුල් ක්ෂේත්‍රයක් එමගින් ආවරණ කර ඇත. විශේෂයෙන්ම ළමා හිංසනය සම්බන්ධයෙන් ද නීතිමය ආවරණයක් මෙම පනතෙන් ලබා දී තිබීම වැදගත් කොට සැලකිය යුතු වේ. ඒ යටතේ පීඩාවට පත් තැනැත්තා සහ පීඩා කරන තැනැත්තා අතර ඇති පෞද්ගලික සම්බන්ධතාවයෙන් පැන නගින නිවස තුළදී හෝ ඉන් පිටතදී සිදු කරන්නා වූ දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් අපරාධමය වැරදි වන මිනී මැරීම, සිය දිවි හානිකර ගැනීමට අනුබල දීම, ගබ්සාව, පහරදීම්, තුවාල සිදු කිරීම්, ලිංගිකත්වය හා සම්බන්ධ වැරදි සිදු කිරීම මෙන්ම උද්වේගශීලී බැණ වැදීම ඇතුළු තවත් වැරදි කිහිපයක් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා ලෙසින් මෙම පනතේ අර්ථ දක්වා ඇත. තවද කායික, මානසික මෙන්ම ලිංගිකමය වශයෙන් සිදුවන හිංසනයන් ද මෙම පනතේ ප්‍රචණ්ඩ ක්‍රියා ලෙසින් දක්වා ඇත.

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් විමසීමේ දී, මෙරට කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය සම්බන්ධයෙන්ද විමසා බැලීම වැදගත් වේ. එහිදී වර්ෂ 1931 දී 4%ක් වූ මෙරට ව්‍යවස්ථාදායකයේ කාන්තා නියෝජනය අද්‍යතනය වන විටත් 6%කට වඩා වැඩිකර ගැනීමට නොහැකි වී තිබේ. වර්ෂ 2010 දී ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 5.8% දක්වා වැඩි වුව ද වර්තමානයේ දී එය 5% දක්වා පහත වැටී ඇති බව සඳහන් වීමෙන් කාන්තාවන් ඒ සම්බන්ධයෙන් යොමු වීමට පවතින අකමැත්ත හා සමාජ මතය විශාල වශයෙන් ඊට බලපෑම් කර ඇති ආකාරයක් විද්‍යමාන වේ. ලොව පළමු අගමැතිනිය ලෙසින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය තේරී පත්වූයේ මීට අවුරුදු 61කට පෙර එනම්, වර්ෂ 1960 දී වන අතර, එතැන් පටන් වසර 34 ක් ගෙවී ගිය තැන ඇයගේ දියණිය

වන චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වර්ෂ 1994 දී අගමැතිනිය ලෙස පත්වීමෙන් නොනැවතී ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපතිනිය ලෙස තේරී පත් විය. එතැන් පටන් ඇය විසින් වර්ෂ 2005 නොවැම්බර් මස තෙක් මෙරට පාලනය කරන ලදි. තවද රටේ මුල්ම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සිට හැම වරකම පාර්ලිමේන්තුවේ කාන්තාවන් කීපදෙනෙකු හෝ නියෝජනය කළ බවද සඳහන් කළ යුතුය. නමුත් යුරෝපීය රාජ්‍යයන් බහුතරයක පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 30% කට වඩා වැඩි බව සංඛ්‍යාලේඛන අනුව පෙනී යන සත්‍යයකි. නූතනය වන විටත් ලොව බොහෝ රාජ්‍යයන්හි නායකත්වයට පුරුෂයන් පත් වී සිටිය ද 2021 වර්ෂය වන විට රාජ්‍යයන් 22ක කාන්තා නායකත්වයක් දැකගත හැකිය. මේ අනුව පැහැදිලි වන්නේ මෙරට දේශපාලන ක්ෂේත්‍රය තුළද ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවක් දැකගත නොහැකි වන බවයි.

**සමාලෝචනය**

මේ අනුව ඉහත කරුණු විමසීමේ දී පැහැදිලි වන සත්‍යයක් වන්නේ, දේශපාලන බලය, ආර්ථික හැකියාව සහ විශේෂයෙන්ම සෞඛ්‍ය හා අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සලකා බැලීමේ දී කාන්තාවන් සහ පුරුෂයන් අතර අතීතයේ පැවති විෂමතාව ගෙවී ගිය වසර කීපය තුළ දී යම් මට්ටමකට අඩු වී ඇතත් එකී තත්ත්වය පූර්ණ වශයෙන් පහව යාමට තවත් ශත වර්ෂයක පමණ කාලයක් ගතවනු ඇති බවයි. එකී කරුණ ලෝක ආර්ථික සංසදය (World Economic Forum – WEF) විසින් වර්ෂ 2019දී නිකුත් කළ වාර්තාව ඔස්සේ වැඩි දුරටත් සඳහන් කර ඇත. මෙම සංසදය ස්විට්සර්ලන්තය මූලස්ථාන කොටගත් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව සම්බන්ධයෙන් ලෝක ප්‍රවණතා මැන බලන සංවිධානයක් ලෙසින් පෙන්වාදිය හැකිය. එහිලා කාන්තා අයිතිවාසිකම් යනු එක් අතකින් මානව හිමිකම් ලෙසින් සඳහන් කිරීම නිවැරදි වනු ඇත. මන්ද යත් කාන්තාව හා පුරුෂයා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත විතැන් වීම මත ඔවුන් හට ආර්ථික, සාමාජීය, ආධ්‍යාපනික සහ දේශපාලනික වශයෙන් තවමත් බොහෝ විට ලැබෙන්නේ පසු පෙළ අසුනක් වන බැවිනි. මේ හේතුවෙන් කාන්තාවන් වෙනුවෙන් හඬක් නැගීමේ අවශ්‍යතාවක් කාලීන වශයෙන් පැන නැගී ඇති බව පසක් වේ. ඒ අනුව පීතෘ මූලිකත්වය මත පදනම්ව අද්‍යතනය වන විට ලෝකයේ සෙසු රාජ්‍යයන්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාව තුළ සෑම සමාජ ස්තරයකදීම කාන්තාවගේ සමානාත්මතා අයිතීන් උල්ලංඝනය වන බවත් ඉහත කරුණු ඔස්සේ මනාව පැහැදිලි වනු ඇත. මේ අනුව ගෘහස්ථය තුළදී ද දැඩිව හිංසනයට ලක් වන කාන්තාවන්ගේ සමානාත්මතා අයිතීන් සුරක්ෂිත කිරීම උදෙසා වගකිව යුතු සෑම පාර්ශ්වයක්ම සක්‍රීය දායකත්වයක් දැක්විය යුතු අවධිය මේ මොහොත වන විට එළැඹ ඇති බව සඳහන් කළ යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


පවුල් හිංසනය සහ ගෘහස්ථ හිංසනය වෙන්ව හඳුනාගෙන ඒවායේ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා දැනගනිමු. (n.d.). SBS Your Language. Retrieved October 10, 2021, from https: // www.sbs.com.au/language/sinhala/audio/difference-between-family-and-domestic-violence-and-know-their-early-warning-signs

රණවීර., දැහැමි. (2021, March 8). ගෘහස්ථ හිංසනය. BBC News සිංහල. https://www.bbc.com/sinhala/topics/cvjp2jyj88wt

ලියනගේ., කමලා, & වළාකුළුගේ., සුමුදු. (2006). Gender and feminism (ස්ත්‍රී – පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය). Friedrich-Ebert-Stiftung.

What is violence against women? | National Plan to Reduce Violence against Women and their Children. (2019). Dss.gov.au. https://plan4womenssafety.dss.gov.au/resources/what-is-violence-against-women/

World Health Organisation. (2021, March 9). *Violence against women*. Who.int; World Health Organization: WHO. https://www.who.int/news-room/fact-sheets/detail/violence-against-women

# භූගෝල විද්‍යාවේ ස්ත්‍රීවාදී ප්‍රවේශය

**එල්.බී.පී.එස්. ජයසේකර**

සමාජය තුළ බොහෝ අවස්ථාවන්වල දී ස්ත්‍රී-පුරුෂ ලිංග භේදය, ස්ත්‍රීත්වය හා පුරුෂත්වය යන පද සමාන අර්ථ ඇති පද වශයෙන් භාවිතයට ගනු ලබයි. නමුත් ස්ත්‍රී-පුරුෂ ලිංගභේදය යන පදයට වඩා ස්ත්‍රී-පුරුෂ භාවය යන පදය සමාජයීය වශයෙන් මෙන්ම මනෝභාවාත්මක වශයෙන් ද වෙනස් වූ අර්ථයක් ගෙන දෙනු ලබයි. 1970 දී පමණ ස්ත්‍රී-පුරුෂ භාවය යන යෙදුම විශ්ලේෂණාත්මක පදයක් වශයෙන් භාවිතයට ගෙන තිබේ. ස්ත්‍රී-පුරුෂ භාවය හඳුනා ගැනීමේ දී

- ලිංග භේදය
- දේහ විද්‍යාත්මක ලක්ෂණ
- කරනු ලබන කාර්යය මත පදනම්ව ස්ත්‍රීපුරුෂ භාවය හඳුනා ගනු ලබයි.

ජීව විද්‍යාත්මක වශයෙන් සියලුම ජීවීන් බාහිර හා අභ්‍යන්තරික වශයෙන් වෙනස්කම් සහිතව උපත ලබනු ඇත. කිසිදු ජීවියකුට උපතට පෙර ලිංගික බව පිළිබඳව තීරණය කිරීමේ හැකියාවක් නොපවතී. ඒ අනුව පුරුෂයා හා ස්ත්‍රිය අතර ඇති ජීව විද්‍යාත්මක ලිංගික වෙනස්කම් මත ඔවුන්ගේ අඟපසඟ ඉන්ද්‍රියයන් හා ශරීර වර්ධනය වෙනස් වීම සිදුවෙයි. එසේම දේහ විද්‍යාත්මක වශයෙන් ද ස්ත්‍රී පුරුෂ භාවය හඳුනාගන්නා අතර විශේෂයෙන් සමාජ හා සංස්කෘතික වශයෙන් ස්ත්‍රී පුරුෂ භාවය හි වෙනස්කම් හඳුනා ගනු ලබයි.

පුරුෂයා සහ ස්ත්‍රිය අතර විෂමතා

| | පුරුෂයා | ස්ත්‍රිය |
|---|---|---|
| i. | ශරීර ශක්තිය හැඩි දැඩි ශක්තිමත් | මුදු මොළොක්, කෝමළ, ළාමක |
| ii. | ලිංගික ප්‍රහාරකයා | ලිංගික පීඩිතයා |
| iii. | තාර්කික (Rational) ලෙස සිතන | හැඟීම්බර (Emotional) ලෙස කටයුතු කරන |
| iv. | විශ්ලේෂණකාරී | සංස්ලේශිත |
| v. | උන්නතවාදී ඒකියවාදී | සමස්තය ගැන සිතන, බහුවිධ |
| vi. | පරිසර ආක්‍රමණකාරී | ගහකොළ, සතා සිව්පාවාට කැමති |
| vii. | ද්විකෝටික තාර්කික | ද්විකෝටිකයට අකමැති |
| viii. | අධික කෝපය | ඉවසිලිවන්ත භාවය |
| ix. | පහසුවෙන් සසල නොවන | පහසුවෙන් සසල වන |
| x. | නායක, ප්‍රධානියා | තීකරු යටත් වැසියා |

(Herath ,H. M. B.,2020)

ඒ අනුව පුරුෂයා හා ස්ත්‍රිය අතර ඇති වෙනස්කම් මත පුරුෂයා සමාජ ප්‍රගමනයට දායක වන නායකයෙකු ලෙසත් ස්ත්‍රිය පුරුෂයාගේ උප භටයකු වශයෙනුත් හඳුන්වා තිබේ. සමස්ත ලෝකයටම මෙම වෙනස පොදු වන අතර ඕනෑම ජාතියක මානවයන් ස්ත්‍රී-පුරුෂ වශයෙන් වූ බෙදීමට අනුව හඳුනා ගැනේ. එසේම ස්ත්‍රී-පුරුෂ වශයෙන් මෙම බෙදීමට අනුව ඔවුන්ගේ මනෝභාවාත්මක හැඟීම් ද එයට සම්බන්ධ වී පවතින බවට විශ්වාස කරනු ලබයි.

තවදුරටත් කරනු ලබන කාර්යය මත පිහිටා ස්ත්‍රී-පුරුෂ භාවය හඳුනා ගැනීම සිදුවේ. ඒ අනුව ස්ත්‍රියක් පිරිමියෙක්ගෙන් වෙන්කර හඳුනා ගැනීමේ දී අවකාශීය වශයෙන් සලකනු ලබන කාර්යය මත පිහිටා ස්ත්‍රී-පුරුෂ භාවය හඳුනා ගනු ලැබේ. විශේෂයෙන් රැකියා කටයුතුවල නියලීම, ආදායම් ඉපයීම පුරුෂයාට නියම වූ කාර්යයන් වන අතර සාම්ප්‍රදායිකව දරුවන් වැදීම, රැකවරණය ලබාදීම, දරුවන් පෝෂණය යනාදී කාර්යයන් ස්ත්‍රීන්ට පැවරුණු කාර්යයන් වශයෙන් හඳුනාගනු ලැබේ.

සමාජයේ ස්ත්‍රී-පුරුෂ භාවයෙහි පවතින අසමානතාවය, එහි ස්වභාවය පුරුෂ මූලිකත්වය ස්ත්‍රී-පුරුෂ බල සබඳතාවය හා ලිංගිකත්වය පිළිබඳව විස්තරාත්මක අර්ථකථනයන් සැපයීම සඳහා ස්ත්‍රීවාදී න්‍යායන් භාවිතයට ගැනිණි. විශේෂයෙන් පවුල තුළත් ලිංගික වශයෙන් මෙන්ම සමාජ, දේශපාලනික, ආර්ථික ක්ෂේත්‍රවලත් පුරුෂයාට සාපේක්ෂව ස්ත්‍රියට හිමි අසමානතාවය පිළිබඳ විචාරාත්මක ව ස්ත්‍රීවාදී ප්‍රවේශය තුළින් පරීක්ෂාකර බලන අතර පවුල හා සමාජය තුළ ස්ත්‍රීන්ට හිමි අප්‍රධාන තත්වය හා කාන්තාවන්ගේ ක්‍රියා කලාපයන්ට නිසි අගයක් නොමැති වීම හෝ අවතක්සේරු කිරීම පිළිබඳ අවධානය යොමු කරනු ලබයි. එසේම එම තත්ත්වය තුරන් කිරීම සඳහා ප්‍රායෝගිකව ක්‍රියා කිරීම ස්ත්‍රීවාදයේ මූලික අරමුණයි.

19 වැනි සියවසට පෙර ද පුරුෂාධිපත්‍ය නිසා ස්ත්‍රිය මත ඇතිවන පීඩනය පිළිබඳව අදහස් වර්ධනය වෙමින් පැවති අතර ප්‍රංශයේ 19 වැනි සියවස අවසානයේ දී කාන්තාවන්ට ප්‍රසිද්ධ ස්ථානවල හිස වසා ගැනීමට ද සිදුවිය. එසේම ජර්මනියේ සමහර ප්‍රදේශවල සැමියකුට තම බිරිඳ විකිණීමේ අයිතිය ද පැවතිණි. තවදුරත් ආර්ථික දේශපාලනිකමය වශයෙන් ස්ත්‍රීවාදයේ පැතිරීම හඳුනාගත හැකි අතර 19 වැනි සියවසේ දී ස්ත්‍රීවාදී ව්‍යාපාරයන්වල මූලික අරමුණ වූයේ ස්ත්‍රියටත් පුරුෂයාටත් සමාන ආකාරයෙන් ඡන්ද අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය, වැටුප් ලබන රැකියාවක නිරත වීමේ අයිතිය දිනා ගැනීමත් නීතිමය වශයෙන් සමාන අයිතිවාසිකම් හිමි කර ගැනීමත්ය.

20 වන සියවසේ මුල් භාගය වන විටත් යුරෝපයේ හා එක්සත් ජනපදයේ බොහෝ ප්‍රදේශවල කාන්තාවන්ට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා හෝ මැතිවරණ ක්‍රියාවලට සහභාගි වීමට නොහැකි වූ බවට වාර්තා වෙයි. ඒ හේතු කොටගෙන 20 වන සියවසේ ස්ත්‍රීවාදී ව්‍යාපාරය සම්බන්ධ අයිතිවාසිකම්, විවාහය හා දික්කසාදය සම්බන්ධ අයිතිවාසිකම්, ප්‍රසූත නිවාඩු, සමාන වැටුප්, ස්ත්‍රීන්ට

එරෙහිව සිදුවන වෙනස්කම් තුරන් කිරීමේ නීති, ලිංගික අතවර, ගෘහීය ප්‍රචණ්ඩත්වය හා එයට එරෙහි නීති හා ලිංගික ක්‍රියාකාරකම් සම්බන්ධ අයිතිවාසිකම් දිනා ගැනීම අරමුණු කර ගෙන තිබේ. තවදුරටත් නූතන ස්ත්‍රීවාදී ව්‍යාපාරවල වඩාත් පුළුල් ආකාරයෙන් සංවර්ධනය හා අනෙක් සියලු කටයුතුවල තීරණ ගන්නා මට්ටම්වල දී ස්ත්‍රී-පුරුෂ සම සහභාගිත්වය හා සමාජානුයෝජනය දිනා ගැනීමේ අරමුණු මත කටයුතු කරනු ලබයි. ඒ අනුව ස්ත්‍රීවාදය තුළ පවුල හා සමාජය තුළ පුරුෂාධිපත්‍යය නිසා ස්ත්‍රියට ඇතිවන පීඩනය හා ඇයට වන අප්‍රධාන තත්ත්වය පිළිබඳව විස්තර කරන අතර එම තත්වයන් ගෙන් ස්ත්‍රීන් මුදවා ගැනීම ස්ත්‍රිවාදයෙහි අරමුණයි. තවදුරටත් ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට සමාන අයිතිවාසිකම්, සමාන සම්පත් හා සමාජයේ සමාන අවස්ථාවන් හිමිකර දීම තුළින් සමාජ වෙනසක් ස්ත්‍රීවාදය තුළින් අපේක්ෂා කරනු ලබයි. විශේෂයෙන් ම පෞද්ගලික ක්‍රියාවන්ට පමණක් සීමා වූ ක්‍රියාවන්ගෙන් බැහැරව පොදු කටයුතුවල දී ද පුරුෂයන් හා සමාන අයුරින් බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට අවස්ථා ඇතිකරීම ස්ත්‍රීවාදය තුළ හඳුනාගෙන තිබේ.

ස්ත්‍රීවාදය පිළිබඳව විද්‍යාත්මක දෘෂ්ටියකින් කටයුතු කිරීම ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාවේ දී සිදු වූ අතර 1970 දශකයේ අග භාගයේ සිට ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාවේ වර්ධනය හඳුනාගත හැකිවේ. සමාජ සම්බන්ධතාව සමාජයේ අවකාශය වශයෙන් ප්‍රතිඵලයක් වන බවත් කාලීන, අවකාශීය, ස්ථානීය වශයෙන් ද ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය තුළ තුළ ධනය, බලය රැකියාව සහ තරාතිරම ලබාගැනීමේ දී පුරුෂයන් හා ස්ත්‍රීන් විසින් අසමානකම් අත්විඳිනු ලබන බව ස්ත්‍රිවාදී භූගෝල විද්‍යාව තුළින් අනාවරණය කරන ලදී. එසේම ස්ත්‍රී පුරුෂ භාවයෙහි අසමානතාව සමාජ, දේශපාලන, ආර්ථික, ආයතනික හා ජනප්‍රිය කතිකාවත් මෙන්ම මාධ්‍ය තුළ මුල් බැස ගෙන පවතින පුරුෂාධිපත්‍ය තුළින් නිර්මාණය කරන ලද්දක් බව පෙන්නුම් කරන ලදී. ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාඥයන් විසින් පුරුෂාධිපත්‍යය අනන්‍යතාවය ප්‍රතිමූර්තිය අවකාශීය ආත්මීයතාව අතර අන්තර් සම්බන්ධතාවයන් අවධාරණය කළ අතර ඒවායින් ස්ත්‍රී පුරුෂ භේදයෙහි කාලානුරූපී බව හා අවකාශය හා සංස්කෘතිය හරහා ඓතිහාසිකව භූගෝලීය වශයෙන් බෙදී වෙන් වී පවතින බව හඳුනාගෙන තිබේ. ඒ අනුව ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාත්මක යතාදර්ශය තුළ ස්ත්‍රී-පුරුෂ සබඳතා විශේෂිත ප්‍රදේශයන්හි පරිණාමය වී ඇති ආකාරය සහ ඒවා විවිධ ස්ථානවල විවිධාකාරයෙන් සෑදී ඇති ආකාරය අධ්‍යයනය කෙරේ.

1973 දී මැක්ඩෝවල් විසින් ඉදිරිපත් කරනු ලබන අදහසට අනුව ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාවේ විෂය පථය තුළ භූගෝල විද්‍යාවේ කේන්ද්‍රීය සංකල්පයන් පිළිබඳව අවධානය යොමු කරන බව දක්වයි. එසේම භූගෝල විද්‍යාඥයන් විසින් ස්ත්‍රීවාදී භූ විද්‍යාවේ මූලික සංකල්ප වන අවකාශය, ස්ථානය සහ ස්වභාවය විවිධ සමාජයේ ස්ත්‍රී-පුරුෂ බෙදීම්වල ව්‍යුහය තුළ ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාවේ සම්බන්ධතාවය ආමන්ත්‍රණය කර ඇත. ඔහු විසින් ස්ත්‍රිවාදී භූගෝල විද්‍යාවේ අරමුණ ද පැහැදිලි කරන ලදී.

ස්ත්‍රීවාදී භූගෝල විද්‍යා අධ්‍යයනය කිරීමේ දී ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව සමාජවාදී ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව සහ වෙනස්කම් පිළිබඳ ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව වශයෙන් වර්ග තුනක් ඔස්සේ හඳුනාගනු ලැබේ. එහි දී ස්ත්‍රී-පුරුෂ සමාජ විෂමතාවයේ බලපෑම විස්තර කිරීම සඳහා ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව යොදාගන්නා අතර සමාජවාදී ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව තුළින් ධනවාදය සහ පිතෘමූලවාදය අතර සමානතාවය සහ සම්බන්ධතා පැහැදිලි කරන අතර වෙනස්කම් පිළිබඳ ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව ඔස්සේ ස්ත්‍රී-පුරුෂ භාවයේ අනන්‍යතාවයන් ගොඩනැගීම විද්‍යාත්මක ලක්ෂණ ආදී වශයෙන් ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාවේ උප කණ්ඩායම් පවතින බව හඳුනාගත හැකිය. මේ අනුව ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සමානතාවය ඇති කරන ව්‍යුහයන් විශ්ලේෂණය කිරීම ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව තුළින් අධ්‍යයනය කෙරේ.

- රැඩිකල්වාදී ස්ත්‍රීවාදී න්‍යාය
- ලිබරල්වාදී ස්ත්‍රීවාදී න්‍යාය
- පශ්චාත් නූතනවාදී ස්ත්‍රීවාදී න්‍යාය යන න්‍යායන් ඔස්සේ ඉදිරිපත් වී ඇත.

එහිදී රැඩිකල්වාදී ස්ත්‍රීවාදී න්‍යාය ඔස්සේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා පිතෘ මූලිකත්වය යන සංකල්ප සම්බන්ධයෙන් විස්තරාත්මක අර්ථකථන සපයනු ලබයි. ජීව විද්‍යාත්මක වශයෙන් ස්ත්‍රීන් හා පුරුෂයන් අතර පවත්නා වෙනසට වඩා ඉතා පුළුල් වෙනසක් පිතෘමූලික සමාජය විසින් නිර්මාණය කරනු ලැබ ඇති අතර එය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ලෙසත්, සමස්ත සමාජ සබඳතා පිළිබඳ විස්තර කෙරෙන බව හා ස්ත්‍රීන් මත වන පීඩනයේ ආරම්භය එය වන බවත් රැඩිකල් ස්ත්‍රීවාදීහු පෙන්වා දෙනු ලබයි. ඒ අනුව ජාති, මානව කුල වර්ග ආදී සෑම සමාජයකම බල සබඳතාවය තීරණය වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත වන අතර සාපේක්ෂව සමාජ බෙදීම් අතර දරුණුතම පීඩනයට ලක් වන්නේ ස්ත්‍රීවාදයෙන් බව රැඩිකල් ස්ත්‍රීවාදීන් පෙන්වා දී තිබේ. ඉන්දියාවේ පවතින සමාජ ක්‍රමය මෙයට නිදසුන් ලෙස දැක්විය හැකිය.

ලිබරල්වාදී න්‍යාය තුළ ස්ත්‍රීන්ට සම තැන හිමිවිය යුතු බව දැක්වේ. පුරුෂයන් හා සමානවම කාන්තාවට අධ්‍යාපනය ලැබීමේ, දේශපාලනික හා සමාජයේ වෙනත් කටයුතුවලට සහභාගි වීමේ, ඡන්දය දීමේ නියෝජනය කිරීමේ අයිතිවාසිකම් හිමිවිය යුතු බව ලිබරල්වාදීන් තර්ක කරන අතර නීතිය ඉදිරියේ සමානාත්මතාවයක් හා සමාන පුරවැසිභාවය ද ස්ත්‍රියට හිමි විය යුතු බව අවධාරණය කරනු ලබයි.

පශ්චාත් නූතනවාදය තුළ ස්ත්‍රීවාදී රැඩිකල් අදහස් ප්‍රතික්ෂේප කරන අතර ස්ත්‍රීන් සම්බන්ධව විශ්වීය තත්ත්වයක් පැවතිය නොහැකි බව තර්ක කරනු ලබයි. විවිධත්වය සැලකිල්ලට ගැනීම මෙම ප්‍රවේශයේ සුවිශේෂ ලක්ෂණයකි. වර්ණය, වර්ගය, වෘත්තිය හා සංස්කෘතිය සැලකිල්ලට ගෙන ස්ත්‍රී-පුරුෂ භාවය විශ්ලේෂණය කළ යුතු බව ඔවුන්ගේ අදහස විය. සමාජයට වඩාත් සාධාරණ යුක්තිගරුක අයිතිය අවධාරණය කරනු ලබන අතර ඒ අනුව ස්ත්‍රියට ආවේණික

විශේෂිත වූ අවශ්‍යතා ආමන්ත්‍රණය කළ යුතු බව දක්වයි. ලෝකයේ බොහෝ රටවල්වල මෙම ක්‍රමය ප්‍රායෝගික හඳුනාගත හැකි අතර වෛද්‍ය හෙද හා කර්මාන්ත අංශය වැනි වෘත්තීන් ආශ්‍රිතව මෙම ක්‍රමය ප්‍රායෝගික ව දැක ගත නොහැකි වෙයි. ඒ අනුව යම් රටක සංවර්ධනය කිරීමෙහි ලා එරට ස්ත්‍රීවාදයෙහි බලපෑම හඳුනාගත හැකිය.

නූතන සමාජ දේශපාලනික න්‍යායන් අතර ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව නවක සංකල්පයක් වශයෙන් පිළිගනී. විවිධ ප්‍රවේශයන් ගණනාවක් සහිත සංකීර්ණ සංකල්පයක් වන ස්ත්‍රීවාදය තුළින් කාලීන, අවකාශීය හා ස්ථානීය වශයෙන් පුරුෂ කේන්ද්‍රීය ස්වභාවයට අභියෝග එල්ල කරනු ලබන අතර ස්ත්‍රීවාදය වඩාත් පුළුල් මෙන්ම කාලානුරූපිව පරිණාමය වීම හඳුනා ගත හැකි ය.

එසේ ම ස්ත්‍රීවාදී ප්‍රවේශය භූගෝල විද්‍යාත්මක සංකල්ප ඔස්සේ සැලකිල්ලට ලක් කරනු ලබන අතර 2016 දී ඩික්සන් සහ ජෝන්ස්ට අනුව ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව මූලික වශයෙන් කාන්තාවගේ පීඩන ප්‍රභව හඳුනාගැනීම තුළින් ස්ත්‍රීවාදයෙහි ගතිකත්වය හා අවකාශය පිළිබඳ අවබෝධය වර්ධනය වීම පිළිබඳ සැලකිලිමත් වී තිබේ

ස්ත්‍රී-පුරුෂ සමාජ, ආර්ථික, දේශපාලනික සමානාත්මතාවය පිළිබද විශ්වාසය බොහෝ දුරට බටහිරින් ආරම්භ වුව ද ලොව පුරා කාන්තාවගේ අයිතිවාසිකම් හා අවශ්‍යතා වෙනුවෙන් ඉදිරිපත් වූ සංකල්පයක් වශයෙන් ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව පෙන්වාදිය හැකිය. එසේම කාන්තා හිංසනය අවම කිරීමේ ව්‍යාපාරය වශයෙන් ද ස්ත්‍රීවාදය හඳුනාගත හැකිය.

ස්ත්‍රී-පුරුෂ සමාජ ක්‍රමය මත පවුලක ප්‍රධානියා පුරුෂයා වශයෙන් හඳුනාගන්නා අතර ශ්‍රී ලංකාව ඉන්දියාව වැනි රටවල් රටවල කාන්තාවට පවතින පීඩනය පිළිබඳ අවකාශීය වශයෙන් අධ්‍යයනය කරනු ලබයි. තවදුරටත් කරනු ලබන කාර්යය මත පිහිටා ස්ත්‍රී-පුරුෂ භාවය හඳුනාගත හැක. විශේෂයෙන් ස්ත්‍රී-පුරුෂ භාවය තුළ සමාජ විෂමතාවයන් ඇති කරනු ලබයි. ලෝකයේ බටහිර සංස්කෘතියක් පවතින එංගලන්තය, ඇමෙරිකාව, කැනඩාව වැනි රටවල කාන්තාවන් ආදායම් ඉපයීමේ හැකියාවෙන් යුක්ත වීමත්, අරාබි සංස්කෘතියක් පවතින පකිස්තානය, ඕමානය ආදී රටවල කාන්තාවන්ට රැකියාවන්හි නිරත වීමේ අවකාශ අවම වීමත් ආදී වශයෙන් වු සමාජ ආර්ථික විෂමතා ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාත්මක සංකල්ප ඔස්සේ අවධාරණය කරනු ලබයි. තුන්වන ලෝකයේ කාන්තාවන්ට තම ආදායම් ඉපයීමේ හැකියාව සඳහා පවතින හැකියාවන් ද අවධාරණය කරනු ලබයි.

භූගෝල විද්‍යාව තුළ පැහැදිලිව ම ස්ත්‍රීවාදී ප්‍රවේශයට අවශ්‍ය පදනම සපයනු ලබයි. ඒ අනුව ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව තුළ ස්ත්‍රී පුරුෂ අසමානතාවය සහ එහි ස්වභාවය අවධාරණය කරනු ලබයි. විශේෂයෙන්ම සමාජ, සංස්කෘතික හා ස්ථානීය වශයෙන් ද ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාවේ ලක්ෂණ අධ්‍යයනය කළ හැකිය. භූගෝල විද්‍යාවේ දී පැහැදිලි ලෙසම කරනු ලබන කාර්යය මත පිහිටා ස්ත්‍රිය

හඳුනා ගනු ලබයි. ඒ අනුව සාර්ව හා ක්ෂුද්‍ර මට්ටමේ දී කාන්තාවගේ කාර්යයන්හි විවිධත්වයක් හඳුනාගනු ලබයි.

විශේෂයෙන් ගම, නගරය අතර කාන්තාවගේ කාර්යයන්හි විවිධත්වයක් පවතින අතර ශ්‍රී ලංකාවේ මීමුරේ, කොහොනාවල ආදී ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන් තවමත් ඔවුන්ට ආවේණික කාර්යයන්වල නිරත වීම හඳුනාගත හැකිය. නමුත් නාගරික ප්‍රදේශ ආශ්‍රිතව කාන්තාවන් රැකියාවල නිරත වීම, ආදායම් ඉපයීම හඳුනාගත හැකිය. එසේම ආගමික හා සංස්කෘතිකමය කාරණා හේතුකොට ගෙන කොට ගෙන ද කාන්තාවගේ කාර්යන්හි විවිධත්වයක් හඳුනා ගත හැකි ය. විශේෂයෙන් ඉස්ලාම් රාජ්‍යයන්වල කාන්තාවන්ට ආර්ථික කටයුතුවල නිරත වීම සඳහා අවස්ථාවක් නොපවතී. ඒ අනුව භූගෝල විද්‍යාත්මක සංකල්ප ඔස්සේ අවකාශීය වශයෙන් ස්ත්‍රීවාදී ප්‍රවේශය පිළිබඳ අවධානය යොමු කළ හැකිය.

එසේම ශ්‍රී ලංකාව, ඉන්දියාව ආදී පිතෘ මූලික සමාජ ක්‍රමයක් පවතින රටවල් ආශ්‍රිතව කාන්තාවන්ගේ කාර්යන්හි අවකාශීය විවිධත්වයක් පවතී. විවිධ ආගමික, සමාජ, සංස්කෘතික සාධක පදනම් කරගනිමින් ස්ත්‍රී-පුරුෂ සබඳතාවයෙහි වෙනස්කම් හඳුනා ගනු ලබයි. එසේම භූගෝල විද්‍යාත්මක ප්‍රවේශයකින් ස්ත්‍රීවාදය අධ්‍යනය කිරීමේ දී කලාපීය වශයෙන් විවිධත්වයක් පවතී. විශේෂයෙන්ම පෙරදිග රටවල කාන්තාවන් සාම්ප්‍රදායික ආගමික සංස්කෘතික, සමාජීය ලක්ෂණවලට අනුගතව කටයුතු කරන නමුත් යුරෝපානු කලාපය ආශ්‍රිත බටහිර රටවල් තුල කාන්තාවගේ කාර්යයනහි විවිධත්වයක් ඇත. ඒ අනුව උසස් අධ්‍යාපනය, රැකියාවන්හි නිරත වීම සමාජ හා දේශපාලන කටයුතු ආශ්‍රිතව කාන්තාවගේ දායකත්වය පැහැදිලිව හඳුනාගත හැකිය.

මේ අනුව ස්ත්‍රිවාදී භූගෝල විද්‍යාව කාන්තාව හා පුරුෂයා අතර පවතින සමාජ ආර්ථික දේශපාලනික විෂමතාවන් කවරේ ද? ඒ ඔස්සේ කාන්තාවට ඇති අභියෝග ක්‍ෂානවා ද? එම අභියෝගයන් අවම කිරීම සඳහා ගන්නා විකල්පයන් මොනවා ද? ආදී වශයෙන් වූ විද්‍යාත්මක ප්‍රශ්න ආමන්ත්‍රණය කරමින් ස්ත්‍රී පුරුෂ සමාජ විෂමතාව මත කාන්තාවන් මුහුණ දෙන ගැටලු හා අභියෝග පිළිබඳවත් එම ගැටලු අවම කර ගැනීම සඳහාත් භූගෝල විද්‍යාත්මක දෘෂ්ටියකින් යුක්ත ව කටයුතු කරනු ලබයි.

බටහිරින් ආරම්භ වූ ස්ත්‍රීවාදී සංකල්පය අවකාශීය සංවර්ධන ක්‍රියාවලියේ දී වැදගත් කොට සැලකේ. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ දෙකොට්ඨාසයේ ම ඒකීය සහභාගිත්වය රටක සංවර්ධන ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය වන අතර ඒ අනුව ස්ත්‍රි පුරුෂ සාධාරණත්වයෙන් යුක්ත සියලු දෙනාගේම අවශ්‍යතා හා අදහස් මැනවින් නියෝජනය වන ආකාරයේ අයිතිවාසිකම් සහිත සමාජයක් නිර්මාණය කිරීම සඳහා ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාත්මක සංකල්ප වැදගත් ය. විශේෂයෙන්ම සමස්ත ලෝකයේ සමාජ, ආර්ථික ,දේශපාලනික ප්‍රවාහයන් කෙරෙහි ස්ත්‍රියගේ මැදිහත් වීම වැදගත් වේ. විශේෂයෙන් දේශීය හා විදේශීය වශයෙන් මේ සඳහා ප්‍රමාණවත් අයිතිවාසිකම් ස්ත්‍රීන්ට හිමි වී ඇති බව අවකාශීය වශයෙන්

හඳුනාගත හැකි නමුත් ප්‍රායෝගිකව පුරුෂයන්ට සාපේක්ෂව ගෝලීය සමාජ, ආර්ථික, දේශපාලනික ක්‍රියාවන් කෙරෙහි කාන්තාවගේ දායකත්වය සඳහා පවතින ඉඩ ප්‍රස්ථාව ඉතාමත් අවම ය. මේ අනුව ස්ත්‍රී-පුරුෂ සාධාරණත්වය ඇතිකිරීම සඳහා ආකල්පමය වශයෙන් වෙනසක් ඇති කිරීම වැදගත්ය. අවකාශීය වශයෙන් සිදුවන ඕනෑම සංවර්ධන ක්‍රියාවලියක් තුළ ස්ත්‍රී-පුරුෂ භේදයකින් තොර ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සහභාගීත්වය සහිත රටක මූලික තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව පවතින අතර ස්ත්‍රී-පුරුෂ සමාජ විෂමතා හඳුනා ගැනීමට ස්ත්‍රීවාදී න්‍යායන් හා ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාත්මක සංකල්ප පිළිබඳව අවධානය යොමු කිරීමත් ඒ ඔස්සේ පුරුෂයන් හා සමානව ම කාන්තාවට ද සමාජ, ආර්ථික, දේශපාලනික කාර්යයන්හි නිරත වීමේ හැකියාව පවතින බව ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව තුළ අවධාරණයට ලක් කෙරේ.

මේ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය පදනම් කරගනිමින් පුරුෂයන් හා සාපේක්ෂ ව ස්ත්‍රීන් කෙරෙහි පවතින සමාජ අසාධාරණත්වය හේතු කොට ගෙන කාන්තාව සමාජයේ අවම වරප්‍රසාද ලබන තත්ත්වයකට පත් වී තිබේ. ඒ අනුව කාලීන, අවකාශීය, ස්ථානීය වශයෙන් ස්ත්‍රියට සමාජ ආර්ථික දේශපාලනික වශයෙන් මුහුණ දීමට සිදුවන ගැටලු හා ස්ත්‍රීවාදයේ අවකාශීය විෂමතාවයන් ස්ත්‍රීවාදී භූගෝල විද්‍යාව ඔස්සේ අධ්‍යයනය කරනු ලබන අතර එම ගැටලු අවම කර ගනිමින් සංවර්ධන ක්‍රියාවලිය තුළ ස්ත්‍රියගේ දායකත්වය වැදගත් වන බව පෙන්වා දී තිබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Researchguides.dartmouth.edu. 2021. Research Guides: Human Geography: Feminist geography. [online] Available at: <https://researchguides.dartmouth.edu/human_geography/feminist> [Accessed 27 August 2021].

Search.library.dartmouth.edu. 2021. [online] Available at: <https://search.library.dartmouth.edu/discovery/fulldisplay?docid=alma991033588233805706&context=L&vid=01DCL_INST:01DCL&lang=en&search_scope=avail_online_all&adaptor=Local%20Search%20Engine&tab=All&query=sub,exact,feminist%20geography,AND&sortby=rank&mode=advanced&pfilter=lang,exact,eng,AND&pfilter=rtype,exact,books,AND&offset=0> [Accessed 27 August 2021].

Taylor & Francis. 2021. Is Feminist geography relevant?. [online] Available at: <https://doi.org/10.1080/14702549908553822> [Accessed 27 August 2021].

McDowell, L., 1992. Doing Gender: Feminism, Feminists and Research Methods in Human Geography. Transactions of the Institute of British Geographers, 17(4), p.399.

2021.[online] Available at: < https: // www. researchgate. net /publication/ 338750812_2009_ISBN_978-955-652-439-4> [Accessed 27 August 2021].

Ukessays.com. 2021. Theories of Feminist Geography. [online] Available at: <https://www.ukessays.com/essays/geography/theories-feminist-geography-7827.php> [Accessed 27 August 2021].

ලියනගේ, කමලා සහ තවත්, 2006, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ෆෙඩ්‍රික් ඊබට් පදනම, ඇඩම්ස් පටුමග, කොළඹ 4.

# ස්ත්‍රියට නිසිතැන

ඒ.ඩබ්.සී.එස්. වීරතුංග

කාන්තාව යනු, මානව සංහතියේ පැවැත්ම තීන්දු කරන්නියයි. දසමසක් පුරා කුස තුළ දරා සිටිනුයේ ද මෙලොව එළිය දකින ඒ පණනලට ජීවය ලබාදෙනුයේ ද ගැහැණියයි. මැක්සිම් ගෝර්කි දක්වන පරිදි ලෝකය නිර්මාණය වී ඇත්තේ හිරුගේ රැස්වලින් සහ මවගේ කිරිවලිනි. එය සාවද්‍ය නොවන්නේ මිහිපිට පවත්නා සෑම ජීවී පරම්පරාවක්ම මවකගේ උණුසුම මැද මවගේ ස්නේහයේ සාරය උරාගෙන ශක්තිමත් වෙමින් සුවිසල් ලෝකයට පා තබන බැවිනි.

බුදු දහම තුළ කාන්තාව අතිශය ගෞරවයට පාත්‍රවන්නේ උතුම් වූ මාතෘත්වය හේතු කොටගෙනය. සංයුක්ත නිකායේ ආවේණික දුක්ඛ සූත්‍රයට අනුව ස්ත්‍රිය යොවුන් වියේදීම පතිකුලයට යාමට සිදුවීම නෑදෑයන්ගෙන් වෙන්ව වාසය කිරීමට සිදුවීම, මාසික ඍතුවීම, ගැබිණියක ලෙසින් දුක් විඳීමට සිදුවීම, දරු උපතකට මුහුණ දීමට සිදුවීම හා පුරුෂයෙකුගේ අත් පා මෙහෙවර කිරීමට සිදුවීම යන ආවේණික දුක්වලට උපතින්ම උරුමකම් කියන්නී ය. එනමුත් මහමෙර තරම් බාධා මැද කාන්තාව ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී සිටිනුයේ ඇ සතු ආධ්‍යාත්මික ශක්තිය නිසාය. කාන්තා උදාරතර පෞරුෂයන්ට නිදසුන් බෞද්ධ සාහිත්‍යය, හෙළ ඉතිහාසය තුළ හඳුනාගත හැකිය. කාන්තාවට විවිධ සමාජවල විවිධ අර්ථකතන ලබා දී තිබුණ ද ඇයට සමකළ හැකි ජීවයක් මිහිපිට තවත් නොමැත. කාන්තාව විටෙක මවක්, විටෙක සොයුරියක්, විටෙක මිතුරියක්, විටෙක ප්‍රේමවන්තියක්, විටෙක බිරිඳක් ලෙසින් ජීවන චක්‍රයෙහි හරය බවට පත් වී ඇත්තේය.

කාන්තාව එවන් වූ අසමසම චරිතයක් නම් ජීවිතය තුළ ඇයට හිමිවිය යුතු අගනාකම් හා වටිනාකම් නොලැබී ඇත්තේ කුමන කරුණක් පදනම් කරගනිමින් ද යන්න විමසා බැලිය යුතුය. එමෙන්ම කාන්තාව සමාජය තුළ කුමනාකාරයෙන් නිරූපණය වුව ද සම තැන නොලැබුණ ද නිසි තැන පවා අහිමි වන යුගයක් වත්මනෙහි එළැඹී ඇත්තේ මක්නිසා වෙන්ද යන්න අවධානයට බඳුන් වන කරුණකි. කාන්තාව ආර්ථිකය, දේශපාලනය, අධ්‍යාපනය හා සමාජ සංස්කෘතිය තුළ කුමනාකාරයෙන් නියෝජනය වන්නේද යන්න මත කාන්තාවට වත්මන් සමාජය තුළ හිමිවිය යුතු තැන හඳුනාගැනීමේ වගකීම සමාජය මත පැටවී ඇත. කාන්තාව අර්ථකතනය කිරීමේ දී වසරේ දින 365න් එක් දිනයක් හෝ පමණක් 'කාන්තා දිනය' ලෙස සුවිශේෂ වන්නේ කාන්තා අයිතිවාසිකම් අරගලයේ තවත් එක් මරමස්ථානයක් ලෙසිනි. 1909 දී ප්‍රථම වරට 'ජාතික කාන්තා දිනය' පෙබරවාරි 28 දින සමරනු ලැබීය. එය පසුව 'ජාත්‍යාන්තර කාන්තා දිනය' ලෙසින් නම් වූ අතර වර්තමානයේ ග්‍රෙගෝරියන් දින දර්ශනයට අනුව සෑම වසරකම 'මාර්තු 08' දින සමරනු ලබයි. කෙසේ නමුත් මානව ජීවිතය පුරාවට ශක්තියක් වන කාන්තාව

කාන්තා දිනය තුළ පමණක් කාන්තාව සුවිශේෂ වී සැමරුම් වැඩසටහන් පැවත්වනු දක්නට ලැබීම කණගාටුවට කරුණකි.

ඩයනි මේරිචයිල්ඩ් විසින් අර්ථකතනය කරන ලද 'කාන්තාව යනු පූර්ණ චක්‍රයකි. ඇය තුළ නිර්මාණය කිරීමේ, රැකබලා ගැනීමේ හා වෙනස් කරීමේ හැකියාව ඇත' යන්න කාන්තාවකගේ පරිපූර්ණත්වය උකහා දක්වයි. සමාජීය අත්දැකම් ඇසුරෙන් දක්වන්නේ නම් 'පිරිමියෙකුගේ සාර්ථකත්වයේ පිටුපසින් සිටිනුයේ කාන්තාවයි' යන්න ගෝලීය වශයෙන් මුලුබැස ගත් සමාජ සිතුවිල්ලකි. එනමුත් කාන්තාවකගේ සාරය මතින්ම ගොඩනැගුණු සමාජය පුරුෂාධිපත්‍යයේ හිණි පෙත්තටම යමින් කාන්තාව තම දෙපතුලෙහි රඳවා ඇත.

**ස්ත්‍රී-පුරුෂභාවය සහ කාන්තාව**

ස්ත්‍රී-පුරුෂභාවය යන්නෙන් අදහස් කරනුයේ පුද්ගලයෙක් පිරිමියෙක් ද ගැහැණියක් ද යන්නයි. ලෝක සංවර්ධන වාර්තාවට අනුව ස්ත්‍රී-පුරුෂභාවය යන්න අර්ථ දැක්වෙනුයේ පුරුෂයන්ගේ සහ ස්ත්‍රීන්ගේ හැසිරීම හා ක්‍රියාවන් තීරණය කරන සමාජයීයව ගොඩනගන ලද සම්මතයන් සහ මතවාදයක් ලෙසය. මෙම ස්ත්‍රී-පුරුෂභාවය බල ගතිකත්වය අවබෝධ කරගැනීම, පුද්ගලයන්ගේ සම්පත් ප්‍රවේශය හා බෙදාහැරීම, තීරණ ගැනීමේ හැකියාව සහ දේශපාලන ක්‍රියාවලින්ගෙන් හා සමාජ සංවර්ධනයෙන් කාන්තාවන් සහ පුරුෂයන් බලපෑමට ලක්වන ආකාරය අවබෝධ කරගැනීම සඳහා පූර්වාවශ්‍යතාවකි. එමෙන්ම ස්ත්‍රී-පුරුෂභාවය යනු කාලය, අවකාශය සහ සංස්කෘතිය අනුව වෙනස් විය හැකි සමාජ නිර්මාණයකි. ස්ත්‍රී-පුරුෂභාවය යන්න තුළ ගැහැණියක් ද පිරිමියෙක් ද යන්න හඳුනාගැනීම සඳහා ප්‍රධාන නිර්ණායක 3ක් භාවිතයට ගනු ලබයි.

01. ලිංග භේදය

02. දේහ ලක්ෂණ විද්‍යාත්මක පදනම

03. කරනු ලබන කාර්යය මත

ලිංග භේදය අනුව ස්ත්‍රී-පුරුෂභාවය තීරණය කිරීමේ දී ලිංගික අවයවයේ පිහිටීම මත යමෙක් පුරුෂයෙක් ද ස්ත්‍රියක් ද යන්න හඳුනාගනී. ඕනෑම පුද්ගලයෙකු මෙලොවට බිහිවන අවස්ථාවේ දී ලිංගික අවයවයේ පිහිටීම මත පිරිමියෙක් ද ගැහැණියක් ද යනුවෙන් වෙන් කර ගත හැකිය. ලිංගිකත්වය යනු මූලික වශයෙන් ප්‍රජනන විභවය මත පදනම් වූ ජීව විද්‍යාත්මක වර්ගීකරණයකි. ස්ත්‍රී-පුරුෂභාවය යනු එම ජීව විද්‍යාත්මක වර්ගීකරණයේ සමාජ විකාශනයයි. දේහ ලක්ෂණවල පිහිටීම මත සහ හැසිරීම මත පුද්ගලයෙකු ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන්න වෙන්කර හඳුනාගැනීම සිදුකරයි. පුරුෂයෙකුට අදාළ දේහ ලක්ෂණ ලෙස උඩු සහ යටි රැවුල් පිහිටීම, හැඩි දැඩි බව, රළු කටහඬ, රළු හම යනාදි වූ දේහ ලක්ෂණවලින් යම් පුද්ගලයෙක් සමන්විත වන විට ඔහු පිරිමියෙකු වශයෙන් හඳුන්වයි. ස්ත්‍රියකට අදාළ දේහ ලක්ෂණ ලෙස සියුමැලි හඬ, ලාලිත්‍ය ගමන, මටසිලිටු හම, පළල් වූ ලැම ප්‍රදේශය යනාදි වූ දේහ ලක්ෂණවලින් යම් පුද්ගලයෙක් ස්ත්‍රියක ලෙස හඳුනාගනු ලබයි. මෙම දේහ ලක්ෂණවල පිහිටීම මත

යම් පුද්ගලයෙක් දුටු සැනින් දර්ශන මාත්‍රයෙන් එම පුද්ගලයා ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන්න ප්‍රකාශ කළ හැකිය.

උක්ත නිර්ණායක ද්විත්වය ලිංගිකත්වය හා දේහ ලක්ෂණ විද්‍යාව මත ස්ත්‍රී පුරුෂභාවය හඳුනාගැනීමට එතරම් මතභේදයට තුඩුදෙන කරුණක් නොවන්නේ එම නිර්ණායක ස්වභාවධර්මයේ දායාද වන නිසාය. එනමුත් තෙවන නිර්ණායකය ලෙස ගනු ලබන කාර්යය මත ස්ත්‍රී-පුරුෂභාවය හඳුනාගැනීම විවිධ සමාජ සංස්කෘතීන් අනුව තීරණය වන්නක් බැවින් විවිධ විද්වතුන් තුළ මේ සම්බන්ධයෙන් මතභේද හටගෙන තිබේ. ඒ අනුව කරනු ලබන කාර්යය මත පිහිටා ස්ත්‍රී පුරුෂභාවය වෙන් කිරීම වඩාත් වැදගත් වන්නකි. කරනු ලබන කාර්යය මත පිහිටා ස්ත්‍රී-පුරුෂභාවය හඳුනාගැනීමේ දී ප්‍රධාන වනුයේ කරනු ලබන කාර්යයයි. සාම්ප්‍රදායික වශයෙන් ගැහැණියට හා පිරිමියාට ආවේණික වූ කාර්යයන් වෙන්ව පැවතුණ අතර එම කාර්යය එකිනෙකට වෙනස්ය. එකී වෙනස මත ස්ත්‍රියක් ද පුරුෂයෙක් ද යන්න තීරණය කළ හැකි විය. ඒ අනුව පුරුෂයාට ආවේණික කාර්යයන් ලෙස රැකියාවන්හි නියැලීම, ආදායම් ඉපයීම, ඒ සඳහා අවශ්‍ය නම් නිවසින් පිට රැකියාවක් සඳහා පිටත්ව යාම, සිය පවුලට ආරක්ෂාව සැපයීම වැනි කාර්යයන් මත පුරුෂයා හඳුනාගත හැකිවිය. ස්ත්‍රියට අයත් කාර්යයන් ලෙස ප්‍රජනන ක්‍රියාවලියේ යෙදීම, දරුවන් බිහිකිරීම, දරුවන් රැකබලා ගැනීම, නිවසේ ඉවුම් පිහුම් කටයුතුවල නියැලීම, සිය පවුලට ආදරය, කරුණාව, දයාව දැක්වීම, නිවසින් පිට දුර පෙදෙස්වල රැකියාවල නොයෙදීම ආදි කාර්යයන් ස්ත්‍රියට සුවිශේෂ මෙන්ම ආවේණික වේ.

එමෙන්ම ස්ත්‍රී-පුරුෂභාවය තුළ කාන්තාවකගේ වටිනාකම පැහැදිලි කිරීමට බොහෝ සංකල්පයන් බිහි වී ඇත. පිතෘ මූලික සමාජය සහ මාතෘත්වය පමණක් සීමා වූ සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කරනු ලබන න්‍යාය වනුයේ රැඩිකල්වාදී ස්ත්‍රීවාදී ප්‍රවේශයයි. රැඩිකල්වාදීන්ගේ මූලිකම අදහස් වනුයේ සම්ප්‍රදායික සමාජයක් තුළ ස්ත්‍රියක් මාතෘත්වය සහ දරුවන් රැකබලා ගැනීම සහ රාමුවට කොටුකර පුරුෂාධිපත්‍ය පසුබිම යටතේ ස්ත්‍රිය සිරකර තබන බවයි. ස්ත්‍රියකගේ කාර්යය මාතෘත්වය සහ දරුවන් රැකබලා ගැනීමට පමණක් සීමා නොවිය යුතුය යන්න රැඩිකල්වාදි ස්ත්‍රීවාදී ප්‍රවේශය තුළ අවධාරණය කර ඇත. පිතෘ මූලික සමාජය පැහැදිලිවම ප්‍රතික්ෂේප කරන ලදි. ස්ත්‍රියට සම අයිතීන් හිමිවිය යුතු බව ලිබරල්වාදීන්ගේ දර්ශනය විය. ඒ අනුව විශේෂයෙන්ම පුරුෂයාට මෙන්ම දේපළ වත්කම් අයිති කරගැනීමේ බලය හෙවත් අයිතිය ස්ත්‍රියකට ද හිමිවිය යුතුය යන්න අවධාරණය කෙරිණි. ස්ත්‍රියට ද වත්කම් මිල දී ගැනීම, වත්කම් පරිහරණය, ඒවා පවත්වාගෙන යාම ආදි අයිතීන් සමව හිමි විය යුතුය යන්න ලිබරල්වාදීන් පැහැදිලිවම පෙන්වා දුනි.

පශ්චාත් ව්‍යුහාත්මකවාදීන් ස්ත්‍රීවාදී ප්‍රවේශයට සහයෝගී නොවන්නන් ලෙස විවරණය වනුයේ ඔවුන් සම අයිතියට වඩා සාධාරණ හෙවත් යුක්ති ගරුක අයිතිය යන සංකල්පය අවධාරණය කරන බැවිනි. ඒ අනුව ඔවුන් පෙන්වා දෙනුයේ ස්ත්‍රියට ආවේණික වූත්, විශේෂිත වූත් අවශ්‍යතා ආමන්ත්‍රණය කළ යුතු බවය. පශ්චාත් ව්‍යුහාත්මකවාදීන් අවධාරණය කරනු ලැබූ කරුණක් නම් මාතෘත්වය

යන්න ස්ත්‍රියට ආවේණික වූ සංකල්පයක් වන බැවින් වැඩපල තුළ පුහුණු, නිවාඩු ලබාදීම වැනි දේ කෙරෙහි සාධාරණ අයිතිවාසිකම් ඇයට හිමිවිය යුතුය යන්නයි. එමෙන්ම රැකියා වැඩපළෙහි කාන්තාවට ඇති අයිතියට වඩා සාධාරණ හා යුක්තියක් ස්ත්‍රියට හිමිවිය යුතුය යන්න මෙම පශ්චාත් ව්‍යුහාත්මකවාදීන් අවධාරණය කළ තවත් කරුණකි. කාන්තාව තම ජීවිතය තුළ ඉටු කරනු ලබන කාර්යයන් පුරුෂයෙකු විසින් කරනු ලබන කාර්යයන් ප්‍රමාණයට වඩා වැඩි බව පර්යේෂණ මගින් තහවුරු වී ඇත. අත් පවතින්නේ නම් දහදෙනෙකුගේ වැඩ නිවසේ මව විසින් කරනු ලබන බව සියලු දෙනාම පිළිගනු ලබන මතයකි. කාන්තාවට හිමිවිය යුතු ස්ථානය නොලැබී ඇත්තේ පුරුෂාධිපත්‍යයේ අදහස්වලට වහල් වූ සමාජීය ආකල්ප අදහස් ඔස්සේද නැතිනම් කාන්තාව විසින්ම සමාජයට බියෙන් තමාටම පණවාගත් සීමාවන් නිසාද යන්න ගැටලුවකි.

## අතීත කාන්තාව සහ වර්තමාන කාන්තාව

ක්‍රිස්තු පූර්ව 2500 පමණ කාලයේ දී ඉන්දු ගංගා ශිෂ්ටාචාරය තුළ පැවත ඇත්තේ මාතෘ මූලික සමාජ ක්‍රියාවලියකි. නමුත් මධ්‍යතන යුගය වන විට එය පුරුෂෝත්තම යුගයක් බවට පත් වීය. අතීත වර්තමාන ලෙසින් භේදයක් නොමැතිව කාන්තා පෞරුෂය අඩු වැඩි වශයෙන් පීඩාවට පත් කරමින් එල්ල කරනු ලබන පීඩාව මුලිනුපුටා දැමීම කාලීන අවශ්‍යතාවයක් බවට පත් වී ඇත්තේය. කාන්තාවට සමාජය තුළ සම්පත්, අයිතීන් සඳහා පෙනී සිටීම, තීරණ ගැනීමේ ක්‍රියාවලිය, නිදහස, සහභාගී වීම, පිළිගැනීම, අවස්ථා මේ ආදි වූ සියලු සමාජ තත්ත්වයන් අවහිර වී ඇත්තේ පුරුෂ මූලික සමාජ අදහස් මත පැරණි නූතන යැයි වෙනසක් නොමැතිව මානව සමූහයා එළඹගෙන සිටින බැවිනි. 1979 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇත කරගත් ස්ත්‍රීන්ට එරෙහි සියලු ආකාර වෙනස්කම් පිටු දැකීමේ සම්මුතියයේ 5වන වගන්තිය යටතේ කාන්තාවන්ට එරෙහිව පවත්නා දූර්මත සහ අදහස් අහෝසි කිරීමේ වැදගත්කම පෙන්වා දී ඇත. ඒ අනුව යම් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සම්බන්ධ ස්ථාපිත ආදර්ශ (Gender stereotypes) මත පිහිටා සමාජය කටයුතු කිරීම මගින් ස්ත්‍රියකගේ උත්තරීතර චරිතය පාගා දමන බව දක්වා ඇත. මානව සංහතියේ පැවැත්ම කාන්තාවගේ උරහිස මත පැට වී තිබුණ ද ඇත අතීතයේ පටන් කාන්තාව පුරුෂයාගේ යටත් වැසියෙකු බවට පත් වී තිබුණි.

හෙළ සාහිත්‍ය තුළ කාන්තාව යනු සුන්දර වස්තුවකි. බොහෝ හෙළ පද්‍ය ගද්‍ය නිර්මාණ සඳහා කාන්තාවගේ සුන්දරත්වය වස්තු විෂය වී ඇත. එනමුත් ඓතිහාසික සන්දර්භයන් විමසා බලන කල්හි ග්‍රීක දාර්ශනික සොක්‍රටීස් දක්වනුයේ 'කාන්තාවන් සිටීම ලොව පරිහානියට ප්‍රබල හේතුකාරකයක් වේ. තවද කාන්තාව යනු විෂ ගසකට සමානය. එම ගසේ බාහිර ස්වරූපය අලංකාර වේ. නමුත් එහි ඵලය බට්ටිත්තන් කෑ විගසම එම බට්ටිත්තන් මියැදෙයි' යනුවෙනි. වේද සාහිත්‍යයට අනුව කාන්තාව යනු සියලු විෂ කලතා තැනූ මායාව නැමැති කරඬුවකි. රෝම සංස්කෘතිය කාන්තාව පණ නැති වස්තුවක් බවට අර්ථකතනය කර ඇති අතර කාන්තාව සදාකාලිකවම භාරකාරයෙකුගේ පාලනයට යටත් විය යුතු විය. ඉන්දියානු සංස්කෘතිය තුළ තම ස්වාමියා මිය ගිය විට කාන්තාව සති පූජාව තුළ දී ම තම ජීවිතය නසා ගත යුත්තේ ගිණි සැයට පැනය. චීන ජාතිකයන්

කාන්තාව ධනයත් භාග්‍යයත් අහිමි කරවන දුර්භාග්‍යමත් කාරණයක් ලෙසින් සලකා ඇත. එමෙන්ම සිල්ලට විපත් ගෙනෙන ජලයට කාන්තාව සමාන කර ඇත. අතීත චීන රජය චීන ජාතිකයන්ට කාන්තාව පණ පිටින් වළලන්නටත් විකුණන්නටත් සම්පූර්ණ අයිතිය ලබා දී තිබුණි. කාන්තාව විසින් ආදම්ව නොමග යවා තහනම් ගසෙහි ගෙඩි කන්නට සැලැස්වීමේ ප්‍රතිඵලයක් ලෙසින් මිනිස් සමාජය බිහි වී දුක් විඳින්නට සිදු වී ඇති බව විශ්වාස කරන ලද්දේ යුදෙව් ජාතිකයන් විසිනි. එමෙන්ම කාන්තාව ස්වභාවයෙන්ම අපරිසිදු මැවීමක් බවත් ඇය සිටින නිවසත් ඇයගේ ස්පර්ශයට හසුවන සියල්ලමත් අපිරිසිදු වන බවත් සියලු ආකාරයේ පාපයන්ට උරුමකම් කියන්නියක් වශයෙන් ද යුදේව් ජාතිකයන් කාන්තාව හඳුන්වා ඇත. ක්‍රිස්තියානිවරුන් අතීතයේ දී කාන්තාව ෂෙයිතාන්ගේ (නපුරෙහි) දොරකඩ ලෙසින් නම් කර තිබුණි.

එකී එක් එක් ආගම්, සංස්කෘතීන්, සමාජ කාන්තාව ස්ථානගත කර ඇත්තේ පුරුෂාධිපත්‍යයේ කෲර මනඃකල්පිත අදහස් ඔස්සේය. වර්තමානය වන විටත් ඉස්ලාමීය කාන්තාවගේ ජීවන ක්‍රියාකාරකම් තීරණය කරනු ලබන්නේ පුරුෂයා විසිනි. ඉස්ලාමීය කාන්තාව සම්පූර්ණ ඇඟ වැසෙන සේ කලු ලෝගුව ඇඳිය යුතුය. වයස අවුරුදු 12 දී ඉස්ලාමීය ගැහැනු දරුවන් විවාහ කරදෙනු ලබයි. අතීතය වර්තමානය කෙතරම් වෙනස් වුව ද ආගමික හණමිටි අදහස් නවීකරණය නොවන බවට කදිම නිදසුන නම් ඇෆ්ගනිස්ථානය තලේබාන්වරුන් පාලනයට නතු කරගැනීමෙන් අනතුරුව වයස අවුරුදු 13න් පසු ඇෆ්ගන් ගැහැනු දරුවන්ට අධ්‍යාපනය තහනම් වීමය. තලේබාන් බල අත්පත්කර ගැනීමත් සමග ලිංගික වහල් සේවයට කාන්තාවන් බලහත්කාරයෙන් යොමු කරගැනීම ඇෆ්ගන්ස්ථානයේ කාන්තා අයිතීන් හා සම්බන්ධ ප්‍රබල ගැටලුවකි. එමෙන්ම බුර්කාව පැළඳීම අනිවාර්ය කිරීමත් එසේ නොපළඳින කාන්තාවන් වෙඩි තබා ඝාතනය කිරීමත් ඇෆ්ගනිස්ථානයේ මෑත භාගයේ දී සිදු වූ සිදුවීම්ය. බටහිර සමාජය තුළ කාන්තාව තාඩන පීඩවලට ගොදුරු වීම අවමය. බටහිරකරණය සමග කාර්මීකරණය, ගෝලීයකරණය හා නවීකරණය වැනි සංකල්පයන් මත කාන්තාව බටහිර ලෝකය තුළ ස්වාධීන වී ඇත. වැඩවසම් අදහස් හා ආකල්ප මතින් නැගිට අනාගත ලෝකය කරා ස්වාධීනව පිය නැගීමේ අයිතිය කාන්තාව සතුවිය යුතුය.

දරුවන් රැකබලා ගැනීම, ස්වාමියාගේ සහ දරුවන්ගේ වැඩ කටයුතු ඉෂ්ට කිරීම හා නිවසේ සියලු වැඩ කටයුතු කළමණාකරණය කිරීම යන සීමාවට කොටු කර තැබූ අතීත කාන්තාව වර්තමානයේ තම ස්වාධීනත්වය හා නිදහස උදෙසා අරගල කරමින් සිටිති. වර්තමාන කාන්තාව තම අයිතීන් සඳහා සටන් කිරීමට කදිම නිදසුන නම් වර්තමානයේ සාපල්‍යතාවය තීරණය කරනු ලබන සාධක බවට ද්‍රව්‍යාත්මක බව, ප්‍රගතශීලී බව හා සමාජීය හුදෙකලා බව යන සාධකයන් පත්වීමය. ඉහළ යන මානව අවශ්‍යතා සහ සම්පත් සීමිත වීම සමග කාන්තාව ආවස්ථික පිරිවැය මත පිහිටා කටයුතු කිරීම හෙවත් විකල්ප කිහිපයක් අතරින් හොඳම විකල්පය තෝරාගැනීම ද්‍රව්‍යාත්මක බව නම් වේ. ප්‍රගතශීලී බව යනුවෙන් දක්වනුයේ ද්‍රව්‍යාත්මක බව අධ්‍යාපනික සහ ආර්ථික සවිබලගැන්වීම මත සාපල්‍යතාවය පමණක් නොව විවාහ වීම පවා කල් දැමීමය. වඩාත් සමාජයේ

හුදෙකලා බව ප්‍රිය කිරීම කාන්තා පාර්ශවය තුළ වර්තමානයේ හඳුනාගත හැකි ප්‍රබල ලක්ෂණයකි. මෙම සාධකයන් සාපල්‍යතාවයට බලපෑම් කිරීම මගින් රටක අනාගත සංවර්ධන නියමයන් අඩාල කරලයි. ඒ අනුව වර්තමාන කාන්තාව තම අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම නිසා අතීතයට සාපේක්ෂව කාන්තාව ස්වාධීන වී ඇත. බටහිර සංවර්ධිත රටවල කාන්තාවට සාපේක්ෂව සංවෙප හෙවත් සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාව පුරුෂාධිපත්‍යය යටතේ සීමා වී ඇත. විශේෂයෙන්ම අනෙකුත් රටවලට සාපේක්ෂව සංවෙප රටක් ලෙසින් ශ්‍රී ලංකාව සලකා බලන විට කාන්තාව තම සීමාබිඳ දමමින් සිටී. එයට බලපෑ හේතු සාධකයන් වන්නේ නිදහස් අධ්‍යාපනය, දේශපාලන මැදිහත්වීමේ හැකියාව, සෞඛ්‍ය අංශය මෙන්ම සමාජ සංස්කෘතික හර පද්ධතීන්වල හිමිකම ලැබීමය.

**කාන්තා සවිබලගැන්වීම හඳුනාගැනීම**

ලෝකය පුරා දහස් ගණනින් කාන්තා සංවිධාන බිහි වී තිබුණ ද තවමත් කාන්තාව සමාජ හර පද්ධතීන්ට යටත්ව සීමා වී ඇත. පුරුෂාධිපත්‍යය බලයේ නාමයෙන් කාන්තාව තමා යටතට ගනු ලබන පුරුෂයන් තවමත් සමකාලීන සමාජය තුළ ජීවත් වේ. කාන්තාව පුරුෂයන්ට වඩා කායික ශක්තියෙන් අඩු වුව ද ආධ්‍යාත්මික ශක්තියෙන් ඉතා ඉහළ බව සියලුදෙනා විසින්ම පිළිගන්නා වූ කරුණකි. එකී ශක්තිය ඔස්සේ නවීකරණය වූ කාන්තාව තම සීමා බිඳ සෑම අංශයකින්ම කළඑලි බැසීමට උත්සහ කරයි. එහි වැදගත්ම කරුණ වනුයේ කාන්තා සවිබලගැන්වීමය. සවිබලගැන්වීම යනු කුමක් ද යන්නට අර්ථවිවරණ සපයන සොලමන් (Soloman) 1976 දී ප්‍රකාශ කරනුයේ 'ස්වකීය ජීවිත කාලය පුරු ගර්භාවට පාත්‍ර වූ සමාජ වර්ගීකරණයකට අයත් පුද්ගලයන්ට සංවර්ධනයට හා අන්තර් පුද්ගල බලපෑම් කිරීම සහ වටිනා සමාජ භූමිකාවන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කුසලතා නැංවීමට උදව් කළ හැකි ක්‍රියාවලියකි' බවය. ස්ත්‍රීවාදී දෘෂ්ටිකෝණයෙන් බලන කල කාන්තා සවිබල ගැන්වීම යනු පුද්ගල මට්ටමෙන් සිදුවන පරිවර්තනයන් සහ කාන්තා යටත්වීමේ හා අදෘශ්‍යමාන තත්ත්වයන් ප්‍රතිනිෂ්පාදනය කරන සමාජ හා ව්‍යුහාත්මක ක්‍රියාවලීන්හි නවෝත්පාදනයන්ය. ආර්ථිකමය, සමාජමය, අධ්‍යාපනික කාන්තා සවිබලගැන්වීම අවශ්‍ය වනුයේ කාන්තාව හා සමතැන් ඉසිලීමට කිසිවෙකු නොවන බැවිනි. මවක, බිරිඳක විසින් කරනු ලබන කාර්යභාරය පුරුෂයෙකුට කළ නොහැකිය. මානව ජීවිතයේ විවිධ චරිත හොබවමින් කාන්තාව ලොවට බෙදා දෙනු ලබන ස්නේහය හා එම යුතුකම් වගකීම් ඉෂ්ට කිරීම අන් කිසිවෙකුට කළ නොහැකිය. එබැවින් කාන්තාව නිදහස් විය යුතුය. කාන්තා සවිබලගැන්වීම අත්‍යවශ්‍ය වනුයේ මන්ද යත් වත්මන් ලෝකය තුළ කාන්තාවන් හට ලැබිය යුතු නිසි ස්ථානය පවා අහිමි වෙමින් පවත්නා බැවිනි.

**ආර්ථිකය තුළ කාන්තාව**

කාන්තාවන් ආර්ථිකව ස්වාධීන වන විට, එමගින් තම දරුවන්ගේ සෞඛ්‍ය හා අධ්‍යාපනය මෙන්ම තමාගේම සෞඛ්‍ය සඳහා ආයෝජනය කිරීමට ද සිය පවුල තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී පක්ෂපාතීත්වය පිටු දැකීමට ද සහ සිය ප්‍රජාවේ දේශපාලන ජීවිතයට මැදිහත්වීමට ද අවකාශය සහ මූල්‍ය විවෘත කර දෙයි.

වර්තමාන ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 52%ක් කාන්තාවන්ය. වර්තමාන ලෝක ශ්‍රම හමුදාව තුළ කාන්තා නියෝජනය 40%ක් වේ. එමෙන්ම ලොව කෘෂි කාර්මික ශ්‍රම හමුදාවෙන් 43%ක් කාන්තාවන්ගෙන් සමන්විතය. 1997-2007 අතර කාලය තුළ කාන්තාවන් මිලියන 200ක් අලුතින් ශ්‍රම වෙළඳපොලට එක් වූ අතර මෙම වර්ධනය රැකියා වනිතාකරණය (Feminisation of Employment) යන සංකල්පය ජීවමාන කරලීමට සමත් වීය (Herath, 2013). වර්තමාන ගෝලීය සන්දර්භය සලකා බලන විට කාන්තාවන් වැඩි වශයෙන් රැකියා සඳහා යොමුවෙති. විශේෂයෙන්ම පුහුණු නුපුහුණු ඇඟලුම් සහ අනෙකුත් කර්මාන්ත ආශ්‍රිත රැකියාවලට යොමු වීමෙන් තම ආර්ථිකමය පසුබිම ගොඩනගා ගැනීමට කාන්තාවන් උත්සහ කරයි. කාන්තා සවිබල ගැන්වීමේ ප්‍රධාන මූල බීජය වනුයේ කාන්තාව ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමය. 2019 ඇමරිකාවේ වාණිජ මණ්ඩල සාකච්ඡාවේ දී 'කාන්තා ශ්‍රම බලකාය සවිබල ගැන්වීම' යන දේශනයේ දී දක්වනුයේ දුගී බව අඩු කිරීමේ හා ආර්ථික වර්ධනය දිරි ගැන්වීමේ එක් ප්‍රධාන ගාමක බලවේගය ලෙසින් සැලකිය හැක්කේ කාන්තාවන් ආර්ථික අතින් ශක්තිමත් කිරීම බවයි. එමෙන්ම ශ්‍රම බලකායේ පිරිමින්ට සමාන කාර්යයභාරයක් කාන්තාවන් අතින් ඉටු කරන පූර්ණ වාතාවරණයක් බිහි වන්නේ නම් 2025 වන විට ගෝලීය දළ දේශීය නිෂ්පාදනයට ඩොලර් ට්‍රිලියන 28ක මුදලක් එකතු කළ හැකි බවත්ය.

විශේෂයෙන් ම දිළිඳුකමේ කාන්තාකරණය නම් ග්‍රාමීය භූගෝල විද්‍යා සංකල්පය තුළ කාන්තාව සහ දිළිඳුකම යන්න කෙතරම් කාන්තා අර්බුදයන්ට බලපාන්නේ ද යන්නයි. ගෝලීය වශයෙන් ගත්කළ බිලියන 1.5කට වඩා අඩු ජනසංඛ්‍යාවක් දිනකට ඩොලරය හෝ ඩොලරයකට වඩා අඩුවෙන් උපයන අතර ඒ අතර බහුතරය කාන්තාවන් වේ. 2010 දී කාන්තවගේ දිළිඳුකමේ ප්‍රමාණය දැක්වූයේ මිලියන 17.2ක් වශයෙනි. එමෙන්ම සංවෙප රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ අපනයන සැකසුම් කලාපයන්වල, කාර්මික කලාපවල මෙන්ම විදෙස් රටවල ශ්‍රම සැපයීම තුළ ද කාන්තා නියෝජනය ඉහළ ගොස් ඇත. 2015 වසරේ ගෝලීය වශයෙන් ස්ත්‍රී-පුරුෂ පරතරය පිළිබඳ වූ වාර්තාවට අනුව 2006 වර්ෂයේ සිට ශ්‍රම බලකායට කාන්තාවන් බිලියන කාලයක් ඇතුළු වුව ද කාන්තාවන්ගේ දැන් වැටුප සමාන වන්නේ පුරුෂයන් මීට වසර 10කට පෙර ඉපයූ ප්‍රමාණයටය. කෙසේ නමුත් වර්තමාන ලෝකයේ කාන්තාව හඹා යන සිහිනය නම් ව්‍යවසායකයෙකු වීමය. එය සැබෑවත් බවට පත් කරමින් වර්තමාන ලෝකයේ ව්‍යවසායකයන්ගෙන් එනම් ලොව පුරා කුඩා ව්‍යාපාරවලින් 38%ක් අයිතිය කාන්තාවන් සතුව පවතී. කාන්තා ව්‍යවසායකයින් යනු වර්තමාන ලෝකයේ වඩාත් කැපී පෙනෙන ක්‍රියාදාමයකි. එබැවින් බොහෝ රටවල් කාන්තා ව්‍යවසායකයන් බිහි කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමට වැඩි අවධානයක් යොමු කර ඇත. ශ්‍රී ලංකාව තුළ කාන්තාව ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීම සඳහා වැන්දඹු හා ගෘහ මූලික කාන්තා වැඩසටහන, විදේශගත වන කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන, ව්‍යවසායකත්ව පුහුණුව, ශිල්පීය පුහුණු වැඩසටහන, ගිණුම් පුහුණු වැඩසටහන, චක්‍රීය ණය වැඩසටහන, වනිතා ශක්ති බැංකු පදනම, නිෂ්පාදන ප්‍රදර්ශනය හා අලෙවි පොළ වැඩසටහන, ගෙවතු වගා වැඩසටහන, පශු සම්පත් වැඩසටහන හා නංවමු ගම්මාන වැඩසටහන යනාදී වැඩසටහන් දියත් කර ඇත. අතීතයේ

නිවසෙහි දරුවන් හා ස්වාමියාගේ කටයුතු කරමින් සිටි කාන්තාව මේ වන විට තම ආර්ථිකය ගොඩනංවා ගනු පිණිස රැකිවල නිරතවීම නිසා වර්තමානයේ ගෝලීය ආර්ථිකය තුළ කාන්තාව වැදගත් ස්ථානයක් හිමි කරගෙන ඇත. රැකියා ක්ෂේත්‍රයේ සෑම අංශයකටම කාන්තාව පිවිස ඇත.

**අධ්‍යාපනය තුළ කාන්තාව**

අඩු අධ්‍යාපනයක් ඇති හා අධ්‍යාපනයක් රහිත ගැහැනු දරුවන් කුඩා කාලයේ දී ම විවාහ කර දීම, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට ගොදුරු වීම, දරිද්‍රතාවයෙන් පීඩා විඳීම සහ ගෙදරදොර වියදම් සහ සිය සෞඛ්‍ය සම්බන්ධයෙන් හඬක් නොමැති වීම යනාදිය මත කාන්තාව දුර්වල වන බව 2014 දී ලෝක බැංකුව කාන්තාවන්ගේ ආර්ථික හා සමස්ත සවිබල ගැන්වීම කෙරෙහි අධ්‍යාපනයෙහි ඇති වැදගත්කම පෙන්වා දෙමින් දක්වා ඇත. කාන්තාව ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීමට අධ්‍යාපනය අත්‍යවශ්‍යමය. වර්තමානය වන විට කාන්තාව අධ්‍යාපනයේ ඉහළ මානයන්ට ළගා වෙමින් සිටිති. විශේෂයෙන්ම අධ්‍යාපනයේ ඉහළ විභාග ඉලක්ක සපුරාගැනීම තුළ වර්තමාන ශ්‍රී ලංකාව නිදසුන් ලෙසින් ගත්තේ නම් පරිපාලන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් වැඩි වශයෙන් හඳුනාගත හැකිය. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රවේශවීම් තුළ ද කාන්තාවගේ ප්‍රතිශතය ඉහළය. ලෝක බැංකුව දක්වන පරිදි අධ්‍යාපනය විසින් කාන්තාවගේ විවාහ වන වයස, ලබන දරුවන් ගණන හා ළදරු මරණ අඩු කිරීම, දරුවන්ගේ යහපැවැත්ම ඉහළ නැංවීම, මාතෘ මරණ අඩු කිරීම යනාදිය සිදු කරනු ලබයි. අධ්‍යාපනය තුළ ඉහළට යන කාන්තාව ශක්‍යතාවයෙන් ඉහළ වීම, සාක්ෂරතාවය සහිත වීම, උගත් වීම සහ ජීවිතය සම්බන්ධ තීන්දු තීරණ ගැනීමේ දී අවශ්‍ය කරන කුසලතාවලින් සමන්විත වීම නිසා කාන්තාව අධ්‍යාපනය තුළ වඩාත් ප්‍රබල චරිතයක් බව විතානගම ප්‍රකාශ කර ඇත (Vithanagama, 2017).

කාන්තාව අතීතයේ දී නිවසටම කොටු වී ජීවත් වුව ද වත්මන් අධ්‍යාපනය තුළ ප්‍රාථමික, ද්වීතියික හා තෘතියික අධ්‍යාපන ඉලක්ක මෙන්ම ඉහළ අධ්‍යාපන ක්ෂේත්‍රයන්ට ද යොමු වී ඇත. එය වර්තමාන ලෝකය තුළ රැල්ලක් බවට පත් වී ඇත. ස්වාධීනත්වය උදෙසා නවමුකරණය වූ අදහස්වලින් වර්තමාන කාන්තාව සමන්විත වීම එයට හේතුවයි. ඇතැම් රටවල ද්වීතියික අධ්‍යාපනය ලබන ගැහැණු ළමුන්ගේ සංඛ්‍යාව පිරිමි ළමුන්ගේ සංඛ්‍යාව ඉක්මවා සිටී. විශේෂයෙන් ම ලතින් ඇමෙරිකාවේ, කැරිබියන් දූපත්වල සහ නැගෙනහිර ආසියානු කලාපවල ද්වීතියික අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ 2006 වසරේ දී ලතින් ඇමෙරිකාවේ හා කැරිබියන් හී ද්විතීයික අධ්‍යාපනයට ඇතුළත් වූ ගැහැණු ළමුන්ගේ අනුපාතය පිරිමි ළමුන් 100-107ක් විය. නැගෙනහිර ආසියාවේ මෙම අනුපාතය පිරිමි ළමුන් 100-101ක් විය. අග්නිදිග ආසියාවේ පිරිමි ළමුන් 100-102ක් විය. සංවර්ධනය වෙමින් පවතින රටවල් 45ක ද්වීතියික අධ්‍යාපනය අතින් ගැහැණු ළමුන් පිරිමි ළමුන් ඉක්මවා යමින් සිටී. තෘතීයික අධ්‍යාපන අවස්ථා පිළිබඳව විමසා බැලීමේ දී රටවල් 60 ක විශ්වවිද්‍යාල සිසුවියන්ගේ සංඛ්‍යාව සිසුන්ගේ සංඛ්‍යාව ඉක්මවා සිටී. ලොව විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ගෙන් අඩකටත් වඩා ගැහැණු ළමුන්ය. 2005 දී ආර්ථික සහයෝගීතාව හා සංවර්ධනය පිළිබඳ සංවිධානයට අයත් (Organization for

Economic Cooperation and Development) රටවල උපාධිධාරීන් අතර කාන්තා ප්‍රතිශතය 57% ක් විය. 2015 වන විට මෙම සංවිධානයට අයත් රටවල් 10 උපාධිධාරී කාන්තා ප්‍රතිශතය 60% ඉක්මවනු ඇතැයි අපේක්ෂා කර ඇත. මේ අයුරින් අධ්‍යාපනයේ ඉහළ අංශ කරා ළඟාවන කාන්තාව අධ්‍යාපනය සම්පූර්ණ කර ඉහළ ආර්ථික තත්ත්ව වෙත යොමු වේ. විශේෂයෙන්ම ඉහළ රැකියා තනතුරුවල කාන්තා නියෝජනය සලකා බලන විට කාන්තාවන් කළමනාකරණ තනතුරු හෙබවීම අතින් මුල් තැනට එන්නේ සිංගප්පූරුවයි. කාන්තාවන් කනිෂ්ට තනතුරු හෙබවීමෙහි ලා චීනය පළමු තැන ගනී.

කාන්තාව අධ්‍යාපනය තුළ ස්ථාවර වීම හුදෙක් ඇයගේ අභිවෘද්ධිය සලසන්නක් පමණක් නොවේ. කාන්තාව ආර්ථික හා අධ්‍යාපනික වශයෙන් බලගැන්වීම ඔවුන් කෙරෙහි ම පමණක් බලපාන්නේ නැත. එය රටක අනාගතය, මතු පරපුර වෙනුවෙන් කෙරෙන අගනා ආයෝජනයකි. කාන්තාවන් තමන් උපයන ආදායමින් විශාල කොටසක් ළමුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා යොදවයි. ඔවුන්ගේ පෝෂණය සහ සෞඛ්‍යය වෙනුවෙන් යොදවයි. එය අනාගතයේ ආර්ථිකය මත යහපත් බලපෑම් ඇති කිරීමට පදනමක් සැපයීමකි. එමෙන්ම අධ්‍යාපනය ලබා හොඳින් දැනුම ලබන කාන්තාව තීන්දු තීරණ ගැනීමේ දී වඩාත් ඵලදායි අදහස් වෙත යොමු වේ. වර්තමාන ලෝක ආර්ථිකය සහ අධ්‍යාපනය තුළ කාන්තා නියෝජනය ක්‍රමානුකූලව වර්ධනය වෙමින් පවතී. එහෙත් එය තවමත් එහි ධාරිතාවෙන් ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉතාමත් ම සුළු කොටසකි. 2010 නැගෙනහිර ආසියාවේ ශ්‍රම බලකායේ කාන්තා ප්‍රතිශතය 67%ක් වූ අතර එය ලොව කලාප අතරින් ඉහළ ම කාන්තා ශ්‍රම බල නියෝජනය බවට පත් වී ඇත. කාන්තාව කුමන අංශයකින් ඉදිරියට ගිය ද ඒ සෑම ස්ථානයකම කාන්තාව තම දක්ෂතා සහ කුසලතා මතින් ඉදිරියටම සිදු වීම වර්තමානයේ කැපී පෙනෙන ලක්ෂණයකි.

**දේශපාලනය තුළ කාන්තාව**

දේශපාලන බලය ආර්ථික හැකියාව සහ සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සලකා බැලීමේ දි කාන්තාවන් සහ පුරුෂයන් අතර පරතරය ගත වූ ගිය වසරේ අඩු වුව ද එම පරතරය සම්පූර්ණයෙන් පහව යාමට තමත් ශතවර්ෂයක් පමණ ගත වනු ඇතැයි ලෝක ආර්ථික සංසදය (World Economic Forum-WEF) 2019 දී දක්වා ඇත. ශ්‍රී ලංකාවේ දේශපාලන කාන්තා නියෝජනය සලකා බැලීමේ දී 1931 දී 4%ක් වූ කාන්තා නියෝජනය 2010 වසරේදී 5.8%ක් දක්වාත් වර්තමානය තුළ 4%ක් දක්වාත් පහත වැටී ඇත. 1960 දී ලොව පළමු අගමැතිනිය ලෙසින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය පත්වීම සියලු අභියෝග ජයගෙන කාන්තාව ඉදිරියටම යන බවට ලොවටම ලබාදුන් හොඳම පූර්වාදර්ශයයි. යුරෝපා රටවල් බොහොමයක පාර්ලිමේන්තු කාන්තා නියෝජනය 30%කට වඩා වැඩිය. 2021 වසරේ දී රටවල් 22ක කාන්තා දේශපාලන නායකත්වය දැකිය හැකිය. ශ්‍රී ලාංකික කාන්තාවන් විදෙස් රටවල් දේශපාලන නියෝජනය තුළ කැපී පෙනෙන චරිත බවට පත් වීම අතිශය වැදගත් කාරණාවකි. එනමුත් මන්ත්‍රී ආසන 225කින් සැදුම්ලත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙහි කාන්තා නියෝජනය මන්ත්‍රී ආසන 12කට පමණක් සීමා වී තිබීම කණගාටුවට කරුණකි. එමෙන්ම කාන්තා සංවිධාන,

වෘත්තීය සංගම්, සමිති සමාගම් යනාදී දේශපාලනය හා සම්බන්ධ සෑම තන්ත්‍රයකම කාන්තා දායකත්වය සක්‍රියව කැපී පෙනේ. දේශපාලනමය වශයෙන් තීන්දු තීරණ ගැනීමේ දී කාන්තා බලගැන්වීම කෙරෙහි වැඩි නීති ප්‍රතිපත්ති අවශ්‍ය වී ඇත්තේ කාන්තාව යනු රටක සංවර්ධන ක්‍රියාදාමයේ මූලික පුරුකක් වන බැවිනි.

**සමාජ සංස්කෘතිය තුළ කාන්තාව**

ඈත අතීතයේ පටන් පුරුෂාධිපත්‍යයට යටත්ව සීමා බාධක මැද තම ජීවිතය ගෙවා දැමීමට කාන්තාවට සිදු වී ඇත්තේ කුමන සාධකය මත පිහිටා ද යන්න විමසා බැලිය යුතුය. කායික ශක්තිය මත වර්ණ ගැන්වූව ද වර්තමාන සමාජය තුළ සෑම අංශයක්ම නියෝජනය කිරීමට කාන්තාව පසුබට වී නොමැත. වර්තමානයේ අධ්‍යාපනය, දේශපාලනය, අර්ථික, පරිපාලනය පමණක් නොව සෞඛ්‍ය, ක්‍රීඩා, සෞන්දර්යාත්මක අංශය කෙරෙහිද කාන්තා ඉදිරිපත් වීම ඉහළ අගයක් ගැනීම අතීත පුරුෂාධිපත්‍යයට නතු වූ සමාජය වෙනස් කිරීමට සුදුසු කාලයක් වී ඇත. විශේෂයෙන්ම නවීකරණය වූ කාන්තාව වත්මන් සමාජය තුළ සමාජ සංස්කෘතික බාධක බිඳ දමමින් වෙළඳකරණය, දැන්වීම්, ටෙලි නාට්‍ය, රංගනය, නිවේදනය, නිරූපණය, නර්තනය වැනි අංශයන්වලට යොමු වී ඇත. බොහෝ රටවල් කාන්තා බලගැන්වීම සංවර්ධනයට ගෙනෙනු ලබන වටිනාකම මත විවිධ සංවර්ධන ප්‍රතිපත්ති දියත් කරනු ලබයි. කාන්තාවන්ට එරෙහි හිංසන ක්‍රියා පිටු දැකීමේ වැඩසටහන, නව යෞවනියන් සඳහා ජීවන නිපුණතා සංවර්ධන වැඩසටහන, ප්‍රජනක සෞඛ්‍ය වැඩසටහන, උපදේශන වැඩසටහන, උපදේශන මධ්‍යස්ථාන පිහිටුවීම හා රැකවරණ මධ්‍යස්ථාන පිහිටුවීම, කාන්තා සමිති හා බල මණ්ඩල ශක්තිමත් කිරීමේ වැඩසටහන, අත්දැකීම් හුවමාරු වැඩසටහන, බන්ධනාගාර කාන්තාවන් සමාජගත කිරීමේ වැඩසටහන, කාන්තා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම, වතු අංශයේ කාන්තාවන් සඳහා වන මූල්‍ය කළමණාකරණ වැඩසටහන් යනාදී කාන්තාවන් සමාජීය වශයෙන් බලගැන්වීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ව්‍යාපෘතීන් වේ.

**ශ්‍රී ලංකාව තුළ කාන්තාවට සමතැන ද? නිසිතැන ද?**

වර්තමාන නවීකරණය තුළ කාන්තාව ශක්තිමත් වුව ද පුරුෂාධිපත්‍ය හා බැඳුණු දීර්ඝ ඉතිහාසයක් වෙනස් කරලීම අතිශය අපහසු කරුණක් බවට පත් වී ඇත. කාන්තාව සහ පුරුෂයා කිසිවිටෙක සමාන නොවේ. කායික ශක්තිය මත පමණක් පුරුෂාධිපත්‍ය තීරණය වීම වත්මන් සමාජයේ ලක්ෂණයකි. මන්ද යත් අනෙකුත් සෑම අවස්ථාවක දී ම කාන්තාව පුරුෂයන් ඉක්මවා යමින් තිබේ.

2000 දශකයේ සිට ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනය සමස්ත ජනගහනයෙන් 52%කි. එක්සත් ජාතීන්ගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ අසමානතා දර්ශකයට අනුව රටවල් 187ක් අතරින් ශ්‍රී ලංකාව 74වන ස්ථානයේ පසුවේ. මෙරට ශ්‍රම බලකාය තුළ කාන්තා නියෝජනය 32.5%කි. කාන්තා විරැකියා අනුපාතය 36.3%ක් වන අතර පුරුෂයන්ගේ විරැකියා අනුපාතය 21.1%කි. කාන්තාවන් තම අයිතීන් උදෙසා හඬ නගනුයේ සම තැන හෝ කාන්තාධිපත්‍යය හෝ අවැසි නිසාවෙන් නොවේ. කාන්තාවට අවශය වනුයේ නිසි තැන පමණි. වර්තමාන ශ්‍රී ලංකාව තුළ වුව ද

කාන්තාව ඉහළ තනතුරු සඳහා යොමු වීමේ දී එල්ලවන පුරුෂාධිපත්‍ය විවේචනයන්ට මෑතකාලයෙන් නිදහුන් සපයන්නේ නම් ශ්‍රී ලංකා පොලිසියේ කාන්තා නියොජ්‍ය පොලිස්පති නිලයට පත් කළ ප්‍රථම කාන්තාව වන බිම්ශානි ජාසිං ආරච්චිගේ මහත්මිය අභියෝගයට ලක් කරමින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන් 32දෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුවක් ගොනු කිරීම ගත හැකිය. අයිතිවාසිකම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ගයන්ට එළඹෙන්නේ නම් එහි දී ද කාන්තාව පුරුෂයන්ට විරුද්ධව ගොනු කරන නඩු ප්‍රමාණය අතිශය විශාලය.

එමෙන්ම කාන්තාව බලගැන්වීම සඳහා විවිධ ප්‍රතිපත්ති සකස් කර ඇති ශ්‍රී ලංකාව තුළ ද සමාන අධ්‍යාපනයක් ලබා සමාන අත්දැකීම් සහිත වුව ද කාන්තාව සඳහා ගෙවන වැටුප් ප්‍රමාණය පුරුෂයන්ට ගෙවන වැටුප් ප්‍රමාණයට වඩා අඩු බව කර්මාන්ත අංශයේ රැකියා ආශ්‍රිතව සොයාගෙන ඇත. සෑම කාන්තාවටම ලිංගික හා ප්‍රජනන අයිතීන් ඇත. එමෙන්ම ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2019 වසරේ සිදු කළ කාන්තා සුබසාධන සමීක්ෂණ වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් 35.3%ක් විවිධ හේතුන් මත තම ස්වාමි පුරුෂයාගේ පහර කෑමට ලක් වී ඇත. සෑම කාන්තාවන් 5දෙනෙකුගෙන් එක් අයෙකුම තම ජීවිත කාලය තුළ කුමන හෝ ශාරීරික හෝ ලිංගිකව ද හිංසාවකට ලක් වී ඇත. එමෙන්ම කාන්තාවන් 47.5%ක් ප්‍රකාශ කර ඇත්තේ පුරුෂයන් කාන්තාවන්ට වඩා උසස් බවයි. එවන් වූ අදහස් දරන තුරු කාන්තාව කෙතරම් දක්ෂ වුව ද කාන්තාව කෙතරම් කැපකිරීම් කළ ද කුමනාකාරයේ තාඩන පීඩනවලට ලක් වූවද කිසි දිනෙක නිසි තැන නොලැබෙනු ඇත. මන්ද යත් තම වටිනාකම උපයා ගත යුත්තේ තමන් විසින්ම වන බැවිනි. වර්තමානයේ ගෝලීය සන්දර්භය තුළ ආර්ථික, සමාජ, දේශපාලන යන සෑම අංශයකම කාන්තාව ප්‍රබල චරිතයකි. එබැවින් තම අයිතීන් උදෙසා ක්‍රියාත්මක වීම පවා කාන්තාවට අයිති වූවකි. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක 1978 ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සියලුම පුද්ගලයෝ නීතිය ඉදිරියේ සමානය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව 'ස්ත්‍රී-පුරුෂ සමානත්මතාවය සහ කාන්තාවන් සහ ගැහැණු දරුවන් සවිබල ගැන්වීම හුදෙක් ඉලක්කයක් නොව, එය තිරසර සංවර්ධනය, ආර්ථික වර්ධනය, සාමය හා ආරක්ෂාව සඳහා යතුරක් වේ'. කාන්තාව අතීත පුරුෂාධිපත්‍යයට ගරු කළ යුතුය. නමුත් යටත් වී තම ජීවිතය නිවසටම සීමා කර තම ආශාවන් බලාපොරොත්තු නිවසෙහි බිත්ති තුළ සිරකර නිවස තුළම ඉපිද නිවස තුළම මිය යාමට උත්සහ නොකළ යුතුය. කාන්තාවක ලෙසින් උපත ලැබීම අභාග්‍යයක් නොවේ. වර්තමාන ලෝකය තුළත් අනාගත ලෝකය තුළත් වැදගත් වනුයේ ස්ත්‍රිය ද පුරුෂයා ද යන ලිංග භේදය නොව දැනුම කුසලතා හා දක්ෂතා මත යම් පුද්ගලයෙකුගේ ශක්‍යතාවයයි. තම නිසි අයිතීන් උදෙසා මුළු මහත් ලෝකයක් සමග සටන් කිරීමට තරම් ආධ්‍යාත්මික පෞරුෂ ශක්තියක් කාන්තාව සතුය. 'කාන්තාවෝ අහසින් අඩක් උසුලාගෙන සිටිති' යන ප්‍රකට කියමන සත්‍ය වනුයේ එබැවිනි. පැරණි ඒකාධිපතීන් බිඳ වැටෙන යුගයක් ආසන්නයේ සිටින වත්මන් පරපුරේ කාන්තාව තම නිසි තැන මෙන්ම අනාගත කාන්තාවගේ නිසි තැන සාක්ෂාත් කිරීමට ඒ වෙනුවෙන් තම ශක්‍යතාවය දිශාගත කළ යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ප්‍රියංගිකා, තුෂාරී. 2011, සමතැනද ? නිසිතැනද ? සියවසක කාන්තාවෝ (1911-2011)

මුලදේශන අදහස් දැක්වීම, 'කාන්තා ශ්‍රම බලකාය සවිබල ගැන්වීම', ඇමෙරිකානු වාණිජ මණ්ඩල සාකච්ඡාව, 2019

රණවීර, දැහැමි. 2021, කාන්තා දිනය 2021: ශ්‍රී ලාංකික කාන්තාවන් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය.

රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනයල සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව 2013.

වනිතා සංවර්ධන ඒකකය, womenaffairs@Gmail.com

විතානගම, රන්මිණි. 2017, කාන්තාවන් ආර්ථිකව සවිබල ගැන්වීම: සාහිත්‍ය විමර්ශනයක්.

සුහුරු ලිය, කාන්තාවන් සවිබල ගැන්වීම හා තිරසර ඉලක්ක, United Nations APICT-ESCAP and Sri Lanka ICTA

Bhuyan. K.S., International Journal of Advanced Science and Technology, Vol. 29, No. 07,(2020), pp.14698-14703, Women Empowerment: The Role of Education in Women Empowerment

Mandal., K.C. 2013, Concept and Types of Women Empowerment

Nayak, Purusottam and Mahanta, Bidisha,. 2009, Women Empowerment in India, North Eastern Hill University.

Sathiabama, K. 2010, Rural women empowerment and entrepreneurship development.

Tandon., T. 2016, Women Empowerment: Perspectives and Views

# නූතන ස්ත්‍රීවාදය කෙරෙහි රැකියාවේ නිරත වන කාන්තාවන්ගේ ආකල්පය

**ජේ.ජී.ඩී. සචිනි හංසිකා**

මානව ජීවියා ජීවවිද්‍යාත්මකව ස්ත්‍රී හා පුරුෂ වශයෙන් කොටස් 02කට බෙදා දැක්විය හැකිය. මෙම ලිංගික වෙනස නිසා ස්ත්‍රීන් හා පුරුෂයින් කායික හා මානසික මෙන්ම අභ්‍යන්තර හා බාහිර වශයෙන් ද යම් යම් වෙනස් ලක්ෂණවලින් යුක්ත වේ. එහෙත් එම වෙනසට වඩා ඉතා පුළුල් වෙනසක් සමාජය විසින් මෙම ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂය අතර නිර්මාණය කර තිබේ. එයට අනුව පුරුෂයාට වඩා වෙනස් වූ අප්‍රධාන තත්ත්වයක් ස්ත්‍රියට පවුල තුළ මෙන්ම සමාජය තුළ ද හිමි කර දී තිබේ. එනම් මෙම දෙපක්ෂයට ම සමාජය විසින් පවරනු ලැබ ඇති කාර්යභාර්යයන් එකිනෙකට වෙනස් ය. එසේම ස්ත්‍රීන් හා පුරුෂයින් සම්බන්ධයෙන් තිබෙන ආකල්ප, සම්ප්‍රදායන් හා විශ්වාසයන් ද එකිනෙකට වෙනස් ය. එපමණක් නොව සමහර අවස්ථාවන්වල දී ස්ත්‍රීන් හා පුරුෂයින් සඳහා වන නීතිරීති ද වෙනස් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස සම්ප්‍රදායික සමාජයේ පමණක් නොව ඇතැම්විට නූතන සමාජය තුළ ද ස්ත්‍රිය දෙවැනි ගණයේ පුරවැසියෙකුගේ තත්ත්වයට පත් වී ඇත. මේ ආකාරයට සමාජ ව්‍යූහය තුළ කාන්තාවන්ට අසාධාරණයක් සිදු වී ඇති බැවින් එය වළක්වා ගැනීමට ක්‍රියා කිරීමේ අරමුණින් ස්ත්‍රීවාදය (Feminism) යන්න සමාජය තුළින් ඉදිරිපත් විය. එනම් ස්ත්‍රීවාදය යනු සමාජයේ සෑම ක්ෂේත්‍රයක දී ම ස්ත්‍රිය වෙත හිමිකොට ඇති අප්‍රධානත්වය, සාපේක්ෂ අසමානත්වය හෙවත් වෙනස් කොට සැලකීම හා ඇයව පීඩනයට හා සූරාකෑමට ලක් කිරීම පිළිබඳ සංවේදීතාවක්, සවිඥානිකයක් සහිත වූත්, එකී අසමානත්වයන්, අප්‍රධාන බව, පීඩනය සහ සූරාකෑම දුරුකොට, සමාජයේ සෑම අංශයකදී ම පුරුෂයන්ට හා සමාන සම සාධාරණයක් නිර්මාණය කිරීමේ මූලික අරමුණු සහිත වූත්, එම අරමුණු, අදහස් දරන්නන් ඒකරාශී කරගනිමින් ස්ත්‍රීන්ගේ නිදහස හා විමුක්තිය සඳහා ප්‍රතිපත්ති හා පොදු ක්‍රියාකාරීත්වයන් සැලසුම් කරන්නා වූත්, එම සැලසුම් හා ක්‍රියාකාරකම් මෙහෙයවන සමාජ හා දේශපාලන ව්‍යාපාරයක් සහිත වූත් දෘෂ්ටිවාදයක් (Ideology) ලෙස හැඳින්විය හැකිය. ආර්ථික, සමාජයීය, සංස්කෘතික, දේශපාලනික, මතවාදීමය හා මානසික වශයෙන් ස්ත්‍රියගේ අප්‍රධාන සමාජ තත්ත්වය හා එය සමාජයට අහිතකර ලෙස බලපාන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ගොඩ නැගීම ස්ත්‍රීවාදී දෘෂ්ටියේ ප්‍රධාන අරමුණකි. සත්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය, යහපත් පාලනය සහ තිරසාර සංවර්ධනය උදෙසා ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයේම සක්‍රීය සහභාගිත්වය අත්‍යවශ්‍ය කරුණක් වන බව ස්ත්‍රීවාදීන්ගේ තර්කයයි. මේ අනුව ස්ත්‍රීවාදයේ මූලික ඉලක්කය වන්නේ ලිංගික වෙනස මත නිර්මාණය කර ඇති ස්ත්‍රී-පුරුෂ සමාජමය වෙනස්කම් තුරන්කොට, එම දෙපක්ෂයට ම සමාන නිදහසක්, සම්පත්, ඉඩ ප්‍රස්ථාවන් හා ගෞරවනීය තත්ත්වයක් හිමිවන ආකාරයේ පුළුල් සමාජ වෙනසක් ඇති කිරීමය.

සාම්ප්‍රදායික යුග පෙරළිය තුළ ගල් යුගයේ සමාරම්භයේ සිට පුරුෂයාගේ කාර්යභාරය දඩයම් කිරීම හා ආහාර සැපයීම වූ නිසාත්, ස්ත්‍රියගේ කාර්යභාරය ස්වාමියාට අනසකව ඔහු සපයා දෙන ආහාර පාන පිළියෙළ කරමින්, සිය දරුවන් පෝෂණය කරමින්, ගේ දොර වැඩ කටයුතු සිදු කිරීමත්, පුරුෂයාගේ ලිංගික අවශ්‍යතා තෘප්තිමත් කරමින් ප්‍රජනන කාර්යය සඳහා දායකවීමත් විය. ඒ තුළින් පුරුෂාධිපත්‍යයක් ගොඩනැගුණු අතර ස්ත්‍රිය තවකෙකු මත යැපීමේ තත්ත්වයකට පත්විය. මෙය ලාංකේය ඉතිහාසය තුළ වසර ගණනක් ක්‍රියාත්මක වෙමින් පැවැතිය ද ක්‍රමයෙන් මෙකී අසාමානත්වය, අප්‍රධානත්වය, අසාධාරණත්වය වැනි තත්ත්වයන් මත ස්ත්‍රිය පැවැති ගතානුගතික අදහස්වලින්, ඇවැතුම්, පැවැතුම්, සම්ප්‍රදායන්ගෙන් විනිර්මුක්තව තවකෙකු මත යැපීම වෙනුවට ස්වාධීන තත්ත්වයක් තමාට හිමි කර ගැනීම උදෙසා පුරුෂයා හා සමානව රැකියා ක්ෂේත්‍රයේ නියුක්ත වන ආකාරයක් වත්මනෙහි සුලබව දැකිය හැකිය.

එනම් ලෝක ජනගහණයෙන් 50% ක් පමණ කාන්තාවන්ගෙන් සමන්විත වන අතර ලෝක ශ්‍රම හමුදාවෙන් 40% ක් නියෝජනය කරන්නේ ද කාන්තාවන් ය. එනම්, විවිධ රාජ්‍යයන්හි ආර්ථික සංවර්ධනයෙහිලා ස්ත්‍රිය විසින් සුවිශේෂ කාර්යභාර්යයක් ඉටු කරනු ලබයි. එමතු නොව එය තවදුරටත් පෙර නොවූ පරිදි වර්ධනය වෙමින්, පුළුල් වෙමින් පවතී. ඒ අනුව ඇතැමුන් විසින් නැගී එන ආර්ථික අතර චීනයේ ආර්ථික පිබිදීමටත්, නව තාක්ෂණයේ පිබිදීමටත් වඩා වේගයෙන් ආර්ථික සංවර්ධනයෙහිලා කාන්තාවන්ගේ සහභාගීත්වය වැඩි වෙමින් පවතින බව සඳහන් කරනු ලබයි. කෙසේ වෙතත් 1997-2007 අතර කාලය තුළ කාන්තාවන් මිලියන 200 ක් අළුතින් ශ්‍රම වෙළඳ පොළට එක් වූ අතර මෙම රැකියා නියුක්තියේ කාන්තා දායකත්වය ඉහළ යෑම රැකියා වනිතාකරණය (Feminisation of Employment) ලෙස ප්‍රචලිත විය. ඇතැම් රටවල සමාජ, සංස්කෘතික හා දේශපාලන හේතු මත කාන්තා ශ්‍රමයෙන් නිසි ඵල ලබා නොගත්ත ද බොහෝ රටවල කාන්තා ශ්‍රමය ආර්ථික සංවර්ධනය සඳහා බහුලව ඉවහල් කොට තිබෙනු දක්නට ලැබෙයි. ඒ අනුව විධිමත් සහ අවිධිමත් යන දෙ අංශයෙහි ම කාන්තා ශ්‍රමයෙහි දායකත්වය වසරින් වසර සාපේක්ෂව පුළුල් වෙමින් පවතී. ලෝක සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි සහ අධ්‍යාපන අංශයෙහි කාන්තාවන් ලබා ඇති ප්‍රගතිය මෙහි දී ඉවහල් වී ඇත.

ශ්‍රී ලංකාවෙහි ද රැකියා ක්ෂේත්‍රය තුළ කාන්තා දායකත්වය දැකිය හැකිය. නමුත් මෙයට වසර ගණනාවකට පෙර ශ්‍රී ලංකාව තුළ ද රැකියා හා වෘත්තීය අවස්ථාව පුරුෂ පාර්ශවයට පමණක් හිමිව පැවැතියත් නූතනය වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ බොහෝ ක්ෂේත්‍රවල කාන්තා නියෝජනය කැපී පෙනෙන මට්ටමකට පිවිස ඇත. ගුරු වෘත්තිය, හෙද සේවය, රූපලාවන්‍ය ක්ෂේත්‍රය වැනි බොහෝ වෘත්තීය ක්ෂෙත්‍රවල බහුලව යෙදී සිටින්නේ කාන්තාවන් ය. එමෙන්ම ව්‍යාපාරික සහ කළමනාකරණ යන ක්ෂේත්‍රවල ද කාන්තා ශ්‍රමයෙහි දායකත්වය ඉහළ යමින් පවතී. එමෙන්ම ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපදවාලීමෙහිලා කාන්තාවන්ගේ කැපකිරීම සුවිශාල ය. විශේෂයෙන් ම අපනයන ආදායම තුළ 40% ක පමණ ප්‍රතිශතයක් නියෝජනය කරන ඇඟලුම් ක්ෂේත්‍රයේ සේවයේ නියුක්ත වූවන්ගෙන් 90% ක් පමණ කාන්තාවන් ය (හෙරත්, වනිතා, 2013).

මේ ආකාරයට නූතනයේ කාන්තාව තවකෙකු මත යැපීමේ තත්ත්වය වෙනුවට තමාට හැකි අයුරින් ආර්ථික සංවර්ධනය උදෙසා සිය ශ්‍රමය කැපකරමින් සෘජුව ම නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වෙමින් මෙන්ම, සිය කුටුම්භය තුළ මනා ආර්ථික කළමනාකරණයක් පිහිටුවීමට හා පවත්වාගෙන යෑමට පියවර ගනිමින් අනාගත ආයෝජනයේ සුවිශේෂ මූලාශ්‍රයක් වන නීරෝගී, සෞඛ්‍ය සම්පන්න සහ දැනුමින් පොහොසත් දරු පරපුරක් සඳහා සිය ශ්‍රමය කැප කරමින් සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ වෙති. කෙසේවෙතත් ශ්‍රී ලංකාව තුළ ජනග්‍රහණයෙන් 52% ක් කාන්තාවන් නියෝජනය කළ ද ශ්‍රම බලකාය සඳහා කාන්තාවගේ සහභාගීත්වය පුරුෂයාට සාපේක්ෂව පහළ අගයක පවතී. එනම් පුරුෂයන් 72.4% සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සඳහා කාන්තාවන්ගේ දායකත්වය 32.5% පමණි. එසේම කාන්තාවන්ගේ විරැකියා අනුපාතය 36.3% ක් වන අතර පුරුෂයන් අතර එය 21.1% ක් පමණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ කාන්තා සංවිධානය 2020 දී නිකුත් කළ වාර්තාවකට අනුව, දැරිය හැකි මුදලකට ගුණාත්මක දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ ළමාරක්ෂක සේවා නොමැතිකම, නිවසේ රාජකාරී බෙදා ගැනීමට සහය නොලැබීම සහ සේවිකාවන්ට අවශ්‍ය සහය නොදක්වන සමහර සේවා ස්ථාන, සංස්කෘතීන් වැනි බොහෝ සාධක නිසා ශ්‍රී ලංකාව තුළ ශ්‍රම බලකායට කාන්තා සහභාගීත්වය අවම වී තිබේ. එනම් වර්තමාන ඩිජිටල් ලෝකය තුළ කාන්තා අයිතීන් ඉතා වේගයෙන් වර්ධනය වෙමින් තිබුණ ද, පුරුෂාධිපත්‍ය සමඟ බැඳුණු දීර්ඝ ඉතිහාසයක් වහ වහා වෙනස් කිරීම ඉතා අපහසු කාර්යයක් ලෙස දැක්විය හැකිය. නමුත් ශ්‍රී ලංකාව තුළ ද ග්‍රාමීය ගතානුගතික අදහස්වලට සාපේක්ෂව නාගරීකරණ සමාජ තුළ මෙම අයුක්තිය, අසාධාරණත්වය හමුවේ තම අයිතීන් උදෙසා ස්ත්‍රීවාදය පෙරදැරිව හඬනගන ආකල්පමය වශයෙන් විවිධත්වයක් දරන පිරිස් බොහෝ විට දැකගත හැකිය.

එනම් ස්ත්‍රිය විසින් මනා අධ්‍යාපනයක් ලැබීම මත, තමාගේ හැකියාවට සරිලන වෘත්තියක නියැලීම මත එදිනෙදා ජීවිතයේ දී තමාගේ අවශ්‍යතා තමා විසින් ම සපුරා ගැනීම මත තවකෙකු මත යැපීමෙන් නිදහස්ව ස්වාධීනව තම අරමුණු අභිමතාර්ථ ඔස්සේ පියනගනු දැකිය හැකිය. එහි දී පුරුෂාධිපත්‍ය සංකල්පය ප්‍රතික්ෂේප කරන ඔවුහු ස්ත්‍රීය යනු තවදුරටත් යටත් නොවිය යුතු, අසාධාරණයට ලක් නොවිය යුතු පුරුෂයාට සාපේක්ෂව සම අයිතීන් ලැබිය යුතු පිරිසක් ලෙස අදහස් කරති. ඒ අනුව නූතන ස්ත්‍රීවාදී සංකල්පය පිළිබඳව රැකියාවේ නියුතු කාන්තාවන්ගේ ආකල්ප පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී කාන්තාවන් තුළ නූතන ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් විවිධාකාර වූ ආකල්ප දක්නට ඇති අතර එහි දී ඇතැම් ස්ත්‍රීන් පුරුෂයා යනු තවදුරටත් ස්ත්‍රියක් සඳහා නොවැදගත් පුද්ගලයෙක් ලෙස විස්තර කරන අතර තමාට රැකියාවක් හිමිවීම මත, ස්ථිර වැටුපක් ලැබීම මත පුරුෂයා මත යැපීම අනවශ්‍ය බැවින් තවදුරටත් ස්ත්‍රිය සඳහා පුරුෂයා අනවශ්‍ය බව ප්‍රකාශ කරයි. එසේම තවදුරටත් ස්ත්‍රිය තම අධ්‍යාපනය නිසියාකාරව සිදුකිරීම හා අධ්‍යාපන ජයග්‍රහණ මත එසේම තරඟ විභාගවල ප්‍රතිඵල මත රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයෙහි ද වෘත්තීන්හි ඉහළ තල නියෝජනය කිරීම තුළින් ස්ත්‍රියට පුරුෂයා මෙහෙයවිය හැකි බව, පාලනය කළ හැකි බවට ද අදහස් දක්වයි. මේ සඳහා කදිම නිදසුනක් ලෙස ලොව ප්‍රථම අග්‍රාමාත්‍යවරිය සිරිමාවෝ

බණ්ඩාරනායක මැතිනිය, එසේම චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය යටතේ පුරුෂයන් ඇතුළු සමස්ථ රාජ්‍යය ම පාලනය කිරීම දැක්විය හැකිය.

මේ ආකාරයට පුරුෂයාට යටත් නොවිය යුතු වීම, පුරුෂයා ස්ත්‍රියක් කෙරෙහි අනවශ්‍ය බව පිළිගැනීම යනාදී ආකල්ප මෙන්ම ස්ත්‍රියට ස්ත්‍රියක් වීම නිසා රැකියාව ආශ්‍රිතව සිදුවන අසාධාරණකම්, අසමානකම් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන නූතන ස්ත්‍රීවාදී ආකල්පයන් ද දැකගත හැකි වේ. එනම් අතැම් සේවා ස්ථාන තුළ රාත්‍රී වැඩමුර සඳහා අමතර වැටුප් ගෙවීම් සිදුකළ ද කාන්තාවන් ඒ සඳහා සහභාගී කර නොගැනීම, රැකියා ස්ථානවල ස්ත්‍රීන් සඳහා ආරක්ෂිත වටපිටාවක්, සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම, ඇතැම් වෘත්තීන්හි ස්වභාවය අනුව නිශ්චිත කාල සීමාවකට දරුවන් වැදීමට අවසර නොලැබීම, ස්ත්‍රියක් වීම මත ඇතැම් රාජකාරී කටයුතුවල දී ඉහළ නිලවල පුද්ගලයින් විසින් අයුතු යෝජනා ගෙන ඒම යනාදී වශයෙන් තත්ත්වයන්ට ස්ත්‍රියට මුහුණ දීමට සිදුවීම මත එම අසමානකම්, අසාධාරණකම්වලට විරුද්ධ වූ ආකල්පයන් ද ස්ත්‍රීවාදය තුළින් හඳුනාගත හැකිය.

මෙම ස්ත්‍රී-පුරුෂ අසමාන සමාජ තත්ත්වය බුද්ධිමය වශයෙන් ලෝක මට්ටමේ අවධානයට ලක්වීම නිසා ස්ත්‍රී බව හෝ පුරුෂ බව මත කිසිම පුද්ගලයකු වෙනස්කමකට භාජනය නොවිය යුතුය යන නීතිමය පිළිගැනීම අන්තර්ජාතික මට්ටමින් ප්‍රකාශයට පත්වී තිබේ. ලොව බොහොමයක් රටවල් එබඳු පිළිගැනීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම හෝ වෙනත් නීති මගින් ප්‍රකාශයට පත්කොට ඇත. එහෙත් පිතෘ මූලික සමාජ ක්‍රමය තුළ තවමත් පුරුෂයා හා සසඳන විට ස්ත්‍රියගේ තත්ත්වය අප්‍රධාන මට්ටමක පවතී. විශේෂයෙන් පොදු කටයුතුවල දී පුරුෂයාට මෙන් සක්‍රීය අයුරින් සහභාගි වීමේ හැකියාවක් තවමත් ස්ත්‍රියට හිමි වී නැත. මෙම වෙනස ස්ත්‍රිය හා පුරුෂයා යන පුද්ගලයින් දෙදෙනා සඳහා බලපාන පෞද්ගලික කාරණයක් පමණක් නොවන අතර පවුලටත්, සමස්ථ සමාජයටත් අසාධාරණ අයුරින් බලපාන්නක් බව ස්ත්‍රීවාදින්ගේ මතයයි.

මේ ආකාරයට වර්තමානය වන විට ස්ත්‍රීන් රැකියා ක්ෂේත්‍රයන්හි නිරත වීම මත, සම අධ්‍යාපනයක් ලැබීම මත, ගතානුගතිකත්වයෙන් මිදී නූතන සමාජය වැළඳ ගනිමින් කටයතු කිරීම මත ස්ත්‍රී අයිතිවාසිකම් සහ ස්ත්‍රීවාදී මතවාදමය ප්‍රකාශන හා ක්‍රියාකාරකම්වල ව්‍යාප්ත වීමක් දක්නට ලැබේ. එමනිසා ලොව පුරා බොහොමයක් රටවල් ස්ත්‍රීවාදී අදහස් පිළිබඳ පුළුල් අවධානයක් යොමු කර තිබේ. ශ්‍රී ලංකාව තුළ ද විශේෂයෙන් උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා අන්තර්ජාතික සංවිධාන හරහා ස්ත්‍රීවාදී අදහස් යම්තරමකින් ව්‍යාප්ත වීමක් සිදුවෙමින් පවතී. එහෙත් එම ව්‍යාප්තිය හා ස්ත්‍රීවාදි මතවාදීමය සාකච්ඡාව බොහෝ සෙයින් අධ්‍යයනවේදීන්, සමීක්ෂකයින් හා රාජ්‍ය නොවන ස්ත්‍රී සංවිධානවල ක්‍රියාකාරින්ට සීමාවී තිබීම විශාල අඩුපාඩුවකි. ස්ත්‍රිය අප්‍රධාන තත්ත්වයෙන් මුදවාලීමට නම් සමස්ත සමාජයටම මේ අසාධාරණ වෙනස පිළිබඳ නිවැරදි අවබෝධයක් තිබිය යුතුය. එම අවබෝධය තුළින්, පවතින වෙනස තුරන් කිරීමට ඇති ශක්තියක් හා සංවිධානාත්මක භාවයක් ස්ත්‍රීන් තුළ ගොඩ නැගිය යුතුය. ඒ සඳහා හඬක් නැගිය හැකි, බලපෑම් කළ හැකි ශක්තිමත් ස්ත්‍රීවාදි ව්‍යාපාරයක අවශ්‍යතාව ශ්‍රී ලංකාවට අද තදින් දැනේ. පුරුෂයින් හා සමාන පුරවැසි

කණ්ඩායමක් බවට පත්වීමට නම් ස්ත්‍රීන්ටත් සමාජ, ආර්ථික හා දේශපාලනමය වශයෙන් සමාන නීතිමය අයිතිවාසිකම් හිමිවිය යුතුය, අදාළ නීති කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මනාව සංවිධානය වූ ආයතන ව්‍යුහයක් ගොඩනැගිය යුතුය. ආර්ථික ක්‍රියාවලියට හා තීරණ ගන්නා ආයතනවලට ස්ත්‍රීන්ට සක්‍රියවම සහභාගි වීමේ අවස්ථාව හිමිවිය යුතුය. මෙම අභියෝග ජයගැනීමට නම් මූලික වශයෙන් ස්ත්‍රියට හිමි අප්‍රධාන තත්ත්වය, ඇයට සිදුවන විෂම සැලකීම, ඇය සමාජ, ආර්ථික හා දේශපාලන කටයුතුවලට සහභාගි වීමේ අවශ්‍යතාව සහ එහි සාධාරණ බව පිළිබඳ නිවැරදි අවබෝධයක් සමස්ත සමාජයට ම ලබාදිය යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අබේපාල, රොනල්ඩ්., (2014), කාන්තා මනෝ විද්‍යාව හා කාන්තාවාදී උපදේශනය, කොට්ටාව, සාර ප්‍රකාශන.

ඇලන්, පීස් බාබරා., (2013), පිරිමි සහ ගැහැණු මෙතරම් වෙනස් ඇයි?, පරි. චන්ද්‍රවංශ, ආරියරත්න, මුල්ලේරියාව, විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ලියනගේ, කමලා., වළාකුළුගේ, සුමුදු., (2006), ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා ස්ත්‍රීවාදය, කොළඹ 4, ෆ්‍රෙඩ්රික් ඊබර්ට් පදනම.

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත තීරණය වන වැටුප් විෂමතාව

එන්.එස්. දිල්ෂාන් ප්‍රේමචන්ද්‍ර

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සමාජ විද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක අර්ථ ගැන්වීම් පිළිබඳ අවධානය යොමු කළ යුතුය. ස්ත්‍රී-පුරුෂ ලිංග භේදය යනුවෙන් සරලව අදහස් වන්නේ මිනිසාගේ උප්පත්තියෙන්ම ලැබෙන ලිංගිකත්වයයි. එය ස්වභාවිකවම පුද්ගලයාට දායාද වන්නක් මිස අවශ්‍යතාවය මත සිදු නොවන්නකි. මිනිසාට පමණක් නොව පෘථිවි තලයේ ජීවි සියලු වස්තූන් කෙරේ ස්ත්‍රී-පුරුෂ බව උරුම වී ඇති බව හඳුනාගත හැකිය (ලියනගේ, වලකුලුගේ, 2006). ඒ අනුව ලිංගිකත්වය යනු ජීව විද්‍යාත්මක කාරණාවක් වන අතර ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු සමාජ විද්‍යාත්මක කාරණාවකි. සමාජයේ බොහෝ අංශයන් පිළිබඳ විවිධ අධ්‍යයනයන් සමාජ විද්‍යාව තුළින් සිදුවී ඇති අතර එවැනි අධ්‍යයනයන්ට මෑත කාලයේ දී එකතු වූ සංකල්පයක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හැඳින්විය හැකිය. එහිදී ස්ත්‍රිය සහ පුරුෂයා පිළිබඳ වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය මගින් අර්ථ ගැන්වීම් සිදු කර ඇති අතර සමාජ සංස්ථා තුළ ඔවුන් නිරූපණය කළ යුතු චරිතයට අනුව ඔවුන් අනුගත කිරීමක් සිදුකර ඇත. එහි දී ස්ත්‍රී-පුරුෂ චරිතවලට වෙන් වෙන් වශයෙන් යොදාගත යුතු චරිත ලක්ෂණ, හැසිරීම් රටා, ජීවන විලාසිතා, කාර්යභාරයන් ආදී සියල්ල සමාජය විසින් නිර්මාණය කොට ඔවුන්ට ලබා දී ඇත. ඒ අනුව හැඩ ගැසෙමින් මානව වර්ගයා සමාජය තුළ තම චරිත නිරූපණයන් සිදු කරයි.

සමාජ සංස්ථාවන් තුළ නොවෙනස් ව මුල් බැසගත් ආකල්පයක් ලෙස ස්ත්‍රිය වනාහි කිසියම් වූ රාමුවකට කොටුවී සිටිය යුතු බවත් ඇය පුරුෂයා කිසිවිටෙකත් අභිබවා නොයා යුතු බවටත් මතය වී තිබේ. අතීත සමාජ සංස්ථාවල මෙන් නොව ස්ත්‍රියකගේ නැතහොත් කාන්තාවකගේ භූමිකාව අද වන විට පුළුල් වපසරියක පැතිරී තිබුණත් සමාජය තවමත් අපේක්ෂා කරනු ලබන්නේ පුරුෂයාට යටහත් වූ ළඳ බොළඳ සුකුමාලියකි.

වර්තමාන සමාජයේ ඇතැම් කාන්තාවන් එම සීමා මායිම් බිඳ දමා ස්ත්‍රීත්වය පසෙකලා සිය චර්යා රටාවන් වෙනස් කර ගැනීමට උත්සුක වී ඇත. නමුත් ඔවුන් අපේක්ෂා කරන සම තැන තවමත් ලබාගැනීමට නොහැකි වී ඇති අතර ඔවුන් කටයුතු කළයුතු වන්නේ සම තැන නොව නිසි තැන ලබා ගැනීමටයි. කාන්තාවක් ලෙස සමාජයේ ලබාගන්නා ස්ථාවරය මවක, බිරිඳක, දියණියක සේම පුරුෂයෙකු ද පියෙකු, සැමියෙකු, පුතෙකු වශයෙන් එකිනෙකට වෙනස් අත්දැකීම් ලබා ගනියි. ඔවුන් වෘත්තීය ක්ෂේත්‍ර තුළද ඒ ඒ අයුරින් කටයුතු කිරීම අතීත සමාජවල නැතත් වර්තමාන සමාජ සංස්ථා තුළ දැකගත හැකිය.

වර්තමානය වන විටදී ආර්ථික සංවර්ධනය සඳහා කාන්තාවන් විවිධ ආකාරයෙන් සිය ශ්‍රමය කැප කරන අතරම කුටුම්භය තුළ මනා ආර්ථික කළමනාකරණයක් පිහිටුවීමට හා පවත්වාගෙන යාමට පියවර ගනිමින් කටයුතු සිදු කරනු ඇත. මූල්‍ය ආර්ථික සංකල්පයක් ලොව පුරා වර්ධනය වීමත් සමඟ ම ස්ත්‍රී පුරුෂ කාර්යභාරයන් අතර තිබූ සම්බන්ධතාවයන් වෙනස්වීමක් දක්නට ලැබුණි. එහිදී ධනපති ආර්ථිකයේ වර්ධනයත් පුරුෂාධිපත්‍යයේ නැගීම මත කාන්තා අයිතීන් ඇගයීමට ලක් නොවීම නිසා කාන්තාව දැඩි අපහසුතාවලට ලක් වී ඇත. (බණ්ඩාර, 2018). ලෝකයේ බොහොමයක් රටවල් තුළ මේ වන විට කාන්තා අයිතීන් රැක ගැනීමට නීති සම්පාදනය කර ඇති නමුත් ලොව පුරා තවමත් කාන්තාවන් සහ පුරුෂයන් අතර සැලකිය යුතු වැටුප් පරතරයක් පවතී. මෙම වැටුප් පරතරය අවම කිරීම උදෙසා ලෝකයේ දියුණු වෙයි යැයි සම්මත සංවර්ධිත රටවල් සම වැටුප් නීති සම්පාදනය කර ඇති අතර ඇමරිකාව 1963 දීත් එංගලන්තය 1970 දීත් එය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. (රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනය, ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). එම නීතිය ක්‍රියාත්මක වීමෙන් පසු එකී රටවල් තුළ මෙම ස්ත්‍රී-පුරුෂ වැටුප් පරතරය අවම අගයක් ගන්නා බවට වාර්තා වී ඇත.

සමාන වැටුප් ගෙවීම සහ ස්ත්‍රී-පුරුෂ ලිංග භේදය මත පදනම් වී වෙනස් වැටුප් ගෙවීම අතර මනා වෙනස්කම් ඇති බවට ඕනෑම පුද්ගලයෙකුට හඳුනා ගත හැකි දෙයකි. සමාන වැටුප් ලැබීම හෝ නොලැබීම සිය අධ්‍යාපනය, සිය හැකියාව, දක්ෂතාවය සහ රැකියාවේ ජ්‍යෙෂ්ඨත්වය මත තීරණය වන්නකි. එය ලිංග භේදය මත සිදු නොවිය යුත්තකි. පුද්ගලයෙක් නිරත වන රැකියාව අනුව ස්ත්‍රී පුරුෂ වැටුප් පරතරය ඇතිවීම සාමාන්‍ය වූවත් එක හා සමාන අධ්‍යාපනයක් ලබා එක හා සමාන අත්දැකීම් ඇති කාන්තාවන්ට පුරුෂයන්ට මෙන් වැටුපක් ලැබීමට හිමිකම තිබිය යුතුය. මේ ආකාරයට ලොව සියලු රටවල් පාහේම ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම එකම රැකියාවල නියුතු වුව ද ඇතැම් අවස්ථාවල දී ඔවුනට ගෙවන නාමික වැටුප අතර වෙනස්කම් පවතින බව හඳුනාගත හැකි කරුණකි.

මේ පිළිබඳ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව පසුගිය වසර කිහිපයක දෛනික වැටුප් ගෙවීම්වල විෂමතා පහත වගුවෙන් හඳුනාගත හැකිය.

**වගු සටහන් අංක 01**

| | වාර්ෂික සාමාන්‍ය රුපියල් | | |
|---|---|---|---|
| | **2008** | **2009** | **2010** |
| **තේ වගාව** | | | |
| පිරිමි | 440 | 448 | 543 |
| ගැහැණු | 305 | 356 | 391 |
| **රබර් වගාව** | | | |
| පිරිමි | 500 | 532 | 463 |
| ගැහැණු | 377 | 416 | 440 |

| | | | |
|---|---|---|---|
| **වී වගාව** | | | |
| පිරිමි | 562 | 613 | 658 |
| ගැහැණු | 395 | 423 | 423 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආර්ථික හා සමාජ සංඛ්‍යාන ,ශ්‍රී ලංකා මහ බැංකුව.

ඉහත දක්වා ඇත්තේ වසර කිහිපයකට පෙර දී මහ බැංකු වාර්තාවට අනුව ලබාගත් අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් පිළිබඳ දත්තයන් වේ. එයට අනුව තේ, රබර් සහ වී වගාවන්වල නිරතවන කාන්තාවන් හා පුරුෂයන්ට ලබාදෙන ලද දෛනික වැටුප් පිළිබඳව වාර්ෂික සාමාන්‍ය රුපියල් වලින් පෙන්වා දී ඇති අතර එම වගුව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි ලෙස ම ස්ත්‍රී පුරුෂ වැටුප් විෂමතා පවතින බව හඳුනාගත හැකිය. මේ සඳහා යොදාගත හැකි තවත් උදාහරණයක් ලෙස මා ලද පෞද්ගලික අත්දැකීමක් පෙන්වාදිය හැකිය. විශ්වවිද්‍යාල භූමිය පිරිසිදු කරන කම්කරුවන් හට ද මෙකී වැටුප් විෂමතාවය පවතී. එහි දී මා සමඟ කතා කළ කාන්තාවක් පවසා සිටියේ ඔවුන්ගේ දෛනික වැටුප රු. 800 ක් බවත් පිරිමි පාර්ශව සඳහා රු. 950ක් ලැබෙන බවත්ය. ඒ අනුව ද පසක් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වැටුප් පරතරයක් තිබෙන බවයි. තවද බී.බී.සී. පුවත් ජාලය තුළින් සිදු කළ පර්යේෂණයකට අනුව ශ්‍රී ලංකාව තුළ නීති ක්ෂේත්‍රය, මහා මාර්ග ඉදිකිරීම් ක්ෂේත්‍රය, නිවාස හා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය, වාස්තුවිද්‍යා ක්ෂේත්‍රය සහ කම්කරු ක්ෂේත්‍රයන් තුළ ද වැටුප් පරතරය ඇති බවට සොයාගෙන ඇත.

තවද ලෝකය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි තවත් කරුණක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත දේශපාලන බලය, ආර්ථික හැකියාව, සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කාන්තාවන් සහ පුරුෂයන් අතර සැලකිය යුතු පරතරයක් නිර්මාණය වී තිබීම හඳුනා ගත හැකිය. මුල් කාලීන සමාජයේ කාන්තාවන් නිවසට කොටු කර තිබුණ ද වර්තමානය වන විට ඒ තත්ත්වය පහව ගොස් කාන්තා දායකත්වය සියලු අංශ වෙත යොමු වෙමින් පවතී. යුරෝපා මධ්‍යම බැංකුව සහ ලෝක බැංකුවේ ඉහළ පෙළේ තනතුරුවලට මෙන්ම පින්ලන්තය, ජර්මනිය සහ නවසීලන්තය ඇතුළු රටවල රාජ්‍ය නායකත්වයට ද කාන්තාවන් පත් වී සිටිය ද සමස්තයක් වශයෙන් කාන්තාවන් පුරුෂයන් හා සමාන තත්ත්වයට පත් වීමට තවත් වසර සියයකට අධික කාලයක් ගතවේ යැයි ලෝක ආර්ථික සංවිධානය තක්සේරු කර ඇත. (බිබිසි පුවත්පත, 2019). ලෝක ආර්ථික සංසදය පෙන්වාදෙන පරිදි ස්ත්‍රී-පුරුෂ පරතරය අඩු කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම දේශපාලන ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන්නේ මන්දගාමී ප්‍රගතියකි. ලොව සියලු රටවල අමාත්‍ය පදවි අතරින් කාන්තාවන්ට හිමි වී තිබෙන්නේ 21% පමණි. ශ්‍රී ලංකාව ද කැබිනට් අමාත්‍ය පදවි දාසයක් සහ රාජ්‍ය අමාත්‍ය පදවි හතළිහක් අතුරින් කාන්තාවන්ට හිමි වී ඇත්තේ එක් අමාත්‍ය පදවියක් පමණි (රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනය, ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). එමෙන්ම ලෝක ආර්ථික සංසදය නිකුත් කළ ගෝලීය දර්ශකයට අනුව පසුගිය

වසරේ මෙන්ම මේ වසරේ ද ස්ත්‍රී -පුරුෂ පරතරය අඩු රටවල් අතරින් ඉදිරියෙන්ම සිටින රටවල් දහයක් ඔවුන් නම් කර ඇත. එම රටවල් පහත දැක්වේ,

1) අයිස්ලන්තය
2) නෝර්වේ
3) ෆින්ලන්තය
4) ස්වීඩනය
5) නිකරගුවා
6) නවසීලන්තය
7) අයර්ලන්තය
8) ස්පාඤ්ඤය
9) රුවන්ඩාව
10) ජර්මනිය (බිබිසි පුවත්පත, 2019).

ලෝක ආර්ථික සංසදයේ පර්යේෂණ අනුව කාන්තාවන් සහ පුරුෂයින්ට සම වැටුප් හිමිවීම අතින් ලොව ඉදිරියෙන්ම සිටින්නේ අයිස්ලන්තයයි. එහෙත් මෙයින් අදහස් වන්නේ මේ වන තුරුම අයිස්ලන්තයේ කාන්තාවන්ට එක හා සමාන කාලසීමාවක් තුළ සමාන සේවයක් සැපයීම වෙනුවෙන් සමාන වැටුපක් හිමි වූ බව නොවේ. ස්ත්‍රී-පුරුෂ අයිතිවාසිකම් විෂයෙහි ලා එතරම් ඉදිරියෙන් සිටින රටක පවා එක හා සමාන සේවයක් වෙනුවෙන් ලැබෙන වැටුප් සලකා බැලීමේ දී කාන්තාවන් සහ පුරුෂයන් අතර 6% ක පරතරයක් පවතින බව සොයාගෙන ඇත. මේ තත්ත්වය සලකා බැලූ අයිස්ලන්ත රජය විසින් "සමාන වැටුප් ප්‍රමිතීන්" නමින් උපදෙස් මාලාවක් නිකුත් කර ඇත. ඒ යටතේ සෑම ආයතනයකම රැකියාවන් විශ්ලේෂණය කෙරුණු අතර එහි දී සෑම රැකියාවක් ම කෙතරම් දුෂ්කර ද යන්න ද, ආයතනයට එහි ඇති වැදගත්කම පිළිබඳවත් සලකා බලා යම් ලකුණු ප්‍රමාණ ලබාදී සමාන ලකුණු සහිත රැකියාවක නිරතවන කාන්තාවකගේ හා පුරුෂයකුගේ නූතන වෙනස්කම් හඳුනාගෙන ඒවායෙහි නිවැරදි කිරීම් සිදුකරන ලෙස අදාළ අංශයන් දැනුවත් කර ඇත. එලෙස කටයුතු නොකරන ආයතන වලට එරෙහිව දඩ නියම කිරීමට ද අයිස්ලන්ත රජය පියවර ගෙන ඇත. මේ ආකාරයට අයිස්ලන්තය කාන්තාවන්ට සමාන වැටුප් ගෙවන ලෙස අදාළ ආයතනවලට බල කළ ප්‍රථම රට බවට පත්වී ඇත.

ලෝක ආර්ථික සම්මේලනය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව රටවල් 149 ක් අතුරින් රටවල් 88ක් ස්ත්‍රී-පුරුෂ ලිංග භේදය මත පදනම්ව වැටුප් ගෙවීමේ විශාල පරතරයක් දක්නට ලැබෙන බව සොයාගෙන ඇත. කාන්තාවන් බොහෝවිට වැටුප් රහිත ක්‍රියාකාරකම්වල නිරත වීම පිළිබඳ තොරතුරු ද ලෝක ආර්ථික සම්මේලනය මඟින් ඉදිරිපත් කර ඇත. ලොව ඇතැම් ප්‍රදේශවල කෘෂිකාර්මික ශ්‍රමයෙන් 70% ක් යැපෙන්නේ කාන්තාවන්ගෙනි. ආහාර නිෂ්පාදනයෙන් 90% ක් නිපදවන්නේ ද කාන්තාවන්ය (රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනය, ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). ශ්‍රී ලංකාව තුළ ද දේශීය කෘෂිකර්මය තුළ කාන්තා ශ්‍රමය යොදා ගනු ලබයි. ඔවුන් කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන

අතරම කුටුම්භය තුළ විශාල මෙහෙවරක් ද ඉටුකරති. පරිභෝජනය උදෙසා ගෙවතු වගාවලත් වෙළඳපොළ ගණුදෙනුවලත් යෙදෙති. එහෙත් මෙම සමස්ත ක්‍රියාවලීන් ජාතික නිෂ්පාදනයන් ගණනය කිරීමේ දී අවධානයට ලක් කරන්නේ නැත. මෙක්සිකෝවේ වැටුප් ලබන කාන්තාවන් සිය රැකියාවේ නියැලීමට අමතරව සතියට පැය 33 ක් නිවසේ කටයුතු සඳහා යොදවයි (රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනය, ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). පිරිමින් ඒ සඳහා කැප කරන්නේ සතියට පැය 06 කි. ආජන්ටිනාව, නිකරගුවාව, ඉන්දුනීසියාව, දකුණු කොරියාව, දකුණු අප්‍රිකාව සහ ටැන්සානියාව යන රටවල්වල කාන්තාවන් පිරිමින්ට වඩා දෙගුණයක් වැටුප් රහිත ක්‍රියාවල නිරත වන බව ලෝක ආර්ථික සංසදය පෙන්වා දී ඇත. ඉන්දියාව මෙම අනුපාතය 10:1 කි. ශ්‍රී ලංකාවේ කාන්තාවන් ද මෙලෙස විවිධ කාර්යවල නිරත වුවත් ඒවා ගණනය කිරීමක් සිදු නොවේ.

සමස්තයක් වශයෙන් ගත් කල වර්තමානය වන විට කාන්තා සේවා නියුක්තියේ ඉතාම ඉහළ මට්ටමක පවතී. ඒ අනුව මේ වන විට එය පුරුෂයා හා සමාන රැකියා මට්ටම්වල නිරත වෙයි. එසේ වුවත් අද වන විටත් පවතින ගැටලුවක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත ගොඩනැගුණු වැටුප් පරතරය පෙන්වාදිය හැකිය. එකම කාර්යය කොටස් ඉටු කිරීම වෙනුවෙන් කාන්තාව හා පුරුෂයා ලබන වැටුප් මට්ටම්වල පැහැදිලි වෙනස් කමක් පවතී. තවද ඒ ඒ රටවල නිෂ්පාදිතයට එකතු නොවන කාර්යභාරයක් ද කාන්තාව විසින් සිදු කරන අතර කාන්තාව බොහෝවිට ඇගේ සේවා මුරය නිමකොට නිවසට පැමිණීමෙන් පසු ගෘහණියක, මවක, බිරිඳක වශයෙන් නිවස තුළ ත්‍රිත්ව කාර්යයක නිරතවෙමින් කටයුතු සිදු කරයි.

පරිපාලන, කළමනාකරණ, කාර්මික, ඉංජිනේරු වෘත්තීන් වැනි පුරුෂාධිපත්‍යයට පමණක් නතුව තිබූ රැකියා ක්ෂේත්‍රවලට වර්තමානය වන විට කාන්තාවන් පිවිසීමක් දිනෙන් දින වැඩි වෙමින් පවතී. එහි දී රැකියාවේ සුරක්ෂිතභාවයට ඉදිරි පියවරක් ලෙස ළඟාවීමේ දී කාන්තාවට එල්ලවන අභියෝග පුරුෂයින්ට වඩා වෙනස්ය. ඇතැම් අවස්ථාවල දී කාන්තාවට තමාගේ රැකියා ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරීන්ගේ ලිංගික අතකොළුවක් බවට ද පත්වීමට සිදුවේ. තවද හඳුනාගත හැකි ප්‍රවණතාවක් ලෙස අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද කාන්තා දායකත්වය ඉහළ අගයක් ගනු ලබයි. නමුත් එලෙස අධ්‍යාපන මට්ටම අතින්, දැනුමින්, හැකියාවන්ගෙන් කෙතරම් දුරට පරිපූර්ණ වුවත් යම් අවස්ථාවක දී එකම තනතුරු දරන පුරුෂ පාර්ශවයේ ද ඊට පහළ තනතුරු දරන පුරුෂ පාර්ශ්වයේ ද අදහස්වලට නතුවීමට කාන්තාවට සිදු වී ඇත. එසේම කාන්තාවන්ට පරිපාලන බලය ක්‍රියාත්මක කිරීමේ දී පුරුෂයාට සේ සමාජ ගරුත්ව තත්වයක් නිර්මාණය නොවීම හඳුනාගත හැකිය. එහෙනම් පුරුෂාධිපත්‍යය සංකල්පය විසින් කාන්තාව සීමා කිරීමට උත්සාහ ගැනීමයි. මේ අනුව පැහැදිලි වන්නේ කාන්තාව ආර්ථික සංවර්ධනයට ලබාදෙන්නා වූ දායකත්වය පිළිබඳ නිසි ඇගයීමක් සමාජ ක්‍රම විසින් සිදු නොකරන බවත්, අතීතයේ සමාජය තුළ පැවති කාන්තා ආන්තීකරණයට ලක් කිරීමේ සේවාවන් තවදුරටත් සමාජය තුළ ක්‍රියාත්මක වන බවයි. එනිසා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පසෙකලා කාන්තාවට නිසි තැන ලබා දීමට පියවර ගත යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ලියනගේ, කමලා, වළාකුළුගේ, සුමුදු., (2006), ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය.

විජේවර්ධන, නෙරංජි, ප්‍රනාන්දු, බැසිල්., (2019), සංස්කෘතික අපරාධ විද්‍යාව.

බණ්ඩාර, ධම්මික, ඩී, එම්, එස්., (2018), අපරාධ සමීක්ෂා ශාස්ත්‍රීය සංග්‍රහය.

රැකියා වනිතාකරණය සහ ලෝක ආර්ථික සංවර්ධනය (ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ ආර්ථික විද්‍යා ද්විමාසකය), 2013.

WWW.lankaepress.com

WWW.BBC.com

# කාන්තා සාපරාධීත්වයට හා වින්දිතභාවයට බලපෑන්නා වූ මාසික ආර්තවය

**සමරප්පුලිගේ ධයනි හන්සිකා**

''දිනක් ඇය සිනහවෙන් හා සතුටින් සිටින්නීය. නිවසේ සිටින ආගන්තුකයෙකු ඇය දුටු විට ඇයට ප්‍රශංසා ගී ගයනු ඇත. නමුත් ඊළඟ දවසේ දී ඇය බැලීමට හෝ සමීප වීමට භයානක යː ඇය දැඩි වියරුවක සිටී.සැමට සමාන වනචාරී ස්වරූපයක් ගනු ලබයි'' (Patricia, 1991).

කාන්තාව විශේෂයෙන් පවුලක සහ පොදුවේ සමාජයේ මුල් ගල වූ බව මානව වර්ගයාගේ ඉතිහාසය හෙළි කරයි. විශේෂයෙන්ම ආසියානු කාන්තාවක් සමාජ සම්මතයන්, සම්ප්‍රදායන්, සිරිත් විරිත්, සදාචාරය සහ පවුල් සංහිඳියාව ආරක්ෂා කරන කාන්තාවක් ලෙස සැලකේ. වර්තමාන ලෝකය තුළ කාන්තාවක් තම පවුල පෝෂණය කිරීමත් සමග අනන්‍යතාවයක් ලබා ගැනීම සඳහා තමන්ගේම සලකුණක් ඇති කර ගැනීමේ අමතර වගකීම භාරගෙන ඇත. මෙකී කාන්තාවක සමාජයේ අනන්‍යයතාවය තහවුරු කරගැනීමේ දී අනෙක් අතට කාන්තා සාපරාධීත්වය මතු වන බව කිව යුතුය. කාන්තා ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු ගොනු කිරීමේ දී මේ සමඟ ම ස්ත්‍රී අපරාධකාරීත්වය පිළිබඳ කරුණු විග්‍රහ කිරීමේ දී ස්ත්‍රී අපරාධවල ජීව විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සාධකවල මූලිකාංගය අවධාරණය කරන න්‍යායාචාර්යවරුන් අදහස් කළේ අපරාධකාරී ස්ත්‍රීන් පුරුෂමය ජීව විද්‍යාත්මක හෝ මනෝවිද්‍යාත්මක දිශානතියන් විදහා දක්වන බවයි. ඒ අතර ලොම්බ්‍රෝසෝ විසින් සඳහන් කළේ කාන්තා අපරාධකරුවන් පුරුෂ ලක්ෂණයන්ගේ අතිරික්තයක් ඇති අය ලෙස ය. ඔහු තර්ක කරනු ලැබුවේ ජීව විද්‍යාත්මකව ගැහැණුන්ට වඩා සාපරාධී කාන්තාවන් පිරිමින්ට සමාන වන බවයි. එසේම, ෆ්‍රොයිඩ් විසින් තර්ක කරන ලද්දේ ස්ත්‍රී අපරාධ ඊර්ෂ්‍යාව නිසා ඇති වන "පිරිමි සංකීර්ණයකින්" සිදු වන බවයි. තව ද ලොම්බ්‍රෝසෝ සහ ෆ්‍රොයිඩ් යන දෙදෙනාම ස්ත්‍රී අපරාධකරුවා ජීව විද්‍යාත්මකව හෝ මනෝවිද්‍යාත්මකව පුරුෂයෙකු ලෙස සැලකූහ. එමෙන්ම ඔටෝ පොලාක් දක්වන පරිදි තවත් මූලික තේමාවක් නම් ජීව විද්‍යාත්මක හා භෞතික විද්‍යාත්මක පදනමක් කාන්තා අපරාධ සඳහා ආරෝපණය කිරීම ය. පොලාක් අවධාරණය කරන්නේ ස්ත්‍රීන්ගේ ස්වභාවයෙන්ම රැවටිලිකාර ස්වභාවය, විශේෂයෙන් ලිංගික සංසර්ගයේ දී කාන්තාවන් විසින් ගනු ලබන උදාසීන භූමිකාව තුළ මුල් බැසගෙන ඇති බවයි. විශේෂයෙන් කාන්තාවන්ගේ අපරාධ සඳහා හෝමෝන සහ උත්පාදන අවධීන්ගේ එනම් ඔසප්වීම, ගැබ් ගැනීම සහ ආර්තවහරණය බලපාන බවයි (Heidensohn, 1995).

කාන්තාවකගේ හෝර්මෝන ක්‍රියාකාරීත්වය සාපරාධීත්වයට නැඹුරුවීමට බලපාන අතර මෙකී හෝමෝනයන් වෙනස් වීමේ දී ඇයගේ මාසික ආර්තවය බලපානු ලබයි. මෙකී හෝර්මෝන හරහා කාන්තාවක සතුව පවතින මනෝභාවයන් වෙනස්

කිරීමට ද සමත්කම් දක්වයි. එහි දී කාන්තාවක් සතුව විවිධ මනෝභාවයන් පවතින අතර ඇය මුහුණ දෙන්නා වූ අභියෝග හමුවේ ඇයගේ මනෝභාවයන් ක්ෂණිකව වෙනස් කිරීමට ඇය සතුව හැකියාව පවතින බව විවිධ පර්යේෂණ හරහා හෙළිකොට ඇත. මීට වසර දෙදහසකට පමණ පෙර රෝමානු ස්වාභාවික විද්‍යාඥ ප්ලිනි, ඔසප් වීමේ දී කාන්තාවන් හුදකලා කිරීම සඳහා තර්ක ගෙන ආ අතර ඔසප් වීම සමඟ ඇති අවදානම පිළිබඳ ඔහු මෙලෙස විස්තර කරන ලදී. ''දැලි පිහියක් මොරවා දමන්න, මී මැස්සන් රංචුවක් මරන්න, මිනිසුන්ගේ ශක්තිය නැති කර දමන්න ඔසප් කාන්තාවකට හැකියාව පවතී'' (Desmond & Penelope,1972). රෝමානු ස්වාභාවික විද්‍යාඥ ප්ලිනි විසින් අදහස් දක්වා ඇති මෙම ප්‍රකාශය සමඟ කාන්තාවකගේ මනෝභාවය ඔසප් දිනයන්හි වෙනස් වන ආකාරයත් එම වෙනස්වීම තුළින් ප්‍රචණ්ඩත්වය මතු වන අතර එම ප්‍රචණ්ඩත්වයේ ප්‍රබල බලපෑම සූක්ෂමව විස්තර කර ඇත. බොහෝ කාන්තාවන් ඔසප් වීම යන වචනය සාපය, මගේ වාරය, මගේ මාසික, මගේ මිතුරා, රතු කොඩිය වැනි වාද මඟින් ආදේශ කර ඇත. එමෙන්ම, කාන්තාව සංස්කෘතිකමය වශයෙන් සහ අතීතය පුරාවටම ඔසප් වීම මඟින් බියට හා අපහාසයට ලක් වන කොට්ඨාශයකි. නිදසුනක් වශයෙන් හින්දු නීතියට අනුව, ඔසප් වීමේ දී කාන්තාවන් දින තුනක් සඳහා සෙසු අය හැර තනිව විශ්‍රාම ගත යුතුය.

''ඔසප් වීම'' සාමාන්‍යයෙන් විග්‍රහ කරනු ලබන්නේ, යෝනි මාර්ගයෙන් රුධිර වහනය වන අතර එය ගර්භාෂය හා ඩිම්බ කෝෂ ඇති අයෙකුගේ සෞඛ්‍ය සම්පන්න මාසික චක්‍රයේ පවතින ස්වාභාවික කොටසකි. වැඩිවිය පැමිණීම (සාමාන්‍යයෙන් වයස 11 සිට 14 දක්වා) සහ ආර්තවහරණය (සාමාන්‍යයෙන් වයස අවුරුදු 51 පමණ) අතර සෑම මාසයකම කාන්තාවකගේ ශරීරය ගැබ් ගැනීම සඳහා සූදානම් වේ. එහි දී ගර්භාෂයේ ආවරණය ඝන වී බිත්තරයක් වැඩී එක් ඩිම්බ කෝෂයකින් මුදා හැරේ. ගැබ් ගැනීම සිදු නොවන්නේ නම්, ඊස්ට්‍රජන් සහ ප්‍රොජෙස්ටරෝන් මට්ටම පහත වැටී අවසානයේ ඔසප් වීම ආරම්භ කරන ලෙස සිරුරට පවසන මට්ටමකට පැමිණේ. ඔසප් කාලය තුළ දී ගර්භාෂය එහි ආවරණ ඉවත් කරන අතර රුධිරය සමඟ එය යෝනි මාර්ගය හරහා ශරීරයෙන් පිටතට යයි. මෙහිදී ඔසප් වීමත් සමඟම බොහෝ කාන්තාවන් ඩිස්මෙනෝරියා (Dysmenorrhea) රෝගයට ගොදුරු වීම දැකගත හැක. ඩිස්මෙනෝරියා යනු ඔසප් සාමයේ කාන්තාවක මුහුණ දෙන රෝගී තත්වයකි. හිසරදය, තෙහෙට්ටුව, ඔක්කාරය, වමනය, පාචනය, නොඉවසීම, මාංශ පේශි කැක්කුම වැනි රෝග ලක්‍ෂණ පෙන්නුම් කරයි. එහි දී මෙම රෝග ලක්ෂණයන්ගේ බලපෑම මත කාන්තාවක ප්‍රචණ්ඩත්වයට යොමු කරන්නාවූ පසුබිම ගොඩනැගීමට හැකියාව පවතී. කෙසේ වෙතත්, එය ජීවිතයේ ගුණාත්මක භාවයට බලපාන බැවින් සෑම මාසික ඔසප් චක්‍රයක් තුළම කාන්තාවන්ගෙන් 33% ක්ම දින 1-3 අතර කාලයක් දැඩි වේදනාවක් අත්විඳිති. ඔසප් වීමේ වේදනාවන් නිසා, ප්‍රජනන වයසේ සිටින කාන්තාවන්ගෙන් ආසන්න වශයෙන් 1% කට සෑම මාසයකම දින 1 සිට 3 දක්වා දරුණු ඩිස්මෙනෝරියා රෝගය හේතුවෙන් තම රැකියාව කිරීමට නොහැකි වූ අතර, ගැහැණු ළමයින්ගෙන් 14%ක් පමණ අධ්‍යාපනයෙන් බැහැරව සිටිති. ඩයිස්මෙනෝරියා රෝගයට දෛනික ක්‍රියාකාරකම් බලපාන අතර, වැඩිවිය

පැමිණීමේ දී අධ්‍යාපනයේ අඩු ක්‍රියාකාරීත්වයන් සහ නින්දේ ගුණාත්මක භාවය දුර්වල වීම මෙන්ම මානසික ආතතියට අහිතකර ලෙස බලපාන අතර එමඟින් සාංකාව සහ මානසික අවපීඩනය සිදුවේ (Pakpour et al., 2020).

මෙහි දී කාන්තාවන් මෙම තත්ත්වය මත කංසාව, විශාදය වැනි රෝගී තත්ත්වයන්ට මුහුණදෙන අතර එමඟින් සියදිවි නසා ගැනීමට ද පෙළඹීමට හැකියාව පවතී. එහිදී, ලොස්ඇන්ජලීස් හි සියදිවි නසාගැනීම් වැළැක්වීමේ මධ්‍යස්ථානයේ (Los Angeles Suicide Prevention Center) සේවය කරන දුරකථන ක්‍රියාකරුවන් විසින් ලබා දුන් වාර්තා පදනම්ව සියදිවි නසාගැනීමේ ඇමතුම් ලබා ගැනීමේදී බොහෝ කාන්තාවන් තම ඔසප් වීමට මුහුණ දුන් කාන්තාවන් බවට වාර්තා වී ඇත (Desmond & Penelope,1972). එමෙන් ම ළදරුවන් ඝාතනය කළ මවුවරුන්ට දඬුවම් ලැබෙන්නේ කලාතුරකිනි. මන්ද පසු ප්‍රසව අවස්ථාවේ දි මවකගේ මනෝභාවය විකෘති ස්වරූපයෙන් පැවතීමයි. එමෙන්ම කැනේඩියානු අපරාධ නීති සංග්‍රහයට අනුව ළමා උපත් මානසික කම්පනය මවගේ මානසික විකෘතිතාවයට හේතු විය හැකි බවට විද්‍යාත්මකව උපකල්පනයක් අඩංගු ළදරු ඝාතන විධිවිධාන ඇතුළත් වී ඇත. එහිදී ඔසප් වීමේ ගැටලු සංකීර්ණ වූ කාන්තාවන්ට උසාවියෙන් විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බව නීති පද්ධති හරහා සඳහන් කොට ඇත (Patricia, 1991).

කෙසේ වෙතත්, 19 වන සියවසේ දී කාන්තා පෞරුෂය පිළිබඳ මතයක් ඉස්මතු වූ අතර එය කාන්තා කායික විද්‍යාව සහ අපරාධකාරීත්වය යන සංකල්ප අතර පවත්නා සම්බන්ධතාවය හෙළිකිරීමට සමත් විය. කාන්තාවකගේ පෞරුෂය ඇගේ හෝමෝන මත පදනම්ව ගොඩනැගෙන අතර කාන්තාවකගේ ඔසප් චක්‍රය හා සම්බන්ධ ප්‍රචණ්ඩකාරී හැසිරීම් තුළින් එම පෞරුෂයෙහි ලක්ෂණ පිළිබිඹු කරයි. ගැහැණු දරුවන් උදාසීන, දුර්වල හා මානසික ආතතියට ඔසප් දිනයන්හි ගොදුරු වීමේ අවදානමක් පවතින අතර විශේෂයෙන් ගර්භණී සමයේ දී, පශ්චාත් ප්‍රසව අවධීන්හි මෙම තත්ත්වය උග්‍රවීම දැකගත හැක. එහි දී මෙම ඔසප් චක්‍රය හේතුවෙන් කාන්තාවන් තමන් විඳින පීඩා හේතුකොට ගෙන ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන්හි නිරතවන බව පෙන්වාදිය හැක. නිදසුනක් වශයෙන්, 1851 දී මිනීමැරුම් චෝදනාවලින් කාන්තාවන් දෙදෙනෙකු නිර්දෝෂී විය. වෛද්‍යවරුන් විසින් ඔවුන් තිදෙනාම ''ඔසප් වීම මැඩපැවැත්වීමේ'' ප්‍රතිඵලයක් ලෙස තාවකාලික උමතුවෙන් ක්‍රියා කළ බව සොයා ගන්නා ලදී. මෙම එක් කාන්තාවක් තමාව ප්‍රතික්ෂේප කළ පෙම්වතා ඝාතනය කර තිබේ. වෛද්‍යවරයෙක් සාක්ෂි දී ඇත්තේ ඇගේ ගර්භාෂයේ ගැටලු හේතුවෙන් මෙම ප්‍රචණ්ඩත්වයන් පෙන්නුම් කළ බවයි (Patricia, 1991). තවදුරටත් මේ පිළිබඳ අධ්‍යයනයේ දී, වර්ෂයක දී පැරීසියේ කාන්තාවන් විසින් සිදු කරන ලද සියලුම සාහසික අපරාධ අතුරින්, 84.0% ක්ම ඔසප් වූ කාන්තාවන් විසින් සිදු කරන ලද අතර නිව්යෝර්ක් බන්ධනාගාරයක දී, දරුණු අපරාධ සඳහා වරදකරුවන් වූ කාන්තාවන් හතලිස් දෙදෙනෙකුගෙන් විසිහය දෙනෙකු අපරාධය සිදු කිරීමේ දී ඔසප් වී ඇති බව හෙළි වී තිබේ. (Desmond & Penelope, 1972).

මේ ආකාරයට ගත් කල කළ කාන්තාවක ප්‍රචණ්ඩත්වය මුදා හැරීමේ එක් අවස්ථාවක් වශයෙන් ඇයගේ ඔසප් සමය පෙන්වාදිය හැකිය. ඔසප් සමය තුළ දී ඇයගේ හෝමෝන ක්‍රියාකාරිත්වය වෙනස් වීම හරහා මෙන්ම ඩිස්මෙනොරියා රෝගය හරහා ඇය විඳින පීඩා හේතුකොට ගෙන ඇය මෙලෙස ප්‍රචණ්ඩත්වය මුදා හැරීමට සමත් ව ඇති බව කිව හැක. අනෙක් දිනයන්ට සාපේක්ෂව ඔසප් දිනවල දී ඇයගේ මෙකී ප්‍රචණ්ඩත්වය මුදා හැරීමට හේතුවක් වශයෙන් හෝර්මෝන බලපෑම කිව හැක. එමෙන්ම ඔසප් දිනයන්හි කාන්තාවක ප්‍රචණ්ඩත්වය මුදා හැරීමට සහ සාපේක්ෂව ඔසප් දිනයන්හි කාන්තාවක වින්දිතබාවයට පත්වීමේ පත් වීමේ අවධානම ද ඉහළ ගොස් ඇත. මෙහි දී කාන්තාවකගේ ඔසප් චක්‍රය තුළ දී ඇය අපරාධකාරීත්වයට පෙළඹීම ද සහ සහය වින්දිතභාවයට පත්වීමට ඇය ජීවත්වන සමාජීය සාධක බෙහෙවින් බලපා ඇත.

යුරෝපීය සමාජයට සාපේක්ෂව ආසියානු සමාජය තුළ කාන්තාවක වින්දිතභාවයට පත්වීම දැකගත හැකි අතර ඔසප් අවධියේ දී කාන්තා වින්දිතභාවය ආසියානු සමාජය තුළ මුල්බැසගෙන ඇත. ආසියානු රටක් වන නේපාලය වැනි රටවල ඔසප් දිනයන්හි කාන්තාව අපිරිසිදු බාවයේ සංකේතයක් බවට පත්කොට ඇත. එහි දී නේපාලයේ බටහිර කොටසේ ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන්ගේ ඔසප් කාලය තුළදී මඩුවල දැමීම සිදු කර ඇති අතර තවදුරටත් ඔවුන් හින්දු ආගමේ විශ්වාසයන් මත මුල්බැස ඇති, චෞපාදි ඇතුළු ඔසප් වීමේ සීමා කිරීමට එම ජනතාව පෙළඹී ඇත. කෙසේ වෙතත්, මෙම පුරුද්ද මූලික මිනිස් අයිතිවාසිකම් හා මධ්‍යම සදාචාරාත්මක මූලධර්ම අභියෝගයට ලක් කරයි. නිදසුනක් වශයෙන්, මෙම පුරුද්ද නිසා කාන්තාවන්ගේ ශාරීරික උෂ්ණත්වය පහළ ගොස් සීතල අවදානම හේතුවෙන් ඇති වන අසනීප, නින්ද නොයාම සහ සෞඛ්‍යාරක්ෂිත නොවන තත්ත්වයන් තුළ ජීවත් වීම, සත්ත්ව ප්‍රහාර, සර්ප දෂ්ට කිරීම්, ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසා සහ දූර්වල ප්‍රවේශයන් වැනි විවිධ සෞඛ්‍ය ප්‍රතිවිපාකවලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇත. මෙම වෙනස්කොට සැලකීම හරහා කාන්තාව වින්දිතබාවයට ගොදුරුවන අතර එම වින්දිතභාවය තුළින්ම ඇය අපරාධකාරී චර්යාවන් පිළිබිඹු කිරීමට ද සමත්ව ඇත (Subash & Arja, 2021).

අසල්වැසි ඉන්දියානු රාජ්‍ය තුළ ඔසප් වීම මිත්‍යා මත රාශියක් මත ගොඩනැගී ඇත. ඒ අතර ඔසප් වීමේ ආරම්භය වෛදික යුගයේ සිට පැවත එන අතර බොහෝ විට එය සම්බන්ධ වී ඇත්තේ ඉන්ද්‍රගේ වර්ත්‍රස් ඝාතනය කිරීම සම්බන්ධයෙනි. මන්ද, බ්‍රාහ්මණ වංශිකයකු ඝාතනය කිරීමේ වරද සෑම මසකම ඔසප් වීමේදී ස්ත්‍රීන් විසින් විඳින වේදනාව ඉන්ද්‍රගේ වරදෙහි කොටසක් කරගත් බැවින් බව වේදයන්හි ප්‍රකාශ කළ ඇත. තවද, හින්දු ආගමේ, කාන්තාවන්ට ඔසප් වීමේ දී සාමාන්‍ය ජීවිතයට සහභාගී වීම තහනම් ය. ඇයට තම පවුලට ආපසු යාමට සහ ඇගේ ජීවිතයේ එදිනෙදා කටයුතු කිරීමට ඉඩ දීමට පෙර ඇය ''පවිත්‍ර'' කළ යුතුයි. කෙසේ වෙතත්, විද්‍යාත්මකව කරුණු නම්, ඔසප් වීමට සැබෑ හේතුව ඩිම්බ මෝචනය පසුව ගැබ් ගැනීමේ අවස්ථා අහිමි වීම සහ එන්ඩොමෙට්‍රියල් යාත්‍රාවලින් ලේ ගැලීම සිදු වන අතර ඊළඟ චක්‍රය සකස් කිරීම බව ය. එම නිසා, ඔසප් වීමේදී කාන්තාවන් "අපිරිසිදු" බවට ප්‍රකාශ කර ඇති මෙම මතය මිථ්‍යා

මතයක් බව ප්‍රකාශ කළ හැක. කෙසේ නමුත් වර්තමානයේ පවා මේ හේතුවෙන් බොහෝ ගැහැණු ළමයින් හා කාන්තාවන් ඔසප් වීම නිසාම ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ සීමාවලට යටත් වේ. බොහෝ සමාජවල පවතින ඔසප් වීම පිළිබඳ තහනම් කිරීම් ගැහැණු ළමයින්ගේ හා කාන්තාවන්ගේ චිත්තවේගීය තත්වය, මානසිකත්වය සහ ජීවන රටාව කෙරෙහි සහ වඩාත්ම වැදගත් ලෙස සෞඛ්‍යයට බලපායි. ආර්ථික වශයෙන් අඩු සංවර්ධනයක් ඇති බොහෝ රටවල ගැහැණු ළමයින් විශාල ප්‍රමාණයක් ඔසප් වීම ආරම්භ වන විට පාසලෙන් ඉවත් වේ. මෙයට ඉන්දියාවේ ගැහැණු ළමයින්ගෙන් 23% කට වැඩි ප්‍රමාණයක් ඇතුළත් වේ (Garg & Anand, 2015). මේ හරහා කාන්තාව සමාජීයමය වශයෙන් වින්දිතභාවයට මුහුණ දීම සිදුවේ. එහි දී අතුරු ප්‍රතිඵල වශයෙන් මානසික ආතතිය මෙමඟින් ඇති විය හැක.

එක්සත් ජනරජයේ ඔසප් වීමේ රෝග ලක්ෂණ: කාන්තාවන්ගේ අත්දැකීම් තුළ සමාජ සාධකවල වැදගත්කම පිළිබඳ නෝමා ඕ ෆ්ලින් විසින් කරන ලද පරීක්ෂණයකට අනුව ඔසප් වීම සඟවා ගැනීම සියලුම කාන්තාවන්ට වැදගත් වන බව හෙළි වී ඇත. මෙහි දී වාචිකව හා වාචික නොවන ආකාරයෙන් ආර්තවය සැඟවීම කාන්තාවන්ගේ අරමුණ වී ඇත. මෙම පරීක්ෂණ තුළින් හෙළිවී ඇත්තේ කාන්තාව තම ස්වාමියා හැරුණු කොට වෙනත් කිසිවෙකු සමඟ මේ පිළිබඳ සාකච්ඡා නොකරන බවයි. උදාහරණයක් වශයෙන් මෙහි දී මෙම අවස්ථාවේ ඔවුන්ට අනෙකාගෙන් උපකාර අවශ්‍ය වුවත් එම උපකාරය ලබා ගන්නේ මේ පිළිබඳව ඍජුව සඳහන් කිරීමකින් තොරව බව එම පර්යේෂණ හරහා හෙළි වී ඇත. එමෙන්ම මෙහි දී කාන්තාව රැකියා ස්ථානයේ දී හෝ අධ්‍යාපන අවස්ථාවක දී ඔසප් වීමේ දී ඇය දරුණු පීඩාවන් යටපත් කොටගෙන මුහුණ දෙන බව ඔවුන් පවසා ඇත. එහි දී බොහෝ විට ඔවුන්ට හේතුවක් නොමැතිව කේන්ති යාම සහ ඉන් මත්තට ප්‍රචණ්ඩත්වයන් මුදා හැරීම සිදු වන බව තවදුරටත් මෙම අධ්‍යයනයෙන් ප්‍රකාශ කළ ඇත. එපමණක් නොව මේ හරහා ප්‍රසිද්ධ සමාජය තුළ දී කාන්තාවක ඔසප් වී ඇති බව දැනගත් අවස්ථාවක සමාජය අනෙක් පුද්ගලයන් ඇයව පහත් ලෙස සලකා ඇයව සමාජයෙන් කොන් කරන අතර ඇයට කායිකව හා මානසිකව පීඩා ගෙන දීමට සමත්කම් කියන බව මෙම පර්යේෂණය හරහා හෙළිවී ඇති තවත් වැදගත් කරුණකි (O'Flynn, 2006).

සමස්තයක් වශයෙන් ගත් කල කළ කාන්තාවක සිය ජීවිතයේ වැඩි කාලයක් සමාජයීය වශයෙන් පොදුවේ වින්දිතභාවයට පත්වන අවස්ථාවක් වශයෙන් ඔසප් සමය පෙන්වා දිය හැක. සමාජයේ ජීවත් වන අනෙක් පුද්ගලයන් විසින් කාන්තාවක අපහසුතාවයට පත් කිරීමට මෙන්ම කාන්තාවක මානසිකව පීඩාවට පත්කිරිමට පවතින එක් අවස්ථාවක් වශයෙන් මෙය පෙන්වා දිය හැක. කෙසේ වෙතත් විසි එක්වන සියවස වන විට මෙම තත්ත්වය යම්තාක් දුරට පාලනය වී ඇති නමුත් වර්තමානය වන විට විට ද මෙවැනි මිත්‍යා මත තුළ සිටිමින් කාන්තාවන් වෙනස් කොට සලකන සමාජීය සංස්ථා ද ඇත. බොහෝ විට මෙම තත්ත්වය යුරෝපීය සමාජවලට සාපේක්ෂව ආසියානු සමාජය තුළ සංස්කෘතියෙහි මුල් මුල්බැසගෙන ඇති ලක්ෂණයක් වශයෙන් පෙන්වා දිය හැක. අනෙක් අතට

ගත්විට කාන්තා සාපරාධිත්වයට කාන්තාවකගේ අභ්‍යන්තරය පවතින හේතු සාධකයක් වශයෙන් මෙම ඔසප් වීම පෙන්වා දිය හැකිය. එම අවස්ථාවන්වල දී ඇය මුහුණ දෙන පීඩාවන් මුදා හැරීම සඳහා ප්‍රචණ්ඩත්වය මාධ්‍ය කරගන්නා අවස්ථා ද උක්ත විග්‍රහය තුළ පහදා ඇත. මේ අනුව ගත් කල කාන්තාවක ඇයගේ ජීවිතය ප්‍රචණ්ඩත්වය කරා ළඟාවීම සහ ඇය වින්දිතභාවය කරා ළඟාවීමට පවතින එක් සාධකයක් වශයෙන් ඇයගේ ඔසප් සමය පෙන්වා දිය හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Amir H., P., Farideh, K., Zainab, A. and Mark D., G., 2020. Depression, anxiety, stress, and dysmenorrhea: a protocol for a systematic review. *US National Library of Medicine*, [online] Available at: <https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC7098110/> [Accessed 15 October 2021].

Desmond .P, E. and Penelope, A., 1972. Menstruation and Aggressive Behavior in a Correctional Center for Women. *ResearchGate*, [online] Available at: <https://scholarlycommons.law.northwestern.edu/cgi/viewcontent.cgi?article=5733&context=jclc> [Accessed 14 October 2021].

Garg.S.,Anand.T.,2015.Menstruation related myths in India: strategies for combating it.*US Nations Library of Medicine*, [online] Available at: <https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC4408698/>[Accessed 15 October 2021]

Heidensohn, F., 1995. Understanding Female Criminality (From The Sociology of Crime and Deviance: Selected Issues. *U.S. Department of Justice*, [online] Available at: <https://www.ojp.gov/ncjrs/virtual-library/abstracts/understanding-female-criminality-sociology-crime-and-deviance> [Accessed 15 October 2021].

O'Flynn, N., 2006. Menstrual symptoms: the importance of social factors in women's experiences. *US National Library of Medicine*, [online] Available at: <https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC1934056/> [Accessed 15 October 2021].

Patricia L., E., 1991. Women and Crime: Premenstrual Issues. *ResearchGate*, [online]Available at:<http://file:///C:/Users/diani/Downloads/Women_and_Crime_Premenstrual_Issues%20(1).pdf> [Accessed 15 October 2021].

Subash, T. and Arja R., A., 2021. Menstruation means impurity': multilevel interventions are needed to break the menstrual taboo in Nepal. *BMC Women's*

*Health*, [online] Available at: <https://bmcwomenshealth.biomedcentral.com /articles/10.1186/s12905-021-01231-6> [Accessed 15 October 2021].

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ කාන්තා වින්දිතයෝ

බුද්ධික මිතුල කුමානායක

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ වැඩි වශයෙන් කතාබහට ලක්වන පාර්ශ්වය ලෙස කාන්තාවන් පෙන්වා දිය හැකිය. එමගින් ගම්‍ය වනුයේ පුරුෂයා පිළිබඳ කතිකාවතක් සමාජය තුළ නොපවතින බව නොවේ. නමුත් පවතින සමාජ ක්‍රමය තුළ පුරුෂයා වීරයකු ලෙස පෙන්වා දෙන අතර කාන්තාවගේ ආරක්ෂාව හා රැකවරණය සපයන්නා වූ මෙන්ම දැඩි පෞරුෂයකින් යුත් චරිතයක් බවට අතීතයේ සිටම මෙම සමාජ ක්‍රමය තුළ පුරුෂයාව ආරෝපණය කර තිබේ. එයටම රුකුලක් දෙනු ලබන අනෙක් මතවාදය වන්නේ කාන්තාව මානසික මෙන්ම ශාරීරික අතින් ද දුර්වල වූ, පුරුෂයා මත යැපෙන චරිතයක් ලෙස පෙන්වා දීම වේ. එය අතීතයේ බමුණු සමාජයේ සිටම පැවත එන්නකි. ඒ අනුව මෙම සමාජ ක්‍රමය තුළ කාන්තාවන් හා පුරුෂයන් සඳහා වෙන වෙනම මතවාද ගොඩනැගී ඇති බව මොනවට අවබෝධ වනු ලබයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ කාන්තාවන් අපරාධ ක්‍රියා තුළින්ම පමණක් වින්දිතභාවයට පත් නොවේ. එනම් ජාතක කතාකරුවා **චන්නකින්නර ජාතකය** තුළින් වියෝ වූ කිඳුරා ළඟ යුක්තිය අයදින කිඳුරියකගේ වැළපීම විදහා දක්වයි. එමෙන්ම ජාතක කතාකරුවා **සම්බුලා ජාතකය** තුළ පතිවත රැකගනිමින් ස්වාමියා වෙනුවෙන් දිවි පරදුවට තබා කැප වෙන කාන්තා චරිතයක් තුළින් පෙන්වා දෙනු ලබයි. මෙකී කරුණු දෙස බැලීමේදී කාන්තාවක් තුළ තිබෙන්නා වූ ආදරය, සෙනෙහස මෙන්ම කාන්තාවකගෙන් ඉටුවිය යුතු යුතුකම් හා ස්වාමියාට තිබෙන්නා වූ භක්තිය පිළිබඳව ජාතක කතාකරුවා පෙන්වා දී ඇති බව ඇතැමෙකුට තර්ක කළ හැකිය. නමුත් මෙම කථා වස්තුන් ද්විත්වය තුළින්ම තම පුරුෂයා අහිමි වේ යැයි සිතමින් මානසික හා කායික වශයෙන් පීඩාවට ලක්වන කාන්තා වින්දිතභාවය පිළිබඳවත්, තම ස්වාමියා අහිමි වීම තුළ පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමයේ කාන්තාවට එල්ලවන අභියෝග හේතුවෙන් මුහුණ දීමට සිදුවන වින්දිතභාවය පිළිබඳවත් පෙන්වා දී ඇති බව සූක්ෂ්මව කරුණු පිරික්සීමේ දී පෙන්නුම් කෙරෙයි. ඒ අනුව ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ විවිධ අයුරින් හා විවිධ දෘෂ්ටිකෝණවලින් බැලූ කල කාන්තාවන් වින්දිතභාවයට පත් වීම නොයෙක් ආකාරයෙන් සිදුවන බව මෙමගින් පැහැදිලි වනු ලබයි.

ඒ අනුව මෙබඳු වූ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වූ කලී සමාජය තුළ ගොඩනැගෙන්නක් ලෙස පෙන්වා දිය හැකිය. නමුත් ස්ත්‍රී-පුරුෂභාවය යනු වෙනත් අර්ථයක් ගනු ලබන ලිංගිකත්වය මත ගොඩ නැගෙන්නක් වේ. එනම් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳව සමාජ විද්‍යාත්මක මතවාදයන් ගොඩනැගෙන අතර ස්ත්‍රී-පුරුෂ භාවය ජීව

විද්‍යාත්මක අංශය සඳහා යොමු වන්නකි. ඒ අනුව ඉහත දැක්වූ කරුණු මඟින් පැහැදිලි වනුයේ කාන්තාවන් විවිධ ආකාරයෙන් වින්දිතභාවයට පත්වන බවයි. එහිදී එකී ආකාර තුළ එන එක් අවස්ථාවක් ලෙස පවුල් සංස්ථාව තුළ ම කාන්තාවන් වින්දිතභාවයට පත්වීම දැකිය හැකිය. කාන්තාවකගේ උපතේ සිට ම අනේකවිධ වූ සීමාවන්ට හා නීති රීතීන්ට යටත්ව පවුල් සංස්ථාව තුළ ම ජීවත් වීමට සිදු වී තිබේ. එනම් ඇතැම් අවස්ථාවන්වල දී පුරුෂයා විසින් කාන්තාව ගෘහය තුළ කොටු කර ගැනීමක්, නැතිනම් පවුල් සංස්ථාව තුළ යම් සීමා පැන්වීම් සිදු කරනු ලැබ ඇත. එහිදී පුරුෂ කේන්ද්‍රීය සමාජයක පුරුෂයා ප්‍රබල අයෙකු බවත්, කාන්තාව දුර්වල අයෙකු බවත්, කාන්තාව නිවස තුළ දරුවන්ගේ හා ස්වාමි පුරුෂයාගේ අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු බවත් යන මතවාද ඔස්සේ පුරුෂයෝ කටයුතු කරති. එතුළින් කාන්තාවකගේ නිදහස අහිමිවීමත්, පෞරුෂය හීන වීමත් සිදුවිය හැකි අතර ඒ තුළින්ද කාන්තාවන් වින්දිතභාවයට පත්වීම සිදුවෙයි. ඇතැම් සමාජ හා සංස්කෘතික තත්ත්වයන් තුළ බාල වයස් විවාහය ආදිය සිදු කිරීම මත කාන්තාවකගේ එනම් ගැහැණු දරුවෙකුගේ ළමා කාලය පවා අහෝසි කර ඇති බව පැහැදිලි වේ. පුරුෂ මූලික සමාජ ක්‍රමයක පවුල් සංස්ථාව තුළ තම ස්වාමියාට පක්ෂපාතීව සිටීමත්, ඇතැම් අවස්ථාවන්වල දී ගෘහස්ථ හිංසනය ආදි විවිධ අතවරයන්වලට ලක් වීමත්, පුරුෂයා නොමැති පවුල් කුටුම්බයක සමාජයෙන් එල්ලවන ගැරහුම් ඉවසා දරා ගැනීමටත් කාන්තාවට සිදු වී තිබේ. ඒ අනුව පවුල් සංස්ථාව තුළ ද ඇතැම් හේතු මත කාන්තාවන් වින්දිතභාවයට පත්වෙන බව මෙහි දී පැහැදිලි වනු ලබයි.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් මෙම සමාජ ක්‍රමය තුළ කාන්තාව වැඩි වශයෙන් අනාරක්ෂිත තත්ත්වයකට පත්වී තිබේ. එනම් කාන්තාවක් හුදකලා වන ස්ථානයක, පොදු ප්‍රවාහන මාධ්‍යයක, රැකියා කරන ස්ථානයක මෙන්ම ඇතැම් අවස්ථාවල දී තම සමීපතමයන්ගෙන් පවා විවිධ ආකාරයේ වින්දිතභාවයන්ට පත්විය හැකි අවස්ථා බහුල ය. මෙවැනි අවස්ථාවන් තුළ බහුල වශයෙන් පුරුෂයන්ගේ ග්‍රහණය තුළින් කාන්තාවන් වින්දිතභාවයට පත් වනු ලබයි. දින චරියාවක් වශයෙන් එකම ක්‍රියාවක නියැලෙන කාන්තාව නම් එමෙන් ම බොහෝ අවස්ථාවන් තුළ දී හුදකලාව කටයුතු කරනු ලබන තැනැත්තියක නම් වින්දිතභාවයට පත් වීමේ ප්‍රවණතාව ඉහළ මට්ටමක පවතී. අපරාධවිද්‍යාව තුළ සාකච්ඡාවට බඳුන් වන දෛනික ක්‍රියාකාරකම් න්‍යාය මෙන්ම ජීවන විලාසිතා න්‍යාය ආදිය මීට කදිම නිදසුන් සපයන න්‍යායාත්මක මතවාද ලෙස පෙන්වා දිය හැකිය. නිදසුනක් ලෙස ගතහොත් සෑම දිනකම තම රැකියාව නිම වී එකම වේලාවක් තුළ එකම මාර්ගයක් ඔස්සේ තම නිවස බලා හුදකලාව ගමන් කරනු ලබන කාන්තාවක් වී නම් ඇය යම් කිසි අපරාධයක ගොදුරක් වීමේ සම්භාවිතාව වැඩි අගයක් ගනු ලබයි. එහිදී තම පළඳනාවකට එනම් චංචල දේපළකට හානියක් සිදුවිය හැකිය. නැතිනම් තවත් ආකාරයකට ඇගේ ජීවිතයට අනතුරක් සිදුවිය හැකිය. ඒ අනුව මෙම සමාජ ක්‍රමය තුළ කාන්තාව දැඩි වශයෙන් සීමාවන්ට පත් වී ඇති අතර වින්දිතභාවයේ උපරිමයකට යටත් වී ඇති බව පැහැදිලි වේ.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ පුරුෂයා වින්දිතභාවයට පත් වීමට වඩා කාන්තාව වින්දිතභාවයට පත්වීම තුළ ඇය තව තවත් වින්දිතභාවයට පත්වීම සිදු වනු ලබයි. එනම් අපරාධ විද්‍යාත්මක දෘෂ්ටි කෝණය තුළින් බැලූ කල අපරාධයකට ගොදුරු වනු ලබන කාන්තාවක් පුරුෂයාට වඩා වැඩි වශයෙන් වින්දිතභාවයට පත්වන බව පෙන්වා දිය හැකිය. නිදසුනක් ලෙස ස්ත්‍රී දූෂණය නම් කාන්තාවන්ට එරෙහිව සිදු වනු ලබන ප්‍රධානතම අපරාධය තුළ කාන්තාව එම අපරාධ ක්‍රියාව හේතුවෙන් මෙන්ම එම අපරාධයේ ප්‍රතිවිපාකයන් තුළින් ද තව තවත් වින්දිතභාවයට පත්වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. එනම් ස්ත්‍රී දූෂණයක් වූ විට එම අපරාධය තුළින් එම කාන්තාව වැඩි වශයෙන් වින්දිතභාවයට පත් වනු ලබයි. එතුළින් කාන්තාවගේ අනාගතයටත්, පවුල් ජීවිතය තුළටත් වැඩි වශයෙන් බලපෑම් ඇති වන අතර ඒ තුළින් සමාජයේ ගැරහුම් නින්දාවලටද පාත්‍ර වීමට කාන්තාවට සිදු වනු ලබයි. ඒ අනුව එකී අපරාධය තුළින් කාන්තාව තවත් ආකාරයක වින්දිතභාවයට පත්වන බව මෙහිදී පෙනී යයි. එමෙන්ම එම අපරාධය සම්බන්ධයෙන් අපරාධ යුක්ති ක්‍රියා පටිපාටියට අදාළ කාර්යයන් සිදු කිරීම තුළ ද ඇය තව තවත් වින්දිතභාවයට පත් වනු ලබයි. එනම් අදාළ සාම නිලධාරීන් හා අධිකරණය ඉදිරියේ මෙම අපරාධය නැවත නැවත පැවසීම තුළ ඇගේ ආත්ම ගෞරවයට හා පෞරුෂයට දැඩි වශයෙන් හානි වන බව අමුතුවෙන් කිවයුතු කරුණක් නොවේ. ඒ අනුව මෙම කාන්තාව මෙකී තත්ත්වයන් තුළ එක් වරක් නොව කිහිප වතාවක් වින්දිතභාවයට නැවත නැවත පත් වන බව මෙමගින් මනාව අවබෝධ වේ.

යථෝක්ත දැක්වූ පරිදි කාන්තාවන් වින්දිතභාවයට පත්වන සුවිශේෂ සාධකයක් ලෙස අපරාධයන් පෙන්වා දිය හැකිය. එහිදී කාන්තාවන්ට සිදුවන අපරාධයන් අතරට ස්ත්‍රී දූෂණය, අඩන්තේට්ටම් කිරීම්, ලිංගික අතවර, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, වෛවාහක ස්ත්‍රී දූෂණය, අපහරණය හා පැහැරගෙන යාම්, බරපතල ලිංගික අපයෝජනය මෙන්ම මිනීමැරුම හා සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය යන අපරාධ ක්‍රියාවන් ද පෙන්වා දිය හැකිය. මෙහිදී ස්ත්‍රී පුරුෂභාවය තුළ මෙකී සමාජ ක්‍රමයේ බහුල වශයෙන් කාන්තාවන්ට එරෙහිව මෙකී වූ අපරාධ සිදු වන බව අමුතුවෙන් කිව යුතු කරුණක් නොවේ. මේ අනුව කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ අතරින් ප්‍රධානතම හා ප්‍රබලම අපරාධයක් ලෙස ස්ත්‍රී දූෂණය පෙන්වා දිය හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාව තුළ මෙකී වූ අපරාධ සිදු වී ඇති ආකාර පිළිබඳව වර්ෂ කිහිපයක වාර්තා වූ වයස අවුරුදු 16ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳ සංඛ්‍යා දත්තයන් නිදසුන් කොට ගනිමින් පෙන්වා දිය හැක. එනම්,


**වගු අංක 01 - වයස අවුරුදු 16ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳ සංඛ්‍යා දත්ත (2016-2020)**

| වර්ෂය | වාර්තා වී ඇති සංඛ්‍යාව |
|---|---|
| 2016 | 350 |
| 2017 | 294 |
| 2018 | 345 |

| | |
|---|---|
| 2019 | 289 |
| 2020 | 300 |

**මූලාශ්‍රය** - www.police.lk

**ප්‍රස්තාර අංක 01 - වයස අවුරුදු 16ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳ සංඛ්‍යා දත්ත (2016-2020)**




මූලාශ්‍රය - www.police.lk

ඉහත දක්වන ලද සංඛ්‍යා දත්තයන් මඟින් පෙනී යනු ලබන්නේ 2016 වසරේ දී වයස අවුරුදු 16ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳ සංඛ්‍යාව 350 ක් පමණ වන අතර එය 2017 වර්ෂය වන විට තරමක් පහත වැටී ඇති බවයි. නමුත් එය 2018 වර්ෂයේ දී නැවත ඉහළ යාමක් පෙන්නුම් කරනු ලබයි. දැනට ආසන්නතම වර්ෂය වන 2020 වර්ෂය වන විට 2019 වර්ෂයේ සඳහන් වන වයස අවුරුදු 16ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම පිළිබඳ වාර්තා වීම් සංඛ්‍යාවට වඩා වැඩියෙන් එම අපරාධ වී ඇති බව පෙනී යනු ලබයි.


එමෙන්ම ස්ත්‍රී දූෂණය පිළිබඳව දැක්වීමේදී ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය පිළිබඳව ද අවධානය යොමු කළ යුතු වේ. කාන්තාවන්ට එරෙහිව සිදු කරනු ලබන ප්‍රබලතම අපරාධයක් ලෙස ගැනෙන මෙය තුළ ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (අවුරුදු 16 ට අඩු කාන්තාවන්) වින්දිතයාගේ කැමැත්ත ඇතිව/නොමැතිව යනුවෙන් කාණ්ඩ ද්විත්වයක් ඔස්සේ පෙන්වා දී ඇත.

**වගු අංක 02 - ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (අවුරුදු 16 ට අඩු කාන්තාවන්) වින්දිතයාගේ කැමැත්ත ඇතිව/නොමැතිව**

| වර්ෂය | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|
| ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (අවුරුදු 16ට අඩු කාන්තාවන්) වින්දිතයාගේ කැමැත්ත ඇතිව | 1394 | 1206 | 1199 | 1185 | 1292 |
| ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (අවුරුදු 16ට අඩු කාන්තාවන්) වින්දිතයාගේ කැමැත්ත නොමැතිව | 292 | 232 | 248 | 305 | 361 |

මූලාශ්‍රය - www.police.lk

**ප්‍රස්තාර අංක 02 - ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (අවුරුදු 16 ට අඩු කාන්තාවන්) වින්දිතයාගේ කැමැත්ත ඇතිව/ නොමැතිව**




මූලාශ්‍රය - www.police.lk

මේ අනුව පෙනී යන්නේ ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය තුළ (අවුරුදු 16 ට අඩු කාන්තාවන්) වින්දිතයාගේ කැමැත්ත නොමැතිව සිදුවී ඇති ස්ත්‍රී දූෂණයන්ට වඩා කැමැත්ත ඇතිව සිදු වී ඇති ස්ත්‍රී දූෂණයන් ඉහළ අගයක් ගනු ලබන බවයි. එමෙන්ම 2016 ඉන්පසුව 2017, 2018, 2019 යන වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේ දී වින්දිතයාගේ කැමැත්ත සහිතව සිදුවී ඇති ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණ අනුව අවුරුදු 16 ට අඩු කාන්තාවන්) ප්‍රමාණය ඉහළ මට්ටමක පවතිනු ලබයි.

එමෙන්ම මෑතකාලීන ගෝලීය ව්‍යාප්ති සංඛ්‍යා ලේඛනවලින් පෙනී යන්නේ ලොව පුරා සිටින කාන්තාවන්ගෙන් 35% ක් තම ජීවිත කාලය තුළ සමීප හවුල්කාර හිංසනය හෝ හවුල් නොවන ලිංගික හිංසනය අත්විඳ ඇති බවයි. සාමාන්‍යයෙන්, සම්බන්ධතාවක සිටි කාන්තාවන්ගෙන් 30% ක් වාර්තා කරන්නේ තම සහකරුගේ යම් ආකාරයක ශාරීරික හෝ ලිංගික හිංසනයකට තමන් මුහුණ දී ඇති බවයි. ගෝලීය වශයෙන් ගත් කල, ස්ත්‍රී ඝාතනවලින් 38% ක් පමණ සිදු කරනුයේ සමීප සහකරුවකු විසිනි (https://apps.who.int/iris/ ).

අද සමාජයේ සිදුවන අපරාධ අතර ගොදුරු විරහිත අපරාධයක් ගත් විට ගණිකා වෘත්තිය ප්‍රධාන තැනක් ගනු ලබයි. ප්‍රධාන වශයෙන් කාන්තාවන් මෙම ගණිකා වෘත්තිය තුළ යෙදෙන අතර ඒ තුළ අපරාධකරුවාත්, වින්දිතයාත් යන දෙදෙනාම එක් අයකු ලෙස පෙන්වා දිය හැකිය. එනම් කාන්තාව වේ. මෙකී තවූ තත්ත්වය තුළ පොදුවේ ගත් කල අපරාධකාරී චර්යාවක් ලෙස පෙනී යන අතර කාන්තාවන් මේ සඳහා යොමු වන්නේ කුමන හේතුවක් මතද, මෙකී නීතිවිරෝධී වෘත්තින් සිදු කරනු ලබන්නේ කුමන පදනමක් මතද යන්න ආදි තත්ත්ව පිළිබඳ විමසා බැලීමේදී වැඩි වශයෙන් ආර්ථික, සමාජීය හා අපරාධ යන සාධක තුළ වින්දිතභාවයට පත්වූවන් සිටිය හැකිය. එනම් ඔවුන්ගේ අපරාධකාරී චර්යාවන් පිළිබඳ වැඩි වශයෙන් කතාබහට ලක්වවූවද ඒ තත්ත්වයට පෙලඹීම්ට බලපෑ සාධකයක් පිළිබඳ සමාජය අඩු අවදානම්කට ලක් කර තිබේ. රණබන්ඩා සෙනෙවිරත්න තම ළඳුනේ ගීතය තුළ '**ලැම පමනක් ලොවට පෙනෙන - ළය නොපෙනෙන ළඳුනේ'** යනුවෙන් මෙකී කාන්තාවන්ගේ සැබෑ ස්වරූපය මනාවට පසක් කොට තිබේ. එමෙන්ම '**පිරිමින්ගේ පාප කඳට - දෝස විඳින ළඳුනේ'** යනුවෙන් සඳහන් කිරීම තුළ මෙකී සාකච්ඡාවට බඳුන් කරනු ලබන ප්‍රස්තුතයට තව තවත් අර්ථ විග්‍රහයක් ලැබෙනු ඇත. ශ්‍රී ලංකාව තුළ මෙම ගණිකා වෘත්තිය තහනම් වන අතර එය නීතියට අනුව වරදක් වේ. එමෙන්ම වින්දිතයන් පිළිබඳ සානුකම්පිත දෘෂ්ටි කෝණයක් තුළින් මේ දෙස බැලීමේදී සැබැවින්ම එකී කාන්තාවන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත සමාජ ගැරහුම් තුළින් වින්දිත භාවයෙන් මිරිකී සිටිනු ලබයි.

සැබැවින්ම ආර්ථික සංස්ථාව තුළ ද කාන්තාවන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ වින්දිතයන් බවට පත්වී තිබේ. එනම් අද වන විට කාන්තාවන් වෙළෙඳ භාණ්ඩ බවට පත් වී ඇති අතර කාන්තාවන් ජාවාරම් කිරීම් ආදිය බහුල වශයෙන් සිදු වනු ලබයි. එමෙන්ම වර්තමානය වන විට පවතින නූතන තාක්ෂණික ක්‍රමයන් තුළ අපරාධකාරී ස්වභාවයන් වෙනස් මාර්ගයක් ගනු ලබන අතර අන්තර්ජාලය ඔස්සේ කාන්තාවන් විකිණීම එමෙන්ම ජාවාරම් කිරීම සිදු කරනු ලබයි. එහිදී කාන්තාවන් නැවත නැවතත් අපරාධ වින්දිතභාවයට පත් වනු ලබයි. එමෙන්ම අද වන විට අප රට තුළට වැඩි වශයෙන් මුදල් ගෙන එනු ලබන ප්‍රධාන සාධකයන් ලෙස ගෘහ සේවිකාවන් ලෙස විදේශගත කාන්තාවන් පෙන්වා දිය හැකිය. මෙහිදී ඔවුන් යම් වැටුපකට රැකියාවක් කිරීම් සඳහා විදේශ ගත වුවද එම රාජ්‍යයන් තුළ විවිධ වින්දිතභාවයන්ට ලක් වනු ලබයි. මෙරට තුළ ආර්ථික වශයෙන් වින්දිතභාවයට පත්වන කාන්තාවන් මෙකී තත්ත්වය මත තව තවත් වින්දිතභාවයට පත්වීම සිදු වනු ලබයි.

**සමාලෝචනය**

ඒ අනුව පෙනී යන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සම්බන්ධව ස්ත්‍රිය වැඩි වශයෙන් වින්දිතභාවයට පත්වන බවයි. මෙහිදී ඇතැම් අවස්ථාවන්වල දී හුදකලා වීම, ඇඳුම් පැළඳුම් නො පැළඳීම, සමාජයේ ජීවත්වීමට අවශ්‍ය දැනුමේ ඌනතාව, මිනිසුන් නිසි ආකාරයෙන් තේරුම් ගැනීමට අපොහොසත් වීම, ආදි විවිධ හේතුන් මත මෙම වූ කාන්තාවන් පුරුෂ කේන්ද්‍රීය සමාජය තුළ පුරුෂයාගේම හෝ වෙනත් ආකාරයෙන් වින්දිතභාවයන්ට පත් වනු ලබන බවයි. ඒ අනුවත් කාන්තාව යනු සැමවිටම ආරක්ෂා කළ යුතු හා අවධානය ලබා දිය යුතු පිරිසක් බව මෙහිදී පෙන්වා දිය යුතුවේ. සමාජ විකාශනයේ හා සමාජ පැවැත්මේ අත්‍යවශ්‍ය සාධකයක් ලෙස පෙන්වා දිය හැකි ස්ත්‍රීන්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය තුළ පීඩාවට පත්වීමට පවතින ඉඩ අහුරමින් ආරක්ෂා කර ගැනීම මුළු මහත් සමාජයේම වගකීමක් වේ. ඒ අනුව මෙකී සමාජය තුළ කාන්තාවන් වින්දිත භාවයෙන් වළක්වා ගැනීමට හා ආරක්ෂා කර ගැනීමටත් කළ යුතු වන ප්‍රධාන පිළියම ලෙස කාන්තාවන් සඳහා සමාජයේ නිසි තැන ලබාදීම කළ යුතු බව පෙන්වාදිය යුතුවේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Apps.who.int.2021[online]Availableat:https://apps.who.int/iris/bitstream/handle/10665/112325/WHO_RHR_14.11_eng.pdf.

2021.[online]Availableat:<https://www.researchgate.net/publication/334761471_Crime_against_Women_and_its_Impact_on_Them

www.police.lk:

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත රැකියාවේ නියුක්ත කාන්තාවන්ගේ අපරාධ වින්දිතභාවය

**එම්.සී.එස්. වර්ණකුලසූරිය**

**හැඳින්වීම**

මෙරට තුළ සිදුවන ලිංගිකත්වය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය (Sexual and Gender Based Violence - SGBV) සම්බන්ධයෙන් නඩු පැවරීම සඳහා වර්තමානයෙහි ක්‍රියාත්මක වන නීති කිහිපයක් පැවතිය ද ඒවා ප්‍රමාණවත් නොවන බව විද්‍යමාන වන අතර, එලෙස පවතින සීමිත නෛතික විධිවිධානයන් භාවිත කිරීමෙන් පවා මේ සම්බන්ධයෙන් නඩු පැවරීම් යම් තරමක් දුරට සිදු වේ. නිදසුනක් වශයෙන්, වර්ෂ 2019 දී ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී දූෂණ සිදුවීම් 1,779 ක් වාර්තා වී ඇති අතර, එම වැරදි සම්බන්ධයෙන් ගොනු කර ඇති පැමිණිලි (සහ/හෝ අධිචෝදනා) සංඛ්‍යාව 235 ක් පමණි. රජයක වගකීම වන්නේ හුදෙක් නීති සම්පාදනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පමණක් නොවන අතර අපාරාධ යුක්තිය පසිඳලීමේ සමස්ත යාන්ත්‍රණයයෙහි සාර්ථකත්වය සහතික කිරීම සඳහා ඊට අදාළ සියලු ව්‍යුහයන්හි කාර්ය කර්තව්‍යයන් සුමටව ක්‍රියාත්මක වන බව සහතික කිරීමට ද පියවර ගත යුතුය. මීට අමතරව, ලිංගිකත්වය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයට අදාල ක්‍රියාවන්ට එරෙහිව නඩු පැවරීම සහතික කිරීම සඳහා රජයෙහි කාර්යභාරයට අමතරව, ලිංගිකත්වය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය වැළකිය යුතුය. ලිංගිකත්වය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සම්බන්ධයෙන් කිසිදු බියකින් සැකයකින් තොරව කාන්තාවන්ට ඔවුන්ගේ දෛනික ජීවිතයෙහි කටයුතු භුක්ති විඳීමේ නිදහස තිබිය යුතු අතර, එසේ කළ හැකි වන්නේ මෙම වැරදිවලට හේතු පාදක වන සාධක ආමන්ත්‍රණය කිරීමෙන් පමණි. සියලු පුරවැසියන්ගේ නිදහස සහතික කෙරෙන සාධාරණ සමාජයක් පැවතිය හැක්කේ මෙවන් තත්ත්වයක් ස්ථාපිත වූ විට පමණි. ඒ අනුව මෙකී ලිපිය තුළින් රැකියා ක්ෂේත්‍රය තුළ කාන්තාවක් කොතෙක් දුරට අපරාධමය වින්දිතභාවයට පත්වනවාද යන්න සාකච්ඡා කිරීම සිදු කරයි. ඒ සඳහා අංශ ගණනාවක් යටතේ ප්‍රවේශය සලසා ගත හැකිය. එනම්,

1. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තාව පිළිබඳ හැඳින්වීම
2. කාන්තා වින්දිතභාවය පිළිබඳ හැඳින්වීම
3. කාන්තා සේවා නියුක්තිය
4. වැඩ කරන ලෝකයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය හඳුන්වා දීම

5. ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තාව පිළිබඳ හැඳින්වීම.**

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නැමති සංකල්පය සාකච්ඡා කරන විට හුදෙක් යම් පිරිස් එය ලිංගිකත්වයයි ප්‍රකාශ කරති. ලිංගිකත්වය යනු ජීවවිද්‍යාත්මක තත්ත්වයක් වන අතර ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු සංස්කෘතිකමය තත්ත්වයකි. සමාජ විද්‍යාව තුළ ස්ත්‍රී-පුරුෂ භාවය අතීතයේ සිට කතාබහකට ලක්ව ඇති නව සංකල්පයක් වශයෙන් ද හැඳින්විය හැකිය. ගැහැණු හා පිරිමි යන දෙපාර්ශවයටම දී ඇති සමාජ සංස්කෘතික නිර්වචනය මීට අයත් වේ. කෙසේ වුවද ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සමාජ ස්ථරයක් ගොඩනැංවීමද මෙමඟින් සිදු වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රධාන කොටස් 3 වර්ග කර ඇත.

- ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධ අඟනාකම්
- ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධ අඟනාකම් උල්ලංඝනය වූ විට අපගාමී චර්යාවන්
- ප්‍රතිශෝධන අනුදැනුම්, වශයෙනී **(එදිරිසිංහ, අ.ඉ.ජ්, 2007).**

යම් සංස්කෘතියක් තුළ පවත්නා විශ්වාස පදනම් කර ගනිමින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පැහැදිලි කර ගත හැකි මෙන්ම ඒ තුළින් සමාජ තත්ත්වයක් ස්ථාපිත කරයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ රැඩිකල්වාදීන් ප්‍රකාශ කරන්නේ, සමාජයේ සිටින බලවත් කණ්ඩායම මඟින් අනෙක් පුද්ගල පිරිස පාලනය කරන බවයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සමාජයට යම් කෘත්‍යයක් ඉටු කරන බවත් බලවත් කණ්ඩායමක් ලෙස පුරුෂයින් කාන්තාවන් පාලනය කරන බවයි. මෙම තත්ත්වය බොහෝ සමාජවල දක්නට ඇති ලක්ෂණයකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ ඉදිරිපත් කරන ලද "Everyday Life Theory" හිදී ඇත්තේ ස්ත්‍රිය හා පුරුෂයා තමා පිළිබඳ හඳුනා ගැනීමක් සිදු කරන බවයි. මිනිසුන් තම කාර්යය ඉටු කරන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගෙන බවයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා කාන්තාව සම්බන්ධව සාකච්ඡා කරන විට,

කාන්තාව යනු සමාජය තුළ සිටින සුවිශේෂිතම හා සුන්දරතම සම්පතකි. එහිදී ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය හි කාන්තාව මෙසේ නිර්වචනය කොට ඇත්තේ, වැඩිහිටි වූ ස්ත්‍රිය කාන්තාවක් වශයෙනි. වැඩිහිටි ස්ත්‍රියක් වශයෙන් සලකනු ලබන්නේ ඕනෑම සමාජයක වැඩිහිටිත්වයට පැමිණි කාන්තාවයි. ඇය පවුල තුළ විවිධ තනතුරු හොබවමින් එම කාර්යභාරය ඉටු කිරිමට යුහුසුළු වන්නීය. ඒ අනුව කාන්තාව පවුල් සංස්ථාව තුළ විශාල කාර්යභාර්යක් ඉටු කරන බවයි (https://www.lexico.com, Accessed on 2021/ 10/ 7). එහි දි අතීතයේ සිට නූතනය දක්වා කාන්තාවට කුමනාකාර සමාජ තත්ත්වයක් හිමි වුවා ද යන්න එක් එක් යුගයන් විමසීමේ දී පැහැදිලි කර ගත හැකි වේ. ක්‍රි.පූ. 2500-1500 අතර කාලයේ ඉන්දියානු මොහෙන්දජාරෝ - හරප්පා ශිෂ්ටාචාරයන්හි කාන්තාවන්ට ඉතා

වැදගත් තැනක් තිබුණි. මාතෘ මූලික සමාජ ක්‍රමය ඇය මව් දෙවඟන ලෙසත්, සශ්‍රිකත්වයේ සංකේතය ලෙසත් සලකන ලදී. ඒ නිසාම වන්දනීය ලෙස සැලකිමටත් කාන්තාවට කිසිදු අතවරයක් නොකිරීමත් නිසා එම යුගයේ දී කාන්තාවට කිසිදු හිංසාවක්, පීඩාවක් ද සිදු නොවුණි. බ්‍රාහ්මණ සංස්කෘතිය තුළ මෙකී තත්ත්වය සම්පූර්ණයෙන් ම වාගේ වෙනසකට බඳුන් වු අතර, හුදෙක් කාන්තාව යනු පුරුෂයාගේ දාසියක් තත්ත්වයට ඇද වැටුණි. කාන්තාවගේ නුවණ තරම දැක්විමට දෑගුල් නුවණැත්තී ලෙස නම් කිරීමත් සියලුම කාන්තාවෝ අවස්ථාව ලද තැන්හි වරදෙහි බැදෙන්නීය, යන බමුණු මත තුළ ඇය සමාජයේ පහළම තැනට දැමීමට එකල බමුණු සමාජය කටයුතු කරන ලදී. බුද්ධකාලීන සමාජය තුළ මෙම බමුණු අදහස් වියැකි කාන්තාවන්ට නිසි තැන ලබා දිමට බුදුන් වහන්සේගේ මූලිකත්වය ලැබුණි. කාන්තාවන්ට පැවිදි බව ලබාදීමට කටයුතු කිරීම සිදුවිමෙන් නිස්සාර බ්‍රාහ්මණ මතවාදය සුනුවිසුණු බවට පත් විය. කෙසේ වුවද පසුකාලීනව පැවති ධනවාදි සමාජයේ කාන්තාවට ලැබුණු තත්ත්වය මාක්ස් එංගල්ස් මෙන් ම ස්ත්‍රීවාදි න්‍යායාත්මක අදහස් තුළින් තුළින් ගම්‍ය වුයේ කාන්තාව යනු නිර්ධන පංතිය ලෙසත් පුරුෂයා ධනපති පංතිය ලෙසත් ය. ඒ බව **ෆ්‍රෙඩ්රික් එංගල්ස් රචිත, පවුල, පෞද්ගලික දේපල හා රාජ්‍ය ඇති වු සැටි, නම් කෘතියේ** මනා ලෙස විග්‍රහා ඇත. එහි එන පරිදි 1846 එංගල්ස් හා මාක්ස් විසින් රචිත පළ නොකරන ලද අත්පිටපත් හි මෙලෙස සඳහන් වේ "ළමයින් ඇතිදැඩි කිරිම සඳහා පුරුෂයා හා ස්ත්‍රිය අතර පළමුවැනි ශ්‍රම විභජනය ඇතිවිය. දැන් මෙයට තවත් එකතු කළ හැකිවේ. ඉතිහාසයේ පෙනෙන පළමුවැනි පංතිමය ප්‍රතිවිරුද්ධතාවය ඒක භාර්යා වෘතය නිසා පුරුෂයා හා ස්ත්‍රිය අතර පැනනැගි ප්‍රතිවිරුද්ධතාවය සමඟ ද පුරුෂයා විසින් ස්ත්‍රිය පළමුවරට පංතිමය වශයෙන් පෑගීමත් එකවර සිදුවිය" (හේවාවසම්, කේ. එන්. 2018).

ධනවාදි සමාජවාදී යුගයන් පසුකර විසිඑක් වන සියවසේ කාන්තාවගේ තත්ත්වය හා කාර්යභාරය යම් ලෙසකට වෙනසකට බඳුන් වී ඇති බව සැලකිය හැකි ය. එහි දි ඒ කාන්තාව රැකියාවක් සිදු කිරිමේ තත්ත්වයට පත්වීමයි. ස්ත්‍රීවාදි මුහුණුවරකින් බැලූ කල්හි මෙය එක්තරා ආකාරයක ධනාත්මක මුහුණුවරක ස්ත්‍රීන්ට හිමි වූ අවස්ථාවකි. අධ්‍යාපනය ලැබීමටත්, උගත්කමට සරිලන රැකියාවක නියුක්ත වීමටත් මෙමඟින් කාන්තාවට හැකි වේ. ඒ කෙසේ වුවත් අදටත් කාන්තාවට අතීතයේ මෙන් නිදහස අහිමි කිරිමේ අවස්ථා නැතිවාම නොවේ. නිදසුනක් වශයෙන් අදටත් ඊජිප්තුව, ආරාබි ජනරජය කාන්තාවන්ගේ වයස කුමක් වුවත් පුරුෂයාගේ අවසරයකින් තොරව නිවසින් පිටතට යාම තහනම් කරයි. ඇමරිකා එක්සත් ජනපදයේ පවා සමහර සමාගම් කාන්තාවන්ට ඔවුන්ගේ පිරිමි සඟයන්ට පවා අඩු මුදලක් ගෙවනු ලබයි. කාන්තාවන්ට අධ්‍යාපනයට ප්‍රවේශ විමට ඔවුන්ට ලැබෙන තවත් එක් වරාප්‍රසාදයකි. නමුත් දිළිඳුකම හෝ සමාජ තහනම හේතුවෙන් අධ්‍යාපනය ලැබිමට නොහැකි ගැහැණු ළමයින් මිලියන හැටදෙකක් ලොව පුරා සිටිති. ඇමරිකාවේ හිටපු ජනාධිපති ආර්යාව වන මිෂෙල් ඔබාමා මෙම ගැටලුවට විසඳුමක් ලෙස වැදගත් පියවරක් ගන්නා ලදි. එනම් ඉතිහාසයේ වැදගත්ම අධ්‍යාපන පෙත්සම වන ගැහැණු ළමයින්ට ඉගෙන ගැනිමට ඉඩදිම ආරම්භ කිරීමය. නායකත්ව තනතුරු සම්බන්ධයෙන් ගත්කළ ලෝකයේ සියලුම පරිපාලන

තනතුරුවලින් 32 %ක් පමණක් කාන්තාවන් විසින් ගනු ලැබේ. මෙම සංඛ්‍යාව 1955 සිට දෙගුණ වී ඇතත් කාන්තාවන් තවමත් අඩුවෙන් නියෝජනය වේ. A.N.D.P 500 වෙළෙඳපළ දර්ශකයේ ලැයිස්තුගත කර ඇති සියලුම සමාගම් අතුරින් ප්‍රධාන විධායක නිලධාරිනියන්ගේ නායකත්වය දරන්නේය 4.8% ක් පමණි (https://worldliteracyfoundation.org, Accessed on 2021/ 10/ 7).

ඒ අනුව සැබැ ලෙසම අද නූතන කාන්තාව අතීත කාන්තාවට වඩා ඉදිරියෙන් සිටින බව සැබැ වුව ද කාන්තාවන් වශයෙන් ඔවුන්ට මුහුණ දෙන්න සිදුවන්නා වූ ප්‍රශ්න අඩු වී නොමැත. යම් ලෙසකට එය කාන්තාවක් වීම නිසා ම මෙකී සමාජගත ප්‍රශ්න උද්ගත වනවා යැයි සිතිය හැකි ය. තනිව මඟක ගමන් කළ නොහැකි වීමත් සේම තනිව නිවසේ හෝ රැකියා ස්ථානයේ කටයුතු කිරිමට නොහැකිවීමත් සේම බසයක හෝ පොදු ප්‍රවාහනයක් තුළ දී වුවත් කාන්තාවන් මුහුණ දෙන අතවරයන් බොහෝ වේ (හේවාවසම්, කේ. එන්. 2018,63). ඒ අනුව සමාජයේ බහුලව කාන්තාවන් වින්දිතභාවයට ලක්විම සිදුවේ. එහි දි කාන්තා වින්දිතභාවය සාකච්ඡා කිරීමට ප්‍රථම වින්දිතයෙකු යන්න සරල අවබෝධය ලබා ගැනිම ඉතාම වැදගත් වේ.

**කාන්තා වින්දිතභාවය පිළිබඳ හැඳින්වීම**

කාන්තා වින්දිතභාවය සාකච්ජා කිරිමට මත්තේන් වින්දිතයකු යන්න විවිධ නිර්වචන හරහා අවබෝධයක් ලබා ගත යුතු වේ. වින්දිතයෙකු යනු, වෙනත් කෙනෙකුගේ ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස ඍජු හෝ තර්ජනයකට ලක් වූ පුද්ගලයකි (https://www.pacific.edy, Accessed on 2021/ 10/ 7). අපරාධයකට ගොදුරු විම හෙවත් වින්දිතභාවයට පත්විම යනු දේපල අහිමි වීම, ශාරිරික හානිය සහ මානසික පීඩාවට වැනි ක්ෂණික ප්‍රතිවිපාක පමණක් නොව දිගු කාලීන ප්‍රතිවිපාක ලැබිමට සමාන වේ. අපරාධ ගොදුරක් බවට පත්වීමේ අත්දැකිම අපරාධයට ඇති බිය ඉහළ මට්ටමට ගෙන ඒමටත් පුද්ගලයාගේ ආරක්ෂාව වෙනස් කිරීමටත් තෘප්තිය අවම කිරීමටත් හේතු සාධක වේ. අධ්‍යයනයන්වලින් පෙනි යන්නේ වින්දිතභාවයට පත්වීම අපරාධ පිළිබඳ ඉහළ මට්ටමේ භීතියකට සම්බන්ධ වන බවය (F.blsk, wesells., 1997) කරන ලද අධ්‍යයනයකින් හෙළි වී ඇත්තේ පුද්ගලයකු තනිවම ඇවිදිම ඍජුවම වින්දිතභාවයට පත්විමට බලපා ඇති නමුත් රාත්‍රියේ දී නිවසේ සිටීම ආරක්ෂාවට කිසිඳු බලපෑමක් නොමැතිවන බවයි. Ludeman **විසින් 2006 දී හැම්බර්ග් හි කරන ලද** අධ්‍යයනයකින් පැහැදිලි වී ඇත්තේ ඍජුවම පුද්ගලයින් අපරාධ වින්දිතභාවයට පත්විම සඳහා බුද්ධිමත් වීමේ සම්භාවිතාවය ධනාත්මකව බලපාන බවයි (රත්නපාල, එන්. 1990). සමාජය තුළ යම් අසරණභාවයක් පෙන්නුම් කරන පුද්ගලයෙක් **වින්දිතයෙකු** ලෙස හඳුනාගත හැකිය. සෑම සමාජයකම මෙවැනි වු වින්දිතයින් සිටිය හැකිය. ඒ අනුව අපරාධයකින් හෝ වෙනත් අනතුරකින්, ස්වභාවික ව්‍යසනයකින්, යම්කිසි ව්‍යාකුල තත්ත්වයකින් දුක් පීඩා විඳින පුද්ගලයෙකු හෝ පුද්ගල පිරිසක් හැඳින්වීම උදෙසා පොදුවේ **හිංසිතයා, වින්දිතයා** ලෙසින් සිංහල භාෂාවේ ව්‍යවහාර වේ. හිංසනය යනු ශාරීරික හෝ

මානසික හෝ සදාචාරාත්මක හෝ ලිංගික දෘෂ්ටි කෝණයකින් ගොදුරු වීමේ ක්‍රියාවලියයි. වින්දිතයාගේ තිරණාත්මක කාර්යභාරය නොතකා ඓතිහාසික හිංසනය කිරිමේ ක්‍රියාවලිය වරදකරුගේ දෘෂ්ටි කෝණයෙන් සියල්ලටම වඩා අධ්‍යයනය කරන ලද්දේ ඔවුන්ගේ අභිප්‍රේරණය සහ වරදට හේතු වූ කරුණු කෙරෙහි අවධානය යොමු කිරිම සඳහාය. හුදෙක් අපරාධයකට නැතහොත් නීතිවිරෝධි චර්යාවක ප්‍රතිඵලයක් වශයෙන් ශාරිරිකමය, භාවමය, මූල්‍යමය,චිත්තවේගීමය, භෞතිකමය යන මේ කුමන ආකාරයක වුවත් පිළිබඳව කරනු ලබන අධ්‍යයනයකි. පොදුවේ ගත්විට කිසියම් අපරාධකාරී චර්යාවක් මඟින් පුද්ගලයකුගේ අයිතිවාසිකම් අහිමි වීම හරහා කායික, මානසික, ආර්ථික, සංස්කෘතික, ලිංගිකමය වශයෙන් පීඩාවකට හානියකට හා කම්පනයට පත් වීම අපරාධ වින්දිතභාවයි (https://www.legalservicesindia.com,Accessed on 2021/ 10/ 7).

කාන්තාවන්ට එරෙහි හිංසනය යනු, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වු ප්‍රචණ්ඩ ක්‍රියාවන් වන අතර එමඟින් කාන්තාවන් ශාරීරික, ලිංගික හෝ මානසික හානියක් හෝ පීඩාවක් ඇති විය හැකිය (එක්සත් ජාතීන්ගේ ප්‍රකාශය, 1979) (https://reliefweb.int/report/srilanaka, Accessed on 2021/ 10/07 ). ඒ අනුව බලන කල්හි කාන්තාවන් බොහෝ ක්ෂේත්‍ර ගණනාවක් තුළ තම ස්ථාවරත්වය රඳවාගෙන ඇත. එනම්, රැකියා සඳහා ප්‍රවේශය, දේශපාලන සහභාගීත්වය, තීරණ ගැනිම, සෞඛ්‍ය හා පුද්ගලික ආරක්ෂාව වැනි අංශවලින් කාන්තාවගේ යහපැවැත්ම තීරණය කළ හැකිය. එහිදි එකී අංශයන් තුළින් කාන්තාවන්ට සිදුවන හිංසනය ප්‍රමාණාත්මක ඉහළ අගයක් ගනු ලබයි. කාන්තාවන්ට එරෙහි හිංසනය යනු කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ දියුණුව හා යහපැවැත්මට බලපාන වඩාත් ප්‍රචලිත මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි.

- ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ලොව පුරා කාන්තාවන්ගෙන් 35% ශාරිරික හා ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හෝ සහකරු නොවන ලිංගික හිංසනය අත්විද ඇත.
- 2019 දී සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කාන්තාවන්ට එරහිව හිංසනය පිළිබඳ 1 ජාතික ව්‍යාප්තිය සමීක්ෂණය සිදු කරන ලද අතර පළමු වරට ලෝක සෞඛ්‍ය සංවිධානයේ ක්‍රමවේදය භාවිත කරන ලදි.

  - හවුල්කරුවකු නොවන (වයස අවු 15 සිට 7.2 % මෙය අත්විද ඇත.)
  - ශ්‍රී ලංකාවේ කාන්තාවන් හවුල්කරුවෙකු විසින් සියළුම කාන්තාවන්ගේ 17.4% ක් ඔවුන්ගේ ජීවිත කාලය තුළ මෙය අත්විද ඇත.
  - කාන්තාවන්ගේ 24.9 % ක් ශාරිරික හා ලිංගික සමීප සහකරු ප්‍රචණ්ඩත්වය හෝ සහකරු නොවන ලිංගික හිංසනය අත්විද ඇත (https://reliefweb.int/report/srilanaka, Accessed on 2021/ 10/ 7).

**කාන්තා සේවා නියුක්තිය**

කාන්තා සේවා නියුක්තිය පිළිබඳ සාකච්ජා කිරිමේ දි, සමස්ත රටේ කාන්තා ජනගහනය සලකා බැලීමේ දී මිලියන 21 ඇස්තමෙන්තු ජනගහනයෙන් 57% පමණ ශ්‍රී ලංකාවේ කාන්තාවන් වේ. කෙසේ වෙතත් මිලියන 8.5 ක් ආර්ථික වශයෙන් ක්‍රියාකාරි ජනගහනයෙන් කාන්තාවන් වන්නේ 33.4% පමණි. මේ අනුව ශ්‍රම බලකායේ 70% කට ආසන්න ප්‍රමාණයක් ආර්ථික වශයෙන් අක්‍රිය කාන්තාවන් වේ. ශ්‍රී ලංකා ශ්‍රම බලකාවේ සමික්ෂණයට අනුව 2013 දෙවන කාර්තුවේ ප්‍රධාන කර්මාන්ත සහ ස්ත්‍රි පුරුෂ භාවය අනුව සේවා නියුක්ත ජනගහනය බෙදා හරියි. ශ්‍රම බලකායේ 39.5% ක් සේවා අංශයේ ඉහළම කාන්තාවන් වන අතර කෘෂිකාර්මික හා කර්මාන්ත අංශවල කාන්තාවන් පිළිවලින් 35.3% සහ 25.1% කි (https://salary.lk, Accessed on 2021/ 10/ 7). ලංකාව යනු ලෝකයේ පළමු වතාවට අගමැතිතුමියක් රටේ රාජ්‍ය නායකත්වයට පත් කරගත් රටකි. Getting to work unlocking women's potential in sri lanka's labor farce නැමති වාර්තාවට අනුව ලංකාවේ අධ්‍යාපනය හා සෞඛ්‍ය කාන්තාවගේ රැකියා සඳහා සම්බන්ධ විම දියුණු කිරිමට පුර්ණ ලෙස යොදා නොගන්නා නිසා පුර්ණ සාර්ථකත්වයට රටේ ආර්ථිකය ගමන් නොකරන බව ඔවුන්ගේ අදහසයි. දැනටම ලෝකයේ ස්ත්‍රී පුරුෂ සමාජබාවය මත රැකියා ලබා දිම නිසා පුරුෂයන් හා කාන්තාවන් අතර හටගන්නා පරතරය 26.7% ක් වේ. එය දකුණු ආසියාවේ 50.8% කි. ලංකාවේ පෞද්ගලික අංශය තුළ පුරුෂයාට වඩා කාන්තාව 30-36%ක් ප්‍රතිශතයක් අඩුවෙන් ආදායම උපයයි.

ලංකාවේ අධ්‍යාපනය හා සෞඛ්‍ය යන සාධක මත කාන්තාවන්ගේ සහාභාගිත්වය තවමත් අල්ප මට්ටමක පවති. 2016 වසර සලකා බලන විට වාර්තාගත ලෙස ලංකාවේ කාන්තා සේවා නියුක්තිය පහළට වැටෙන අතර එයට ප්‍රධාන හේතුවක් ලෙස සැලකෙන්නේ කාන්තාවන් 48% ක් පෙර සේවා නියුක්තව සිට විවාහය දරුවන් බලා ගැනිම යන කාරණා මත ඉවත්විමයි. 2017 වසරේ කාන්තා සේවා වියුක්තිය 35.66% වන අතර 2018 වසරේ එය 35.29% කි. 2019 වසරේ එය 35.44% ක් ද 2020 වසරේ 35.29% ක් ද වේ. ලංකාවේ සේවා වියුක්තිය වැඩිපුර දැකගත හැකි වසර 1990 වන අතර එය 45.51% කි. අඩුම අගය 2020 දි වාර්තාගත වේ. කාලානුරූපිව බැලු කළ අප රට සාධනීය ප්‍රතිඵල ලබා ඇත. "කාන්තාවන්ට ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායට එක්විමට සහ සාර්ථකත්වයට ඇති නොයකුත් ගැටලුවලට විසදුම් සෙවිමට ප්‍රබල මැදිහත්විමක් අවශ්‍ය වනු ඇතැයි" (ලෝක බැංකුවේ ජෝෂ්ඨ සමාජ සංවර්ධන විශේෂඥවරියක් වන ජෙනිෆර් සොලතරොෆ්) පවසනු ලබයි (https://salary.lk, Accessed on 2021/ 10/ 7). ඒ අනුව අද වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හැරවුම් ලක්ෂය බවට පත් වන රැකියා ක්ෂේත්‍රය තුළ කාන්තාවන් දැක ගත හැකිය.

**වැඩ කරන ලෝකයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය හඳුන්වා දීම.**

වැඩ කරන ලෝකය යනු අයි.එල්.ඕ විසින් වැඩි දියුණු කරන ලද සංකල්පයක් වන අතර එය ගෙවන සහ නොගෙවූ වැඩ මෙන්ම කාන්තා හා පිරිමි වැඩ කරන ජීවිතයේ සියළුම අංගයන් ඇතුළත් වේ. වැඩ කරන ලෝකයේ, නිවසේදී, පොදු ස්ථානවල, සේවායෝජකයා විසින් නිවාස ලබා දීමේදී සහ රැකියාවට යන විට සහ ඉන් පිටවීමේදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැඩ ලෝකයේ සිදුවිය හැකිය. වැඩ ලෝකය පිළිබඳ සංකල්පය තුළ වීදියේ නිෂ්පාදන විකිණීම හෝ කාර්මික නිෂ්පාදන හෝ නිවසේ වැඩ කිරීම වැනි අවිධිමත් වැඩ ද ඇතුළත් වේ. වැඩ කරන ලෝකයේ ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය යනු කුමක්ද?

**වැඩ කරන ලෝකයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ඇතුළත් වන්නේ,**

- වැඩ කරන සගයන්, අධීක්ෂකයින් හෝ කළමනාකරුවන්ගෙන් හිරිහැර කිරීම, ශාරීරික හා වාචික ලෙස අපයෝජනය කිරීම.
- ලිංගික හිංසනය සහ අනවශ්‍ය ලිංගික දියුණුව.
- ලිංගික බලහත්කාරකම් සහ ප්‍රචණ්ඩත්වය, බලහත්කාරය හෝ ගනුදෙනු ලිංගික සම්බන්ධතා, දූෂණය සහ ලිංගික හිංසනය.
- ගර්භණී සමයේදී අපයෝජනය හා හිරිහැර කිරීම.
- මානසික හිංසනය සහ බිය ගැන්වීම.
- ශාරීරික හා ලිංගික හිංසනයේ තර්ජන සහ ක්‍රියාවන්.
- දුර්වල සෞඛ්‍ය සහ ආරක්ෂාව (ගොඩනැගිලි සහ උපකරණ ආරක්ෂාව ඇතුළුව) වැනි අයහපත් සේවා කොන්දේසි.
- ප්‍රමාණවත් හෝ නුසුදුසු සනීපාරක්ෂක පහසුකම් සහ ඒවා භාවිතා කිරීම පිළිබඳ නීති.
- අකමැත්තෙන් වැඩිපුර දිගු වැඩ කරන වේලාවන් සහ අතිකාල වැඩ කිරීමට අනපේක්ෂිත හෝ ප්‍රමාද වූ ඉල්ලීම්.

සේවා ස්ථානයේ ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් සහ ගෞරවයට හා ශාරීරික හා මානසික අඛණ්ඩතාවයට එල්ල කරන ප්‍රහාරයකි. ලොව පුරා කාන්තාවන්ගෙන් 35 % ක් රැකියා ස්ථානයේදී ප්‍රචණ්ඩත්වයට ගොදුරු වන අතර, මේ අයගෙන් සියයට 40 ත් 50 ත් අතර ප්‍රමාණයක් අනවශ්‍ය ලිංගික වර්ධනයන්, ශාරීරික සම්බන්ධතා හෝ වෙනත් ලිංගික හිංසනයන්ට ලක් වේ (යුරෝපීය ආර්ථික හා සමාජ කමිටුව, 2015, 2.4.1) (https://gbv.ltcilo.org, Accessed on 2021/ 10/ 7).

**ලිංගික හිංසනය**

වැඩ කරන ලෝකයේ ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ වඩාත් සුලභ ක්‍රමය නම් ලිංගික හිංසනයයි. ලිංගික හිංසනය යනු ලිංගික හැසිරීම්වල අකමැත්තෙන් හා අප්‍රසන්න හැසිරීමක් වන අතර එමගින් සේවකයින් නින්දාවට, බිය ගැන්වීමට හෝ අපහසුතාවයට පත් විය හැකිය. එය සේවක අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි. ලිංගික හිංසනය භීතියේ වාතාවරණයක් සහ ශාරීරික හා මානසික සෞඛ්‍යයක් ඇති කරයිත සේවකයින්ට අසනීප නිවාඩු ගැනීමට සිදු විය හැකි අතර නරකම අවස්ථාවක රැකියාවෙන් ඉවත් වීමට සිදු වේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව රැකියා ස්ථානයේ ලිංගික හිංසාවන් වර්ග දෙකක් තිබේ. **ලිංගික අනුග්‍රහය සඳහා යමක් ඉල්ලීම සහ සතුරු පරිසරය ලිංගික හිංසනය** වශයෙනි. මෙය විවිධ ස්වරූපයන් ගත හැකියඃ

> **ශාරීරික හිංසනය -** අකමැත්තෙන් ස්පර්ශ කිරීම, ප්‍රිය කිරීම, වැළඳ ගැනීම හෝ සිප ගැනීම.
>
> **වාචික හිරිහැර -** ලිංගික යෝජනා, අපහාසාත්මක, අදහස් එළියට යාමට නුසුදුසු ආරාධනා, පෞද්ගලික ජීවිතය ගැන අනවශ්‍ය ප්‍රහාරාත්මක ප්‍රශ්න, කාන්තාවකගේ ශාරීරික පෙනුම ගැන ආක්‍රමණශීලී අප්‍රසන්න අදහස්.
>
> **වාචික නොවන හිරිහැර-** නුසුදුසු, බිය උපදවන බැල්ම හෙළීමත අහිතකර, ලිංගික අප්‍රසන්න පින්තූර, ඡායාරූප හෝ තෑගි ලැබීම හෝ පෙන්වීම අවිනීත නිරාවරණයත කෙනෙකුගේ කැමැත්තට පටහැනිව කාමුක දර්ශන නැරඹීමට හෝ බැලීමට සැලැස්වීම.
>
> **සයිබර් හිරිහැර -** අනවශ්‍ය, අප්‍රසන්න, ලිංගික අප්‍රසන්න ඊමේල් හෝ කෙටි පණිවුඩ ලැබීම සමාජ ජාල වෙබ් අඩවිවල හෝ අන්තර්ජාල චැට් රූම්වල නුසුදුසු, අහිතකර දියුණුව.

ලිංගික හිංසනය යනු කාන්තා සේවකයින්ගේ ගැටලුවකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය අතර සාමාන්‍ය අන්තර්ක්‍රියා සමඟ එයට කිසිදු සම්බන්ධයක් නැත. එයින් අදහස් කරන්නේ වෙනත් පුද්ගලයෙකුට අපහාසයක් වන අතර එය අන් අය කෙරෙහි බලය තහවුරු කිරීමට හෝ ඔප්පු කිරීමට භාවිතා කරයි. ලිංගික හිංසනය පිළිකුල, උල්ලංඝනය, කෝපය සහ බල රහිතභාවය යන හැඟීම් ඇති කරයි. තම සේවකයින්ට ගෞරවයෙන් සැලකීම ව්‍යවසායයේ දිගු කාලීන අවශ්‍යතාවයක් බව හොඳ කළමනාකරුවන් දනී. සාර්ථක නීතිමය පිළියම් අවශ්‍ය වුවද, ගැටලුව නැවැත්වීම හෝ වඩාත් හොඳින් කිසි විටෙකත් ආරම්භ නොවීම සහතික කිරීම ද වැදගත් ය. එබැවින් වැළැක්වීමේ පියවර විශේෂයෙන් වැදගත් වේ (https://gbv.ltcilo.org, Accessed on 2021/ 10/ 7).

**ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ගේ වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය**

සේවා ස්ථාන ලිංගික හිංසනය සහ හිංසනය කාන්තාවන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන අතර ඔවුන්ගේ යහපැවැත්ම සහ විශ්වාසය බිඳ දමමින් බිය මත පදනම්ව වැඩ කරන පරිසරයක් ඇති කරයි. නරකම අවස්ථාවන්හි දී රැකියා ස්ථානයේදී, සේවා ස්ථානයට අනුබද්ධ නේවාසිකාගාරවල සහ රැකියා ස්ථානයට යන විට සහ ආපසු යන ගමනේදී ස්ත්‍රී දූෂණ සහ ලිංගික හිංසනය, එච්අයිවී/ඒඩ්ස් සහ වෙනත් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග වැළඳීමේ අවදානමක් ද ඇති කරයි. සේවා ස්ථානයේදී, පොදු ස්ථානවල හෝ නිවසේදී වුවද ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සේවා යෝජකයන්ට ගෙවිය යුතුය. එක්සත් ජාතීන්ට අනුව එයට සේවා ස්ථානයේ ඵලදායිතාව අඩුවීම, නොපැමිණීම, සෞඛ්‍ය හා ආරක්ෂිත අවදානම සහ සේවායෝජකයාගේ සෞඛ්‍ය සේවා පිරිවැය වැඩි කිරීම තුළින් සේවා ස්ථානයට බලපෑම් කළ හැකිය. වැඩි වැඩියෙන් ලිංගික හිංසනය සහ හිංසනය වැදගත් වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය ගැටලු ලෙස සැලකේ. වැඩ කරන වේලාවන් තුළ වැසිකිළිය භාවිත කිරීම සීමා කිරීම ලිංගික හිංසනයට ඇතුළත් විය හැකිය. මෙක්සිකෝවේ කාන්තා ඇඟලුම් කම්හල් සේවිකාවන් සහ හොන්ඩුරාස්හි කාර් එකලස් කිරීමේ සේවිකාවන් ඩයපර් පැලඳීම පිළිබඳ වැසිකිළි බිඳීම් සඳහා ඇති දැඩි සීමා කිරීම් වාර්තා වේ. මීට අමතරව, කර්මාන්තශාලා තුළ උෂ්ණත්වය බොහෝ විට 30° ඉක්මවන නමුත් වැසිකිළි බිඳීම් සීමා කර ඇති හෙයින්, සේවකයින් පානීය ජලයෙන් වැළකී සිටී. විශේෂයෙන් ගර්භනී සහ ඔසප් වීමේදී කාන්තාවන්ට ආසාදනය වීමේ අවදානම සහ තවදුරටත් වෛද්‍යමය සංකූලතා ඇති වන බව වාර්තාවල සඳහන් වේ (https://gbv.ltcilo.org, Accessed on 2021/ 10/ 7).

පූර්ණ කාලීන සේවකයින් වෙනුවට පිරිවැය අඩු කිරීමේ මාධ්‍යයක් ලෙස කාන්තා අවිධිමත් රැකියා ගෝලීයකරණය සහ සංවිධානය (වීගෝ), ගෙදර වැඩ කරන ලෝක ව්‍යාප්ත සහ හෝම්නෙට් වැනි රාජ්‍ය නොවන සංවිධාන විසින් ගෘහ සේවිකාවන් සඳහා උප කොන්ත්‍රාත් සපයන සැපයුම්කරුවන්ගේ වැඩිවීමක් පෙන්වා දී ඇත. ඊට අමතරව බොහෝ ඇඟලුම් කම්හල් වල කාන්තා සේවකයින් අධීක්ෂණය හා කළමනාකරණය පිරිමින් විසින් සිදු කරනු ලබයි. මෙය බොහෝ විට බලශක්ති අසමතුලිතතාවයට හේතු වන අතර අනතුරුදායක තත්වයන් යටතේ වැඩ කිරීමට හා භයානක ද්‍රව්‍ය භාවිතා කිරීමට ඇතැම් විට කාන්තාවන්ගේ කැමැත්තට බල කෙරෙනු ඇත. 2013 අප්‍රේල් 24 වෙනිදා උදෑසන ඩකා නගරයට නුදුරින් පිහිටි තට්ටු අටකින් යුත් රානා ප්ලාසා වාණිජ ගොඩනැගිල්ලේ කර්මාන්ත ශාලා සේවකයින් දහස් ගණනක් වැඩට ගියහ. පැය කිහිපයකට පසු ගොඩනැගිල්ල කඩා වැටීමෙන් පුද්ගලයින් 1137 ක් මිය ගිය අතර තවත් කම්කරුවන් 2500 ක් තුවාල ලැබූහ. එදින උදෑසන මියගිය අයගෙන් වැඩි දෙනෙක් කාන්තාවන් ය (https://gbv.ltcilo.org, Accessed on 2021/ 10/ 7).

ඇඟලුම් අපනයන කර්මාන්තයේ මිලියන 4.2 ක ශක්තිමත් ශ්‍රම බලකායෙන් 80 % ක් කාන්තාවන් වන අතර බොහෝ දෙනෙකුට මෙම රැකියා ආර්ථික ස්වාධීනත්වය සඳහා ඇති පළමු අවස්ථාව වන අතර නිවසින් පිටත රැකියාවක් වේ. එක්සත් ජාතීන්ගේ කාන්තාවන්ට අනුව, රනා ප්ලාසා ඛේදවාචකය මගින් මෙම රැකියාව දෙපැත්ත කැපෙන කඩුව ඉස්මතු කර දැක්වීය. ඇඟලුම් කර්මාන්ත ශාලා විසින් ඛේදජනක ලෙස අනාරක්ෂිත, සූරාකෑමට හා අනතුරුදායක සේවා ස්ථාන නිර්මාණය කර ඇති අතර එමගින් කාන්තා සේවකයින් දුප්පත් වැටුප්, අසමානකම්, හිරිහැර හා හිංසනයට මුහුණ දෙයි. අද ඔවුන් බංග්ලාදේශයේ රෙදිපිළි කර්මාන්ත ශාලා 5000 ක නිෂ්පාදන මාලාවේ සේවකයින් පස්දෙනාගෙන් හතර දෙනෙක් සිටියත් කාන්තාවක් වන්නේ අධීක්ෂණ නිලධාරීන් 20 දෙනෙකුගෙන් එක් අයෙක් පමණි (එක්සත් ජාතීන්ගේ කාන්තා, 2015 , 59)

කාන්තාවන්ගේ බලශක්ති හිඟකම නිසා බොහෝ විට ආරක්ෂිත ලිංගික සම්බන්ධතා සාකච්ඡා කිරීමට හා අනවශ්‍ය ලිංගික සම්බන්ධතා ප්‍රතික්ෂේප කිරීමට අපහසු වේ. රැකියා ස්ථානයේ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට බලයක් නොමැති විට හෝ ඔවුන්ගේ නවාතැන් ඔවුන්ගේ රැකියාවට සම්බන්ධ වුවහොත්, ලිංගික අතවර හා ස්ත්‍රී දූෂණ ඇතුළු ප්‍රචණ්ඩත්වයේ වැඩි අවදානමක් ඔවුන් මුහුණ දෙයි. බලහත්කාරයෙන් ලිංගික සම්බන්ධකම් පැවැත්වීම සඳහා තරුණ කාන්තාවන් විශේෂයෙන් ගොදුරු වන අතර වැඩි වැඩියෙන් එච්අයිවී/ඒඩ්ස් ආසාදනයට ගොදුරු වේ. ලොව පුරා නව එච්අයිවී ආසාදනයන්ගෙන් හරි අඩකටත් වඩා සිදුවන්නේ වයස අවුරුදු 15 ත් 24 ත් අතර තරුණයින් අතර ය. මෙම වයස් සීමාව තුළ සිටින එච්අයිවී ආසාදිත තරුණයින්ගෙන් සියයට 60 කට වඩා වැඩි ප්‍රමාණයක් කාන්තාවන් ය. උප සහරා අප්‍රිකාවේ කාන්තාවන් සහ ගැහැණු ළමයින් එච්අයිවී වලට ගොදුරු වීමේ අවදානම විශේෂයෙන් ඉහළ මට්ටමක පවතින අතර ලොව පුරා සිටින එච්අයිවී ආසාදිත කාන්තාවන්ගෙන් 80 % ක්ම එයට දායක වේ. (WHO ,UN, 2010) ස්ත්‍රී-පුරුෂ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ බලපෑම කාන්තාවන්ගේ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය කෙරෙහි ඇති කරයි. ප්‍රචණ්ඩත්වය පවුල් සැලැස්මට සහ සුරක්ෂිත ලිංගික හැසිරීම් වලට බලපායි. එය ගැබ් ගැනීම් වලින් සහ එච්.අයි.වී ඇතුළු ලිංගිකව සම්ප්‍රේෂණය වන ආසාදන වලින් ආරක්ෂා වන ආරක්ෂිත ලිංගික හැසිරීම් වල කාන්තාවගේ බලය සීමා කරයි. ප්‍රචණ්ඩත්වය යනු එච්.අයි.වී සඳහා අවදානම් සාධකයක් පමණක් නොව එහි ප්‍රතිඵලයක් ද වේ (https://gbv.ltcilo.org, Accessed on 2021/ 10/ 7).

කෙසේ වුවද ලිංගික හිංසනය, අපහාස කිරීම, නින්දාව, වෙනස් කොට සැලකීම සහ ඉන් ඔබ්බෙහි පරස්පර විරෝධී නියෝග හෝ හුදෙකලාව රැකියා සම්බන්ධතාවල ස්වාභාවික අංග බවට පත්වෙමින් තිබේ. ඊටත් වඩා, බොහෝ කාන්තාවන් තම සිදුවන හිංසාවන් ගැන වාර්තා කිරීමට බිය වන බවත් එයට මුලිකම හේතු බවට තම **රැකියාව අහිමි වේ යැයි බිය** මීට මූලික වශයෙන් බලපා ඇත. වඩාත් නරකම දෙය නම්, සමහර **කාන්තාවන් එයට පුරුදු වී ඇති අතර, හිංසනය නොවැළැක්විය හැකි බව විශ්වාස කිරීම, එය ඔවුන්ගේ රැකියාවේ**

**කොටසක් යනුවෙන් සිතීම බරපතලම** කරුණක් බවට වර්තමානය තුළ පත්ව තිබීම. උදාහරණයක් වශයෙන්, මෙක්සිකෝවේ, රැකියා පරිසරයේ කායික හෝ ලිංගික හිංසාවන් අත්විඳ ඇති බව ඇඟවූ කාන්තාවන් 10 න් 9 ක් කිසි විටෙකත් උදව් ඉල්ලුවේ නැත, පැමිණිල්ලක් හෝ වාර්තාවක් ඉදිරිපත් කළේ නැති බව පර්යේෂණයකින් තහවුරු වී ඇත (https : // human – resources -health, biomedcentral.com, Accessed on 2021/ 10/ 7).

සේවා ස්ථානයේදී පිරිමින්ට හිංසනය සහ හිංසනයන්ට මුහුණ පෑමට සිදු වුවද, ඒකාකෘතිකරණය සහ බල සම්බන්ධතාවල අසමානතාවය හේතුවෙන් කාන්තාව ඊට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති කරයි. සමාජයේ ප්‍රමුඛස්ථානයක් ගන්නා සමාජීය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම් ආයතනික සංස්කෘතිය මඟින් ප්‍රතිනිෂ්පාදනය උග්‍ර කර ඇත. මීට අමතරව කාන්තාවන් හෝ (ජනවාර්ගික, ලිංගික) සුළු ජාතීන් යටත් හෝ ප්‍රචණ්ඩකාරී තත්වයන්ට තල්ලු කිරීමට පෙළඹී තිබීම ද දුක්ඛිත තත්ත්වයක් වේ. මෙම තත්ත්වය නිසා කාන්තාවන්ගේ රැකියාව අත්හැරීමට හෝ රැකියාව අතහැරීමට හේතු විය හැකි අතර එමඟින් වර්තමාන සහ අනාගත ආදායම (විශ්‍රාම වැටුප් සඳහා අඩු අයිතියක්) ඇති වන අතර එමඟින් පිළිගත නොහැකි ස්ත්‍රී-පුරුෂ වැටුප් පරතරය ස්ත්‍රීන් හා පුරුෂයින් අතර 23% ක් දක්වා වැඩිවේ. සේවා ස්ථාන හිංසනය සෑම අංශයකටම සහ සියලු වර්ගවල සේවකයින්ට බලපාන නමුත්, සෞඛ්‍ය අංශය, කාන්තාවන් වැඩිපුරම සිටින කම්කරුවන් තත්වයේ බරපතලකම වඩාත් හොඳින් විදහා දක්වයි. ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) ගණනය කරන්නේ මෙම අංශයේ ප්‍රචණ්ඩත්වය රැකියා ස්ථානයේ සිදුවන පහරදීම්වලින් හතරෙන් එකක් පමණ වන බවයි. උදාහරණයක් වශයෙන්, එක්සත් ජනපදයෙන් මෑතකදී නිකුත් කරන ලද වාර්තාවකින් හෙළි වූයේ හදිසි හෙදියන්ගෙන් සියයට 54 ක් මෙම අධ්‍යයනයට පමණක් සහභාගී වී දින හතක් ඇතුළත රැකියා ස්ථානයේ හිංසනයන්ට ගොදුරු වූ බවයි. මෙම ප්‍රචණ්ඩත්වය පැමිණෙන්නේ කොහෙන්දැයි හෙදියන්ගෙන් විමසූ විට ඔවුන් පෙන්වා දෙන්නේ එක් අතකින් රෝගීන් සහ අමුත්තන් සහ අනෙක් පැත්තෙන් ඔවුන්ගේ සගයන් සහ ඉහළ නිලධාරීන් ය. ඇත්ත වශයෙන්ම, වැඩ සම්බන්ධ ප්‍රචණ්ඩත්වය සහ එහි ස්ථාවර වැඩිවීම ද බාහිර සාධක නිසා සිදු වේ. එය යුද්ධයේ හා ආර්ථික අර්බුදයේ දී තීව්‍ර වන නමුත් එය පෞද්ගලීකරණය කිරීමේ හා කප්පාදු පියවරයන්ගේ ප්‍රතිවිපාකයක් වන අතර එමඟින් ඔවුන් සමඟ වැඩිපුර නියාමනය ඉවත් වන අතර වැඩි වැඩියෙන් නම්‍යශීලීභාවය ඇති වන අතර එය සාමාන්‍යයෙන් කම්කරුවන් වෙත ප්‍රචණ්ඩත්වය බවට පරිවර්තනය වේ. ජාත්‍යන්තර කම්කරු සංවිධානය (අයිඑල්ඕ) පවසන්නේ වෙනස්කම්, නිෂ්පාදන ක්‍රියාවලීන් ප්‍රතිව්‍යුහගත කිරීම, ප්‍රමාණවත් නොවන කාර්ය මණ්ඩලය, අධික වැඩ බර, සම්මත නොවන කොන්ත්‍රාත්තු සහ ආරක්ෂාව නොමැතිකම වැනි සාධක හේතුවෙන් සේවා ස්ථානවල හිංසනයේ අවදානම වැඩි වන බවයි (https://human-resources-health,biomedcentral.com , Accessed on 2021/ 10/ 7).

**සමාලෝචනය**

මේ ආකාරයට මෙම ලිපිය තුළ එක් දෙයක් අර්ථ පූර්ණය කළ හැකි වේ. එනම් ලෝකයේ එක් තැනකට සිමා නොවූ එක් රැකියා අංශයකට සීමා නොවූ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අදුරු පැතිකඩක් බවට රැකියා අංශය තුළ කාන්තා වින්දිතභාවය හඳුනාගත හැකිය. සමස්තයක් වශයෙන් රැකියාවේ නිරතවන කාන්තාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසාම යම් ලෙසකට කොතරම් හිංසනයට නතු වුවද ඔවුන් නිහඬව පසු වීම තුළම තීලන අපරාධමය ත්තත්ත්වයක් බවට පත්ව තිබීම කණගාටුවට කරුණකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට එක්සත් ජාතීන්ගේ ගෝලීය සැලැස්ම සාකච්ජා කළ විට, 2013 කාන්තාවන්ගේ තත්ත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසමේදී ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට සහ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කිරීමට රජයන් 130 ක් එකඟ වූහ. මෙම ගෝලීය සැලැස්ම පිළිගන්නේ කාන්තාවන්ට එරෙහි හිංසනය වැළැක්වීම සඳහා කාන්තාවන්ගේ ලිංගිකත්වය පාලනය කිරීමේ අයිතිය අත්‍යවශ්‍ය බවත් ප්‍රචණ්ඩත්වයට හේතු වන හානිකර ස්ත්‍රී-පුරුෂ භාව ඒකාකෘති අඩු කිරීමට ලිංගික අධ්‍යාපනය තුළින් හැකි බවත් ය. ප්‍රමුඛතාවයන් අතර ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය සඳහා සෞඛ්‍ය, මනෝවිද්‍යාත්මක සහය සහ උපදේශනය මෙන්ම ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සඳහා ඇති අයිතිය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ඇතුළු බහු ආංශික සේවාවන් ස්ථාපිත කිරීම ප්‍රමුඛතාවයන් ගෙන ඇත. මෙවන් විවිධ ප්‍රතිපත්තිමය වැඩසටහන් හරහා මෙකී හිංසනයෙන් තොර සමාජයක් බිහිකිරීමට හැකි වුවහොත් එය අනාගත සංධිස්ථානයක් බවට පත් වීම නොවනුමානය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


එදිරිසිංහ, අ.ඉ.ඒ., (2007), ස්ත්‍රි-පුරුෂ සමාජභාවය හා කාන්තා සපරාධිත්වය, කතෘ ප්‍රකාශන

රත්නපාල, එන්., (1997), අපරාධ විද්‍යා මුලධර්ම 1, බොරලැස්ගමුවල සඳුන් ප්‍රකාශකයෝ.

හේවාවසම්, කේ.එන්., (2018), සමාජ ප්‍රශ්න හා අපරාධ, කොළඹ10, සී/ස ඇස්. ගොඩගේ සහෝදරයෝ.

Declaration of Basic priciples of justic for victimes of crime, https://www.legalservicesindia.com, Accessed on 2021/ 10/ 7.

Gender based violence in the work place,https://gbv.ltcilo.org, Accessed on 2021/ 10/ 7.

Gender based violence in the work place, https://human-resourceshealth,biomedcentral.com, Accessed on 2021/ 10/ 7.

women'S employment, https://salary.lk,  Accessed on 2021/ 10/ 7.

women's wellbenig survey 2019 findings form sri lankan's frist dedicated national sarvay, https://reliefweb.int/report/srilanaka, Accessed on 2021/ 10/ 7.

# ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා බැඳි අපරාධ වින්දිතභාවයෙහි කාලීන ස්වභාවය පිළිබඳව පූර්ව පර්යේෂණ පත්‍රිකා ඇසුරෙන් විශ්ලේෂණය

**ටී.ඒ. ශානිකා තාඹුගල**

**හැඳින්වීම**

*ඉංග්‍රීසි බසින් "Gender" ලෙසින් හඳුන්වන ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (පුමිතිරිභාවය) සංකල්පය සංස්කෘතිකමය තත්වයකි.එය සමාජ සංවිධානයන් තුළින් ආරෝපණය කරන්නාවූ සංස්කෘතික සමාජීය විවිධාංගයන් තුළින් නිර්මාණීකෘත වූ සංකල්පයකි. යම්කිසි රටක ව්‍යවස්ථාපිත නීතියෙන් කළයුතු යැයි සඳහන් ක්‍රියාවක් නොකර හැරීමක් නොකළ යුතු යැයි සඳහන් ක්‍රියාවක් කිරීමත් ව්‍යවස්ථාපිත නීතිය අපරාධයක් ලෙස හඳුන්වා දී තිබේ. සාපරාධී ක්‍රියාවන්වලට ගොදුරුවීම සෑම සමාජයකම සිදුවේ. අපරාධ වින්දිතයින් වීමේ අවදානම ස්ත්‍රීපුරුෂ භාවය, වයස, තරගය, සමාජ ආර්ථික පන්තිය මත වෙනස් වේ (නොරිස් 1992, ඇඩ්ලර් සහ වෙනත් 1994, රීස් සහ රොස් 1993, රොසෙන්බර්ග් සහ මර්ෆ් 1991). ස්ත්‍රී-පුරුෂභාවය මතින් බිහිවන අපරාධ වින්දිතයන් විශ්වීය වේ. මෙකී තත්ත්වය සම්බන්ධව සිදුකර ඇති පර්යේෂණ අධ්‍යයනයන් අසුරෙන් රචනා කරන ලද පර්යේෂණ පත්‍රිකා **6**ක් මෙම ලිපියට පාදක වී ඇත.*

විශ්වය තුළ සිටිනුයේ ස්ත්‍රිය සහ පුරුෂයා යන මානව කොට්ඨාස දෙවර්ගයයි. පුරුෂයින් යනු ශාරීරිකව මෙන්ම මානසික වශයෙන් ශක්තිමත් එඩිතර, ඉක්මන් තීරණයන් ගත හැකි, නායකත්වය බුද්ධිමත් මෙන්ම තාර්කිකව කටයුතු කරන නායකත්ව ලක්ෂණයන්ගෙන් හෙබි ජීවී කොට්ඨාසයක් ලෙස සමාජය විසින් පවරා දී ඇත. කාන්තාව හෙවත් ස්ත්‍රිය සුන්දර, ළාමක මෙන්ම පුරුෂයෙකු මත යැපෙන කාරුණික සහ ඉක්මනින් සසල වන සංවේදී මනෝභාවයකින් හෙබි ජීවී කොට්ඨාසයයි. විශේෂයෙන්ම ස්ත්‍රීන්ට ස්වභාවධර්මයෙන්ම ප්‍රජනන කාර්යය පවරා දී ඇත.

මෙම ස්ත්‍රීත්වය සහ පුරුෂත්වය මත ගොඩනැගුණු සංකල්පයන් අතර ජීව විද්‍යාත්මක ස්වරූපයෙන් ඉදිරිපත් වී ඇති ලිංගිකත්වය හෙවත් ස්ත්‍රී-පුරුෂ භාවයත් (Sex), සංස්කෘතිකමය සහ සමාජීය ස්වරූපයෙන් ඉදිරිපත් වී ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender)වැදගත් වේ. ස්ත්‍රී-පුරුෂ භාවය යන්න ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට වඩා හාත්පසින්ම වෙනස්ය.

ස්ත්‍රී-පුරුෂ භාවය යනු ලිංගිකමය හෙවත් ජීව විද්‍යාත්මක තත්වයකි. එනම් වර්ණදේහ, හෝමෝන සහ ප්‍රජනක අවයව වැනි ගැහැණු, පිරිමි සහ අන්තර් ලිංගික පුද්ගලයින්ගේ විවිධ ජීව විද්‍යාත්මක හා භෞතික විද්‍යාත්මක ලක්ෂණ ය. නමුත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පුද්ගලයන්ගේ ක්‍රියාවන්, විශ්වාසයන් සහ ආශාවන් තුළ තරයේම

ගැබ් වී ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන්න මනෝභාවාමය වශයෙන් වෙනස් වූ අර්ථයක් සහිත සංකල්පයකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සංකල්පයෙහි උපත සිදුවනුයේ මනෝවිද්‍යාවේය. ඇමෙරිකානු ජාතික රොබට් ස්ටෝලර් (Robert Storler) විසින් එය ප්‍රථම වරට වෙන් වෙන් සංකල්පයන් වශයෙන් හඳුන්වා දීය. නූතන අර්ථයෙන් පුළුල්ව එය හැඳින්වීම ආරම්භ වූයේ ස්ත්‍රීවාදයත් සමඟය.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිර්මාණය කරනුයේ සමාජීය වශයෙන් ගොඩනඟන ලද සම්මතයන් සහ මතවාදයන් ලෙසය. එමඟින් පුරුෂයින්ගේ හා කාන්තාවන්ගේ හැසිරීම හා ක්‍රියාවන් තීරණය වේ (ලෝක සංවර්ධන වාර්තාව,WDR, 2012 ).

ගැහැණුකම සහ පිරිමිකම හා බැඳි සමාජානුයෝජනය පිළිබඳව හඳුන්වා දුන් ඈන් ඕක්ලේ ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් වන ශ්‍රම විභජනය පිළිබඳව පූර්ව සමාජයන් 200ක් ආශ්‍රයෙන් කරුණු ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥ මර්ඩොක්, මෙය හා තරයේ සම්බන්ධ වන පුරුෂාධිපත්‍යය සංකල්පය පිළිබඳව 1990 දී රචිත Theorizing patriarchy නම් කෘතිය මඟින් පුරුෂාධිපත්‍යය සංකල්පය හා බැඳි ලිංගිකත්වය, දික්කසාදය, සංස්කෘතිය, ගබ්සාව, උපත් පාලනය, ස්ත්‍රීවාදය, නෛතික තත්ත්වය වැනි කරුණු රාශියක් පිළිබඳව ඉදිරිපත් කළ සිල්වියා වොල්බි, පුරුෂාධිපත්‍යය හා බැඳි සුවිශේෂ ලක්ෂණ 3ක් පිළිබඳව 1990 දී Manhood in the Making Culture Concept of Mascalinity නම් කෘතියෙන් සිය අදහස් ඉදිරිපත් කළ ඩේවිඩ් ගිල්මෝර් යන පුද්ගලයන් මෙන්ම සංකල්පයන් සහ මතවාදයන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී වැදගත් වේ. තවද, මාග්‍රට් මීඩ්, වෙස්ට් සහ සිමර්මන්, ගෝෆ්මාන් වැනි සමාජ විද්‍යාඥයින් ද ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා සම්බන්ධ සංකල්පයන් ආශ්‍රිතව අධ්‍යයනයන් සිදු කර ඇත.

ලෝක ආර්ථික සමුළුවේ 2021 වාර්තාව අනුව, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ පරතරයෙන් ලොව රටවල් 156ක් අතරින් ශ්‍රී ලංකාව 116 වැනි ස්ථානයට පත්ව පසුගිය වසරේ දී ශ්‍රී ලංකාව රටවල් 153ක් අතරින් 102වැනි ස්ථානයේ පසුවිය.

සමාජය යනු පුද්ගල ක්‍රියාකාරකම් රාශියක එකතුවකි. සමාජය තුළ යම් අසරණ භාවයක් පෙන්නුම් කරන පුද්ගලයෙක් ***වින්දිතයෙකු*** **(victim)** ලෙස හඳුනාගත හැක. එම තැනැත්තා හිංසාවට පීඩාවට පාත්‍රවීම ඕනෑම තත්ත්වයක් යටතේ සිදුවිය හැකිය (යම් රෝගී තත්ත්වයකින් පෙළෙන්නන්, ස්වාභාවික ව්‍යසනයකට රිය අනතුරු, පිළිකා රෝගීන්, හදිසි අනතුරුවලට ලක් වූවන්, අසාධාරණයන්ට ලක් වූවන්, ස්වභාවික ආපදාවන්ට ලක් වූවන්, අපරාධ වින්දිතයින්, සමූල ඝාතනය) **(Karmen,** 1990, Crime victims an introduction to Criminology**).** වින්දිත විද්‍යාව යන වචනයේ මූලාරම්භය බෙන්ජමින් මෙන්ඩල්සන්ගේ (1937 - 1940) මුල් ලියවිලිවලින් ඇරඹිණි. නමුත් යම් සාපරාධී ක්‍රියාවක් නිසාවෙන් පීඩාවට පත්වන්නෙක් අපරාධ වින්දිතයෙක් වේ. 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතේ 46 වගන්තියේ අපරාධ වින්දිතභාවය පිළිබඳව සඳහන් වේ.

සරලව ගත්විට දක්වා ඇති උද්දේශිත වරදක් සංයුක්ත වන්නා වූ හෝ යම් ක්‍රියාවක හෝ නොකර හැරීමක ප්‍රතිඵලයක් ලෙස හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 හෝ 13(1) හෝ (2) මඟින් සුරක්ෂිත කර ඇති මූලික අයිතිවාසිකමක් හෝ මානව හිමිකමක් කඩ කිරීමක ප්‍රතිඵලයක් ලෙස කායික, මානසික, චිත්තාවේගී, ආර්ථික හෝ වෙනත් අලාභයක්, හිංසාවක්, හානියක්, දුබලතාවයක් හෝ හානියක් අත්විඳින යම් තැනැත්තකු ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයෙකු,දරුවකු හෝ ඔහු හෝ ඇය කෙරෙහි විශේෂිත බැඳිමක් ඇති යම් තැනැත්තකු අපරාධ වින්දිතයෙකි. බෙන්ජමින් මෙන්ඩල්සන් (1940-1963) හැන්ස් වොන් හෙන්ටින්,ස්ටීවන් ෂාපර්, එඩ්වින් සදර්ලන්ඩ් (1924), මර්වින් වෝල්ෆ්ගැංග්, මර්ගරි ෆ්‍රයි (1957), බර්ට්‍රම් (1949) ආදී අපරාධ විද්‍යාඥයින් විසින් අපරාධ වින්දිතභාවය පිළිබඳව අධ්‍යයනය කරන ලදි.

අපරාධ වින්දිතභාවයට පත්වීම සඳහා ස්ත්‍රීපුරුෂ සමාජභාවයෙහි පවත්නා වූ බලපෑම කෙබඳු ද යන්න විවිධ පර්යේෂකයන් සිදු කරන ලද පර්යේෂණ පත්‍රිකා ආශ්‍රයෙන් මෙසේ විශ්ලේෂණය කළ හැක. අපරාධ වින්දිතයන් වීමේ අවදානම මත බලපාන ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳව පර්යේෂණ අධ්‍යයනයක් Heather Zaykowski සහ Whitney Gunter විසින් අපරික්ෂාකාරී ජීවන රටාවන්හි කාර්යභාරය ගවේෂණය කරමින් සිදු කර ඇත.

මෙහි දක්වන ආකාරයට පිරිමින් හා ගැහැණු ළමයින් සඳහා ගොදුරු වීමේ අවදානමට අශෝභන සහ වෙනත් විකෘති හැසිරීම් දායක වන්නේ කෙසේද? යන්න පිළිබඳව වර්තමානයේ වැඩි අවධානයක් යොමුවී නැත. ස්ත්‍රී-පුරුෂ සමාජ භාවය හිංසනය පිළිබඳව සැලකිය යුතු පුරෝකතනයක් බව විවිධ පරීක්ෂණ මඟින් හෙළි වුවත් එහි වෙනස්කම් පැහැදිලි කිරීම කෙරෙහි අඩු අවධානයක් ලබා දී ඇත. කෝපය සහ ප්‍රචණ්ඩකාරී හැසිරීම වින්දිතභාවයට පත්වීමේ අවදානමට බෙහෙවින් සම්බන්ධ වේ.

මෙම අධ්‍යයනය තුළින් ප්‍රචණ්ඩකාරී හිංසනයට ලක්වීම සහ නැවත නැවත හිංසනයට ලක්වීම පුරෝකතනය කරන හරස්කඩ සහ කාලානුරූපී ආකෘතීන් පිරිමින් සහ ගැහැණුන් සඳහා හිංසනය වීමේ අවදානමට වෙනස් ජීවන රටාවන් බලපා ඇත්තේ කෙසේදැයි යන්න සොයා බලයි. ප්‍රචණ්ඩකාරී හැසිරීම සියල්ලටම අවදානම වැඩි කරයි. කෙසේවෙතත් අවදානම් සාධකවල ස්ත්‍රී-පුරුෂ භේදය පැහැදිලි කිරීමේ පරතරය ජන විකාශන, පවුල් සහ ප්‍රජා සාධක සහ වින්දිතයන්ගේ ජීවන රටාවන් සහ වින්දිත න්‍යායන්වලට සීමා වී තිබේ. එනම් ස්වයං පාලන සහ දෛනික ක්‍රියාකාරකම් න්‍යාය වැනි න්‍යායන් සඳහාය.

වින්දිතයන් ගොදුරුවීමේ අවදානම හා බැඳී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සලකා බැලීමේ දී ප්‍රධානම සාධකය වන්නේ ජීවන රටාවයි. ජාතික අපරාධ වින්දිත සමීක්ෂණයේ සහ ඒකාකාරී අපරාධ වාර්තාවේ සාක්ෂිවලින් පෙනී යන්නේ ස්ත්‍රීන් හා සසඳන විට ස්ත්‍රී දූෂණ ලිංගික අතවරයන් හැරුණුවිට පුරුෂයන් හට ප්‍රචණ්ඩකාරී හිංසනයන් සහ වරදට පත්වීමේ වැඩි අනුපාතයක් ඇති බවයි. එමෙන්ම මාධ්‍ය ගවේෂණය කිරීමට න්‍යායන් කිහිපයක් පවතී. වඩාත් කැපී පෙනෙනුයේ දෛනික ක්‍රියාකාරකම් න්‍යාය සහ ජීවන රටාවන් / ස්වයංපාලන න්‍යායයි. දෛනික ක්‍රියාකාරකම් න්‍යායට අනුව

සුදුසු භාරකාරත්වයක් නොමැති විට ගොදුරු වීමේ ප්‍රතිඵලය වනුයේ ගොදුරු ඉලක්ක සහ අභිප්‍රේරිත වැරදිකරුවන් අභිසාරී වීමයි (කොහෙන් සහ ෆෙල්සන් 1979) (මියර් සහ මීතේ 1993). ඒ හා සමානව ජීවන විලාසිතා න්‍යාය යෝජනා කරනුයේ අවදානම් සහ ගත හැසිරීම් සහ නිවසේ සිට ගත කරන කාලය අභිප්‍රේරිත වැරදිකරුවන්ට නිරාවරණය වීම වැඩි දියුණු කරන බවයි. විකෘති ජීවන රටාවන්වල නිරත වීමේ පුද්ගලයන් තවදුරටත් අවදානමට ලක් කරයි (ජෙන්සන් බ්‍රවුන්ෆීල්ඩ් 1986). ගොදුරු වීම කාන්තාවන්ට වඩා පුරුෂයන්ට 49% ක් වැඩි වුවද ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විචල්‍යතාවයෙන් 1/3 ක් පමණ ජීවන රටාව සහ සම්බන්ධ වේ.

ස්ත්‍රීපුරුෂ සමාජභාවය පැහැදිලි කිරීම සඳහා දක්වා ඇති තවත් ඉදිරි දර්ශනයක් පිළිබඳව මෙහි සඳහන් වේ. එය General Strain Theory (GST)* කෝෂයෙන් හා ආක්‍රමණශීලී ලෙස ප්‍රතික්‍රියා කරන පිරිමින් හා සසඳන විට දුක්ඛිත බව සහ මානසික අවපීඩනය තුළින් කාන්තාවන්ට ජීවිත ආතතියට ප්‍රතිචාර දැක්වීමට වැඩි ඉඩක් ඇත. මෙසේ වින්දිතභාවයට ලක්වීමේ ආතතිය සෘණාත්මක මෙන්ම ධනාත්මක විය හැකිය. හින්නෝන්මාදය, මත්පැන් සහ මත්ද්‍රව්‍ය මත යැපීම, කාංසාව ඇති පුද්ගලයින් ප්‍රචණ්ඩකාරී හිංසනයන්ට ගොදුරු වීමට බොහෝ ඉඩකඩ ඇත. වැරදි සහගත හැසිරීම් වලට සහාය වීම සහ අවදානම් සහිත අවස්ථාවන්ට නිරාවරණය වීම තුළින් වින්දිතයින්ගේ අවදානම වැඩිකිරීමට සමවයස් කණ්ඩායම් හේතුවිය හැකිය. GST න්‍යාය අනුව සෘණාත්මක ජීවිත සිදුවීම් සහ ආතතිය අපරාධවලට ගොදුරු වීමට මාර්ගය සලසයි. තව ද මානසික සෞඛ්‍ය හා ඒ ආශ්‍රිත ගැටලු ද ගොදුරු වීමේ ප්‍රවණතාවය වැඩි කරයි. එමෙන්ම අධික මත්පැන් පානය සහ ප්‍රචණ්ඩත්වය හිංසනයට සම්බන්ධ බව මෙහි දක්වයි.

අධ්‍යයනයේ දී යොදාගත් නියැදිය අනුව සිදුකළ සමීක්ෂණය අනුව පහර කෑමට ලක් වූවන් අතර පොලීසියට වාර්තාවී ඇත්තේ සිදුවීම් 19ක් පමණි (17.6%). තවද විශ්වවිද්‍යාල හිංසනය අවම කිරීමට දරන ප්‍රයත්නයන්, ආක්‍රමණශීලී හැසිරීම, ද්‍රව්‍ය භාවිතය, මානසික සෞඛ්‍ය ඇතුළු ගොදුරුවීමේ අවදානම සඳහා බලපාන සාධක කෙරෙහි අවධානය යොමු කළ යුතුය. වින්දිතභාවයට පත්වීම වැළැක්වීම සහ නැවත නැවත වින්දිතභාවයට පත් වීම වැළැක්වීම සඳහා එවැනි මූලාරම්භයන් විශේෂිත ස්ත්‍රී පුරුෂ අවදානම්වලට අනුකූල විය යුතුය. කෙසේ වෙතත් පිරිමින් සහ ගැහැණුන් යන දෙපාර්ශවයම ආගන්තුකයන්ට වඩා තමන් දන්නා කෙනෙකුගේ ගොදුරක් බවට පත් වීමට ඉඩ ඇත. වර්තමානයේ දී ලිංගික හිංසනය අවබෝධ කරගැනීමට හා වැළැක්වීමට වැඩි උනන්දුවක් ඇති වී ඇත. එමෙන්ම අවදානම් සාධක සහ ශාරීරික පහරදීම් ඇතිවීම පිළිබඳව සලකා බලා ඇත්තේ අඩුවෙනි. ඒ පිළිබඳව ඇත්තේ අවම අධ්‍යයනයන් ය.

**General Strain Theory ( GST )යනු අනෝමීය න්‍යායේ නවතම සහ පුළුල්ම අනුවාදයයි (ඇග්නිව්, 2006). GST නියෝජනය කරන්නේ මර්ටන් (1938), කොහෙන් (1955) සහ ක්ලෝවර්ඩ් සහ ඕලින් (1960)ගේ සම්භාව්‍ය න්‍යායන් ඇතුළුව පූර්ව අනෝමීය න්‍යායන් සංශෝධනය කිරීම හා දීර්ඝ කිරීමය.*

Kathleen A Fox, Matt R Nobles සහ Alex R Piquero විසින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, අපරාධවලට ගොදුරු වීම සහ අපරාධවලට ඇති බිය යන්නෙන් සිදුකරන ලද පර්යේෂණ පත්‍රිකාවෙන් වර්තමානයේ දී සිදුවුණු යම් යම් සිදුවීම් හේතුකොටගෙන විශ්වවිද්‍යාලවල අපරාධ සහ ආරක්ෂාව පිළිබඳව වැඩි වශයෙන් අවධානයට ලක්වී තිබේ. මෙම අධ්‍යයනය විශ්ව විද්‍යාලයේ සිසුන් නියැදියක් ගෙන සිදුකර ඇති අතර එහි දී අපරාධවලට ගොදුරු වීම සහ භීතිය අතර ඇති සම්බන්ධතාවය, භීතියෙහි ස්ත්‍රී-පුරුෂ භේදය හා සම්බන්ධ ප්‍රධාන කරුණු විමසා දත්තයන් ලබාගෙන ඇත.

පුද්ගලික හිංසනයට ලක්වන ප්‍රධාන ආකාර හතරකි. එය පිරිමින් සහ කාන්තාවන් අතර ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පරික්ෂා කරන ආකාරයන් වේ. ලිංගික අතවර, පවුල් හිසනය, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය සහ පල්වීම එම ආකාර හතරයි. මෙහි දී පෙනී යන්නේ පිරිමින්ට වඩා කාන්තාවන් වැඩි වශයෙන් අපරාධවලට ගොදුරු වීමට බියක් දක්වන බවයි. එමෙන්ම පිරිමින් කාන්තාවන්ට වඩා අපරාධවලට ගොදුරු වන අතර එයට දිවා කාලය සහ රාත්‍රී කාලය ද යම් සම්බන්ධතාවයක් දක්වනු ලබයි.

මෙහි දී විශේෂයෙන්ම විශ්වවිද්‍යාලීය කාන්තාවන් වැඩි වශයෙන් අත්විඳිය හැකි අන්තර්පුද්ගල හිංසනය, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය IPV, ලිංගික අතවර, පවුල් හිංසනය, ශාරීරික හිංසනය, දේපළ අපරාධවලට ගොදුරු වීම ආදිය පිළිබඳවත්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත ඒවායෙහි වෙනස් වීමත් වැඩි වශයෙන් ගවේෂණය කර ඇත. ලිංගික අපරාධ, දේපළ අපරාධ, පුද්ගලික අපරාධ, සමීප සහකරු ප්‍රචණ්ඩත්වය, ලිංගික අතවර, පල්වීම වැනි විශේෂිත අපරාධ සඳහා පිරිමින්ට වඩා කාන්තාවන් වැඩි වශයෙන් ගොදුරු වන බව මෙහි දක්වා ඇත. ඒ හේතුවෙන් කාන්තාවන් තුළ අපරාධ බිය වැඩි වශයෙන් දක්නට ලැබේ. නමුත් බොහෝ අපරාධයන්වලට වැඩි වශයෙන් ගොදුරු වන්නේ පුරුෂයන්ය. සෙවණැලි කල්පිතය යන යෙදුම ෆෙරාරෝ විසින් භාවිත කරනු ලැබුවේ කාන්තාවන්ගේ අපරාධ සඳහා ඇති බිය ලිංගික අතවරයන් සඳහා ප්‍රධාන වශයෙන් බලපෑම් කරන බව පෙන්වීමටය. විශ්ව විද්‍යාල සිසුවියන් ඔවුන්ගේ පිරිමි සගයන්ට අපරාධ බියෙන් පසු වේ. විශේෂයෙන් ලිංගික අතවර සහ ආගන්තුකයන් පසුපස හඹා ඒම ශාරීරික හිංසන පහරදීම් ආදිය ඒ සඳහා හේතුවේ එමෙන්ම අපරාධවලට ඇති බිය කාන්තාවන්ට පමණක් සීමා නොවිය යුතු අතර පිරිමින් ද වක්‍රව හා සෘජුවම අපරාධවලට ගොදුරු වේ. විශේෂයෙන් ලිංගික අපරාධ වලට සහ පහරදීම්වලටය. එමෙන් ම බොහෝ අපරාධ සඳහා ගොදුරු වන්නේ රාත්‍රී කාලයේ දී ය. සොරකම්, පහරදීම්, ලිංගික අතවර, ප්‍රචණ්ඩත්වය විශ්වවිද්‍යාලයයන්වල බහුල වේ.

බොහෝ විට කාන්තාවන් අපරාධවලට ගොදුරු වන්නේ ආගන්තුකයන් මගින් නොව හොඳින්ම දන්නා හඳුනන පුද්ගලයන් මඟිනි. එම නිසා විශ්වවිද්‍යාල තුළ යටිතල පහසුකම් වර්ධනය කළ යුතු බව මෙන්ම මේ පිළිබඳව වැඩි අවධානයක් දිය යුතු බව මෙහි දක්වා ඇත. විශේෂයෙන් ආරක්ෂාව තර කිරීම, බාහිර ආලෝකය වැඩි කිරීම, විදුලිය, ප්‍රාග්ධන වියදම වැඩි කිරීම, විශ්වවිද්‍යාල සිසුන් දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග ඒ අතර ප්‍රධාන වේ. විශ්වවිද්‍යාල පරිපාලකයන්

අවධානය දිය යුතු කරුණු කාරණා පිළිබඳවත් විශ්වවිද්‍යාල සිසුන් තම මානසික ශක්තිය වර්ධනය කර ගත යුතු බවත් තම ආරක්ෂාව තමා විසින්ම විශ්වාසනීයත්වය කින් යුතුව සපයාගත යුතු බවත් නිරන්තරයෙන්ම දැනුවත්ව අවධානයෙන් කටයුතු කළ යුතු බවත් මෙහි දී වැඩිදුරටත් සඳහන් කර ඇත.

හරියන් හලුවාන් පුවත්පතේ ඇති ස්ත්‍රී දූෂණවල ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ සඳහන් වන පත්‍රිකාව අධ්‍යයනය කිරීමේදී, ඉන්දුනීසියාවෙහි Negeri Padang විශ්වවිද්‍යාලයේ Hendrika Era Farida, Novia Juita,Ngusman Manaf විසින් මෙය සිදු කර ඇත. වර්තමානය වන විට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සමාජය පුරා පැතිරීමට ජනමාධ්‍ය දායක වී ඇත. බොහෝ ජනමාධ්‍යවලින් කාන්තාවන් සිදු කරනු ලබන අරගල, කාන්තාවන්ට සිදුවන අසාධාරණකම් ආදී තේමාවන් පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. ප්‍රධාන වශයෙන් ස්ත්‍රී දූෂණ වැනි මාතෘකාවන් ඊට අන්තර්ගත වේ. ජනමාධ්‍යයන්වලට අනුව ස්ත්‍රී දූෂණයට ගොදුරු වූ කාන්තාවන් කොන් කිරීමක් දක්නට ලැබේ. මෙහි දැක්වෙන්නේ හරියන් හලුවාන් නම් පුවත්පත තුළ ඇති ස්ත්‍රී දූෂණ පුවත් පිළිබඳවයි. විවේචනාත්මක දේශන විශ්ලේෂණ ආකෘතියක් වන සාරා මිල්ස්ගේ ක්‍රමය භාවිතා කරමින් ජනමාධ්‍ය වල ස්ත්‍රී දූෂණ පිළිබඳ වාර්තාවන් විශ්ලේෂණය කිරීම සිදු කරනු ලබයි. මෙහිදී වැඩි වශයෙන් ස්ත්‍රී දූෂණයන් සඳහා පුරුෂාධිපත්‍ය ඉස්මතු වී ඇත. බොහෝ ස්ත්‍රී දූෂණ ප්‍රවෘත්තීන්වල සඳහන් වනුයේ පිරිමින් හට කාන්තාවන් කෙරෙහි තම බලය යෙදවීමට හැකි යැයි උපකල්පනය කිරීම මත කාන්තාවන් යටහත් පහත් කොට සහ යටත් වීමට නැඹුරු වීමකි.

ස්ත්‍රී දූෂණ ඉහළ යාමත් සමඟම මාධ්‍ය ඒ පිළිබඳව ආක්‍රමණශීලීව සාකච්ඡා කරනු ලබන අතර බොහෝ රටවල වර්තමානය වන විට මේ පිළිබඳව පරීක්ෂණයන් සිදුකරනු ලබයි. නිදසුන් වශයෙන් ඉන්දියාව, මැලේසියාව පෙන්වාදිය හැකිය.

ඩර්මා දක්වනුයේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු පුරුෂයන් හා ස්ත්‍රීන් තුළ ඇති ආවේණික ගති ලක්ෂණයන් බවයි. දූෂණ යනාදිය පිළිබඳව රචනා කරනු ලබන කතුවරයෙක් සෑම විටම ස්ත්‍රී-පුරුෂ මතවාදයන් ව්‍යංගයෙන් පෙන්නුම් කරනු ලබයි. ඉන්දුනීසියාවේ දේශීය දිනපතා පුවත්පතක් ලෙස වැඩිම අගයක් ලබා ගත් හරියන් හලුවාන් පුවත්පත තුළ අන්තර්ගත ස්ත්‍රී දූෂණ පිළිබඳ පුවත් පරීක්ෂණ ප්‍රභවයන් ලෙස තෝරා ගැනීමේ පරමාර්ථය සහ මෙම අධ්‍යනය පරමාර්ථය වනුයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව දැනුවත් කිරීම සහ ස්ත්‍රී දූෂණ පිළිබඳව වැඩි අවධානයක් ලබා දෙමින් මාධ්‍යවේදීන් සඳහා යම් දැනුවත් භාවයක් ලබා දීමයි. මෙම පුවත්පත තුළ වැඩි වශයෙන් කාන්තාවට අවධානය දී ඇති අතර කාන්තාව වින්දිතයා බවට පත් කරමින් බොහෝ පුවත් වාර්තා කර ඇත. (ලොංටොං ගේ භාර්‍යාවන් සහ ලැඩොං කාන්තාව අපයෝජනය කිරීම). කාන්තාව අපයෝජනයට ලක් වූ විට බොහෝවිට කාන්තාවන් තමන් දූෂණයට හෝ වින්දිතභාවයට පත් වූ බව සෘජුවම ප්‍රකාශ නොකරයි. එයම වින්දිතයාට හානිදායක විය හැකිය.

ඩර්මාට අනුව දේශප්‍රේමී දෘෂ්ටිවාදය, සාමාන්‍ය පවුල් වාදය, මාතෘවාදය සහ පීතෘවාදය ලෙස ස්ත්‍රී-පුරුෂ දෘෂ්ටිකෝණය කොටස් හතරක් පවතී. හරියන් පුවත්පතෙහි බොහෝ පුවත් ඇත්තේ පුරුෂාධිපත්‍ය මූලික කරගෙනය. එමෙන්ම

මාධ්‍යවේදීන් එම පුවත් රචනා කරනුයේ සැකකරුවන්, පොලිසිය හෝ සාක්ෂිකරුවන් පදනම් කරගනිමිනි. බොහෝ විට මෙසේ පොලිසිය තොරතුරු ලබාගත් පසු සත්‍ය සිදුවීම්වලට අනුකූල නොවන අයුරින් එය රචනා වුවොත් වින්දිතයාට එය හානිකර වේ. ශාරීරිකව සහ මානසිකව පීඩාවිඳ ඇති කාන්තාවන්ට මෙන්ම වින්දිතයන්ට ආත්මාභිමානය පහත් කරන පුවත් මඟින් නැවත හානිදායක විය හැකිය.

මෙමඟින් නිගමනයන් දෙකක් ගම්‍ය වේ. එනම් හලුවාන් දූෂණ පුවත්වල කාන්තාවන්ගේ ස්ථාවරත්වය පැවසීමයි. කාන්තාවන් පිරිමින්ගේ අධිකාරිය යටතේ සිටින අතර ඔවුන්ට තර්ජනයක් හෝ බියක් ඇති නිසාවෙන් සටන් කළ නොහැකිය. දෙවනුව මෙහි දෘෂ්ටිකෝණය වනුයේ පුරුෂාධිපත්‍යයයි. මේ සම්බන්ධව හලුවාන් ඩේලි පුවත්පතෙහි ස්ත්‍රී දූෂණ පුවත්වල මාධ්‍යවේදීන් පෙළගැස්වීම සඳහාත් මාධ්‍යවේදීන් දූෂණයට ලක්වූවන් සමඟම සම්බන්ධ වී කටයුතු කිරීමට නැඹුරු බවත් නිගමනය වේ. අපරාධකරුට පක්ෂව ශබ්දකෝෂ සහ නිෂ්ක්‍රීය වාක්‍ය භාවිත කිරීමෙන් එය මනාවට පැහැදිලි වේ.

David Achanfuo Yeboah සහ Farley Brathwaite විසින් සිදුකර ඇති බාබඩෝස් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ අපරාධ වින්දිත කරණය දෙස අවධානය යොමු කිරීමේ දී, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ සාපරාධී හිංසනය අතර අන්තර් සම්බන්ධතාවය ලොව පුරා අධිකරණ බලතල මූලාශ්‍රවල ලේඛනගත කර ඇත. මෙහි දැක්වෙන්නේ එම අන්තර් සම්බන්ධතාවය පිළිබඳව විමර්ශනය කිරීමක් සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, අපරාධවලට ඇති බිය, අපරාධ වර්ග මෙන්ම සාපරාධී හිංසනයන්ගේ බලපෑම සමඟ සම්බන්ධතාවයක් ඇති යැයි සාහිත්‍යවල දක්වා ඇති පොදු මතයට සහාය දක්වන සාක්ෂි සංස්ලේෂණයකි. හිංසනය සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳව ඔවුන්ගේ අපරාධවලට ඇති බිය මෙන්ම සාපරාධී හිංසනයට ලක්වීමේ බලපෑම තීරණය කරන බවත් මෙමඟින් දක්වා ඇත. මෙහි අපරාධවලට ඇති බිය, හිංසනයට ලක්වන ආකාරය, සාපරාධී හිංසනය, භෞතික, ආර්ථික, චිත්තවේගීය බලපෑම පිළිබඳ ස්ත්‍රී-පුරුෂ භේදය පිළිබඳව පැහැදිලිවම සඳහන් වේ.

වර්තමානය වනවිට මේ පිළිබඳව පරීක්ෂණයන් බොහෝ සිදු කරයි. මෙහි දී බොහෝ අවස්ථාවන්වල දී ලිංගික අපරාධවලට ගොදුරු වූ කාන්තාවන් එසේ හිංසනයට ලක්වීමේ ප්‍රතිවිපාක මෙන්ම ස්ත්‍රීන් හා පුරුෂයන් අතර සිදුවන සාපරාධී හිංසනවල ස්වභාවය එය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සඳහා බලපාන ආකාරය විවිධ පර්යේෂකයන් විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යයනයන් සඳහා අවධානය යොමු කරමින් අපරාධ විද්‍යාවේ සමාජභාවය පරික්ෂා කර ස්ථාපිත කිරීමට උත්සාහ දරයි. චැඩ් සඳහන් කළ ප්‍රකාශවලට අනුව අපරාධ සඳහා ඇති බිය ප්‍රකාශ කිරීමට කාන්තාවන් තම පිරිමි සගයන්ට වඩා බොහෝ කැමති බව පර්යේෂණ සාක්ෂි තිබේ. ට්‍රිනීඩෑඩ් ගැන ලියන චැඩ් සඳහන් කරනුයේ, සාහිත්‍ය නිරන්තරයෙන් ලිංගිකත්වය අපරාධවලට බය වීමේ පුරෝකතනය කරන්නෙකු ලෙස පෙන්වා ඇති බවයි.

එම නිරීක්ෂණ එම රටේ ඉහළ මට්ටමේ අපරාධ සැලකිල්ලට ගෙන බාර්බඩෝස් සඳහා ද සත්‍ය දැයි සොයාගැනීමට උත්සාහ කිරීම මෙම අධ්‍යයනයෙන් දක්නට ලැබේ. වින්දිතයාට භෞතික, ආර්ථික, මානසික බලපෑම අංශ තුනක් ලෙස අපරාධය බලපානු ලබයි. එමෙන්ම විශාල වශයෙන් පිරිමින්ට වඩා කාන්තාවන් තුළ ශාරීරික තුවාල සිදුවීමේ වැඩි අවදානමක් පවතී. හිංසනයට ලක්වීම සම්බන්ධව ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවයෙහි බලපෑම පිළිබඳව පැහැදිලි සාක්ෂි නොමැති අතර සාක්ෂිවලින් පෙනී යන්නේ අපරාධයේ මානසික බලපෑම අනෙක්වාට වඩා විනාශකාරී සහ කල් පවත්නා බවයි. මිනීමැරුම්, දරුණු පහරදීම් සහ මංකොල්ලකෑම් වැනි ප්‍රචණ්ඩකාරී අපරාධ වලට වැඩි වශයෙන් පුරුෂයන් ගොදුරු වීමට ඉඩ ඇත (මීතේ සහ මැකෝර්කල් 1998).

එමෙන්ම පුරුෂයන් ආගන්තුකයන්ට ගොදුරුවීමේ වැඩි ඉඩක් ඇති අතර කාන්තාවන් තමන් දන්නා පුද්ගලයින් විසින් ගොදුරු වීමට වැඩි ඉඩක් ඇති බව කිව හැක (අධිකරණ සංඛ්‍යා ලේඛන කාර්යංශය). කාන්තාවන්ගේ අපරාධ වලින් පීඩාවට, මානසික සහ කායික ගැටලු රාශියකට මුහුණ පෑමට වැඩි ඉඩක් පවතී. කෙසේ වුව ද මේ සම්බන්ධව ගැහැණු පිරිමි වෙනස්කම් ස්වයංක්‍රීය නොවන බවට පරස්පර විරෝධී සාක්ෂි ද තිබේ. මෙහි දී මෙම වින්දිත සමීක්ෂණයන් මගින් විවිධ ප්‍රශ්නයන් යොමු කරමින් දත්ත රැස්කර ඇති අතර එමගින් පෙනී යන්නේ බාර්බඩෝස් අපරාධ සිදුවීම සහ පැතිරීම ඉහළ මට්ටමක පවතින නමුත් මේ පිළිබඳව කිසිදු අධ්‍යයනයක් මීට පෙර සිදුකර නොමැති බවයි. එය එහි අපරාධ තත්වයන් වර්ධනය වීමට ද යම් ආකාරයකින් හෝ බලපා තිබිය හැකිය.

ඍජු වින්දිතකරණ අත්දැකීම් සහ අපරාධවලට ඇති බිය පිළිබඳව ස්ත්‍රී-පුරුෂ සමාජ දෘෂ්ටිකෝණයෙන් Emiliano Sironi සහ Leda Maria Bonazzi විසින් පර්යේෂණ අධ්‍යයනයක් සිදුකර ඇත. අපරාධ වින්දිතකරණය දශක තුනක් පමණ කාලයක් තිස්සේ සමාජ විද්‍යා සාහිත්‍යයේ කේන්ද්‍රස්ථානයක් වී ඇත්තේ එය ප්‍රබල සමාජ ගැටලුවක් වන බැවිනි. අවදානම් යැයි සිතිය හැකි ස්ථාන හෝ ක්‍රියාකාරකම් වළක්වා ගැනීමෙන්, වැඩි කාලයක් නිවසේ ගත කිරීමෙන්, හැසිරීම් චර්යාවන් පුරුදු ආදිය වෙනස් කිරීම මඟින් පුද්ගලයෙකු අපරාධ සඳහා බිය විය යුතු ප්‍රමාණය අවම කරගත හැකිවේ. සාහිත්‍යයන් තුළ ඍජු හෝ වක්‍ර අපරාධ වින්දිත අත්දැකීම් පිළිබඳ අන්තර්ගත වේ. අපරාධ බිය පිළිබඳව පැහැදිලි කිරීමේ දී අපරාධයන් පිළිබඳ අවදානම හා හිංසනයට ලක්වීම පිළිබඳ ඍජු පෞද්ගලික අත්දැකීම් වැදගත් වේ. ප්‍රධානම කරුණක් වන්නේ ප්‍රජාවක් තුළ අපරාධ භීතියේ මට්ටම් ඇති වනුයේ එම ප්‍රජාව තුළ සාපරාධී ක්‍රියාකාරකම්වල මට්ටම් නිසාය. කාන්තාවන් තුළ පිරිමින්ට වඩා ආරක්ෂිත සංජානනය අඩුය. එමෙන්ම මෙමඟින් අපරාධයකට ගොදුරු වීම අපරාධ භීතියේ මට්ටම වැඩි කරන බව ඔප්පු කිරීමට උත්සාහ දරනු ලබයි. විශේෂයෙන්ම මෙහි අපරාධ බිය සඳහා බලපාන අත්දැකීම්, වයස, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ජාතිය, අසල්වැසි සාධක වැනි සමාජයීය සාධක සඳහා පක්ෂග්‍රාහී වෙමින් ගොදුරු වීමේ සම්භාවිතාව සහ සංජානන බිය ආදිය තහවුරු කිරීමට යොදාගනු ලබයි. ඒ පිළිබඳව බොහෝ පර්යේෂකයන් සිදුකළ අධ්‍යයනයන්ද පවතින අතර පුද්ගලයන් අපරාධ සඳහා ගොදුරු වීමට සහ අපරාධ බිය ඇතිවීමට

අත්දැකීම් පමණක් නොව පුද්ගල, සමාජ, ජන විකාශන ලක්ෂණ ද හේතු විය හැකිය. විශේෂයෙන්ම වයස අපරාධ බිය සඳහා ඍජුවම බලපානු ලබයි. නිදසුනක් ලෙස අවුරුදු 60ට වැඩි පුද්ගලයන් තුළ අපරාධ බිය ඉහළය.

එමෙන්ම පුරුෂයින් සම්බන්ධයෙන් වැඩි අවදානමක් ඇති කාන්තාවන් අපරාධවලට ගොදුරු වීමේ ප්‍රවණතාව ඉහළය. තවද භීතියේ මට්ටම ඉහළ නැංවීමට ජාතිය සහ සමාජ නාගරික ක්ෂය වීම ද බලපානු ලබන බව වර්තමානයේ සොයාගෙන ඇත. භීතියේ පරිසරය එනම් විශේෂයෙන් මිනිසුන් ජීවත් වන ස්ථානය හා සඳහන් කර ඇති අනෙකුත් සාධක අපරාධ වින්දිතභාවය සමග මෙන්ම අපරාධ බිය සඳහාද සංයෝජනය වන බව මූලාශ්‍රයවල පවතී. තදාසන්න ප්‍රදේශවල, කුඩා නගරවල හෝ ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන මිනිසුන්ට වඩා විශාල නගරවල, අභ්‍යන්තර ප්‍රදේශවල පදිංචිකරුවන් අපරාධවලට බිය වීමට ඉඩකඩ පවතින බව මෙහි දැක්වේ. කාන්තාවන් තුළ සැඟවුණු හිංසනය නම් සංකල්පය බොහෝ ලෙස පවතී. බොහෝ කාන්තා වින්දිත තත්වයන් නිල වශයෙන් වාර්තා නොවේ. කාන්තාවන් අතර භීතියේ මට්ටම පුරුෂයින්ට වඩා ඉහළ මට්ටමක පවතින බවට බොහෝ ආනුභවික සාක්ෂි තිබේ.

විවිධ සමීක්ෂණ ක්‍රම භාවිතා කරමින් මෙම අධ්‍යයනය තුළ දත්ත රැස්කර ඇති අතර මෙහි දී ආක්‍රමණයන් අත්විඳ ඇති වින්දිතයන් පිළිබඳව කිසිදු ආක්‍රමණයක් අත්විඳ නැති කාන්තාවන් ද අතීත වින්දිතභාවයන් පිලිබඳව අපරාධ බියකින් පසුවන කාන්තාවන් හා පුරුෂයන් පිළිබඳව අතීත අත්දැකීම් වර්තමාන ආරක්ෂිත සංජානන මට්ටම කෙසේ බලපෑම් කරයිද යන්න දත්ත හා නිගමනයන් සඳහා එළඹී ඇත. මෙහි දී පිරිමින් සම්බන්ධව වැඩි වශයෙන් අපරාධ බියක් දක්වයි. වින්දිත අත්දැකීම් වර්තමාන මානසික මට්ටම් සඳහා බලපෑම් කරන බව දක්වා ඇත. පුරුෂයින් කාන්තාවන්ට වඩා භයානක හා බිය උපදවන ක්‍රියාකාරකම්වලට සහභාගී වේ. මෙයින් නිගමනය වන්නේ පිරිමි පුරුෂයන් සමස්තයක් වශයෙන් කාන්තාවන්ට සාපේක්ෂව අපරාධවලට ගොදුරු වීමටත් වැඩි ඉඩක් තිබුණ ද වැඩි වශයෙන් අපරාධ බිය කාන්තාවන් තුළ ඇතිවන බවයි.

මෙක්සිකෝවේ හි අල්ලස් දීම සම්බන්ධයෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ අනාරක්ෂිත භාවයෙහි බලපෑම වර්තමානයෙහි ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ අල්ලස් දීම අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව වැඩි අවධානයක් දෙමින් අධ්‍යයනය කර ඇත. සාම්ප්‍රදායික සමාජ සැකැස්ම අනුව පුරුෂයින් කාන්තාවන්ට වඩා ආර්ථික අල්ලස් සඳහා ගොදුරු වෙයි. එමෙන්ම ලිංගික සූරාකෑම්වලට වැඩි වශයෙන් කාන්තාවන් ගොදුරු වේ. නමුත් ශ්‍රම බළකාය තුළ වැඩි ඉපයීමේ හැකියාවක් පවතින්නේ කාන්තාවක් සඳහා බව මෙහි දක්වා ඇත. මින් නිගමනය කරනුයේ මෙක්සිකෝවේ කාන්තාවන්ගේ ආර්ථික හා සමාජ තත්ත්වය වැඩි දියුණු වන විට ඔවුන් යටත් විය හැකි දූෂණ වැඩි වන බවයි. කාන්තාවන්ගේ ආර්ථික තත්වය වැඩි නොවුව ද ඔවුන් අල්ලස් සඳහා ගොදුරු වන අතර ලිංගිකව හැසිරීම මෙන් ම ස්ත්‍රීපුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය සහ ආර්ථික කාන්තාවන් සඳහා එම තත්ත්වයන් අවම කිරීමට ප්‍රතිපත්තීන් සකස් කිරීමට තවමත් ප්‍රමාද නොවන බවත් මෙම අධ්‍යයනයෙන් තවදුරටත් සඳහන් කර ඇත.

**සමාලෝචනය**

අපරාධයක් සඳහා ගොදුරු වන අපරාධ වින්දිතයින් පිළිබඳ අධ්‍යයනයේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ඇත්තේ ඉතා වැදගත් වටිනාකමකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සංස්කෘතික තත්වයකි. ගැහැණු සහ පිරිමි යන දෙපාර්ශවයටම දී ඇති සමාජ සංස්කෘතික නිර්වචනය මීට ඇතුළත් වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විවරණය කිරීමේ දී ඊට මූලික වන සමාජ විද්‍යාත්මක සංකල්පය වනුයේ සමාජානුයෝජනයයි. එය උපතින් ආරෝපණය නොවන්නක් වේ. සංස්කෘතික අගනාකම් සහ ධර්මතාවන් අභ්‍යන්තරීකරණය කරගන්නා පුද්ගලයා ඒ අනුව තම අනන්‍යතාවය ගොඩනගා ගනී. ගැහැණුකම සහ පිරිමිකම ඒ අනුව ගොඩනගන පුද්ගලයෙකු සමාජානුයෝජන ක්‍රියාවලියට බඳුන් වීම තුළින් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඉස්මතු වේ. එය විවිධ සමාජ පරිසරයන් අනුව වෙනස් විය හැක. මාග්‍රට් මීඩ් ගේ නිව්ගිනියා අධ්‍යයනය මඟින් විවිධ සමාජයන්හි පවත්නා පුමුතිරිභාවයන්වල විශේෂතා හඳුනාගත හැක. අරපේශ්, මුණ්ඩුගුමාර්, චම්බුලි ගෝත්‍රික කණ්ඩායම් තුලින් ද ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මනාවට පැහැදිලි කරයි. එමෙන්ම එය සමාජ ස්ථරායනයක් ලෙස ද විග්‍රහ කල හැක. බොහෝ සමාජ වල කාන්තාවට පහළ තත්වයක් ද පුරුෂයින්ට ඉහළ සමාජ තත්ත්වයක් ද ලබා දී ඇත. එමනිසා පුද්ගලයන්ට සාපේක්ෂව අපරාධ සඳහා කාන්තාවන් බොහෝ බියක් දක්වනු ලබයි. ඒ පිළිබඳව ඉහත දක්වා ඇති ගවේෂණ අධ්‍යයනයන්වල මැනවින් සඳහන් කර ඇත.

බොහෝ අධ්‍යයනයන්වල පවතිනුයේ අපරාධ සඳහා ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් පවතිනුයේ පුරුෂයන්ට බවත් අපරාධ බිය ඉහළ වශයෙන් දැනෙනුයේ කාන්තාවන්ට බවත්ය. රැඩිකල්වාදීන්ගේ අදහස වනුයේ සමාජයේ සිටින බලවත් කණ්ඩායම අනෙක් පුද්ගල පිරිස පාලනය කරනු ලබන බවයි. ඒ අනුව බලවත් කණ්ඩායම ලෙස පුරුෂයන් කාන්තාවන් පාලනය කරන බව ගම්‍ය වේ (පුරුෂාධිපත්‍යය). මෙම තත්ත්වය බොහෝ අධ්‍යයනයන්වල මෙන්ම සැබෑ වශයෙන්ම සමාජය තුළ ද දක්නට ලැබේ. එහි ප්‍රතිපලය වනුයේ කාන්තාව විවිධ අයුරින් වින්දිතභාවයට පත්වීමයි. නිදසුන් ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට, ස්ත්‍රී දූෂණ, ලිංගික අතවර, ශාරීරික හිංසනය, පහරදීම් වැනි අපරාධයන් ගත හැකිය මෙසේ වීම සමාජ සංස්කෘතික තත්ත්වයක් බව අධ්‍යයනවල සඳහන් වේ. එනම් පුරුෂයෙකු යනු ප්‍රචණ්ඩකාරී දඩබ්බර අකාරුණික ශරීර ශක්තිය ඇති ආක්‍රමණශීලී අයකු විය. නමුත් කාන්තාව යනු ඉතා කාරුණික තැන්පත් ගති ඇත්තෙකු ලෙස පෙන්වා දෙයි.

පුද්ගලයාට සංස්කෘතිය තුළින්ම ප්‍රචණ්ඩත්වය උරුම කර දී තිබේ. ඒ අනුව මෙවැනි සංස්කෘතික ආරෝපණය තුළින් ද පුරුෂයාට අධික බලයක් හිමි වී තිබෙනු දක්නට ලැබේ. ඇමරිකාවේ අපරාධ සම්බන්ධ ජනාධිපති කොමිසම ඉදිරිපත් කරනුයේ ද කාන්තාවන් පිරිමින්ට වඩා අපරාධවලට ගොදුරු වීමේ තුන්ගුණයක ප්‍රවණතාවක් පවතින බවයි. නමුත් එය විවිධ අපරාධ සඳහා විවිධ ලෙස බලපානු ලබයි.වුල්ෆ් ගැන්ග් මනුෂ්‍ය ඝාතනයන්ට ගොදුරු වීමේ දී පිරිමින් තුන් දෙනෙකුට එක් කාන්තාවක් ලෙස අනුපාත වේ යන්න දක්වයි. එහි දී පුරුෂ මනුෂ්‍ය ඝාතන

වින්දිතයන් අධික වේ. ස්ත්‍රීවාදී අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විග්‍රහ කිරීමේ දී කාන්තාවක් කාන්තාවක ලෙස පුරුෂයන්ට වඩා ශරීර ශක්තියෙන් ද හීන වන ලෙසින් උපත ලැබීම ද අපරාධ සඳහා ගොදුරු වීමට බලපානු ලබන සාධකයකි. මෙකී තත්ත්වය නිසාවෙන් කාන්තාවන් බොහෝ විට දෙවන පන්තිය නියෝජනය කරනු ලබයි.

ඉහත අධ්‍යනයන් තුළ සඳහන් වී ඇත්තේ කාන්තාවන් තුළ පුරුෂයින්ට වඩා අපරාධ බිය පවතින බවක්ය. එයට හේතු සාධක ඉහතින් දක්වා තිබෙන ඇයගේ සංස්තික උරුමයයි. එමෙන්ම බොහෝ අවස්ථාවල පුද්ගලයන් අපරාධ සඳහා ගොදුරු වීමේදී ඔවුන්ගේ ජීවන රටාව සහ දෛනික ක්‍රියාකාරකම් හේතුවන බව ජීවන විලාසිතා සහ දෛනික ක්‍රියාකාරකම් න්‍යාය තුළින් ගම්‍ය වේ.

එය ඉහත ඇති බොහෝ පත්‍රිකා තුළ අන්තර්ගත වීම ප්‍රධානම කරුණකි. බොහෝ වශයෙන් කාන්තාවන් ලිංගිකමය අපරාධ සඳහා ගොදුරු වන බවත් මංකොල්ලකෑම්, සොරකම්, පහරදීම් වැනි ප්‍රචණ්ඩ අපරාධ සඳහා වැඩි වශයෙන් පුරුෂයන් ගොදුරු වන බවත් දක්නට ලැබේ. අපරාධ සඳහා ගොදුරු වනුයේ ආගන්තුක පිරිස්ගෙන් නොව තමා හොඳින් හඳුනන පුද්ගලයන්ගෙන් බව දැක්වේ. එම නිසා කාන්තාවන් තමා හොඳින්ම දන්නා හඳුනන සගයන්ට අපරාධ බියක් දක්වන බව මෙහි දී දක්වා ඇත. එහි සත්‍ය අසත්‍යතාවය විමසන විට හැඟීයනුයේ මධ්‍යස්ථතාවයකි. සමහර අවස්ථාවල දී එය සත්‍ය විය හැක. නමුත් අසත්‍ය වන අවස්ථා ද ඇත. නාඳුනන පුද්ගලයන් අතින් අපරාධයන්ට ගොදුරු වන අවස්ථාවල දී හඳුනන දන්නා හිතවත් පුද්ගලයන් බේරා ගන්නා අවස්ථාද විශාල වශයෙන් සමාජය තුළ පවතී. තවද අපරාධයන් සඳහා ගොදුරු වීමේ දී දවල් කාලයට වඩා රාත්‍රී කාලය ගොදුරුකරණයට ලක්වීම ඉහළ අගයක් ගනී. එය ඉහත අධ්‍යයනයන් තුළ දක්වා ඇති ප්‍රධානම කාරණාවකි. එයට ප්‍රධාන වශයෙන් අන්ධකාරය, පරිසරය අපැහැදිලි වීම, ජනගහණය අඩු වීම වැනි හේතු සාධක අයත්වේ.

එමෙන්ම රාත්‍රී කාලයේ දී කාන්තාවන් සඳහා එළියට පහළියට බැසීම ඉතා ඈත සාම්ප්‍රදායිකව ම තහනම් කර ඇත්තේ ද මෙම හේතුව නිසාවෙනි. මන්ද රාත්‍රී කාලය තුළදී අපරාධ වින්දිතභාවයට පත්වීමේ අවකාශය වැඩි නිසාවෙනි. මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සංකල්පය මත පුද්ගල පෞරුෂයද ගොඩනඟාගත හැකි අතරම ඒ අනුව පුද්ගලයන් තම කාර්යයභාරයන් නිර්ණය කර ගනී. ඕනෑම පුද්ගලයෙකු සමාජානුයෝජනයේ දී තමා කවුරුන්ද යන්න පිළිබඳව ස්වයං සංකල්පයක් ගොඩනගා ගනී. තමා පිළිබඳව ඕනෑම අයෙකු අනන්‍යතාවය තීරණය කර ගනු ලබන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුවය.

සංස්කෘතික අගනාකම් ආරෝපණය වීම මඟින් බොහෝ වශයෙන් කාන්තාව වටා පීඩාකාරී පසුබිමක් නිර්මාණය වන අතර මානව නියාම ධර්මයන්වලට අනුව උත්පත්තිය ලබන සෑම පුද්ගලයෙකුටම තමන්ට අනන්‍ය වූ අයිතිවාසිකම් පවතී. කිසිවෙකුගේත් බලපෑම් සහ පීඩනයන්ට යටත් නොවී ස්වාධීනව නිදහස්ව ජීවත් වීමේ අයිතිය හිමිවී තිබුණ ද වර්තමාන සමාජයේ තත්ත්වය කොයිබටද?.....

කෙසේ වෙතත් අපරාධයන් සඳහා ගොදුරු වීමේ දී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය වැදගත් වන්නේ සංස්කෘතිය මඟින්ම නිර්මාණය කරනු ලබන හේතු කාරණා නිසාවෙන් බවත් මෙම අධ්‍යයනයන්ගෙන් පැහැදිලි වන අතරම කාන්තාව හෝ පුරුෂයා හෝ අපරාධ වින්දිතයෙක් බවට පත්වීමට අවධානය නොමැතිකම ද බලපාන බවයි. ප්‍රථමයෙන්ම තමාගේ ආරක්ෂාව තමන් විසින් සපයාගත යුතුය. කාන්තාව සහ පුරුෂයා යන දෙපාර්ශවයටම එය අදාළ වේ. අවධානයෙන් කටයුතු කිරීම සහ උපක්‍රමශීලීව කටයුතු කිරීම මෙන්ම ආරක්ෂා වීම මඟින් අපරාධ ගොදුරක් වීමේ ප්‍රවණතාවය අවම කරගත හැකිය. එවිට අපරාධ වින්දිතයන්ගේ සංඛ්‍යාව ද අවම කර ගත හැක.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Abeyratne, V.,& Abeyratne, V.(2021). ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ පරතරයන්; ශ්‍රී ලංකාව 116 වැනි තැනට.Retrieved 13 October 2021, from https://girayanews.lk/2021/04/03/12311/

Adler, N. E., Boyce, T., Chesney, M.A.,Cohen, S., Folkman, S.,Kahn, R. L., & Syme, S. L.(1994).Socioeconomic status and health. American Psychologist, 49, 15-24.

Cohen L.E.,& Felson M.(1979).Social change and crime rate trends:A routine activity approach. American Sociological Review,44,588–608.

Cruz,A.(2020).*GENDER AND VULNERABILITY TO BRIBERY IN MEXICO*(LLB). Georgetown University.

Era Farida, H., Juita, N., & Abdul Manaf, N. (2018). Gender perspective in the news of rape o Harian Haluan. Proceedings Of The International Conferences On Educational, Social Sciences And Technology - ICESST 2018. https://doi.org/10.29210/2018156

Fox, K., Nobles, M., & Piquero, A. (2009). Gender, crime victimization and fear of crime. Security Journal, 22(1), 24-39. https://doi.org/10.1057/sj.2008.13

Gilmore, D. Manhood in the making.New Haven,Conn.:Yale Univ.Press.

Jensen, G. F., & Brownfield, D.(1986).Gender,lifestyles,and victimization:Beyond routine activity.Violence and Victims,1(2),85-99

Karmen, A.,(1990).Crime Victim: An Introduction to Victimology. Belmont, CA:Wadsworth Publishing Company.

Library.fes.de.Retrieved10October2021,fromhttps://library.fes.de/pdf.files/bueros/sri_lanka/08687.pdf.

liyanage, k., & walakuluge, s.(2006).ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය. F.E.S.

Meier,R. F. & Miethe, T. D(1993).Understanding Theories of Criminal Victimization, in Crime and Justice:A Review of Research,edited by M. Tonry and N. Morris. Chicago: University of Chicago Press.

Miethe, T., & McCorkle, R. (1998). Crime profiles- the anatomy of dangerous persons, places and situations. Los Angeles: Roxbury Publishing.

Norris,F.H.(1992).Epidemiology of trauma:Frequency and impact of different potentially traumatic events on different demographic groups. Journal of Consulting and Clinical Psychology, 60,409-418.

Reiss,A.J.,&Roth, J.A.(1993).Understanding and preventing violence.Washington,D.C.: National Academy Press

Rosenberg,M.L.& Mercy, J.A.(1991).Assaultive violence. In Violence in America,pp 12-50, New York: Oxford University Press

Sironi, E., & Bonazzi, L. (2016). Direct Victimization Experiences and Fear of Crime: A Gender Perspective. Peace Economics, Peace Science And Public Policy, 22(2), 159-172. https://doi.org/10.1515/peps-2016-0008

Walby,S.(1990).Theorizing patriarchy.Oxford, UK: B.

Yeboah, D.,& Brathwaite, F. (2010).Gender and Criminal Victimization in Barbados.The Open Criminology Journal,3(1), 1-8. https://doi.org/10.2174/1874917801003010001

Zaykowski, H., & Gunter, W. (2013). Gender Differences in Victimization Risk: Exploring the Role of Deviant Lifestyles. Violence And Victims, 28(2), 341-356. https://doi.org/10.1891/0886-6708.vv-d-12-00019

# පුමිතිරිභාවය හා සංක්‍රාන්තික ලිංගිකකත්වය

**හපුතන්ත්‍රීගේ පැතුම් නිවන්ත**

"අපි සැම දෙනාම අපේ පවුල ආගම, සමාජය, ඉතිහාසයේ අපේ මොහොත, අපේ ශරීරය විසින්ම පෙට්ටිවල දමා ඇත. එයින් සමහර මිනිසුන්ට නිදහස් වීමට ධෛර්යයක් ඇත."

-ජීනා රෙසෝරෝ-

මිනිස් වර්ගයා කෙරේ අවධානය යොමු කිරීමේදී මිනිසාට මිනිසෙකු වෙනස් වේ. එය සමාජීයව මනෝභාවයිකව පෞරුෂය, ධනය, තත්ත්වය, තරාතිරම මත හෝ ලිංගිකත්වය මත විය හැකිය. සාමාන්‍යයෙන් ලිංගිකත්වය මත මිනිසුන් අතර වෙනස තීරණය වන්නේ ස්ත්‍රී හෝ පුරුෂ ලෙසයි. නමුත් මෙම වර්ගීකරණ දෙකටම අයත් නොවන මනුෂ්‍ය කණ්ඩායමක් සිටිනා බවට බොහෝ දෙනෙකුට අමතක වී ඇත. උපතේදී අප සැවොම ස්ත්‍රියක් හෝ පුරුෂයකු ලෙස සමාජ ජීව විද්‍යාත්මක නම්නීකරණයකට ලක් වේ. නමුත් උපතේදී වෛද්‍යවරයකු අප පිරිමියකු හෝ ගැහැනියක. ලෙස වර්ග කරන්නේ ශරීර ලක්ෂණ මතයි. නමුත් සමාජානුයෝජනයත් මනෝ විද්‍යාත්මක ඉගැනුමත් මත පුද්ගලයා තම ලිංගික අනන්‍යතාව ගැන ප්‍රශ්න කරයි නම්, තමා පිළිබඳ සමාජ නම්නීකරණය ප්‍රශ්න කරයි නම් එය වෙනස් කර ගත යුතු ලෙස සිතන්නේ නම් ඒ සංක්‍රාන්තිකයකු වීමක් ය. සංක්‍රාන්තිකයන් නොවන මිනිසුන්ට සංක්‍රාන්තික ලිංගිකයන්ගේ හැඟීම කුමක් දැයි වටහා ගැනීම දුෂ්කර විය හැකිය. එම නිසාවෙන් සංක්‍රාන්තික ලිංගිකයන්ට එරෙහිව විවිධාකාරයේ දෝෂාරෝපණ සමාජය තුළ දක්නට ලැබේ. ඔවුන් වෙනස්කොට සැලකීමත්, අවඥාවට භාජනය කිරීමත් අපහසුතාවට පත් කිරීමත් වැනි ක්‍රියාකාරකම් තුන්වන ලෝකයේ රටවල වැඩි වශයෙන් දක්නට ලැබේ. නමුත් ඔබ දන්නා ඔබගේ ලිංගභේදය වැරදි යැයි සැම කෙනෙකුම ඔබට පැවසුවහොත් එය කෙසේ වේ දැයි සිතා බලන්න. මුළු මහත් සමාජයක්ම ඔබව පිරිමියකු ලෙස හඳුන්වද්දීත් , ඔබ මනසින් කාන්තාවක වූවොත්, මුළු සමාජක්ම ඔබව කාන්තාවක ලෙස හඳුන්වද්දීත් ඔබ මනසින් පිරිමියකු වූවොත් ඒ හැඟීම කෙසේ විය හැකිද? සැම සංක්‍රාන්තියකුම මෙම හැඟීමේ එල්බ ගත් අය වේ. සංක්‍රාන්තිකයන් යනු උපතේදී ලද ලිංගික සමාජභාවය ස්වකීය මනෝභාවය මත නොබියව වෙනස් කර ගැනීමට පෙලඹුන ස්වයං විප්ලවවාදීන් පිරිසක් ලෙස අපට අර්ථ දැක්විය හැකි වේ. ඔවුන් හට පුමිතිරිභාවය නැතහොත් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යන සංකල්පයේදී ලැබෙන තත්ත්වය කුමක් ද? ඔවුන් එම සංකල්පය තුළ ප්‍රතික්ෂේපිත කණ්ඩායමක් ද? ඒ බැව් සාකච්ඡා කිරීමට සමාජ ක්‍රියාකාරීන් මැලි වන්නේ මන්ද? යන ගැටලු මේ වන විට සමාජය තුළ මතු වී ඇත. මේ මාතෘකාව සම්බන්ධයෙන් සමාජ

කතිකාවතක අවශ්‍යතාව කාලීනව පැන නැගීම හේතුවෙන් එම කතිකාවතට අවශ්‍ය පූර්විකාවක් වශයෙන් මෙම ශාස්ත්‍රීය ලිපිය ඉදිරිපත් කෙරේ.

සංක්‍රාන්ති ලිංගිකයන් යන වචනය විවාදාත්මක වන්නේ සංක්‍රාන්තික ලිංගිකයන් ඓතිහාසික වශයෙන් මානසික රෝගීන් ලෙස වර්ගීකරණ කිරීමට භාවිත කළ බැවිනි. ඔවුන්ට එරෙහිව බොහෝ විට වෙනස් කොට සැලකීම, හිරිහැර කිරීම සහ අයුතු ලෙස හැසිරීම වැනි ක්‍රියා යුක්ති සහගත කිරීමක් ඉතිහාසයේ සිටම ක්‍රියාත්මක විය. නමුත් වර්තමානය වන විට මෙම ප්‍රජාව තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙළගැසෙමින් සිටිති. සංක්‍රාන්තික ලිංගිකයන් යන පදය සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව තුළ මෙන්ම ඉන් පිටත ද දැඩි ලෙස විවාදාත්මක ය. කෙනෙකුගේ සංක්‍රාන්ති ලිංගික අත්දැකීම තහවුරු කිරීම සඳහා වෛද්‍ය රෝග විනිශ්චය හෝ ශල්‍යකර්මයක් කිරීම අත්‍යවශ්‍ය සහ වැදගත් යැයි සමහර අයට හැඟේ. අන්‍යයන්ට වෛද්‍ය හෝ මානසික සෞඛ්‍ය මැදිහත් වීමක් අවශ්‍ය බව  නොදැනෙන අතර මැදිහත් වීමක් අවශ්‍ය වන්නේ සංක්‍රාන්ති ලිංගිකයන්ට ආවේණික වෛද්‍ය හෝ මානසික සෞඛ්‍ය ගැටලුවක් ඇතැයි යන සාවද්‍ය උපකල්පනය ස්ථිර කිරීම පමණි. අතීතයේදී ලිංගික සංසර්ගය, සංක්‍රාන්තිවාදය සහ ස්ත්‍රී-පුරුෂ අනන්‍යතා ආබාධ යනු උපතේදී පැවරෙන ලිංගිකත්වයට වඩා වෙනස් ස්ත්‍රී-පුරුෂභාවයක් හෝ පෙනුමක් ඇති අයෙකුට වෛද්‍යමය හා මානසික වශයෙන් වර්ගීකරණය කිරීමට භාවිත කරන ලද ලේබල්කරණයක්ම පමණක් විය. නමුත් වර්තමාන වෛද්‍ය සහ මනෝවිද්‍යාත්මක මාර්ගෝපදේශ මත සංක්‍රාන්ති ලිංගික හෝ සම ලිංගිකත්වය තුළ සිටීම මානසික රෝගයක් හෝ වෛද්‍ය ගැටලුවක් නොවන බව තහවුරු කරගෙන තිබේ. වඩාත් ගැඹුරින් අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ බොහෝ සංක්‍රාන්ති ලිංගිකයන් මුහුණ දෙන මානසික සෞඛ්‍ය ගැටලු සඳහා දායක වන්නේ ස්ත්‍රී-පුරුෂ විවිධත්වය පිළිබඳ ප්‍රවේශය, පිළිගැනීම සහ අවබෝධය නොමැතිකම මත ඇති වන්නා වූ මානසික අස්ථාවරභාවයයි. සංක්‍රාන්ති ලිංගික යන වචනයේ සෘණාත්මක අර්ථයෙන් පුද්ගලයාගෙන් පුද්ගලයාටත් සංස්කෘතියෙන් සංස්කෘතියටත් වෙනස් වේ. සමහර සංස්කෘතීන් එය පිළිගත් නමුදු සාම්ප්‍රදායික මතවාදයන් තුළ එල්බගත් සංස්කෘතීන් මෙම සංකල්පය හා මානසික තත්ත්වය පිළිබඳ කිසිදු තැකීමක් නොකරයි.

සංක්‍රාන්තික ලිංගිකත්වය යන්න යුරෝපීය සමාජයට වඩා ආසියානු සමාජයට පැරණි සංකල්පකි. ඓතිහාසික භාරතීය සංස්කෘතිය තුළ උපතේ දී උරුම වූ ස්ත්‍රී-පුරුෂභාවය වෙනස් කිරීමේ සංකල්පය ඉතා සුලභ වන අතර ජීව විද්‍යාත්මක ලිංගිකත්වය හා සංස්කෘතික ස්ත්‍රී පුරුෂභාවය අතර වෙනසක් සිදු වී නොමැත (Scherer. B, 2006: 68). හින්දු ආගමික දර්ශනය තුළ සශ්‍රීකත්වයේ දේවතාවියද සමග මෙම සංක්‍රාන්තික විශ්වාස බැඳී පවතින අතර ඔවුන් අන් අයගේ යහපත උදෙසා තම සාරවත්භාවය පරිත්‍යාග කරන බව විශ්වාස කෙරේ. ඉන්දීය සමාජය තුළ ද නපුංසක හිජ්‍රාවරු පූජනීය වන අතර අලුත උපන් දරුවන්ට ආශීර්වාද කිරීම හා අලුත විවාහ වූ යුවලවල්වලට ආශීර්වාද කිරීම වැනි පූජනීය කර්තව්‍යයන්වලට දායක වෙති. හින්දු සංස්කෘතිය මුල් බැසගත් ශ්‍රී ලංකාවේ යාපනයේ ද පිරිමියකු ස්ත්‍රියක් වීමද, ස්ත්‍රියක පිරිමියකු වීම ද ආගන්තුක

සංකල්පයක් නොවේ. යාපනයේ හින්දු-දමිළ ජනයාගේ බද්ධ ඇඳුම් ඇඳීමේ සංකල්පය වැනි දෑ තුළින්ද සංක්‍රාන්තිකත්වය යන සංකල්පය ශ්‍රී ලංකාවට නවමු අත්දැකීමක් නොවන බව හෙළි වේ. ශ්‍රී ලාංකික සංස්කෘතියට මූලික ආභාසය ලද බුදු දහම තුළ සංක්‍රාන්තිකයන් ''පණ්ඩක'' යන නාමයෙන් හැඳින්වූ අතර පණ්ඩකයන් වනාහී සුවිශේෂ මනෝ සැකැස්මක් ඇති අය ලෙස බුදු දහමේ සැලකේ. අනුරාධපුරයේ වැඩවාසය කල බුද්ධඝෝෂ හිමි සංක්‍රාන්තිකයන් නැතහොත් පණ්ඩකයන් අර්ථ දක්වන්නේ උස්සානකිලේසා (අපවිත්‍ර වූ ආශාවන්ගෙන් පිරී ඇති), අවුපන්තාපරිලාහා (ආශාවන් නිවා දැමිය නොහැකි), පරිහලවේගාභිභූත (ආධිපත්‍ය දරන්නා වූ), වේසියා (ගණිකා වෘත්තියේ නිරත වන්නා වූ), තුලාකුමාරිකා (රළු තරුණ ගැහැනු ළමයින්) යන ලක්ෂණයන්ගෙන් සමන්විත කණ්ඩායමක් වශයෙනි (Ziwilling. L. 2009). අතීත රජවාසල තුළ ද අන්තඃපුර ආරක්ෂාව උදෙසා පණ්ඩකයන් යොදා ගැනීමේදී වෘත්තිමය සුවිශේෂකරණයක් සංක්‍රාන්තිකයන් කෙරේ තිබූ ආකාරය අපට අනාවරණය වේ. එලෙසම ''නාච්චි'' නමින් විෂම ලිංගික පුරුෂ ඒකාකෘතියක් ඓතිහාසිකව හඳුනාගත හැකිය. ඔවුන් බද්ධ ඇඳුම් අඳිමින් ජීවත් වූ අතර මෙම කණ්ඩායම ද ආසියානු සමාජය තුළ ජීවත් වූ සංක්‍රාන්තිකයන් ලෙස අපට හඳුනාගත හැකි වේ (IPID. 2016). කෙසේ නමුත් මෙරට දේශීය ජන සංස්කෘතිය සංක්‍රාන්තික ලිංගිකත්වය හෝ සම ලිංගිකත්වය නිශේධනාත්මක අපකීර්තියක් ඇති කළ කාරණාවක් නොවූ බව ක්‍රිස්තු වර්ෂ 14 වන ශතවර්ෂයේ රචිත උපාසකජණාලංකාරයේ අපචාර හැසිරීම් ලැයිස්තුවේ සමලිංගිකත්වය අපරාධයක් ලෙස සඳහන් නොවීමෙන් තහවුරු වේ. බොහෝ විට පැවිදි වීම වැනි අවස්ථා, ධර්මානුකූලව අහිමි වූවද මානසික සහනය පතා බොහෝ සංක්‍රාන්තිකයන් හා සම ලිංගිකයන් බෞද්ධ ප්‍රතිපදාවන් කරා පෙළඹීමක් Equal Ground නම් ව්‍යාපෘතියෙන් පෙන්වා දෙයි (Chandimal. D. 2014: 14). එම අදහස්වලට අනුව ශ්‍රී ලාංකික සමාජ සංස්කෘතියට සංක්‍රාන්තිකයන් යනු ආගන්තුක සංකල්පයක් නොවන බව අපට හඳුනාගත හැකි වේ.

1965 දී ආචාර්ය ජෝන් එෆ් ඔලිවන් විසින් ''සංක්‍රාන්ති ලිංගික'', යන වචනයේ ප්‍රථම භාවිතය ඇතුළත් වෛද්‍ය පාඨයක් ප්‍රකාශයට පත් කරන ලදි. ඔහු ප්‍රකාශ කරන පරිදි ''බලහත්කාරී පෙළඹීම කාන්තා ඇඳුම්වලින් ඔබ්බට ගොස් ලිංගිකත්වය මත පදනම් වූ ස්ත්‍රී-පුරුෂභාවය වෙනසක් කිරීම සඳහා වූ පෙළඹවීමක් බවට පත් වූ විට, සම්ප්‍රේෂණවාදය ලිංගික සංක්‍රාන්තිය බවට පත් වේ. නමුදු මෙම පදය නොමඟ යවන සුළු ප්‍රාථමික සංක්‍රාන්තිවාදයේ ලිංගිකත්වය ප්‍රධාන සාධකයක් නොවන හෙයින් ඇත්ත වශයෙන්ම ''සංක්‍රාන්ති ලිංගිකත්වය'' යන්නෙන් අදහස් කෙරෙන්නේ සමාජභාවීය වටපිටාවක් වේ. එම අදහස තුළ ගැබ්වී ඇත්තේ සංක්‍රාන්තිකත්වය වනාහි ස්ත්‍රී-පුරුෂභාවය වෙනස් වීම අභෞතික සංස්කෘතිය ස්ඵර්ශ කිරීම දක්වා දුරදිග යෑමක් ලෙසයි. සංක්‍රාන්ති ලිංගික යන වචනයේ අනෙක් මූලාරම්භය නම් 1970 දශකයේ දී සිදු වූ අතර මේ සඳහා පුරෝගාමී වෙමින් ශාස්ත්‍රීය ප්‍රවේශයක් ගනු ලැබුවේ, ජනප්‍රිය සමාජ ක්‍රියාකාරිනියක් හා සංක්‍රාන්තික

පුරෝගාමීයකු වන වර්ජිනියා ප්‍රින්ස් විසිනි. 1969 දී ප්‍රින්ස් මුලින්ම සංක්‍රාන්ති ලිංගික යන යෙදුම භාවිත කළේ සංක්‍රාන්ති ලිංගිකයන් සංක්‍රමණය සඳහා ශල්‍යකර්මය භාවිත කළ අයගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා ය. වර්ජිනියා ප්‍රින්ස් 1969දී ප්‍රථම වරට “ට්‍රාන්ස්ජෙන්ඩර්” යන යෙදුම භාවිත කළ එම වර්ෂයම ස්ටෝන්වෝල් කැරැලිකරුවන් විසින් නූතන සමලිංගික අයිතිවාසිකම් ව්‍යාපාරය ආරම්භ කළ වර්ෂය ද විය. වසර කිහිපයකට පසු, 1974 දී, සමාජ සේවකයන්, වෛද්‍ය වෘත්තිකයන් සහ ක්‍රියාකාරීන් විසින් ලීඩ්ස් විශ්ව විද්‍යාලයේ දී ප්‍රථම වරට ට්‍රාන්ස්වෙස්ටයිට් සහ ට්‍රාන්ස් ලිංගික සම්බන්ධතා පිළිබඳ අධ්‍යයන පවත්වන ලදී. මෙම අධ්‍යයන සාහිත්‍යය, සංක්‍රාන්ති සෞඛ්‍ය පිළිබඳ ලබා ගත හැකි මුල්ම සම්මන්ත්‍රණ සාහිත්‍යයන්ගෙන් ලබාගත් අතර මෙහිදී ට්‍රාන්ස්වෙස්ටයිට්ස් (විරුද්ධ ලිංගයේ අය ලෙස සැරසී සිටි අය), ලිංගික සංක්‍රාන්ති ලිංගිකයන් (ශල්‍යකර්මය තුළින් ස්ත්‍රී-පුරුෂ භාවය වෙනස් කළ පුද්ගලයන්) සහ සංක්‍රාන්ති වූ නමුත් තෝරා නොගත් සංක්‍රාන්ති ලිංගිකයන් අතර පැහැදිලි වෙනස්කම් ඇති බව අනාවරණය කළේය. වර්ෂ 1975 සංක්‍රාන්තික ලිංගිකයන් උදෙසා තවත් වැදගත් සන්ධිස්ථානයක් විය. එම වසරේදී පළමු වරට සංක්‍රාන්ති ලිංගිකයන් සඳහා වූ ආරක්ෂක සිවිල් අයිතිවාසිකම් නීතියට ඇතුළත් කෙරිණි. කෙනෙකුගේ ජීව විද්‍යාත්මක පුරුෂභාවය හෝ කෙනෙකුගේ ජීව විද්‍යාත්මක ස්ත්‍රී-පුරුෂභාවය හා සම්බන්ධ නොවන ස්වයං ප්‍රතිරූපයක් තිබීම හෝ ප්‍රක්ෂේපණය කිරීම, යන පදනම මත වෙනස්කම් කිරීම වළක්වාලීම වැළැක්වීමේ අණ පනතක් සම්මත කර ගැනීමෙන් ප්‍රථමයෙන් එය සිදු කළේ අමෙරිකාවේ මිනියාපොලිස් (Minneapolis) නගරය යි (Rose. A. 2018). 1975 දී ලොස් ඇන්ජලීස් හි කැලිෆෝනියාවේ විශ්වවිද්‍යාලයේ මනෝචිකිත්සක රොබර්ට් ස්ටොලර් ලිංගික හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ඔහුගේ පෙළ පොතේ අමුතු දෙයක් ලිවීය. ඔහු කියා සිටියේ උපදින විට පිරිමි ළමුන් යැයි උපකල්පනය කළ නමුත් ස්ත්‍රී-පුරුෂභාවයේ අනන්‍යතාව හෝ ප්‍රකාශනය එම උපකල්පනයට නොගැළපෙන අය බොහෝ විට ලස්සන මුහුණු ඇති, සිහින් හිසකෙස්, ලස්සන සම, ලස්සන චලනයන් සහ විශේෂයෙන් විශාල ඇස් ඇති හුරුබුහුටිකම නිසා බොහෝ පිරිමින් සංක්‍රාන්ති ලිංගිකයන් බවට පත්වන බවත්, ඒ සඳහා අවශ්‍ය න්‍යායයික ආකෘතියක් ද රොබර්ට් විසින්ම යෝජනා කරනු ලැබීය. සමාජය ඔවුන්ට ගැහැනු ළමයින්ට වඩා සලකන බවත්, ඔහු තර්ක කළ අතර මෙම අත්දැකීම නිසා ඔවුන් ගැහැනුන් ලෙස හඳුනා ගැනීමට පටන් ගන්නා බව රොබර්ට් ප්‍රකාශ කළේය. ස්ටෝලර්ගේ නිරීක්ෂණයන් මිනිසුන් සංක්‍රාන්ති ලිංගිකයන් බවට පත් කිරීම පිටුපස ඇති බොහෝ මනෝවිද්‍යාත්මක න්‍යායයන් සඳහා පෙළඹවීමක් ඇති කළේය. 1993දී ටොරොන්ටෝවේ ක්ලාක් මනෝචිකිත්සක ආයතනයේ පර්යේෂකයන් කණ්ඩායමක් රොබර්ට්ගේ උපකල්පනය පරීක්ෂා කිරීමට පටන් ගත් අතර අලංකාරය සහ, ස්ත්‍රී-පුරුෂ අනන්‍යතා ආබාධය, යනුවෙන් හැඳින්වූ දේ එකිනෙකට සම්බන්ධ වී තිබෙන බව අනාවරණය කර ගත් හ. ඔවුහු රෝග විනිශ්චය සහිතව උපන් පිරිමි ළමයින් 17 දෙනෙකු සහ එය නොමැතිව උපන් පිරිමි ළමයින් 17 දෙනෙකු බඳවා ගත්හ. වයස අවුරුදු අටක් පමණ. පර්යේෂකයන් පසුව ළමයින්ගේ හිස් පටි ගෙන විද්‍යාලයේ සිසුන් 36 දෙනෙකුට පෙන්වීය. “ආකර්ෂණීය, කඩවසම්

සහ ලස්සන" යන කාණ්ඩයන්ගෙන් යුත් තරුණයන්ගේ ශාරීරික පෙනුම එක සිට පහ දක්වා පරිමාණයෙන් ඇගයීමට සිසුන්ට උපදෙස් දෙන ලදි. අවසානයේදී, විද්‍යාලයේ සිසුන්ට "ලිංගික අනන්‍යතා ආබාධ" සහිත දරුවන් සිස්ජෙන්ඩර් පිරිමි ළමයින්ට වඩා "ලස්සන" බව සොයා ගත්හ. සොයාගැනීම්වලින් පෙනෙන්නේ ස්ටොලර් නිවැරදි යඃ සමහර විට, ඔවුන්ගේ පෙනුම නිසා මිනිසුන් හිටපු කණ්ඩායමේ තරුණයන්ට ගැහැනු ළමයින්ට මෙන් සැලකූ අතර, එම නිසා ඔවුන් සංක්‍රාන්ති ලිංගිකයන් බවට පත් විය. කතුවරුන් පසුව පුවත්පතේ සඳහන් කළ පරිදිම, සමාන පිළිගත හැකි සිද්ධාන්තයක් නම්, මෙම දරුවන්ට ඔවුන්ගේ අනන්‍යතාවට ගැළපෙන ආකාරයෙන් පෙනුම (දිගු කෙස් සහ වෙනත්) වෙනස් කළ හැකි බවයි (Turban . J. 2020).

සමාජය තුළ එකිනෙකා හා ගැටෙමෙන් ජීවත් වන සමාජ ජීවීන් වශයෙන් සංක්‍රාන්ති පුද්ගලයන් මුහුණ දෙන අභියෝග මොනවාද? යන්න සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතුව ඇත. ජනප්‍රිය සංස්කෘතිය තුළ මෙන්ම එදිනෙදා ජීවිතයේදී සංක්‍රාන්ති පුද්ගලයන් වැඩි වැඩියෙන් දැකිය හැකි නමුත් අප සමාජය තවමත් ඔවුන් කෙරේ දැඩි වෙනස්කම් කිරීම්, අපකීර්තිය සහ පද්ධතිමය අසමානතාවයනට ලක් කර වින්දිතභාවයට පත් කරයි. එහිදි ඇමරිකානු සංක්‍රාන්තික සමාජය දෙස අවධානය යොමු කරමින් සංක්‍රාන්ති ප්‍රජාව මුහුණ දෙන විශේෂිත ගැටලු කිහිපයක් හඳුනා ගැනීමට LGBTQ ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටින HRC (The Human Rights Champaing) සංවිධානය සමත් වී තිබේ එම ගැටලු අපට පහත පරිදි හඳුනාගත හැකි වේ.

**නීතිමය ආරක්ෂාවක් නොමැතිකම**

සංක්‍රාන්තික ලිංගික අනන්‍යතාව මත පදනම්ව වෙනස් කොට සැලකීමෙන් ඔවුන්ව ආරක්ෂා නොකරන නීති පද්ධතියකට සංක්‍රාන්තික පුද්ගලයන් මුහුණ දී සිටී. අමෙරිකාව තුළ වුවද රැකියා ස්ථානයේ වෙනස්කම්වලින් සංක්‍රාන්ති පුද්ගලයන් නීත්‍යානුකූලව ආරක්ෂා කර ඇති බව පැහැදිලි කරන මෑතකාලීන එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් තිබියදීත්, ස්ත්‍රී-පුරුෂ අනන්‍යතාව ඇතුළත් පුළුල් ෆෙඩරල් වෙනස්කම් කිරීම් නොවන නීතියක් තවමත් නොමැත. එයින් අදහස් කරන්නේ සංක්‍රාන්තිකයන් වෙනස්කම්වලට මුහුණ දෙනවා නම් සංක්‍රාන්ති පුද්ගලයන්ට තවමත් පිහිටක් නොමැති විය හැකි බවයි. ඔවුන් සාමාන්‍ය සමාජයෙහි හැසිරෙන විටද ඒ සමාජය තුළ පවත්නා සමාජ, ආගමික, සංස්කෘතික විශ්වාසයන් ඔවුන්ව නිරන්තරයෙන් වින්දිතභාවයට පත් කර ආකාරයක් HRC ආයතනය පෙන්වා දේ. මේ දියුණු යැයි සම්මත අමෙරිකාවේ තත්ත්වය යි. එම තත්ත්වයට අනුරූපව ශ්‍රී ලංකාවෙ තත්ත්වය සලකා බැලීමේදී නීතියේ අංශුමාත්‍ර අවධානයක්වත් මේ ප්‍රජාව කෙරේ යොමු නොවීම ඛේදජනක කාරණාවකි. මානව හිමිකම් ආවේක්ෂණය මගින් ශ්‍රී ලංකාවට ප්‍රකාශ කළේ මෙරට නීති පද්ධතිය මගින් තුන්වන ලිංගිකත්වයට ආරක්ෂාවක් නොමැති බවයි. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 හා 365 (අ) යන වගන්තිවලින් මෙන්ම අයාල ආඥාපනත යටතේ ද සංක්‍රාන්තික ලිංගිකයන් වරදකරුවන් ලෙස නිරපරාදේ විග්‍රහ වන බව ප්‍රකාශ කරන

මානව හිමිකම් ආවේක්ෂණය යෝජනා කරන්නේ එම නීති තුන මෙරට අහෝසි කර සංක්‍රාන්තිකයන්ට සමාජභාවීයමය වශයෙන් තෙවන ලිංගිකත්වයේ අයිතිය තහවුරු කර දෙන ලෙසයි. නමුත් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ අවධානය යොමු නොවී තිබීම මෙරටෙහි සංක්‍රාන්තික අයිතීන් පිළිබඳ දක්වන උදාසීනභාවය ඔප්පු කරන්නක් වේ.

**දූප්පත්කම**

අමෙරිකාව තුළ සංක්‍රාන්ති ජනතාව ඉහළ අනුපාතයකින් දරිද්‍රතාවයේ ජීවත් වන අතර වර්ණභේදයට ලක් වූ සංක්‍රාන්ති පුද්ගලයන් සඳහා මෙම අනුපාතය ඊටත් වඩා වැඩිය. HRC සංවිධානය අමෙරිකාව අධ්‍යයනය ක්ෂේත්‍රය කරගනිමින් කරන ලද අධ්‍යයනයකදී අනාවරණය වූයේ සමස්ත අමෙරිකානු සංක්‍රාන්තිකයන්ගෙන් 29% ක් පමණක් පමණ සුදු ජාතික සංක්‍රාන්තික වැඩිහිටියන් ප්‍රමාණයක් ද, 39% ක් කළු ජාතික සංක්‍රාන්තික වැඩිහිටියන් ප්‍රමාණයක්ද, 48% ක් ලතින් සංක්‍රාන්තික වැඩිහිටියන් ප්‍රමාණයක් හා 35% ක් ඇලස්කානු ස්වදේශීය, ආසියානු, ස්වදේශීය අමෙරිකානුවන් අතර, දේශීය හවායි හෝ පැසිෆික් දූපත්වාසී සංක්‍රාන්තික වැඩිහිටියන් ප්‍රමාණයක් දරිද්‍රතාවයේ පෙළෙන බවයි.අමෙරිකාවේ සංක්‍රාන්තික දරිද්‍රතාවය හා ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික ආර්ථිකය ගැන අවධානය යොමු කිරීමේදී මෙරට ඒ සම්බන්ධයෙන් විධිමත් අවධානයක් යොමු වී නැති බව හඳුනාගත හැකි වේ. මෙරට ධනවත් පවුල් පසුබිමක උපත ලැබූ සංක්‍රාන්තිකයන්ට ආර්ථික ගැටලු නොපැවතුනත් නිර්ධන පාන්තික පසුබිමක සංක්‍රාන්තිකයන් බොහෝ විට පවුල තුළිනුත් ප්‍රතික්ෂේප වීම නිසා විවිධ අපගාමී වෘත්තීන් කරාද පෙළඹෙන අවස්ථා ඇත. ගණිකා වෘත්තිය මත්ද්‍රව්‍ය ජාවාරම් වැනි අපගාමී චර්යාවල නිරත වෙන්නන් අතර රූපලාවන්‍යාගාර පවත්වාගෙන යෑම, නර්තන කටයුතුවල නිරත වීම වැනි පිළිගත් වෘත්තීන්වල නිරත වීම මත බොහෝමයක් ශ්‍රී ලාංකික සංක්‍රාන්තිකයන් තම ආර්ථික පසුබිම ගොඩ නගා ගනී (Nizam A. 2018).

**අපකීර්තිය, හිංසනය සහ වෙනස් කොට සැලකීම**

HRC සංවිධානය ප්‍රකාශ කරන පරිදි දශක භාගයකට පමණ පෙර, එක්සත් ජනපදයේ සංක්‍රාන්ති අයිතිවාසිකම් සඳහා සහයෝගය දුන්නේ සමස්ත ජනගහනයෙන් හතරෙන් එකක් පමණක් වන අතර මේ වන විට එම සහය 62% දක්වා වර්ධනය වී ඇත. 2019 වසර වන විට මෙම ප්‍රගතිය නොතකා, ශතවර්ෂයකටත් වැඩි කාලයක් මානසික රෝගීන්, සමාජීය වශයෙන් අපගමනය වූ අය සහ ලිංගික කොල්ලකාරීන් ලෙස සංලක්ෂිත වීම හේතුවෙන් සංක්‍රාන්තික ප්‍රජාව තවමත් සැලකිය යුතු අපකීර්තියකට මුහුණ දී සිටියි. පිරිමි සමලිංගිකයන් හා කාන්තා සමලිංගිකයන් සඳහා මෑත වසරවල දී මෙම නොඉවසනසුලු අදහස් මැකී ගොස් ඇති අතර, සංක්‍රාන්තික මිනිසුන් තවමත් නොසලකා හරිමින් සමාජයක් මඟින් සමච්චලයට ලක් කරමින් සිටියි. මෙම අපකීර්තිය එල්ල වීම විවිධාකාර සන්දර්භයන් තුළ ක්‍රියාත්මක වේ. දේශපාලනික අවධානය ලබා ගැනීම සඳහා සංක්‍රාන්ති විරෝධී අපකීර්තිය උපයෝගී කර ගන්නා දේශපාලඥයන් මෙන්ම

සංක්‍රාන්තිකබව අනාවරණය කර ගත් පසු එම පවුලට ඔවුන්ගේ මිතුරන්ට සඟයන්ට හිරිහැර හා බරපතල හිංසා කරන පුද්ගලයන් මෙම කණ්ඩායම් අතර ප්‍රබලව කැපී පෙනේ. අමෙරිකාව තුළ කාන්තාවන්ගෙන් 30% ක් පමණ සංක්‍රාන්තිකයන් සමඟ නිවෙස්වල නවාතැන් ගැනීමට කැමැත්තෙන් සිටී. සංක්‍රාන්තික නීතිය මෑත කාලීන නෛතික ප්‍රගතිය සාර්ථක කර ඇත නමුත්, එච්ආර්සී පදනමේ පර්යේෂණයන්ගෙන් හෙළි වී ඇත්තේ සංක්‍රාන්තික සුදු වැඩිහිටියන්ගෙන් 49% ක් සහවර්ණවල වැඩිහිටියන්ගෙන් 55% ක් කියා සිටියේ ඡන්ද විමසීම්වල දී වෙනස්කම්වලට බිය වීම හෝ භීතිය හේතුවෙන් තම ජීවිතයේ එක් මැතිවරණයකදීවත් ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ බවය. ආසියානු සමාජයට සංක්‍රාන්තිකත්වය නව සංකල්පයක් නොවූවත් මෙරට තුළ රැකියා අවශ්‍යතා හා අධ්‍යාපනය තුළ සංක්‍රාන්තිකයන් යම් කිසි ආකාරයක වෙනස්කොට සැලකීමකට ලක් වී ඇත. මෙරට රාජ්‍ය හා පෞද්ගලික සේවය තුළ ද තෙවන ලිංගිකත්වය සඳහා අවස්ථාව ඇහිරී තිබීම ද අපට වෙනස් කොට සැලකීමක් ලෙස හඳුනාගත හැකි වේ. ලංකාවේ වෙනස් කොට සැලකීම නිසාම සංක්‍රාන්තික ලිංගිකයන් හා සම ලිංගිකයන්ගෙන් 51% ක්ම නිවෙස්වලින් බැහැර වූ අය වේ. ඉන්දියාව තුළ මෙම තත්ත්වය තව දුරටත් කොන් කිරීමක් හෝ වෙනස්කොට සැලකීමක් ලෙස නොපවත්වා ගැනීම උදෙසා 2016 වසරේ දී සංක්‍රාන්තික ලිංගිකයන් උදෙසාම සහජ් ජාත්‍යන්තර පාසල ඉදි කළේය. මීට ප්‍රබල සංක්‍රාන්තික ක්‍රියාකාරිනියක් වන කල්කි සුබ්‍රමනියම් වැනි අය ඉදිරිපත් වීය. එම අධ්‍යාපන ක්‍රමවේදය තුළ ජීවන කුසලතා හා පෞරුෂ සංවර්ධනයට වැඩි ඉඩක් ලබා දීමට ද උත්සාහ ගෙන ඇත (Fonseka.P,2017).

**සංක්‍රාන්ති පුද්ගලයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය**

සාමාන්‍ය පුද්ගලයන්ට වඩා වැඩි ප්‍රමාණයකින් සංක්‍රාන්ති පුද්ගලයෝ හිංසනය අත්විඳිති. HRC සංවිධානයට අනුව සංක්‍රාන්ති පුද්ගලයන්ගෙන් බහුතරයක් 54% කට වැඩි ප්‍රමාණයක් යම් ආකාරයක සමීප හවුල්කාර හිංසනයකට මුහුණ දී ඇති අතර, 47% ක් තම ජීවිත කාලය තුළ ලිංගික හිංසනයට ලක් වී ඇති අතර 2014 සහ 2015 අතර කාලය තුළ දස දෙනෙකුගෙන් එක් අයෙකුට ශාරීරික හිංසනයට ලක් වී ඇත. මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා මාරක විය හැකිය. 2020 වසරේදී අවම වශයෙන් සංක්‍රාන්ති ලිංගිකයින් 27 දෙනෙකු හෝ සංක්‍රාන්ති ලිංගික නොවන පුද්ගලයින් 27 දෙනෙකු ලිංගිකත්වයට මත ඇති වන ප්‍රචණ්ඩත්වය නිසා ඝාතනය වී ඇති අතර, 2019 දී ද ඒ සමාන සංඛ්‍යාවක් ඝාතනය වී ඇත. ශ්‍රී ලංකාවේ LGBTQ සමාජජාල තුළ දී සමාජ විද්‍යාඥයන්ගේ සංගමය විසින් සිදුකළ අධ්‍යයනයක දී අනාවරණ වූයේ ඔවුන්ගෙන් 89% ක් පමණ පිරිස ප්‍රචණ්ඩත්වයට හා හිංසනයට මුහුණපා ඇති බවත්, ඉන් 87% ක්ම පාසල තුළ දී හෝ කුලී නිවාස තුළ දී වෙනස්කම්වලට භාජනය වී ඇති බව අනාවරණය විය. සාමාන්‍ය පුද්ගලයන් වෙසෙන සාමාන්‍ය සමාජය තුළ සාමාන්‍ය පරිදි ජීවත් වීම සංක්‍රාන්තිකයන්ට ගැටලුවක් වී ඇත (wfd. org. 2021). කණ්ඩායම් වශයෙන් වාසය කිරීමට තුළ ඇති වන වෙනම උප සංස්කෘතියක පිහිටක් බලාපොරොත්තු වීම මේ නිසා

නිසඟයෙන්ම සිදු වේ. නිරන්තර ඇති වන සමාජ අසාධාරණය නිසාම ඇති වන අනෝමීයත්වය මත සංක්‍රාන්තික කණ්ඩායම් අපගාමී වීම ද වැළැක්විය නොහැකි කරුණක් බව අපට අපරාධ විද්‍යා දෘෂ්ටිකෝණයෙන් බලන කල අවබෝධ කර ගත හැකි වේ.

**සෞඛ්‍ය ආරක්ෂක ආවරණය නොමැතිකම**

මානව හිමිකම් කොමිෂන් සභාවේ පදනම් විශ්ලේෂණයකින් හෙළි වූයේ සංක්‍රාන්ති පුද්ගලයන්ගෙන් 22% ත් 32% අතර ප්‍රමාණයකට සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් නොමැති බවයි. සංක්‍රාන්ති වැඩිහිටියන්ගෙන් හතරෙන් එකකට (29%) කට වැඩි ප්‍රමාණයක් වෛද්‍යවරුන් හෝ සැපයුම්කරුවන් විසින් ඔවුන්ගේ ලිංගික අනන්‍යතාව හේතුවෙන් සෞඛ්‍ය සේවා ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. සංක්‍රාන්ති ප්‍රජාවේ අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වන සෞඛ්‍ය සේවා පද්ධතියක් මෙම සංවේදී දත්තවලින් හෙළි වේ. ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සෞඛ්‍ය පහසුකම් නොමිලේ සිදු වූවද, සෞඛ්‍ය සේවකයන්ගේ වෙනස්කොට සැලකීම්වලට ඔවුන් භාජනය වන අතර ආකල්පමය වශයෙන් සෞඛ්‍ය සේවකයන්ගෙ ඇති දුර්වලතා මත සංක්‍රාන්තිකයන් කොන් කිරීමටකට ලක් වීමක් සිදු වේ.

**අනන්‍යතාව ප්‍රකාශ කිරීම හා හැඳුනුම්පත් ගැටලු**

අමෙරිකාව තුළ ද හදිසි නිවාස හෝ වෙනත් පොදු සේවාවන් සඳහා ප්‍රවේශය ඇතුළුව සංක්‍රාන්ති පුද්ගලයන් අතර නිවැරදි හැඳුනුම්පත් නොමැතිකම ඔවුන්ගේ ජීවිතයේ සෑම අංශයකටම බලපෑම් කළ හැකිය. හඳුනා ගැනීමකින් තොරව කෙනෙකුට සංචාරය කිරීමට, පාසලකට ලියාපදිංචි වීමට හෝ සමාජයේ ක්‍රියාත්මක වීමට අත්‍යවශ්‍ය සේවාවන් ගණනාවකට ප්‍රවේශ වීමට නොහැකිය. බොහෝ ප්‍රාන්තවල සංක්‍රාන්ති පුද්ගලයන්ට තම ස්ත්‍රී-පුරුෂභාවයේ අනන්‍යතාවට ගැළපෙන පරිදි හැඳුනුම්පත් යාවත්කාලීන කිරීමට ඉඩ නොදේ. අනෙක් අයට වෛද්‍ය විද්‍යාත්මක වශයෙන් ලිංග මාරුව පිළිබඳ සාක්ෂි අවශ්‍යය. එය මිල අධික විය හැකි අතර එය සියලුම සංක්‍රාන්ති මිනිසුන්ට අවශ්‍ය දෙයක් නොවේ. මෙම නව හැඳුනුම්පත් සැකසීම සඳහා වන ගාස්තු ද සමහර විට ඒවා සංක්‍රාන්තික ප්‍රජාවේ සමහර අයට දරා ගත නොහැකි විය හැකිය. යුරෝපීය සමාජය තුළ මේවන විට මෙවන් අනන්‍යතා ක්‍රමවේදයක් හෝ ක්‍රියාත්මක වීමක් දක්නට ලැබුන ද අප රට තුළ තවමත් එවන් ප්‍රවේශයකට යොමු නොවීම කණගාටුවට කාරණාවක් වේ.

HRC සංවිධානය හඳුනාගත් සංක්‍රාන්තික ලිංගිකයන් සමාජය තුළ ජීවත් වීමේදී ඇති වන්නා වූ ගැටලු ශ්‍රී ලාංකේය සමාජයට ද ආදේශ කර අධ්‍යයනය කිරීමේදී යම් කිසි ආකාරයක සමානාත්මතාවක් දැකගත හැකි වේ. නමුත් මෙම බටහිර සමාජයට වඩා තරමක් පහ මට්ටමක සංක්‍රාන්තික එළැඹුමක් මෙරට තුළ පිළිගන්නා බවද අමතක කළ යුතු නොහේ. බටහිර සමාජයට වඩා ඓතිහාසිකව සංක්‍රාන්තිකයන් සම්බන්ධයෙන් සාධක හා පිළිගැනීම් මෙරට සමාජය තුළ පැවතුන ද වර්ථමානයේ දී ඔවුන් වෙනුවෙන් පෙනී සිටීම උදෙසා තරමක පසුගාමීත්වයක් දක්වන ආකාරයක් අපට හඳුනාගත හැකි වේ. ශ්‍රී ලංකාවේ සමාජ විද්‍යාඥන්ගේ

සංගමය මධ්‍යම කොළඹ නගරය මූලික කරගෙන කරන ලද අධ්‍යයනයක දී සාමාන්‍ය ජනතාව LGBTQ ප්‍රජාව පිළිබඳ තිබූ අවබෝධය අනාවරණය කර ගත්තේය. එහිදී 27% ක් පමණ දෙනා සංක්‍රාන්තික ලිංගිකත්වය පිළිබඳ අවබෝධයෙන් සිටි අතර 24% පමණ ප්‍රමාණයක් සම ලිංගිකත්වය හා සංක්‍රාන්තික ලිංගිකත්වය යන දෙකම පිළිබද අවබෝධයකින් පසු වී තිබේ. එම කණ්ඩායමෙන් 60% ක් කියා සිටියෙ මෙම සංක්‍රාන්ති හෝ සම ලිංගික කණ්ඩායම් සමග සමාජ වාසය ඔවුන්ට ගැටලුවක් නොවන බවය (wfd. org. 2021). ජනතාවක් වශයෙන් හෝ සංස්කෘතියක් වශයෙන් සංක්‍රාන්තික ලිංගිකත්වය ශ්‍රී ලාංකිකයන්ට ගැටලුවක් නොවූවත්, එයට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සඳහා දේශපාලනය අවධානයක් යොමු නොවීම කණගාටුවට කරුණකි.

මේ වන විට ශ්‍රී ලංකාව තුළ ද සංක්‍රාන්තික ක්‍රියාකාරීන් විසින් තම අයිතිවාසිකම් දිනා ගැනීම උදෙසා වූ නිර්දේශ හා යෝජනා ඉදිරිපත් කරමින් පවති. එහිදී ඉහත සඳහන් කළ දණ්ඩනීති සංග්‍රහයේ 365 හා 365 (අ) වගන්තින් අහෝසි කිරීමද, අයාල ආඥා පනත සංශෝධනය කිරීම ද මෙන්ම ස්ත්‍රී-පුරුෂ අනන්‍යතාව හා ලිංගික දිශානතිය මත බැදුණු වෙනස්කම් අහෝසි කර එලෙස වෙනස්කම් කිරීම නීති විරෝධී කිරීම  නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනස්කම් සිදු කරමින් වාර්ගික, ආගමික, භාෂා, කුල, ලිංගික, දේශපාලන මතයන්, උපන් ස්ථානය හා ආරක්ෂිත වෙනත් ලක්ෂණ සමග ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හා ලිංගික දිශානතිය පැහැදිලිව ඇතුළත් කිරීම මෙන්ම වෛද්‍ය පටිපාටිවලින් හෝ බලහත්කාරයෙන් තොර ස්වයං ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලියක් තුළින් සියළුම ලියකියවිලි සිය ස්ත්‍රී-පුරුෂභාවය වෙනස් කිරීමට හා ස්ත්‍රී-පුරුෂභාවය හඳුනාගැනීමට ක්‍රියා පටිපාටියක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම, සියලුම වෛද්‍යවරුන්, හෙදියන් හා අනෙකුත් සෞඛ්‍ය සේවකයන් සඳහා පුහුණුවේ දී එල්ජීබීටීඅයි ප්‍රජාවට බලපාන වෙනස්කම් නොකිරීම හා සංක්‍රාන්තික සෞඛ්‍ය ගැටලු පිළිබඳ වෙනම ඒකකයක් ඇතුළත් කිරීම, ස්වකීය උප්පැන්න සහතික හා හැඳුනුම්පත් හි ස්ත්‍රී-පුරුෂභාවය සංශෝධනය කිරීමට ඉඩ ප්‍රස්තාව ලබා දීම වැනි යෝජනා ඉදිරිපත් වී තිබේ. මෙම යෝජනා මගින් ස්ත්‍රීන් මෙන්ම පුරුෂයන්ට සමානව සමාජ අයිතිවාසිකම් දිනා ගැනීමට මඟ පැදෙන අතර මෙම කර්තව්‍යය සඳහා ජාතික සංක්‍රාන්ති ලිංගික ජාල භාරය වැනි සංවිධාන මෙරට තුළ ප්‍රබලව ක්‍රියාකාරීව පවතී.

**සමාලෝචනය**

අවසාන වශයෙන් සඳහන් කළ හැක්කේ ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට සමානව සමාජය තුළ මනුෂ්‍යත් වය පදනම් කරගනිමින් අයිතිවාසිකම් දිනාගැනීමේ අයිතියක් සංක්‍රාන්තිකයන් සතුව ද පවතින අතර ඔවුන් සමාජය තුළ ප්‍රතික්ෂේපිත තත්ත්වයකට පත් වීමට හේතුව ඔවුන්ගේ වරදක් නොව පවතින සමාජ දැනුම් පද්ධතියේ හීනභාවයක් බව වටහා ගත යුතුය. නූතන ලෝකය දියුණුවේ හිනිපෙත්තට යමින් සිටින මිනිසා තවමත් තම සමාජයේ ජීවත් වන මනුෂ්‍ය කණ්ඩායමක් වෙනස්කොට සළකයි නම් ප්‍රතික්ෂේප කරයි නම් මෙතුවක් කාලයකට මිනිසා ලබා ඇති දියුණුව කුමක්ද? ඔවුන් අත්පත් කරගෙන ඇති මානව

ධර්මතා මොනවාද? යන්න පිළිබඳ ගැටලුවක් පැන නගී. මිනිසා සභ්‍යත්වයේ අරමුණු සාක්ෂාත්කර ගනිමින් යන ගමනේ තම ජයග්‍රහණ නිර්ණය කළ හැකි වන්නේ තමා හා එකට සමාජයේ ජීවත් වන සමාජ ජීවීන්ගේ අයිතීන් පිළිගැනීමට හා සැමට එක ලෙස ජීවත් වීමට හැකි පරිසරයක් බිහිවීම මතයි. එනිසාවෙන් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත අයිතිවාසිකම් දිනා ගැනීමේදී සංක්‍රාන්තික ප්‍රජාව අමතක කරමින් තම සටන ගෙන යන්නේ නම් එවන් අරගලයක ඵලය පිළිබඳ ගැටලුවක් පැන නගිනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Aisha Nazim. (2018, 6 26). Fitting In As A Transwomen In Sri Lanka. Retrieved from Roarmedia: https://roar.media/english/life/in-the-know/fitting-in-as-a-transwomen-in-sri-lanka

Angelica Rose. (2018, 9 7). What Does the Word Transgender Mean? Retrieved from Them.us:https://www.them.us/story/inqueery-transegender

Bhanthe Dhammika . (2018, 11 28). What about the Pandaka? Retrieved from http://www.bhanthedhammika.net

Burkhard Scherer. (2006). Gender Transformed and Meta-Gendered Enlightenment:Reading Buddhist Narratives as Paradigms of Inclusiveneess. Revista de Estudos da Religiao, 65-76.

Damith Chandimal (Editor: Rosanna F.C). (2014). Analyzing the Culture of Transphobia : The Situational Assessment on Stigma,Discrimination and Violence Faced Transgender Persons in Sri Lanka. Equal ground.

HRC. (2021). Understanding the Transgender Community. Retrieved from The Humen Rights Campaign: https://www.hrc.org/resources/understanding-the-transgender-community

Institute for Participatory Interaction in Development. (2016). Rapid Situation Assessment of Transgender Persons in Sri Lanka : Final Draft. Dehiwala: IPID.

Jack Turban. (2020, 10 23). The Disturbing History of Research into Transgender Identity. Retrieved from Scientific American: https://www.scientificamerican.com/artical/the-disturbing-history-of-research-into-transgender-identity/?amp=true

Leonard Ziwilling. (2009, 04 28). American Bhuddihst Journal: Homosexyality and Buddihism "Pandaka". Retrieved from Wisdom Quarterly: http://wisdomquarterly.blogspot.com

Piyumi Fonseka. (2017, 01 9). Chalenging Fate of Transgenders. Retrieved from Daily Mirror: https://www.dailymirror.lk/artical/Chalenging-fate-of-Transgenders-121863.html

The Nation. (2018, 12 01). Homophobic Law has No Basis in Buddism. Retrieved from The Nation: http://www.nationmultimedia.com/opinion/ Homophobic-Law -has-No-Basis-in-Buddism

WFD. (2021, 6 28). Sri Lankans Percepations of LGBT Persons. Retrieved from Foreign Commonwealth and Development Office: https://www.wfd.org /2021/06/28/Sri-Lankans-Percepations-of-LGBT-Persons/#_ftnref2

# පොදු ප්‍රවාහනයේ දී සිදුවන කාන්තා ලිංගික හිංසනය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය

**චමත් සඳරූ ගුණරත්න**

ලොව පුරා එදිනෙදා ජීවිතය තුළ තම කටයුතු සඳහා ගමනාගමන පහසුව සඳහා බොහෝ දෙනා විසින් රථවාහන භාවිත කරනු ලැබේ. එහිදී තම පෞද්ගලික රථවාහන මෙන් ම පොදු ප්‍රවාහන සේවය තුළින් ද තම ගමනාගමන පහසුව සලසා ගැනීමට මිනිසා අද වන විට හුරුවී ඇත. මෙම ගමනාගමන මාධ්‍ය තුළින් වර්තමානයේ දී ලෝකයේ වැඩි පිරිසක් යොදාගනු ලබන්නේ පොදු ප්‍රවාහන සේවයයි. එයට හේතුව සංවර්ධිත රටවල දී ජනගහනය වැඩිවීම හේතුකොට ගෙන රථවාහනවල ඇති දැඩි තදබදය වැළැක්වීම සඳහා සුබෝපභෝගීත්වයෙන් යුතු පොදු ප්‍රවාහන සේවාවන් පිළියමක් ලෙස ඔවුහු යොදාගනිති. නමුත් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවත්වන්නා වූ රටකට එම ගැටලුවට පිළියමක් ලෙස මෙම තත්ත්වය පෙන්වා දිය නොහැක. එයට හේතුව වන්නේ අප රට තුළ පොදු ප්‍රවාහන සේවය භාවිත කරනු ලබන්නේ හුදෙක් පුද්ගලයන්ගේ ප්‍රවාහනය සඳහා පමණක් වන අතර එය ද භාවිත කරන්නේ තමාට පෞද්ගලික රථයක් භාවිත කිරීමට මූල්‍යමය හැකියාවක් නොමැති පුද්ගලයන් විසිනි. අප රට තුළ ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන පොදු ප්‍රවාහන සේවාවන් වනුයේ බස් හා දුම්රිය ප්‍රවාහන සේවාවන් ය. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ දී පමණක් නොව ලෝකයේ ද පොදු ප්‍රවාහන සේවය තුළ දී පුද්ගලයන් ලිංගික අතවරයට ලක්වීම දැකගත හැකි කාරණයකි. එහිදී ප්‍රධාන වශයෙන් කාන්තාවන් හා ගැහැණු ළමුන් වින්දිතභාවයට පත්වනු ඇත. නමුත් වර්තමානය තුළ පිරිමි පාර්ශ්වය ද මෙහි වින්දිතයන් බවට පත්වීමේ නව ප්‍රවණතාවක් ඇති වී ඇත. මෙය අද ඊයේ සිදු වූ කාරණයක් ලෙස පෙන්වා දිය නොහැකි අතර ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැමිණි තත්ත්වයකි. ලෝකය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සාදාචාරාත්මක බවින් යුතු හා සංවර්ධිත රටවල පොදු ගමනාගමනය තුළ පුද්ගලයන් අතවරයට ලක්වීම පිළිබඳ අසන්නට ලැබෙන්නේ අඩු වශයෙනි. නමුත් ශ්‍රී ලංකාව වැනි රටවල් තුළ මෙම අපරාධකාරීත්වයෙහි වැඩිවීමක් දැකගත හැකිය. එහිදී මෙම කාරණයේ දී තුළදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කොතෙක් දුරට බලපානවා ද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතු වූවකි.

පුද්ගලයකු පොදු ප්‍රවාහන සේවය භාවිත කරන විටදී ලිංගික අතවරයට ලක්වීමට බොහෝ ඉඩකඩ ඇත. මෙයට හේතුව වන්නේ පොදු ප්‍රවාහන සේවය තුළ ඇති අධික තදබදය හා විනයක් නොමැති කමයි. ශාරීරික හා වාචික ලෙස මෙය සිදුවන අතර සමහර අවස්ථාවන්වල දී දූෂණයක් හෝ අපචාරයක් දක්වාද දික් ගැස්සීමට ලක්වනු ඇත. මෙම කාරණය නිසා බොහෝ දෙනා පොදු ප්‍රවාහන සේවය භාවිත කිරීම හා නිවසින් පිටවීයාමට මැලිකමක් දැක්වුව ද එසේ කිරීමට නොහැකි වන්නේ අප රට තුළ පවතින ආර්ථික මට්ටම හේතුවෙනි. මෙහිදී විශේෂයෙන් ම

කාන්තාවන් හා ගැහැනු ළමුන් මෙම කාරණය නිසා තමා තුළ ඇති ලැජ්ජාව හා බිය හේතුකොට ගෙන තම අවශ්‍යතාවන් සඳහා ද පිටවීයාම අවම කොටගෙන ඇත. එයට හේතුව වන්නේ පොදු ප්‍රවාහන සේවය භාවිත කරන පිරිසගෙන් ලිංගික අතවරයට ලක්වන වැඩි පිරිස වැඩිහිටි කාන්තාවන් හා ගැහැනු ළමයින් වීමයි. මෙයට හොඳම උදාහරණය වන්නේ 2015 වසරේදී අප රට තුළ එක්සත් ජාතීන්ගේ ජනගහන සංවිධානය විසින් බස්රථවල දී හා දුම්රිය භාවිත කිරීමේ දී එහි ගමන් කරන කාන්තාවන් හා ගැහැනු දරුවන් 90% ලිංගික හිංසනයට ලක්වන බව සිදු කරන ලද පරීක්ෂණය යයි. එහිදී මෙම පාර්ශ්ව පවසන අන්දමට කාන්තාවන් පිරිමි පාර්ශ්වයට සාපේක්ෂව වැඩි වශයෙන් ලිංගික හිංසනයට ලක්වීමට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ද හේතුවක් වන බව පෙන්වා දී ඇත. ඔවුන් පවසන අන්දමට සමාජය තුළ පවත්නා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත ගොඩ නැගෙන්නා වූ කාර්යයන් හේතුවෙන් මෙම කාරණය සමාජය තුළ දැකගත හැකිවන බවයි. එහිදී ප්‍රධාන වශයෙන් පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන් පොදු ප්‍රවාහන සේවය භාවිත කිරීම මෙයට හේතුවක් ලෙස මෙම පර්යේෂකයන් පෙන්වා දී ඇත. මෙම පර්යේෂණය තුළින් ලිංගික හිංසනය යැයි සැලකිය හැකි විවිධ ක්‍රියාකාරකම් 33 ක් පෙන්වා දී ඇත. ශ්‍රී ලංකාව තුළ කාන්තාවන්ගේ ශ්‍රම බලකායට මෙය ප්‍රධාන වශයෙන් ගැටලුවක් ඇති කරන බව පර්යේෂකයන් වැඩිදුරටත් පෙන්වා දී ඇත.

එහිදී ඔවුන් පෙන්වාදෙන ප්‍රධානම කාරණය වන්නේ කාන්තාවන් පොදු ප්‍රවාහන සේවය භාවිතයට ගනු ලබන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා බවය. ශ්‍රී ලංකාව තුළ පොදු ප්‍රවාහන සේවයන් භාවිත කිරීමේ දී කාන්තාවන් හා පිරිමින් අතර ප්‍රධාන වශයෙන් විෂමතාව දැකගත හැකිය. එහිදී කාන්තාවන් වැඩිපුර පොදු ප්‍රවාහන සේවයන් භාවිත කරනු ඇත. එයට හේතුව වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ කාන්තාවන්ට සමාජය විසින් ලබාදෙනු ලබන තත්ත්වය හා කාර්යභාර යයි. ශ්‍රී ලාංකේය සමාජය තුළ කාන්තාවකට රථ වාහනයක් පැදවීම ඔවුන්ගේ තත්ත්වය හා කාර්යභාරය යටතට නොවැටෙන කාරණයකි. සමාජීය ආකල්ප අනුව ඔවුන්ට එය නොහොබිනා කාර්යයක් වන අතර එය සිදු කිරීම යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති කරනු ලබන බව විශ්වාසයයි. කාන්තාවන්ට කුඩා කාලයේ සිටම සෙල්ලම් කිරීමට පවා ලබාදෙනු ලබන්නේ සෙල්ලම් කාරයක් නොව බෝනික්කෙකි. කුඩා ගැහැනු දරුවෙකු සෙල්ලම් කාරයකින් සෙල්ලම් කිරීමට අවශ්‍ය වුවත් ඒ සඳහා අවස්ථාව ලැබෙන්නේ ඉතා අල්ප වශයෙනි. ඔවුනට කුඩා කලම මනසට ලබාදෙන්නේ කාරය යනු පිරිමින් සතු භාණ්ඩයක් වන අතර කාන්තාවයට අයිති කාර්යය නිවස තුළ රාජකාරී සිදු කිරීම බවයි. එය එසේ සිදුවන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා ඇති කරනු ලබන්නා වූ තත්ත්වය හා කාර්යභාරය හේතුකොට ගෙනය. මෙම හේතුව නිසා කාන්තාවන්ද රථවාහන පැදවීම තම කාර්යයක් නොවන බව කුඩා කාලයේ සිටම හිතේ තබාගෙන කටයුතු කරනු ඇත. එමෙන්ම කුඩා කාලයේ සිටම ගැහැනු දරුවන්ට රිය ධාවන තුළින් බොහෝ අනතුරුවලට ලක්වීමට ඇති වන බවත් එම ඇති වන අනතුරු කාන්තාවන්ගේ ශරීරයට දරාගත නොහැකි වන බවත් ගැහැනු දරුවන්ගේ වැඩිහිටියන් පවසා ඇත.  එම නිසා කාන්තාවන් තුළ යම් චකිතයක් හා බියක් රිය ධාවනය තුළදී දැකගත හැකිය. මෙම කාරණය බොහෝ විට තම පෞද්ගලික ප්‍රවාහන ක්‍රමය භාවිත නොකර පොදු ප්‍රවාහන මාධ්‍යයන් භාවිත කිරීමට ප්‍රධාන හේතුවක් ලෙස පෙන්වා දිය හැකිය. මෙම කාරණය තුළදී වැඩිහිටියන් එසේ පවසා කාන්තාවන් කුඩා කාලයේ සිටම ඇතිදැඩි කරනු ලබන්නේ සමාජය තුළ ක්‍රියාත්මක

වන්නා වූ ස්ත්‍රී-පුරුෂභාවය හේතු කොට ගෙනය. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මගින් කාන්තාවන්ට හා ගැහැනු දරුවන්ට සමාජය තුළ මුලු ගැන්විය යුතු තත්ත්වයක් හා කාර්යභාරයක් ලබා දී ඇත. එම රාමුවෙන් පිටට පැමිණ කටයුතු කරන කාන්තාව හා ගැහැනු දරුවා දෙස සමාජය බලන්නේ මහා අපරාධකරුවෙකු දෙස බලන ආකාරයෙනි. එම තත්ත්වය ද සමාජය තුළ ඇති කොට ඇත්තේ මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවයයි.

මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හේතු කොටගෙන කාන්තාවන්ට රථවාහන පැදවීමේ අයිතිය යම් වාරණයකට ලක්ව ඇති අතර මේ නිසා තම අවශ්‍යතා සඳහා කාන්තාවන්ට පොදු ප්‍රවාහන සේවයන් භාවිත කිරීමට සිදුවී ඇත. එහිදී ඔවුන් පොදු ප්‍රවාහන සේවාවන්වල දී ලිංගික හිංසනයට ලක්වීමට සිදු වී ඇත. යම් හෙයකින් මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මගින් ලබාදෙන තත්ත්වය හා කාර්යභාරය පරිබාහිරව ගොස් කාන්තාවන් රථවාහන භාවිතය සිදුකළ හොත් කාන්තාවන් හා ගැහැනු දරුවන් පොදු ප්‍රවාහන සේවය භාවිත කිරීම අවම කරනු අතර එමගින් ඔවුන් මෙම මුහුණ දෙන වින්දිතභාවය තුළින් ද ගැළවීයාමට හැකියාව ලැබෙනු ඇත. නමුත් එයට මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙතරම් දුරට ඉඩ ලබා දෙනවා ද යන්න පිළිබඳව යම් ගැටලුකාරී ස්වභාවයක් ඇති වනු ඇත. එයට හේතුව වන්නේ සමාජය තුළ මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ඇති නිසාය. දරුවෙක් කුඩා කාලයේදී ලබාදෙන සමාජානුයෝජනයේ සිට මරණය දක්වාම මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සමාජය තුළ ගැබ්ව ඇත. එම නිසා මෙම කාරණය කෙරහි අවධානය යොමු කිරීමේදී කාන්තාවන්ට රථවාහන පැදවීම පිළිබඳ යම් ගැටලුකාරී තත්ත්වයක් දැකගත හැකිය. මෙම පර්යේෂණය සඳහා යොදගන්නා ලද නියැදියෙන් 50% ප්‍රමාණයක් ම තම රැකියා කටයුතු සඳහා පිට වූ පිරිස්ය. එහිදී රැකියා ස්ථානයට පිටත් වී යාම සඳහා යොදාගනු ලබන ප්‍රවාහන මාධ්‍යය වූවේ පොදු ප්‍රවාහන සේවයන්ය. එහිදී එම වින්දිත පාර්ශ්වයන් තම සේවා ස්ථානයේදී ගමන් කිරීමේ දී මෙම මුහුණ දෙන සිදුවීම් හේතුවෙන් කාන්තාවන් තම රැකියාවෙන් පවා ඉවත්වීමට හැකියාව ඇත. එහිදී රටේ පවතින ශ්‍රම බලකායට මෙය දැඩි බලපෑමක් ඇති කළ හැකිය.

ගැහැනිය හා ගැහැනු දරුවන් නිතරම පොදු ගමන් සේවාවන්වල දී ලිංගික හිංසනයට ලක්වීමට තවත් හේතුවක් වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ සමාජය තුළ ගැහැනියට, පිරිමි පාර්ශ්වයට වඩා හීන තත්ත්වයකින් සැලකීමයි. එයට හේතුව වන්නේ කාන්තාව යන චරිතය පිරිමින්ගේ අතකොළුවක් බවට පත්වීමයි. පිරිමියා සිතන්නේ ගැහැනිය තමාට භාවිත කිරීමට ඇති සෙල්ලම් බඩුවක් වන බවයි. මෙම තත්ත්වය සම්පූර්ණයෙන්ම ගොඩනැගී ඇත්තේ සමාජය තුළ ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හේතුකොට ගෙනය. එහිදී පිරිමින් තමන්ගේ අනවශ්‍ය අවශ්‍යතා හා ආශාවන් සියල්ලම ඉෂ්ට කර ගැනීම සඳහා ගැහැනියව තැනක් නොතැනක් නොමැතිව යොදාගනු ඇත. මෙයට විරුද්ධව නැගීසිටීමට පවා කාන්තාවට ඇති ශක්තිය අවම කිරීමට මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සමාජය තුළ ඇති කර ඇත. සෑම අවස්ථාවකදීම පුරුෂ මූලික සමාජයක් මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ කාන්තාවට හිමිවන්නේ පුරුෂයාට වඩා දෙවන ස්ථානයයි. එම හේතුව නිසා කාන්තාව නිතරම සමාජය තුළ තාඩන පීඩනයට ලක්වනු ඇත. මෙය පොදුවේ සමාජය තුළ දැකගත හැකි කාරණයකි. මෙය ගැහැනු දරුවෙකු උපතේ සිටම ඔවුන්ට හිමිවන සාමාජානුයෝජනයත් සමගම ඇති වන්නා වූ කාරණයකි.

ගැහැනු දරුවන්ගේ වැඩිහිටියන් ඔවුන්ට පවසන්නේ කාන්තාව පිරිමින්ට වඩා කායික මෙන්ම මානසික වශයෙන් ශක්තිමත් නොවන නිසා තමාට ස්වයංව තමාව රැකගත නොහැකි වන අතර එම නිසා පුරුෂ පාර්ශවය ලවා තමාගේ ආරක්ෂාව සලසා ගෙන ඔවුන්ව යටහත්ව කටයුතු කරන ලෙසයි. මෙය කාන්තාවට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා හිමි වූ කාරණයකි. කාන්තාවකට පිරිමියකුගේ රැකවරණයක් නොමැතිව ජීවිතය පවත්වා ගැනීමට නොහැකිය යන්න පැවසීම සිනහවට කාරණයකි. මෙය අසත්‍ය කාරණයක් බව ලෝකය තුළ මෙන්ම අප රට තුළ ද ප්‍රායෝගිකව කාන්තාවන් පෙන්වා දී ඇත. නමුත් ශ්‍රී ලංකාව වැනි සංස්කෘතිකාංගවලින් යුක්ත රටක මෙම කාරණය දැකගත හැකි වන්නේ ස්වල්ප වශයෙනි. එමෙන්ම අප රට තුළ එසේ ජීවත් වන කාන්තාවන් සිටියත් ඔවුන් සමාජයට එම කාරණය නොපෙන්වා සිටීමට කටයුතු කරනු ඇත. එයට හේතුව වන්නේ අප සමාජය තුළ දැකගත හැකි ප්‍රබල ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ බලපෑමයි. පිරිමින් මෙම කාරණය හේතුවක් කර ගෙන පොදු ප්‍රවාහන සේවයේදී පවා තමන්ට මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා ලබා දෙනු ලබන අසීමිත පුරුෂ බලය නිසා කිසිදු බිය සැකයකින් තොරව කාන්තාවන්ව ලිංගික හිංසනයට ලක් කරනු ඇත. මෙම පර්යේෂණයට තොරතුරු ලබාදුන් වින්දිත කාන්තාවක් පවසන ආකාරයට ඇය බස් රථය තුළ ගමන් කරන විටදී ඇයගේ පිටුපස ආසනයේ වාඩිවී සිටි පිරිමි පුද්ගලයකු ඇයගේ ශරීරය ස්පර්ශ කර ඇති අතර ඇය එයට විරුද්ධත්වය ප්‍රකාශ කළ විටදී ඔහු පවසා ඇත්තේ ''ඔයාට ඕන විදිහට යන්න අවශ්‍ය නම් පෞද්ගලික වාහනයක යන්න'' ලෙසයි. මෙම අත්දැකීමෙන්ම පෙනී යනු ලබන්නේ පුරුෂයාට අවශ්‍ය පරිදි කාන්තාව ඔවුන්ගේ තාඩන පීඩන ඉවසා සමාජය තුළ ජීවත්විය යුතු බවයි. මෙම තත්ත්වය කාන්තාවට ඇතිව ඇත්තේ සමාජය තුළ මෙම පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුකොට ගෙනය.

යම් හෙයකින් කාන්තාවක් තමාට සිදු වන ලිංගික හිංසනයක් වෙනුවෙන් පෙනී සිටියහොත් ඇයට ඒ වෙනුවෙන් පෙනී සිටීමේ හැකියාව ද මෙම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මගින් වළක්වා ඇත. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා මෙන්ම පුරුෂ මූලික සමාජය තුළ පුරුෂයාට ලබා දී ඇති අසීමාන්තික සමාජ බලය නිසා පුරුෂයා අතින් පොදු ප්‍රවාහන සේවයේ දී ඇතිවන ලිංගික හිංසනයන්ට විරුද්ධ වීමට හැකියාව එමඟින් වළකා ඇති අතර යම් හෙයකින් එයට විරුද්ධව නැගී සිටියහොත් ඇයව සමාජය තුළ කොන් කිරීමක් හෝ ලැජ්ජාවකට පත් කිරීමක් සිදු කිරීමට සමාජය තුළ වාසය කරනු ලබන පුරුෂ මූලික සමාජය කටයුතු කරනු ඇත. මෙවැනි අවස්ථාවලට මුහුණ දෙන මෙවැනි වින්දිත කාන්තාවන් මෙම හේතු කාරණා නිසා තමා තුළම මෙම කාරණය සිතේ රඳවාගෙන තමා පිළිබඳව ම පිළිකුළක් හා සමාජය පිළිබද වෛරී හැඟීමක් ඇති කර ගනු ලබයි. මෙම නිසා මෙම ලිංගික හිංසනයට ලක්වන කාන්තාවන් මානසික වශයෙන් යම් යම් රෝගාබාධවලට ලක්වන අතර එම කාන්තාවන් නිතරම පොදු ප්‍රවාහනය තුළ මෙසේ වින්දිතභාවයට ලක්ව එයට විරුද්ධව නැගී සිටීමට නොහැකි වීමෙන් හා වින්දිතභාවය දරා ගැනීමට නොහැකි වීමෙන් සිය දිවිනසා ගැනීමේ තත්ත්වයට පවා පත්වනු ඇත. මෙය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා සමාජයේ ජීවත් වන සමස්ත වින්දිත කාන්තාවන්ගේම අවසාන ඉරණම බවට පත්වනු ඇත. එමෙන්ම යම් හෙයකින් මෙම කාරණය දරා ගැනීමට අපහසුවුවහොත් ඔවුන් අපරාධකරුවාට යම් හානියක් සිදුකර අපරාධකරුවෙකු බවට පත්වීමට මෙම වින්දිත කාන්තාවන්ට

සිදුවනු ඇත. මෙම සියල්ලට ම හේතු කාරණය වන්නේ ශ්‍රී ලාංකේය සමාජය තුළ දක්නට ඇති ස්ත්‍රී-පුරුෂ සමාජභාව යයි.

එමෙන්ම මෙහිදී පෙනී යන තවත් කාරණයක් වන්නේ මෙම පර්යේෂණයට සහභාගී වූ කාන්තාවන්ගෙන් ලිංගික හිංසනය පිළිබඳව නීතිය තුළ දඬුවම් ඇති බව 60% පිරිසක් නොදැන සිටින බවයි. කාන්තාවන්ට මෙම කාරණය පිළිබඳ ලොකු දැනුමක් නොමැති වන ඒ තුළින් ද පැහැදිලි වේ. මෙයට ද යම්තාක් දුරකට ස්ත්‍රී පුරුෂ සමාජභාවය බලපානු ලැබේ. එයට හේතුව වන්නේ පුරුෂ මූලික සමාජය තුළ කාන්තාවට තමාට වින්දිතභාවයට පත්වූ විට එයට අදාළ නීතිමය පිහිටක් ඇති බව පූරුෂ මූලික සමාජය තුළ ලබා නොදීමට උත්සාහ කරන නිසාය. එසේම පුරුෂයාගේ බලය අභිබවා යන නිසාය. එම නිසා ඔවුන් එය එසේ නොවීම සඳහා සෑම අවස්ථාවකම පාහේ කටයුතු කරනු ඇත. මෙම හේතුව නිසා ඔවුන්ට ලිංගික හිංසනයේදී නීතියේ සරණ පවා ලබා ගැනීමට පවා දැනුමක් නොමැති බව පෙනී යනු ඇත. මෙම පර්යේෂණයේ පෙන්වා දෙන ආකාරයට පොදු ප්‍රවාහන සේවයේ දී ලිංගික හිංසනයට ලක්වූ කාන්තාවන්ගෙන් 4% පමණ ඉතා අවම සංඛ්‍යාවක් පමණක් පොලීසියේ හෝ වෙනත් අයගෙන් සහය ලබාගෙන ඇත. මෙය ඉතාමත් භයානක තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකිය. එයට හේතුව වන්නේ වින්දිතභාවයට පත්වුණු පාර්ශවය තමාගේ වින්දිතභාවය ඉවසා දරාගෙන කාලය ගත කිරීමයි. මෙයට ද ප්‍රධානම හේතුව වන්නේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවයයි. එහිදී කුඩා කාලයේ සිටම ගැහැනු දරුවන්ට ලබාදෙන සමාජානුයෝජනය හේතුවෙන් තනිවම පොලීසියක් වෙතට හෝ ඔවුන්ගෙන් උපකාරයක් ලබා ගැනීමට කාන්තාවන්ට උචිත කාර්යයක් නොවන බව ඔවුන් කියා සිටියි. එමෙන්ම කාන්තාවකට නොදන්නා කෙනෙකුගෙන් උදව්වක් ඉල්ලා ගැනීමට ඔවුන් පසුබට වනු ඇත. එයට හේතුව වන්නේ තමන් නොදන්නා කෙනෙකුගෙන් උපකාරයක් බලාපොරොත්තු නොවන ලෙසත්, විශේෂයෙන් පිරිමි පාර්ශ්වයෙන් උපකාරයන් බලාපොරොත්තු නොවිය යුතු බවත් කාන්තා පාර්ශවයෙන් පමණක් උපකාර ලබාගත යුතුය බවත් කුඩා කාලයේ සිටම ස්ත්‍රී මනසට කාවද්දා තිබීමයි. මෙය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා සිදුවන සාමාජානුයෝජනයේ එක් ප්‍රතිඵලයකි. එමෙන්ම කාන්තාවකට පුද්ගලයකුගෙන් උපකාරයක් ලබා ගැනීමට බියක් හා කුතුහලයක් ඇත. එයට හේතුව වන්නේ ද ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ එන සමාජ තත්ත්වයයි.

**සමාලෝචනය**

මේ අනුව පෙනී යනු ලබන්නේ පොදු ප්‍රවාහන සේවය භාවිත කරන කාන්තාවන්ට සිදුවන ලිංගික හිංසනයට ඍජු ලෙසම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය බලපාන බවයි. එහිදී ප්‍රධාන වශයෙන් සමාජය තුළ ක්‍රියාත්මක වන ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නිසා කාන්තාවන්ට මෙයට විරුද්ධව නැගී සිටීමය හැකියාවක් නිර්මාණය වී නොමැත. මෙම කාරණය කුඩා කාලයේ සිටම ලැබෙන දෙයකි. එනම් පුරුෂ මූලික සමාජයක් යටතේ සමාජානුයෝජනය වී ජීවත් වීමට සිදුවීමයි. මෙම කාරණයට පිළියමක් ලෙස කාන්තාවන්ට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යටතේ ලබාදී ඇති වාරණයෙන් නිදහස් කොට ඔවුන්ට අවශ්‍ය පරිදි තමාගේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය වටපිටාවක් ඇති කළ යුතුය. එමෙන්ම පොදු ප්‍රවාහන සේවය තවත් ශක්තිමත් කිරීම ද මෙයට තවත් යෙදිය හැකි පිළියමකි. කාන්තාවන්ට හා ගැහැනු දරුවන්ට

ලිංගික හිංසනය පිළිබඳව ඇති නීතිමය තත්ත්වය පිළිබඳ දැනුවත් කර ඔවුන්ට නීතියේ ආරක්ෂාව ඇති බව පෙන්වා යම් හෙයකින් වින්දිතභාවයට පත්වන විටදී එයට විරුද්ධව නැගී සිටීමට අවශ්‍ය වටපිටාව ගොඩනැගීම තුළින් ද පොදු ප්‍රවාහන සේවයේ දී සිදුවන ලිංගික හිංසනයට විරුද්ධව නැගී සිටීමට හැකියාව ලැබෙනු ඇත. තවද වින්දිත අවස්ථාවේ දී අවට සිටින පිරිසගෙන් සහය පැතීම වරදක් නොවන හැඟීමක් වන බව හා ඔවුන්ගේ උපකාර ලබා ගත යුතු බව කුඩා කල සිටම පෙන්වා දිය යුතුවේ. මෙම ආකාරයෙන් පෙනී යන්නේ මෙම පොදු ප්‍රවාහන සේවයන්වල දී ලිංගික හිංසනයට කාන්තාවන් හා ගැහැනු දරුවන් ලක්වීමට එක් හේතුවක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය හේතුවක් වන බවයි. එමෙන්ම මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය යම් හෙයකින් පාලනයට ලක්කොට එය සමාජයට අත්‍යවශ්‍ය කාරණයක් නොවන බව සමාජයට පෙන්වා දිය යුතුය. එමෙන්ම ගැහැනියට හා ගැහැනු දරුවාට පිරිමි පාර්ශවය මෙන්ම සමතැන ලබාදීම තුළින් සමාජය සාරධර්මවලින් පිරි සමාජයක් බවට පත්කළ හැකිය. ඒ තුළින් මෙම අපරාධ සඳහා කාන්තාවන් හා ගැහැනු දරුවන් වින්දිතභාවයට පත්වීම වැළැක්වීමට හැකියාව ලැබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

Asian Development Bank, 2015. Policy Brief: A Safe Public Transportation Environment for Women and Girls http://genderinsite.net/sites/ default/files/ safe-public-transport-women-girls. pdf

Asian Development Bank, 2014. Rapid Assessment of Sexual Harassment In Public Transport and Connected Spaces in Karachi. Technical Assistance Consultant's Report. https://www.adb.org/sites/default/files/projectdocument /152881/44067-012-tacr-19.pdf

# පුමිතිරි

## pumithiri
## 2021

Equal Opportunity Cell
Faculty of Humanities and Social Sciences

**සම අවස්ථා කේන්ද්‍රය**
**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, සමානාත්මතාව හා සාධාරණත්වය පිළිබඳ ඒකකය**
**මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**